# ශුද්ධාත්මයාණන්වහන්සේගේ

# මෙහෙය

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


මෙම අත්පොත භාවිතා කරන්නේ කෙසේද? . . . . . . .

කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . . . . . 3

හැඳින්වීම . . . . . . . . . . . . . 4

පාඨමාලාවේ අරමුණු . . . . . . . . . . 5

1. ශුද්ධාත්මයාණන්වහන්සේ හඳුන්වාදීම . . . . . . . . 6

2. ශුද්ධාත්මයාණන්වහන්සේ නියෝජනය කිරීම . . . . . . . 18

3. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය . . . . . . . . 26

4. ශුද්ධාත්ම බව්තිස්මය . . . . . . . . . . 40

5. ශුද්ධාත්මයාණන්ගේ දීමනාවන්ට හැඳින්වීමක් . . . . . . . 52

6. ශුද්ධාත්මයාණන්ගේ විශේෂ දීමනා . . . . . . . . 66

7. ශුද්ධාත්මයාණන්වහන්සේගේ වාචික දීමනාවන් (කතාකරන) . . . . . 88

8. ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවයකිරීමේ දීමනා . . . . . . 95

9. සලකුණු පිළිබඳ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා . . . . . . 109

10. ඔබගේ ආත්මික දීමනා සොයාගැනීම . . . . . . . . 122

11. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල . . . . . . . . 150

12. මාංගයේ ක්‍රියා . . . . . . . . . . . 168

13. ආත්මික ඵල වර්ධනය කිරීම . . . . . . . . . 186

උපග්‍රන්ථය . . . . . . . . . . . . . 199

ස්වයං - පරීක්ෂණය සඳහා පිළිතුරු . . . . . . . . 200

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තිරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවති.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයින්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කරගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයින් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයින් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය**: ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

**මොඩියුලය :** නියෝජනය කිරීම.
**පාඩමාලාව :** ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය.

# හැඳින්වීම.

ප්‍රේරිත පාවුල් ඔහුගේ එක් ධර්ම දූත චාරිකාවකදී ඇදහිලිවතුන් කණ්ඩායමකින් ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ ප්‍රශ්න කළේය. ඔව්හු අදහාගත් කල ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබුවාදැයි ඔවුන්ගෙන් විමසීය. ඔවුන්ගේ පිළිතුර වූයේ "නැත, ශුද්ධාත්මයාණන්වහන්සේ ඇති බවවත් නො ඇසීමු" යනුවෙනි (ක්‍රියා 19:2). පාවුල් මෙම කිතුබැතියන් සමග ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය පිළිබඳ පණිවුඩය බෙදා ගත්තේය (ක්‍රියා 19). අද දින පවා ඇදහිලිවන්තයෝ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය අවබෝධ කරගැනීම එදා මෙන්ම ඉතා වැදගත්ය. දෙවියන්වහන්සේ පොරොන්දුවී ඇත්තේ :

> **අන්තිම දවස්වලදී මාගේ ආත්මය සියළු මනුෂ්‍යයන් පිට වගුරුවන්නෙමි. නුඹලාගේ පුත්‍රයෝද දුවරුද අනාගතවාක්‍ය කියන්නෝය, නුඹලාගේ තරුණයෝද දර්ශන දකින්නෝය, නුඹලාගේ මහල්ලන්ද ස්වප්න දකිනවා ඇත. (ක්‍රියා 2:17)**

දෙවියන්වහන්සේ මෙම යුගයේ ශුද්ධාත්මයාණන්වහන්සේ අප මත වැගිරවීමට කැමතිව සිටීම අපට මෙම අධ්‍යයනය වඩාත් වැදගත් කමක් ගෙන දෙයි. දෙවියන්වහන්සේගේ බලයෙහි විශේෂ එළිදරව් වීමෙහි කොටසක් වීමට නම් අප ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය වටහාගත යුතුය. ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ ඉගෙනීම බයිබලයෙහි ඇතුලත් මූලික ධර්මවලින් එකකි. ධර්මය නම් කිසියම් විෂයක් සම්බන්ධයෙන් ඉගෙනීමට ඇති සියළු කාරණාය.

පාවුල් මෙසේ ප්‍රකාශ කළේ :

> **මා එනතුරු කියවීමෙහිද අවවාදකිරීමෙහිද ඉගැන්වීමෙහිද යෙදී සිටින්ට බලාගනින්න. (1 තිමෝති 4:13)**

දෙවියන්වහන්සේ අපගේ ලෝකයෙහි ක්‍රියාකරනුයේ මිනිසාගේ ස්වාභාවික බලය තුලින් නොවේ. එය සිදුවනුයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය කරණකොට ගෙනය.

> **...එනම්, බලයෙන්වත් ශක්තියෙන්වත් නොව මාගේ ආත්මයෙන්යයි සේනාවල ස්වාමීන්වහන්සේ කියනසේක. (සෙකරියා 4:6)**

මෙම පාඩමාලාවෙහිදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ ස්වභාවය හා පුද්ගලිකත්වය පිළිබඳ සොයා බලනු ඇත. මෙහිදී ශුද්ධාත්මයාණන්වහන්සේව හැඳින්වීමට භාවිතාකර ඇති නාම හා එතුමා නියෝජනය කරන්නාවූ සංකේත පිළිබඳ සාකච්ඡා කරනු ඇත. මෙම කරුණු දෙකින්ම එතුමාගේ මෙහෙය පිළිබඳ හෙළිකරයි. ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථ, දීමනා සහ ඵල පිළිබඳව විස්තරාත්මකව සොයා බලනු ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් බව්තිස්මය ලැබීම සඳහා, ආත්මික දීමනා හඳුනා ගැනීම සඳහා සහ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වර්ධනය කරගැනීම සඳහා ප්‍රායෝගික උපදෙස් සපයනු ඇත.

# පාඨමාලාවේ අරමුණු.

මෙම පාඨමාලාව අවසන් කළ පසුව ඔබ හට හැකි වන දේ :

- ශුද්ධාත්මයාණන්වහන්සේගේ පුද්ගලිකත්වය විස්තර කිරීමට.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ විවිධ නාම සහ තනතුරු නම් කිරීමට.
- ශුද්ධාත්මයාණන්වහන්සේ නියෝජනය කරන්නාවූ සංකේත හඳුනාගැනීමට.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය විස්තර කිරීමට.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තීස්මය ලැබීම විස්තර කිරීමට.
- ඔබගේ ආත්මික දීමනාව(න්) හඳුනාගැනීමට.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල හඳුනාගැනීමට.
- මාංශයේ ක්‍රියා හඳුනාගැනීමට.
- ඔබගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වර්ධනය කරගැනීමට.

# පළමුවන පරිච්ඡේදය

## ශුද්ධාත්මයාණන්වහන්සේ හඳුන්වාදීම

### අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට හැකිවන දේ :

- දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයේ පුද්ගලයෙක්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ හඳුනාගැනීමට.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ පුද්ගලභාවයේ චරිත ගුණාංග නම් කරන්න.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ ස්වභාවය පැහැදිලි කිරීමට.

### ප්‍රධාන පදය :

**යේසුස්වහන්සේ බව්තිස්ම ලැබ එකෙණෙහිම දියෙන් ගොඩනැගුණු සේක. බලව, අහස උන්වහන්සේට විවරවිය, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු මෙන් බසිනවාද තමන් පිටට පැමිණෙනවාද උන්වහන්සේ දුටු සේක: තවද: මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක් විය. (මතෙව් 3:16-17)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය ශුද්ධාත්මයාණන්වහන්සේව හඳුන්වාදෙයි. දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයේ උන්වහන්සේට හිමි ස්ථානය, එතුමාගේ පුද්ගලභාවයේ චරිත ලක්ෂණ පැහැදිලිකරන අතර එතුමාගේ සංවේදී ස්වභාවය පිළිබඳ අනතුරු දක්වයි. ශුද්ධාත්මයාණන්වහන්සේව හැඳින්වීමට "ආත්මයාණන්" යන පදයද භාවිතාකෙරේ. එසේම "එතුමාණෝ" යන පදයද භාවිතාකෙරේ. එතුමා ත්‍රිත්වයේ එක් පුද්ගලයෙකු බැවින් "එතුමා" ලෙසද හැඳින්වේ.

යේසුස්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ කතාකිරීමේදී "එතුමා","උන්වහන්සේ" යනුවෙන් භාවිතා කළ සේක.

- උන්වහන්සේ මා ගැන සාක්ෂි දෙන සේක. යොහන් 15:26.
- උන්වහන්සේ නුඹලා වෙත එවන්නෙමි. යොහන් 16:7.
- උන්වහන්සේ මා ගෞරවයට පමුණුවන සේක. යොහන් 16:14.
- උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර: යොහන් 16:13.

## දෙවියන්වහන්සේ තුන් ආකාර ස්වභාවය.

ලොව පුරා වන්දනා වෙන්නාවූ දෙවිවරු රාශියක් ඇති නමුත් ඇත්තේ එකම සත්‍ය දෙවි කෙනෙකි. මෙම දෙවියන්වහන්සේගේ කථාව ශුද්ධ බයිබලයෙහි අන්තර්ගත වේ. ශුද්ධ බයිබලය දෙවියන්වහන්සේගේ වචනය වන අතර එය සියලු මිනිස් සංහතිය උදෙසා ඇති එතුමාගේ විශේෂ සැලැස්ම හෙළිකරදෙයි.

බයිබලය හෙළිදරව් කරදෙන එක් කරුණක් නම්, දෙවියන්වහන්සේ ත්‍රිත්වයක් බවය. එහි අර්ථය නම්, එතුමාගේ පුද්ගලභාවය තුන් ආකාරයකින් හෙළිදරව් කර ඇති බවය. උන්වහන්සේ පුද්ගලයන් තුන් දෙනෙක් වන නමුත් එක් දෙවි කෙනෙකි. ශුද්ධාත්මයාණන්වහන්සේ, දෙවියන්වහන්සේ වන පියාණෝ, පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ වන ත්‍රිත්ව ස්වභාවයේ කොටසකි. මෙම පුද්ගලභාවය තුනම දේවත්වයෙහි එකතු වී ත්‍රිත්වය සාදයි.

ත්‍රිත්වයේ සෑම අංශයකටම, එනම්...පියාණන්ට, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට හා ශුද්ධාත්මයාණන්වහන්සේට මිනිස් සංහතිය උදෙසා කිරීමට විශේෂ කාර්යයක් පවතී. මෙම පාඩමාලාවෙහිදි සලකා බලනුයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථය හා මෙහෙය වේ.[1]

## දෙවිවූ ශුද්ධාත්මයාණෝ.

ශුද්ධාත්මයාණන්වහන්සේට දෙවියන්වහන්සේයයි ආමන්ත්‍රණය කරනු ලැබේ :

> **නුමුත් පේත්‍රුස් කථාකොට: අනනියස්නි, ශුද්ධාත්මයාණන්වහන්සේ රවටා බිමේ මිලෙන් කොටසක් තබාගන්ට සාතන් නුඹේ සිත පිරෙවුවේ මක්නිසාද? ඒක තිබියදී නුඹටම අයිතිව තිබුණා නොවේද? වික්කායින් පසුත් මිල නුඹේ කැමැත්ත යටතේ තිබුණා නොවේද? නුඹේ සිතින් මෙබඳු දෙයක් යෝජනාකරගන්ට යෙදුණේ කොහොමද? නුඹ බොරු කීවේ මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේටයයි කීවේය. (ක්‍රියා 5:3-4)**

උන්වහන්සේට දෙවියන්වහන්සේ යයි ආමන්ත්‍රණය කරන බැවින් එතුමා පියවූ දෙවියන්වහන්සේට හා පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සමානය. මෙම පාඩමාලාවෙහි ප්‍රධාන පදයෙන් පැහැදිලි ලෙස දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයෙහි ස්වභාවය පෙන්වා දෙයි. යේසුස්වහන්සේ බව්තිස්මය ලබමින් සිටිඃ ශුද්ධාත්මයාණන්වහන්සේ උන්වහන්සේ පිටට වැඩම කර ඇතඃ දෙවියන්වහන්සේ කතාකරයි.

> **යේසුස්වහන්සේ බව්තිස්ම ලැබ එකෙණෙහිම දියෙන් ගොඩනැගුණුසේක. බලව, අහස උන්වහන්සේට විවර විය, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු මෙන් බසිනවාද තමන් පිටට පැමිණෙනවාද උන්වහන්සේ දුටු සේකඃ තවද: මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක් විය. (මතෙව් 3:16-17)**

යේසුස්වහන්සේ මිහිපිට තම සේවාව නිමකොට, ස්වර්ගයට යාමට පෙර, එතුමා ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව කතා කළසේක.

> **නුමුත් පියාණන්වහන්සේ කෙරෙන් මා විසින් නුඹලාට එවන සැනසිලිකාරයාණන්වහන්සේ එනම් පියාණන්වහන්සේ වෙතින් නික්මෙන්නාවූ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන්වහන්සේ මා ගැන සාක්ෂිදෙනසේක. (යොහන් 15:26)**

ප්‍රේරිත පාවුල් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ත්‍රිත්වයෙහි ස්වභාවය පිළිබඳව කතා කළසේක.

> **මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස්කළාය. මක්නිසාද දෙවියන්වහන්සේ තමන්වහන්සේගේම පුත්‍රයාණන් පාප-මාංසයේ සමානකමෙන්ද පාපය නිසාද එවා, මාංසයේ පාපය දඬුවමට පත්කරමින්, මාංසය කරණකොටගෙන දුර්වලවූ ව්‍යවස්ථාවට බැරිවූ දේ ඉෂ්ටකළ සේක. (රෝම 8:2-3)**
>
> **ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවද දෙවියන්වහන්සේගේ ප්‍රේමයද ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහභාගිකමද නුඹලා සියල්ලන් හා සමග වේවා.
> (2 කොරින්ති 13:14)**
>
> **මක්නිසාද උන්වහන්සේ කරණකොටගෙන අප දෙගොල්ලට එක ආත්මයාණන්වහන්සේ තුළ පියාණන්වහන්සේ ළඟට පැමිණීමේ පුළුවන්කම තිබේ. (එපිස 2:18)**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ත්‍රිත්වයෙහි ස්වභාවය පිළිබඳ පේත්‍රුස් ද කතාකළේය.

---


[1] පියවූ දෙවියන්වහන්සේ පිළිබඳවත් පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳවත් අධ්‍යයනයක් *"ආත්මික උපක්‍රම"* නම් "හාවස්ට්ටයිම් ජාත්‍යයන්තර අධ්‍යයන" පාඩමාවෙහිදී සපයා තිබේ. වැඩිදුර අධ්‍යයන කොටසෙහි දෙවියන්වහන්සේ හා යේසුස්වහන්සේ පිළිබඳව අධ්‍යයනයක් සපයා ඇත.

**ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා නින්දාකරනු ලබන්නහු නම් නුඹලා ආශිර්වාද ලද්දහුය. මක්නිසාද මහිමයේ ආත්මයාණන්වහන්සේ වන දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි රඳනසේක. (1 පේත්‍රුස් 4:14)**

ක්‍රියා පොතද ත්‍රිත්වයෙහි දේව ස්වභාවය පිළිබඳව සනාථ කරයි.

**එහෙයින් උන්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණතින් උසස් කරනු ලැබ, පොරොන්දුවූ ශුද්ධාත්මයාන්වහන්සේ පියාණන්වහන්සේගෙන් ලබා, නුඹලා අසන දකින මේ දේ වැගිරවූ සේක. (ක්‍රියා 2:33)**

පහත සදහන් රූපයෙන් ත්‍රිත්වයෙහි ස්වභාවය පැහැදිලිකරයි. පුද්ගලභාවයන් තුනකි. එනම් පියාණෝ, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ශුද්ධාත්මයාණෝය... නමුත් ඒ තුන්දෙනාම එක දෙවිකෙනෙකි.




## ශුද්ධාත්මයාණන්වහන්සේගේ ස්වභාවය.

දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයෙහි කොටසක් විලසින් ශුද්ධාත්මයාණන්වහන්සේට විශේෂ ස්වභාවයක් ඇත. උන්වහන්සේගේ ස්වභාවය ලෙසට අප හඳුන්වන්නේ එතුමාව විස්තර කෙරෙන මූලික ගුණාංග වේ. බයිබලය උගන්වන පරිදි ශුද්ධාත්මයාණන්වහන්සේ :

### සර්වව්‍යාපීය :

එනම් උන්වහන්සේ සැම ස්ථානයකම වැඩ සිටී.

**ඔබගේ ආත්මය කෙරෙන් කොතැනට යන්නෙම්ද? ඔබ ඉදිරියෙන් කොතැනට පලා යන්නෙම්ද? (ගීතාවලිය 139:7)**

### සර්වඥය :

එනම් උන්වහන්සේ සියල්ල දන්නා සේක.

**නුමුත් දෙවියන්වහන්සේ ස්වකීය ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන අපට ඒ දේ එළිදරව් කළ සේක. මක්නිසාද ආත්මයාණන්වහන්සේ සියලු දේ, එසේය, දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් විමසනසේක. මනුෂ්‍යයෙකුගේ කාරණා මනුෂ්‍යයා තුළ තිබෙන ඔහුගේ ආත්මය හැර මනුෂ්‍යයන් අතරේ වෙන කවරෙක් දන්නේද? එසේම දෙවියන්වහන්සේගේ කාරණා දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මිස වෙන කිසිවෙක් නොදනියි. (1 කොරින්ති 2:10-11)**

### සර්වබලධාරීය :

එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ සියලු බලයෙන් යුක්තය.

**දෙවියන්වහන්සේ එක් වරක් කීසේක, මම මෙය දෙවරක් ඇසීමි: එනම් බලය දෙවියන්වහන්සේට අයිති බවත්, ... (ගීතාවලිය 62:11)**


**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

## සදාකාලික :

එනම් උන්වහන්සේ සදාකාලිකව පවතින බවය, එතුමාට ආරම්භයක් නැතිවාක් සේම නිමවීමක් නැත.

> **... කැලලක් නැතුව සදාකාල ආත්මයාණන් කරණකොටගෙන තමන්ම දෙවියන්වහන්සේට පූජාවුණාවූ ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් ජීවමාන දෙවියන්වහන්සේට සේවයකරන පිණිස, මළ ක්‍රියාවලින් නුඹලාගේ හෘදයසාක්ෂිය කොපමණ වැඩියෙන් පිරිසිදුකරනු නොලබන්නේද? (හෙබ්‍රෙව් 9:14)**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ සදාකාලික ස්වභාවය වෘත්තයකින් නිදර්ශනය කළ හැකිය. වෘත්තයක ආරම්භයක් හෝ අවසානයක් නොමැත. එහෙත් එය පවතී.



ශුද්ධාත්මයාණන්වහන්සේගේ සදාකාලික ස්වභාවය.

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ පුද්ගලභාවය.

ශුද්ධාත්මයාණන්වහන්සේ ත්‍රිත්වයේ දෙවිඳුන්ගේ කොටසකි. නමුත් ශුද්ධාත්මයාණන්වහන්සේට තමාගේ පුද්ගලභාවයක්ද ඇත. බයිබලය හෙළිකරන පරිදි:

## එතුමාට මනසක් තිබේ :

> **ඒ ආත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන බැවින්, සිත් විමසන තැනන්වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නාසේක. (රෝම 8:27)**

## මිනිස් මනස සොයා බලයි :

> **නුමුත් දෙවියන්වහන්සේ ස්වකීය ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන අපට ඒ දේ එළිදරව් කළසේක. මක්නිසාද ආත්මයාණන්වහන්සේ සියලු දේ, එසේය, දෙවියන්වහන්සේගේ ගැඹුරු දෙවල් විමසන සේක. (1 කොරින්ති 2:10)**

## කැමැත්තක් තිබේ :

> **නුමුත් ඒ එකම වූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදා දෙමින්, මේ සියල්ල කරවනසේක. (1 කොරින්ති 12:11)**

ඇදහිලිවන්තයන්ට යම්කිසි කාරණාවලට අවසර නොදීමෙන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ කැමැත්ත ඔවුන්ට මගපෙන්වාදෙයි.

> **ඔව්හු ආසියාවේදී වචනය කියාදෙන්ට ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු ලැබ, පිරිගිය සහ ගලාතිය පළාත මැදින් ගියෝය; ඔවුහු මීසිය ඉදිරියට ඇවිත් බිතිනියට යන්ට උත්සාහ කළෝය; නුමුත් යේසුස්වහන්සේගේ ආත්මයාණෝ ඔවුන්ට ඉඩ නුදුන්සේක. (ක්‍රියා 16:6-7)**

එසේම කිසියම් කාරණාවලදී ඇදහිලිවතුන්ට අවසර දීමෙන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ කැමැත්ත ඔවුන්ට මගපෙන්වාදෙයි.

> **ඔහු දර්ශනය දුටු කල, ඔවුන්ට ශුභාරංචිය දේශනාකරන්ට දෙවියන්වහන්සේ අඬගැසූ බව තේරුම්ගෙන, එකෙණෙහිම මකිදෝනියට යන්ට අපි උත්සාහ කළෙමුව. (ක්‍රියා 16:10)**

### කතාකරයි :

උන්වහන්සේ පිලිප්ට කතා කළ සේක.

**එවිට ආත්මයාණන්වහන්සේ පිලිප්ට කථාකොට: නුඹ මේ රථය ළඟට ගොස් එක්වෙන්නැයි කීසේක. (ක්‍රියා 8:29)**

උන්වහන්සේ පේත්‍රුස්ට කතාකළසේක.

**පේත්‍රුස් වනාහි දර්ශනය ගැන කල්පනාකරමින් සිටියදී, ආත්මයාණන්වහන්සේ කථාකොට: බලව, මනුෂ්‍යයෝ තුන්දෙනෙක් නුඹ සොයති. (ක්‍රියා 10:19)**

අන්තියෝකියේ නගරයෙහි වැඩිමහල්ලන්ට උන්වහන්සේ කතා කළ සේක.

**ඔවුන් ස්වාමීන්වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන් කල, ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට: මා විසින් බාර්ණබස්ද සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලායයි කීසේක. (ක්‍රියා 13:2)**

ආසියාවෙහි පිහිටි සභා සතට ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් කතාකළාවූ පණිවුඩ කිහිපයක් එළිදරව් 2 හා 3 පරිච්ඡේදවල වාර්තාවී තිබේ.

### ප්‍රේමකරනසේක :

**සහෝදරයෙනි, යුදයෙහි සිටින අකීකරුවන්ගෙන් මා ගළවනු ලබන ලෙසත්, යෙරුසලම උදෙසා මා කරන උපස්ථානය ශුද්ධවන්තයන්ට ප්‍රසන්න වන ලෙසත්, ... (රෝම 15:30)**

### මැදිහත්කාරකම් කරනසේක :

ශුද්ධාත්මයාණන්වහන්සේගේ එක් පුද්ගල චරිත ගුණාංගයක් නම් එතුමා මැදිහත්කරුවෙකි. එනම්, උන්වහන්සේ අන්‍යයන් උදෙසා දෙවියන්වහන්සේට යාච්ඤා කරන බවය.

**එලෙසම ආත්මයාණන්වහන්සෙත් අපගේ දුර්වලකම්වලදී උපකාර කරනසේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අප නොදැනිමුව: නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම්වලින් අප උදෙසා මැදහත්කම් කරන සේක. (රෝම 8:26)**

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ සංවේදීබව

ශුද්ධාත්මයාණන්වහන්සේ සතුව සංවේදී ස්වභාවයක් පවතී. ඉන් අදහස් කරනුයේ මිනිසාගේ ක්‍රියාවන් මගින් බලපෑම් ඇතිවිය හැකි හැඟීම් එතුමා සතුවන බවය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ සංවේදී ස්වභාවය නිසා බයිබලය ඔබට අනතුරු අගවනුයේ එතුමාට මෙසේ නොකරන ලෙසය :

### ශුද්ධාත්මයට බොරු නොකියන්න :

**නුමුත් පේත්‍රුස් කථාකොට: අනනියස්නි, ශුද්ධාත්මයාණන්වහන්සේ රවටා බිමේ මිලෙන් කොටසක් තබාගන්ට සාතන් නුඹේ සිත පිරෙවුවේ මක්නිසාද?**

**...නුඹ බොරු කීවේ මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේටයයි කීවේය. (ක්‍රියා 5:3-4)**

### ශුද්ධාත්මය වලක්වන්න එපා.

ශුද්ධාත්මයාණන්වහන්සේ හට ඇදහිලිවන්තයා උදෙසා කළයුතු වූ විශේෂිත සේවාවන් කිහිපයක් ඇත. එය අපි මෙම පාඩමාලාවේ තුන්වන පරිච්ඡේදයෙහිදී සාකච්ඡා කරන්නෙමු. ශුද්ධාත්මයාණන්වහන්සේ වැලැක්වීම නම් ඔබගේ ජීවිතයට එතුමා මෙහෙකිරීමට උත්සාහ කරන විට එතුමාට යටත් නොවීමය.

**තදවූ කුලල් ඇත්තන්, සිතින්ද කන්වලින්ද අචර්මජේදිතයෙනි, නුඹලා නිතරම ශුද්ධාත්මයාණන්ට විරුද්ධව සිටිහුය. නුඹලාගේ පියවරුන් කළාක්මෙන් නුඹලාත් කරහුය. (ක්‍රියා 7:51)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ නිවා දමන්න එපා :

ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට කරන සේ පවසන දෙය නොකළ විට උන්වහන්සේව නිවා දමනු ලබයි. "නිවා දැමීම" තවත් ස්ථානයකදී බයිබලයෙහි සඳහන් වනුයේ ගින්නක් නිවාදැමීම හා සම්බන්ධ කරගෙනය. ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේ නිවාදමූ කල ඔබ තුළින් එතුමාගේ බලය ගලායාම නැවතේ. එය ගින්දරට ජලය වත්කිරීමක් වැනිය.

**ආත්මයාණන්වහන්සේ නොනිවල්ලා. (1 තෙසලෝනික 5:19)**

## ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් දෙන්න එපා :

ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට කිරීමට පවසන දෙය නොකර සිටීමෙන් එතුමා නිවා දමයි. උන්වහන්සේට දුක්දීම නම්, එතුමා නොකිරීමට පවසන දෙය කිරීමය. ඉශ්‍රායෙල් ජාතිය ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් දුන්නෝය.

**කීවරක් ඔවුහු වනයෙහිදී උන්වහන්සේට විරුද්ධව කැරලිගැසුවෝද, කාන්තාරයේදී උන්වහන්සේට දුක් දුන්නෝද! (ගීතාවලිය 78:40)**

බයිබලය අනතුරු අඟවමින් :

**දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙල්ලා; මක්නිසාද උන්වහන්සේ තුළ නුඹලා මිදීමේ දවසට මුද්‍රාකරනු ලැබුවහුය. (එපීස 4:30)**

## ශුද්ධාත්මයාණන්වහන්සේට නිගරු නොකරන්න :

ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙය කරණ කොට ගෙන පව්සමාව අත් දුටු පසුව නැවතත් පාපයට හැරී යාමෙන් ශුද්ධාත්මයාණන්වහන්සේට නිගරු කරයි.

**නුඹලා සිතන්නේ මොකද? දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් පාගාදමා, තමා පිරිසිදුකළ ගිවිසුමේ ලේ අශුද්ධ දෙයක් කොට සිතා, අනුග්‍රහයේ ආත්මයාණන්වහන්සේට අපහාසකළ තැනැත්තා ඊට වඩා කොපමණ මහත් දඬුවමකට සුදුස්සෙක් කොට ගණන්ගනු නොලබන්නේද? (හෙබ්‍රෙව් 10:29)**

**මක්නිසාද වරක් ආලෝකකරනු ලැබුවාවූ, ස්වර්ගීය දීමනාවේ රසය වින්දාවූ, ශුද්ධාත්මයාණන්වහන්සේට පංගුකාරයන් වුණාවූ දෙවියන්වහන්සේගේ යහපත් වචනයේද මතු පැමිණෙන කාලයේ බලවලද රසය බැලුවාවූ තැනැත්තන්, වැටීගිය කල්හි ඔවුන් නැවත පසුතැවිල්ලට පමුණුවන්ට නුපුළුවන. මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේගේ පුත්‍රයා තමුන්ටම දෙවනු කුරුසියෙහි ඇණගසා නින්දාවට පමුණුවති. (හෙබ්‍රෙව් 6:4-6)**

## ශුද්ධාත්මයාණන්වහන්සේට දේව අපහාස නොකරන්න :

**එබැවින් මම නුඹලාට කියමි: හැම පාපයද දේව අපහාසයද මනුෂ්‍යයන්ට කමාකරනු ලබන්නේය; නුමුත් ශුද්ධාත්මයාණන්ට විරුද්ධවූ අපහාසය කමාකරනු නොලබන්නේය. යමෙක් මනුෂ්‍ය පුත්‍රයාට විරුද්ධව වචනයක් කියන්නේද, ඒක ඔහුට කමාකරනු ලබන්නේය; නුමුත් යමෙක් ශුද්ධාත්මයාණන්ට විරුද්ධව කථාකරන්නේද, ඒක ඔහුට මේ ලෝකයේදීවත් මතු පැමිණෙන ලෝකයේදීවත් කමාකරනු නොලබන්නේය. (මතෙව් 12:31-32)**

ශුද්ධාත්මයාණන්වහන්සේට එරෙහිව දේව අපහාසය "සමාව දිය නොහැකි පාපය" ලෙස නම් කර ඇත්තේ මෙම බයිබල් කොටසට අනුව එයට සමාවක් නොමැති බැවිනි. දේව අපහාසය නම්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ප්‍රතික්ෂේප කරමින් පරුෂ වචන භාවිතා කරමින්,

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය දෙවියන්වහන්සේගෙන් නොව සාතන්ගෙන් යයි සරදම් සහගත ලෙස කතාකිරීමය. කිසියම් පුද්ගලයෙකු ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරයි නම් ඔහුට කිසිදා ගැළවීම ලද නොහැක. පාපිෂ්ට මිනිසුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ඇද ගන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේය.

ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්වෙන දෘෂ්‍යමාන සංකේත රාශියක් නිපදවන සේක. යේසුස්වහන්සේ පැවසුවේ ශුභාරංචියේ සත්‍යතාවයට ඔප්පුවක් සේ මෙවැනි ආශ්චර්යමත් සලකුණු පිළිගත නොහැකි නම් එවැනි පුද්ගලයෙකුට ඒත්තු ගැන්විය හැකි දෙයක් තවත් පවතිද යනුවෙනි.

## ශුද්ධාත්මයාණන්වහන්සේ අමනාප නොකරන්න.

මෙයින් අදහස් කරන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේට කෝපගැන්වීම, හිංසාකාරීවීම, තරහව ඇවිස්සීම යනාදියයි. මනුෂ්‍යයාගේ අකීකරුකම හා අවිශ්වාසය එතුමාව කෝපගන්වයි. දෙවියන්වහන්සේගේ ජනතාව වන ඉශ්‍රායෙල් ජනතාව උන්වහන්සේ කෝපගැන්වීය. මේ බව යෙසායා අනාගතවකතෘ සටහන් කරයි.

> **නුමුත් ඔව්හු කැරළි ගසා, උන්වහන්සේගේ ශුද්ධාත්මයට දුක් ඉපදෙවුවෝය. ඒ නිසා උන්වහන්සේ ඔවුන්ට සතුරෙක් වී, උන්වහන්සේම ඔවුන්ට විරුද්ධව යුද්ධකළ සේක.**
> **(යෙසායා 63:10)**

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

____________________________________________________________

____________________________________________________________

2. ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයෙහි එක් අංගයකි. ත්‍රිත්වය සමන්විත වනුයේ ____________________ වූ දෙවියන්වහන්සේ, ____________________ වූ ____________________ දෙවියන්වහන්සේ සහ ____________________ ____________________ දෙවියන්වහන්සේගෙන්ය.

3. මෙම පරිච්ඡේදයෙහිදී සාකච්ඡා කළාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පුද්ගලභාවයේ චරිත ලක්ෂණ හය නම් කරන්න.

____________ ____________ ____________ ____________ ____________ ____________

4. ශුද්ධාත්මයාණන්වහන්සේ සතුව "සංවේදී ස්වභාවයක්" පවතී යන්නෙහි අර්ථය කුමක්ද?

____________________________________________________________

5. ශුද්ධාත්මයාණන්වහන්සේට සංවේදී ස්වභාවයක් ඇති බැවින් බයිබලය අපට නොකරන ලෙස කාරණා පිළිබඳව අනතුරු අගවයි. ඒවා නම්,

ශුද්ධාත්මයාණන්වහන්සේට ____________________ ශුද්ධාත්මයාණන්වහන්සේට ____________________

ශුද්ධාත්මයාණන්වහන්සේට ____________________ ශුද්ධාත්මයට ____________________

ශුද්ධාත්මයට ____________________ ශුද්ධාත්මයට ____________________

ශුද්ධාත්මයට ____________________

6. පහතින් සඳහන් කර ඇති පද කිහිපය සහ අර්ථදැක්වීම් බලන්න. පළමු ලැයිස්තුවේ හිස් තැනට සුදුසු අර්ථදැක්වීමේ අංකය යොදන්න.

### ශුද්ධාත්මයාණන්වහන්සේගේ ත්‍රිත්වයෙහි ගුණාංග

| පළමු ලැයිස්තුව | දෙවන ලැයිස්තුව |
|---|---|
| ________ එකසමාන. | 1. මෙහි අදහස එතුමා සියලු බලයෙන් යුක්ත බවය. |
| ________ සර්වවාසී. | 2. මෙහි අර්ථය එතුමා සියල්ල දන්නා බවය. |
| ________ සර්වඥාන | 3. මෙහි අර්ථය එතුමා සම තැනම වැඩවසන බවය. |
| ________ සර්ව බලධාරී. | 4. මෙහි අර්ථය එතුමා සදාකාලයට වැඩ වසන බවය. |
| ________ සදාකාලික. | 5. මෙහි අර්ථය උන්වහන්සේ පියාණන් හා පුත්‍රයාණෝ සමග එක සමාන බවය. |

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

මෙම පාඨමාලාවෙහි විෂය වනුයේ ත්‍රිත්වයේ දෙවියන්වහන්සේගේ එක් පුද්ගලභාවයක් වන ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ අධ්‍යයනය වේ. ත්‍රිත්වයෙහි අනෙක් පුද්ගලයන් දෙදෙනාවන පියවූ දෙවියන්වහන්සේ සහ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අධ්‍යයනයට පහත සඳහන් කටු සටහන ඔබට උපකාරී වනු ඇත.

### ත්‍රිත්වය :

දෙවියන්වහන්සේ ත්‍රිත්වයකි. පියවූ දෙවියන්වහන්සේ, පුත්‍රවූ දෙවියන්වහන්සේ හා ශුද්ධාත්ම දෙවියන්වහන්සේ එම තිදෙනාවෙති.

- පියාණෝ, පුත්‍රයාණන් පිළිබඳව සාක්ෂිදරයි. මතෙව් 3:17
- පුත්‍රයාණෝ, පියාණන් ගැන සාක්ෂිදරයි. යොහන් 5:19-20
- පුත්‍රයාණෝ, ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ සාක්ෂිදරයි. යොහන් 14:26

## පියවූ දෙවියන්වහන්සේ

දෙවියන්වහන්සේ සියල්ලෙහි මැවුම්කරුය. නෙහෙමියා 9:6.

### දෙවියන්වහන්සේගේ නාම :

"දෙවියන්වහන්සේ" යන පදය (වැඳුම් ලබන පුද්ගලයා) මිනිසා විසින් උසස් ජීවියෙකු විස්තර කිරීමට යොදන තනතුරු නාමයකි. බයිබලයෙහි දෙවියන්වහන්සේට වෙනත් නම් කිහිපයක් දී ඇත. බයිබල් නාම හැඳින්වීමේ නාම පමණක් නොවේ. එම නාම දරණ තැනැත්තා පිළිබඳ විස්තරද සපයයි. දෙවියන්වහන්සේට දී ඇති නම් කිහිපයක් :

| | | |
|---|---|---|
| යෙහෝවා: | එහි අදහස ස්වාමීන්වහන්සේය. බයිබලය දෙවියන්වහන්සේට ඇති අනෙක් නම් සමග මේ වචනය සම්බන්ධ කර ඇත. | |
| යෙහෝවා-රාෆා | "සුවකරන්නාවූ ස්වාමීන් වහන්සේ" | නික්මයාම 15:26 |
| යෙහෝවා-නිස්සි | "ධජයේ ස්වාමීන්වහන්සේ" | නික්මයාම 17:8-15 |
| යෙහෝවා-ෂාලොම් | "සමාදානයේ ස්වාමීන්වහන්සේ" | විනිශ්චයකාරයා 6:24 |
| යෙහෝවා-රාආ | "එඬේරාවූ ස්වාමීන්වහන්සේ" | ගීතාවලිය 23:1 |
| යෙහෝවා-සිඩ්කේනු | "ධර්මිෂ්ඨවූ ස්වාමීන්වහන්සේ" | යෙරමියා 23:6 |
| යෙහෝවා-ජිරේ | "සපයන්නාවූ ස්වාමීන්වහන්සේ" | උත්පත්ති 22:14 |
| යෙහෝවා-ෂම්මා | "එහි සිටින ස්වාමීන්වහන්සේ" | එසකියෙල් 48:35 |
| එලෝහිම්: | එහි අදහස දෙවියන්වහන්සේ වේ. දෙවියන්වහන්සේගේ නිර්මාණාත්මක බලයන් භාවිත කරන තැන්වල එය භාවිත කරයි. | |
| පියාණන්වහන්සේ: | ක්‍රියා 17:28, යොහන් 1:12-13 | |
| අදොනායි: | යන්නෙහි තේරුම ස්වාමීන්වහන්සේ හෝ ස්වාමියා වේ. නික්මයාම 23:17 යෙසායා 10:16,33 | |
| එල්: | මෙය බොහෝ විට භාවිත කරන්නේ දෙවියන්වහන්සේට ඇති අනෙකුත් වචන සමග එකට සම්බන්ධකර වේ. | |
| එල් ෂඩායි : | "තම සෙනගගේ අවශ්‍යතාවන් සපුරාලන දෙවියන්වහන්සේ" නික්මයාම 6:3 | |
| එල් ඔලාම් : | "සදාතන දෙවියන්වහන්සේ" උත්පත්ති 21:33 | |
| එල් එලොන්: | "ඉතා උසස් දෙවියන්වහන්සේ, දෙවිවරුන් යයි කියන අනෙකුත් සියල්ලන්ටම වඩා මහොත්තමය." උත්පත්ති 14:18,22 | |

පැරණි ගිවිසුම් ලියා අත්තාවූ හෙබ්‍රෙව් භාෂාවෙන් "යාඃවේ" යන පදයෙහි අර්ථය දෙවියන්වහන්සේ යන්නය. එම වචනය එතුමාගේ චරිතය නිරූපණය කිරීම සඳහා වෙනත් වචන හා බැඳී තිබේ. දෙවියන්වහන්සේ හැඳින්වීමට දුන් නාම :

| | | |
|---|---|---|
| යාවේ ජිරේ : | -"සපයන්නාවූ ස්වාමීන්වහන්සේ" | - උත්පත්ති 22:14 |
| යාවේ නිස්සි : | -"මාගේ ධජය වූ ස්වාමීන්වහන්සේ" | - නික්මයාම 17:15 |
| යාවේ ෂාලොම් : | -"සමාදානයේ ස්වාමීන්වහන්සේ" | - විනිශ්චයකාරයා 6:24 |
| යාවේ සබාහොත් : | -"සේනාවල ස්වාමීන්වහන්සේ" | - 1 සාමුවෙල් 1:3 |
| යාවේ මක්කද්දේෂ්කෙම්: | -"ශුද්ධවන්ත කරන්නාවූ ස්වාමීන්වහන්සේය" | - නික්මයාම 31:13 |
| යාවේ සිඩ්කේනු : | -"ධර්මිෂ්ඨ වූ ස්වාමීන්වහන්සේ" | - යෙරමියා 23:6 |
| යාවේ ෂම්මා : | -"එහි සිටින ස්වාමීන්වහන්සේ" | - එසකියෙල් 48:35 |
| යාවේ එලොහිම් ඉශ්‍රායෙල් | -"ඉශ්‍රායෙල්හි දෙවි ස්වාමීන්වහන්සේ" | - විනිශ්චයකාරයා 5:3 |
| කදෝශ් ඉශ්‍රායෙල් | -"ඉශ්‍රායෙල්හි ශුද්ධවන්ත තැනැන්වහන්සේ" | - යෙසායා 1:14 |

## දෙවියන්වහන්සේ කොහේද?

දෙවියන්වහන්සේගේ සිංහාසනය ඇත්තේ ස්වර්ගය නම් ස්ථානයක වුවත්, උන්වහන්සේ මුළු විශ්වයෙහිම වැඩ වසන සේක. දෙවියන්වහන්සේ සැම තැනම ය: 11 ලේකම් 16:9; යෙසායා 66:1; හිතෝපදේශය 15:3; ගීතාවලිය 139:7-8.

## දෙවියන්වහන්සේ කෙතරම් විශාලද?

දෙවියන්වහන්සේ විශ්වයට වඩා විශාලය. උන්වහන්සේ මැනිය හැකි මිනුම් දණ්ඩක් මිනිසා සතුව නොමැත. යෙසායා 40:12,15,22

## දෙවියන්වහන්සේගේ ගුණාංග :

මෙහිදී ගුණාංග යනු චරිත ගුණාංග වේ. දෙවියන්වහන්සේගේ චරිත ගුණාංග පහතින් දක්වා ඇත.
දෙවියන්වහන්සේ :

**ආත්මයකි.** යොහන් 4:24.

**අනන්තය :** (මිනිස් සීමාවලින් සීමාවී නොමැත) 1 රාජාවලිය 8:27; නික්මයාම 15:18; ද්විතිය කථාව 33:27; නෙහෙමියා 9:5; ගීතාවලිය 90:2; යෙරමියා 10:10: එළිදරව් 4:8-10.

**ඒකත්වය :** මෙහි අර්ථය නම්, එක් කෙනෙකු ලෙස සාමුහිකව එකමුතුව තුන් දෙනෙකු බවය. නික්මයාම 20:3; ද්විතිය කථාව 4:35,39; 6:4; 1 සාමුවෙල් 2:2; 2 සාමුවෙල් 7:22; 1 රාජාවලිය 8:60; 2 රාජාවලිය 19:15; නෙහෙමියා 9:6; යෙසායා 44:6-8; 1 තිමෝති 1:17.

**සර්වබලධාරී :** උත්පත්ති 1:1;17:1; 18:14; නික්මයාම 15:7; ද්විතීය කථාව 3:24; 32:39; 1 ලේකම් 16:25; යෝබ් 40:2; යෙසායා 40:12-15; යෙරමියා 32:17; එසකියෙල් 10:5; දානියෙල් 3:17; 4:35; ආමොස් 4:13; 5:8; සෙකරියා 12:1; මතෙව් 19:26; එළිදරව්ව 15:3; 19:6.

**සර්වවාසී :**උත්පත්ති 28:15-16: ද්විතිය කථාව 4:39; යෝෂුවා 2:11; හිතෝපදේශය 15:3; යෙසායා 66:1; යෙරමියා 23:23-24; ආමොස් 9:2-4,6; ක්‍රියා 7:48-49; එපීස 1:23;

**සර්වඥන :** උත්පත්ති 18:18,19; 2 රාජාවලිය 8:10,13; 1 ලේකම් 28:9; ගීතාවලියව 94:9; 139:1-16; 147:4-5; හිතෝපදේශ 15:3; යෙසායා 29:15-16. 40:28; යෙරමියා 1:4,5; එසකිලේ 11:5; දානියෙල් 2:22,28; ආමෝස් 4:13; ලූක් 16:15; ක්‍රියා 15:8,18; රෝම 8:27,29; 1 කොරින්ති 3:20; 2 තිමෝති 2:19; හෙබ්‍රෙව් 4:13; 1 පේත්‍රුස් 1:2; 1 යොහන් 3:20.

**ප්‍රඥාවන්තවූ :** ගීතාවලිය 104:24, හිතෝපදේශ 3:19; යෙරමියා 10:12 , දානිලේ 2:20-21; රෝම 11:33; 1 කොරින්ති 1:24,25,30; 2:6-7; එපීස 3:10; කොලොස්සි 2:2-3.

**ශුද්ධවූ :** නික්මයාම 15:11; ලෙවිකථාව 11:44-45; 20:26; යෝෂුවා 24:19; 1 සාමුවෙල් 2:2; ගීතාවලිය 5:4; 111:9; 145:17; යෙසායා 6:3; 43:14-15; යෙරමියා 23:9; ලූක් 1:49; යාකොබ් 1:13; 1 පේත්‍රුස් 1:15-16; එළිදරව් 4:8; 15:3-4.

**විශ්වාසවන්ත :** නික්මයාම 34:6; ගණන් කථාව 23:19; ද්විතිය කථාව 4:31; යෝෂුවා 21:43-45; 23:14; 1 සාමුවෙල් 15:29; යෙරමියා 4:28; යෙසායා 25:1; එසකියෙල් 12:25; දානියෙල් 9:4; මීකා 7:20; ලූක් 18:7-8; රෝම 3:4; 15:8; 1 කොරින්ති 1:9; 10:13; 2 කොරින්ති 1:20; 1 තෙසලෝනික 5:24; 2 තෙසලෝනික 3:3; 2 තිමෝති 2:13; හෙබ්‍රෙව් 6:18; 10:23; 1 පේත්‍රුස් 4:19; එළිදරව්ව 15:3

**කාරුණිකය :** තිතස් 3:5; විලාප ගී 3:22; දානියෙල් 9:9 යෙරමියා 3:12; ගීතාවලිය 32:5; යෙසායා 49:13; 54:7.

**ප්‍රේමණීය :** ද්විතිය 7:8; එපීස 2:4; ශෙපනියා 3:17; යෙසායා 49:15-16; රෝම 8:39; හොෂෙයා 11:4; යෙරමියා 31:3.

**යහපත් :** ගීතාවලිය 25:8; නාහුම් 1:7; ගීතාවලිය 145:9; රෝම 2:4; මතෙව් 5:45; ගීතාවලිය 31:19 ක්‍රියා 14:17; ගීතාවලිය 68:10; 85:5.

# පුත්‍රවූ දෙවිඳු - යේසුස් ක්‍රිස්තුස්වහන්සේ.

## ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය :

පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කථාව මතෙව්, මාර්ක් ලූක් සහ යොහන් පොත්වල සඳහන් වේ. යේසුස්වහන්සේගේ ජීවිත කතාව එනම් - උපත, ජීවිතය, මරණය, නැවත නැගිටීම හා ඉගැන්වීම් පිළිබඳ සම්පූර්ණ අධ්‍යයනයක් සඳහා මේ පොත් කියවා බලන්න.

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේට දුන් තනතුරු නාම :

"යේසුස්" යන නාමයේ අර්ථය "ගැළවුම්කරු හෝ මිදුම්කරුය" මතෙව් 1:21.

"ක්‍රිස්තුස්" යන නාමයේ අර්ථය නම් "ආලේපලත් තැනැත්තා" ය. යොහන් 3:34.

බයිබලයෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේට දී ඇති තවත් නම් :

| | | |
|---|---|---|
| - යහපත් එඬේරා | : | යොහන් 10:11 |
| - ලෝකයෙහි ආලෝකය | : | යොහන් 8 :12 |
| - ජීවනදායක කෑම | : | යොහන් 6 :48 |
| - මාර්ගය | : | යොහන් 14:6 |
| - සත්‍යය | : | යොහන් 14:6 |
| - ජීවනය | : | යොහන් 14:6 |
| - රජුන්ගේ රජ සහ ස්වාමීන්ගේ ස්වාමී | : | එළිදරව් 19:16 |
| - මනුෂ්‍ය පුත්‍රයා | : | මතෙව් 17:22 |
| - දාවිත්ගේ පුත්‍රයා | : | මතෙව් 1:1 |
| - අවසාන ආදම් | : | 1 කොරින්ති 15:45 |
| - ඉහළින් පැමිණි අරුණෝදය | : | ලූක් 1:78 |
| - දෙවියන්වහන්සේගේ පුත්‍රයා | : | මතෙව් 16:6 |
| - ඒක ජාතක පුත්‍රයා | : | යොහන් 3:16 |
| - කොනේ ප්‍රධාන ගල | : | එපීස 2:20 |
| - මහත් උත්තම පූජකයා | : | හෙබ්‍රෙව් 4:14 |
| - මැදිහත්කරු | : | හෙබ්‍රෙව් 12:24 |
| - යූදා වංශයෙහි සිංහයා | : | එළිදරව් 5:5 |
| - ඇල්ෆා සහ ඔමේගා (ප්‍රථම සහ අවසාන) | : | එළිදරව් 1:8 |
| - ධර්මිෂ්ඨ විනිශ්චකරු | : | 2 තිමෝති 4:8 |
| - යුදෙව්වන්ගේ රජ | : | මාර්ක් 15:26 |
| - ඉශ්‍රායෙල්හි රජ | : | යොහන් 1:49 |

| | | |
|---|---|---|
| - ඇදහිල්ලේ නිර්මාතෘ හා අවසන් කරන්නා | : | හෙබ්‍රෙව් 12:2 |
| - ආශිර්වාදලත් සහ එකම අධිපතියා | : | 1 තිමෝති 6:15 |
| - ජීවනයේ කුමාරයා | : | ක්‍රියා 3:15 |
| - ගැළවීමේ කපිතාන්වරයා | : | හෙබ්‍රෙව් 2:10 |
| - ස්වාමීන් | : | ක්‍රියා 2:36 |
| - ගැළවුම්කරු | : | යොහන් 4:42 |
| - ක්‍රිස්තුස් | : | මාර්ක් 1:1 |
| - වාක්‍යාණෝ නොහොත් ලෝගොස් | : | යොහන් 1:1,14 |
| - දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ | : | යොහන් 1:29 |

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ චරිත ගුණාංග.

යේසුස්වහන්සේ ත්‍රිත්වයෙහිම කොටස්කරුවෙක් බැවින් දෙවියන්වහන්සේ සතු සියලු ගුණාංග උන්වහන්සේ සතුව ඇත. බයිබලයෙහි පහත සදහන් පදවල එතුමා පිළිබදව විශේෂිත අයුරින් ගුණාංග වෙන්කොට සදහන් කර ඇත.

### යේසුස්වහන්සේ :

| | | |
|---|---|---|
| සර්වබලධාරී | : | මතෙව් 28:18 |
| සර්වඥාන | : | මතෙව් 16:30; යොහන් 21:17 |
| සර්වවාසී | : | මතෙව් 18:20; 28:20 |
| සදාකාලිකය | : | යොහන් 1:1-2; 8:58 |
| වෙනස්නොවන සුළුය | : | හෙබ්‍රෙව් 13:8 |

### යේසුස්වහන්සේගේ දේවත්වය :

යොහන් පොත යේසුස්වහන්සේගේ දේවත්වය අවධාරණය කරයි. උන්වහන්සේ ත්‍රිත්වයෙහි කොටසකි. මේ බව සනාථ කිරීමට සැම පරිච්ඡේදයකම යමක් සදහන් වේ. පහත සදහන් තෝරාගත් කොටස් කියවා අන්තර්ගතය සැකෙවින් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1:49 | ____________________ | 11:27 | ____________________ |
| 2:11 | ____________________ | 12:32 | ____________________ |
| 3:16 | ____________________ | 13:13 | ____________________ |
| 4:26 | ____________________ | 14:11 | ____________________ |
| 5:25 | ____________________ | 15:1 | ____________________ |
| 6:33 | ____________________ | 16:28 | ____________________ |
| 7:29 | ____________________ | 17:1 | ____________________ |
| 8:58 | ____________________ | 18:11 | ____________________ |
| 9:37 | ____________________ | 19:7 | ____________________ |
| 10:30 | ____________________ | 20:28 | ____________________ |
| | | 21:14 | ____________________ |

# දෙවන පරිච්ඡේදය

## ශුද්ධාත්මයාණන්වහන්සේ නියෝජනය කිරීම

### අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ,

- ශුද්ධාත්මයාණන්වහන්සේගේ සංකේත හඳුනාගැනීමට.
- එක් එක් සංකේතයෙන් නියෝජනය වන කරුණු පැහැදිලි කිරීම.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිලනාම ලැයිස්තුවක් සෑදීමට ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය:

> **නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද? (1 කොරින්ති 3:16)**

### හැඳින්වීම.

ශුද්ධාත්මයාණන්වහන්සේට දී ඇති සංකේත හා නිල නාම ඇදහිලිවන්තයා උදෙසා එතුමාගේ ස්වභාවය හා ක්‍රියා කලාපය පිළිබඳ දැනුමක් අපට සපයා දෙයි. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය හඳුන්වාදෙන මෙම පාඨමාලාවෙහි මෙම පරිච්ඡේදයෙහි විෂය වනුයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ නාම සහ සංකේත වේ.

### ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිල නාම.

නිල නාමයක් යනු කිසියම් පුද්ගලයෙකු දරණ තත්වය හෝ ක්‍රියාකලාපය විස්තර කිරීමට යොදන පදයක් වේ. උදාහරණයක් ලෙස කිසියම් පුද්ගලයෙකු "ජනාධිපති" යනුවෙන් නිල නාමය දරයි නම්, ඉන් ඔහුට රජයේ හිමි ස්ථානයත්, ජාතියේ නායකයා ලෙස ඔහුගේ කාර්යය භාරයත් විස්තර කරයි.

බයිබලයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේට දී ඇති නිලනාම මගින් එතුමාගේ තත්වයත් කාර්යය භාරයත් එළිදරව් කරදෙයි.

ශුද්ධාත්මයාණන්වහන්සේ හඳුන්වා ඇත්තේ :

### දෙවියන්වහන්සේගේ ආත්මය :

> **නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද? (1 කොරින්ති 3:16)**

**ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මය :**

> **නුමුත් නුඹලා තුළ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ වාසයකරනසේක් නම්, නුඹලා මාංසයෙහි නොව ආත්මයෙහි සිටින්නෝය. ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ යම් කෙනෙකුට නැත්නම් ඔහු උන්වහන්සේට අයිති නැත. (රෝම 8:9)**

**සදාකාලික ආත්මය :**

මෙයින් අර්ථවත් වන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ සදාකාලික බවය. එතුමාට ආරම්භයක් හෝ අවසානයක් නැත.

> **කැලලක් නැතුව සදාකාල ආත්මයාණන් කරණකොටගෙන තමන්ම දෙවියන්වහන්සේට පූජාවුණාවූ ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් ජීවමාන දෙවියන්වහන්සේට සේවය කරණ පිණිස, මළ ක්‍රියාවලින් නුඹලාගේ හෘදයසාක්ෂිය කොපමණ වැඩියෙන් පිරිසිදුකරනු නොලබන්නේද? (හෙබ්‍රෙව් 9:14)**

**සත්‍යතාවයේ ආත්මය :**

දේව වචනය වන බයිබලයට සත්‍යතාවයේ සැපයීම් මාධ්‍යය වූයේ ශුද්ධාත්මයාණන්වහන්සේය. උන්වහන්සේ මෙම සත්‍යය මනුෂ්‍ය සංහතියට හෙළිකළ සේක.

> **එසේවී නුමුත්, උන්වහන්සේ, එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මගපෙන්වන සේක. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා, පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශකරනසේක. (යොහන් 16:13)**

**අනුග්‍රහයේ ආත්මය :**

> **නුඹලා සිතන්නේ මොකද? දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් පාගාදමා, තමා පිරිසිදු කළ ගිවිසුමේ ලේ අශුද්ධ දෙයක් කොට සිතා, අනුග්‍රහයේ ආත්මයාණන්වහන්සේට අපහාස කළ තැනැත්තා ඊට වඩා කොපමණ මහත් දඬුවමකට සුදුස්සෙක් කොට ගණන්ගනු නොලබන්නේද? (හෙබ්‍රෙව් 10:29)**

**ජීවනයේ ආත්මය :**

> **මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ වූ ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස් කළාය. (රෝම 8:2)**

**මහිමයේ ආත්මය :**

> **ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා නින්දාකරනු ලබන්නහු නම්, නුඹලා ආශිර්වාද ලද්දහුය: මක්නිසාද මහිමයේ ආත්මයාණන්වහන්සේ වන දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි රඳනසේක. (1 පේත්‍රුස් 4:14)**

**ප්‍රඥාවේ සහ එළිදරව්වේ ආත්මය :**

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන්හට ප්‍රඥාව සපයා දී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ දැනුම හෙළිකර දෙනසේක.

> **එසේ කරන්නේ මහිමයේ පියාණන් වන අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවියන්වහන්සේ, උන්වහන්සේ ගැන දැනගැනීමට ප්‍රඥාවේද එළිදරව්කිරීමේද ආත්මයක් නුඹලාට දෙන ලෙසත්, (එපීස 1:17)**

**සැනසිලිදායකයාණෝ.**

ඇදහිලිවන්තයාට කරදර, වේදනාව හා හුදකලාව ඇති විට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහුව සනසවයි.

> **නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියනලද සියල්ල නුඹලාට සිහිකරවන සේක. (යොහන් 14:26)**

**පොරොන්දුවෙහි ආත්මය :**

ශුද්ධාත්මයාණන්වහන්සේ පොරොන්දුවේ ආත්මය වේ. දෙවියන්වහන්සේගේ පොරොන්දුව සම්පූර්ණ කිරීම පිණිස එවූ තැනන්වහන්සේ එතුමාය.

> **උන්වහන්සේ ඔවුන් සමග රැස්ව, ඔවුන්ට ආඥාකරමින්: යෙරුසලමෙන් අහක්ව නොගොස් නුඹලා මගෙන් ඇසූ පියාණන්වහන්සේගේ පොරොන්දුව බලා සිටපල්ලා. මක්නිසාද යොහන් වතුරෙන් බව්තීස්ම කළේය: නුමුත් නුඹලා මෙයින් නොබෝ දවසක් ගිය පසු ශුද්ධාත්මයෙන් බව්තීස්මකරනු ලබන්නහුයයි කීසේක. (ක්‍රියා 1:4-5)**

**ශුද්ධකමේ ආත්මය :**

> **ඒ පුත්‍රයාණන්වහන්සේ මාංසාකාරයෙන් දාවිත්ගේ වංශයෙන් ඉපිද, ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන බලයෙන් යුක්තව ප්‍රකාශ කරනු ලැබූසේක. (රෝම 1:5)**

**ඇදහිල්ලේ ආත්මය :**

> **තවද: මම විශ්වාස කළෙමි, ඒ නිසා කථා කළෙමියි ලියා තිබෙන ලෙස, ඇදහිල්ලේ එම ආත්මය ඇත්තාවූ අපිත් විශ්වාස කරමුව, එබැවින් කථාකරමුව. (2 කොරින්ති 4:13)**

**පුත්‍රකම ලබාදීමේ ආත්මය :**

අපව දෙවියන්වහන්සේගේ පවුලට පුත්‍රයන් බවට "හදාගැනීම" සිදුවූයේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළිනි.

> **මක්නිසාද නුඹලා භය උපදවන දාසකමේ ආත්මය නැවත නොලබා, පුත්‍රකමේ ආත්මය ලබාගත්තහුය: එයින් අපි: අබ්බා, පියාණනි, කියා හඬගසමුව. (රෝම 8:15)**

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ සංකේත.

බයිබලය ශුද්ධාත්මයාණන්වහන්සේව නියෝජනය කිරීමට සංකේත කිහිපයක් භාවිතා කර ඇත. සංකේතයක් කිසියම් කාරණයක් නියෝජනය කරයි. එනම් කිසියම් විශේෂිත අර්ථයක් සහිත වූ සලකුණකි. ශුද්ධාත්මයාණන්වහන්සේව නියෝජනය කිරීමට බයිබලය භාවිතා කර ඇති සංකේත මෙසේය. එනම් :

**පරවියා.**

යේසුස්වහන්සේගේ බව්තීස්මය වෙලාවෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ පරවියෙකුගේ හැඩයෙන් එළිදරව් විය. මෙම සංකේතය පෙන්නුම් කරනුයේ අනුමැතිය, පවිත්‍රතාවය හා සාමය වේ.

> **තවද යොහන් සාක්ෂිදෙමින්: ආත්මයාණන් පරවියෙකු මෙන් අහසින් බසිනවා දුටිමි: එය උන්වහන්සේ පිට නැවතුණේය. (යොහන් 1:32)**

අනුමැතිය.

> **තවද යොහන් සාක්ෂිදෙමින්: ආත්මයාණන් පරවියෙකු මෙන් අහසින් බසිනවා දුටිමි: එය උන්වහන්සේ පිට නැවතුණේය. (යොහන් 1:32)**

සාමය :

> **මමද කථාකොට: අනේ මට කොබෙයියෙකුට මෙන් පියාපත් ඇත්නම්! එවිට ඉගිලී ගොස් නිශ්චලව සිටින්නෙමි. (ගීතාවලිය 55:6)**

පවිත්‍රතාවය.

> **මාගේ පරෙවිදෙන, මාගේ නිර්මල තැනැත්තිය, අසමාන තැනැත්තිය. ඈ ඇගේ මවුගේ එකම දරුවාය ... (සාලමොන්ගේ ගීතිකා 6:9)**

## තෙල් :

බයිබලයෙහි ශුද්ධාත්මයන්වහන්සේගේ සංකේතයක් ලෙසට තෙල් භාවිතා කොට තිබේ. තෙල් නියෝජනය කරනුයේ ආලෝකය, සුවය සහ සේවයට ආලේපකිරීමය. ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් මේ සියල්ල ඇදහිලිවන්තයා සතු වනු ඇත.

> **ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය: මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේප කළ සේක: වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද (ලූක් 4:18)**

> **දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසිරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

> **ඔබ ධර්මිෂ්ඨකමට ප්‍රියව අධර්මිෂ්ඨකමට ද්වේෂකළසේක: එබැවින් දෙවියන්වහන්සේ, ඔබගේ දෙවියන්වහන්සේ, ඔබගේ සහකාරයන්ට වඩා ප්‍රීතිය නමැති තෛලයෙන් ඔබ ආලේප කළසේකැයි කියනසේක. (හෙබ්‍රෙව් 1:9)**

## ජලය :

ඇදහිලිවන්තයා හට තම පාපයෙන් පවිත්‍ර වී නව ජීවනයක් හිමි කරදෙන අලුත් බව හා පවිත්‍ර බව ජලයෙන් පෙන්නුම් කරයි. ශුද්ධාත්මයාණන්වහන්සේ එය ලබාදෙනසේක. යේසුස්වහන්සේ කථාකරමින් ශුද්ධාත්මයාණන්වහන්සේ ජලයට සමාන කළ සේක.

> **මංගල්‍යයේ මහත් දවස වූ අන්තිම දවසේ යේසුස්වහන්සේ නැගිට සිට ශබ්ද පවත්වමින්: යමෙකුට පිපාස ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ. මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක. උන්වහන්සේ මෙසේ කීවේ තමන් අදහාගත්තවුන් විසින් ලබන්ට සිටිය ආත්මයාණන් ගැනය. මක්නිසාද යේසුස්වහන්සේ ඒතාක්ම මහිමයට නොපැමිණි බැවින් ඒතාක්ම ආත්මයාණන් නොදෙන ලද්දේය. (යොහන් 7:37-39)**

> **මක්නිසාද පිපාස ඇත්තා කෙරෙහි වතුරද වියළි භූමිය කෙරෙහි ජලධාරාද වගුරුවන්නෙමි. නුඹේ වංශය කෙරෙහි මාගේ ආත්මයද නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශිර්වාදයද වගුරවන්නෙමි. (යෙසායා 44:3)**

## මුද්‍රාව:

මුද්‍රාව යනු අයිතිවාසිකම සංකේතවත් කරන විශේෂ සලකුණකි. එසේම එයින් නිමාවූ ගණුදෙනුවක් පෙන්නුම් කරයි. ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේට හිමි වූවන් මුද්‍රාකොට තිබේ. එසේම ඔවුන්ගේ ගැලවීම නිමාවූ ක්‍රියාවක් බව පෙන්නුම් කරයි.

**උන්වහන්සේ තුළ නුඹලාත් නුඹලාගේ ගැළවීමේ ශුභාරංචිය වන සැබෑවේ වචනය අසා, උන්වහන්සේ කෙරෙහි අදහාගෙන, උන්වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව සඳහා දෙවියන්වහන්සේට හිමිවූ වස්තුවේ මිදීම පිණිස, (එපීස 1:13)**

**දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙල්ලා; මක්නිසාද උන්වහන්සේ තුළ නුඹලා මිදීමේ දවසට මුද්‍රාකරනු ලැබුවහුය. (එපීස 4:30)**

**උන්වහන්සේ අප මුද්‍රාකොට අපේ සිත් තුළ ආත්මයාණන්වහන්සේ නැමැති අත්තිකාරම අපට දුන් සේක. (2 කොරින්ති 1:22)**

**සුළඟ :**

සුළඟද ශුද්ධාත්මයාණන්වහන්සේගේ සංකේතයකි. එමගින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය නියෝජනය කරයි.

**හුළඟ කැමති කැමති තැනට ගසයි, එහි ශබ්දය නුඹට ඇසෙයි, නුමුත් කොතැනින් එන්නේද කියාවත් කොතැනට යන්නේද කියාවත් නුඹ දන්නේ නැත. ආත්මයාණන්ගෙන් ඉපිද සිටින සියල්ලෝම එසේමයයි කීසේක. (යොහන් 3:8)**

**තවද පෙන්තකොස්ත දවස පැමිණි කල ඔවුන් සියල්ලෝ එක තැනක රැස්ව සිටියෝය. තද හුළඟක් හමන්නාක්මෙන් ශබ්දයක් අහසෙන් හදිස්සියෙන් පැමිණ, එයින් ඔවුන් හිඳගෙන ඉන්නාවූ මුළු ගෙය පිරුණේය. (ක්‍රියා 2:1-2)**

ස්වාභාවික ලෝකයෙහි සුළඟ ඔබට පියවි දෑසින් නොපෙනුනත්, එහි බලපෑම දැකිය හැකිය. ස්වාභාවික ලොවෙහි සුළඟ මගින් සිදුකරන විශේෂ කාර්යභාරයක් ඇත. ආත්මිකව ශුද්ධාත්මයාණන්වහන්සේගේ "සුළඟ" ඉටුකරන්නාවූ කාර්යභාරයද ඒ හා සමානය.

**සුළඟ ජීවනය නිපදවයි :**

සුළඟ හමන ගමන් බීජ ව්‍යාප්ත කරයි. එමගින් නව වර්ධනයක් ගෙන දෙයි. දේව වචනය වන බීජ මනුෂ්‍යයන්ගේ හදවත් වල සහ මනසෙහි ව්‍යාප්ත කිරීමෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ මිනිසා තුළ නව ජීවනය නිපදවනසේක. මෙම ජීවනය සදාකාල ජීවනයෙහි ගැලවීම පමණක් නොව, දේව වචනය නැමැති බීජයෙන් හටගන්නාවූ ආත්මික ඵල වලින් සමන්විත පරිණත ආත්මික ජීවිතයකි.

**සුළඟ තිරිඟු වලින් බොල් වී වෙන්කරනු ලබයි.**

සුළඟ හමන ගමන් සුන් බුන් ඉවතට විහිදුවා දමයි. පවිත්‍ර කරයි. ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයාගේ ජීවිතයෙහි පවිත්‍රකිරීමේ බලයක් ලෙස මෙහෙකරයි.

**සුළඟ වියලී යන ගිනි අඟුරු වලට හමා නැවත ගිනි දල්වයි.**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ සුළඟ දෙවියන්වහන්සේගේ ජනතාවට "පවන්සලා" පිබිදීම ඇතිකර එතුළින් ලෝකයෙහි සේවය සඳහා දැවෙන ගිනි සිළුවක් බවට පත්කරයි.

**ගින්න :**

ශුද්ධාත්මයාණන්වහන්සේ සංකේතවත් කිරිමට යෙදු තව එක් ලාංජනයක් නම් ගින්න වේ. ගින්නෙන් පෙන්නුම්වනුයේ :

**ස්වාමින්වහන්සේගේ අභිමුඛය :**

**ස්වාමින්වහන්සේගේ දූතයා පඳුරක් මැද ගිනිජාලාවක සිට ඔහුට පෙනුණේය. ඔහු බලා සිටියේය, බලව, පඳුර ගිනි ඇවිළ තිබුණු නමුත් දාලා නොගියේය. (නික්මයාම 3:2)**

**ස්වාමින්වහන්සේගේ අනුමැතිය :**

> **ස්වාමින්වහන්සේ ඉදිරියෙන් ගිනි නික්ම අවුත් පූජාසනය පිට දවන පූජාවද තෙල්ද දවා දැමුවේය. මුළු සෙනග ඒ දැක ශබ්ද පවත්වා මුහුණින් වැටුණෝය. (ලෙවී කථාව 9:24)**

**ආරක්ෂාව හා මගපෙන්වීම :**

> **තවද ඔවුන් දවාලෙත් රාත්‍රියේත් ගමන් කරන පිණිස ස්වාමින්වහන්සේ ඔවුන්ට මගපෙන්වීමට දාවල් වලා ටැඹකින්ද රාත්‍රියේ ඔවුන්ට එළිය දීමට ගිනි ටැඹකින්ද ඔවුන්ට පෙරටුව ගියසේක. (නික්මයාම 13:21)**

**පවිත්‍රකිරීම :**

යෙසායා 6:1-8 හි යෙසායා අනාගතවක්තෘවරයා ශුද්ධාත්මයාණන්වහන්සේගේ ගින්නෙන් පවිත්‍රකරනු ලැබූ බවට සඳහන් වේ. මෙම බයිබල් කොටස කියවා බලන්න.

### ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාව :

ශුද්ධාත්මයාණන්වහන්සේ පළමුවර දෙනු ලබූ විට, එතුමාගේ වැඩවිසීම සංකේතවත් කිරීම පිණිස ගින්න භාවිතා විය.

> **ගිනි වැනි වූ දිව් බෙදී යනවා ඔවුන්ට පෙනුණේය; එය ඔවුන් එක් එක්කෙනා කෙරෙහි පිහිටුනේය. (ක්‍රියා 2:3)**

**විනිශ්චය :**

> **මක්නිසාද අපගේ දෙවියන්වහන්සේ විනාශකරන ගින්නක්ය. (හෙබ්‍රෙව් 12:29)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ නියෝජනය කිරීම.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ නාම සහ සංකේත නියෝජනය කරනුයේ එතුමාගේ පරමාර්ථයේ සහ සේවාවෙහි සමහරක් පමණකි. ශුද්ධාත්මයාණන්වහන්සේගේ අනෙකුත් සේවාවන් ඉදිරි පරිච්ඡේදයෙහිදී සවිස්තරාත්මකව ඉගෙන ගනු ඇත.

## ස්වයං-පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

_______________________________________________

2. සංකේතයක් යනු කුමක්ද?

_______________________________________________

3. පහත සදහන් අංක 1 ලැයිස්තුවෙහි සපයා ඇති සංකේත හා අංක 2 ලැයිස්තුවෙහි ඇති අර්ථදැක්වීම් කියවා බලන්න. සංකේතයට ගැළපෙන අර්ථ දැක්වීමෙහි අංකය සපයා ඇති හිස්තැනෙහි ලියන්න.

**ශුද්ධාත්මයාණන්වහන්සේගේ සංකේත.**

| 1 වන ලැයිස්තුව | | 2 වන ලැයිස්තුව |
|---|---|---|
| ________ | සුළඟ | 1. පවිත්‍රතාවය හා සාමය පෙන්නුම්කරයි. |
| ________ | මුද්‍රාව | 2. ආලෝකය, සුවය, සේවය සඳහා අලේප |
| ________ | ජලය | 3. ජීවනය හා පවිත්‍රතාවය පෙන්නුම් කරයි. |
| ________ | පරවියා | 4. අයිතිබව පෙන්නුම්කරයි. |
| ________ | තෙල් | 5. බලය පෙන්නුම්කරයි. |

4. ගින්න ශුද්ධාත්මයාණන්වහන්සේ සංකේතවත් කරන්නාවූ එක් ලාංජනයකි. ගින්නෙන් පෙන්නුම් කරන්නාවූ කරුණු 6 නම් කරන්න.

____________________ ____________________

____________________ ____________________

____________________ ____________________

5. මෙම පරිච්ජේදයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේට දී ඇති නිලනාම දහතුනක් සාකච්ඡාවට භාජනය විය. මින් කීයක් ඔබට නම් කළ හැකිද?

________ ________ ________ ________ ________

________ ________ ________ ________ ________

________ ________ ________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

අලුත් ගිවිසුමෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ උපුටා දැක්වීම් 261 ඇතුලත් වේ. උන්වහන්සේ සඳහන් වී ඇත්තේ :

- ශුභාරංචි පොත් වන මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන්වල 56 වතාවක්
- ක්‍රියා පෙතෙහි 57 වතාවක්
- අලුත් ගිවිසුමෙහි ඉතිරි පොත්වල 148 වතාවක් ලෙසිනි.

මුළු අලුත් ගිවිසුම සම්පූර්ණයෙන් කියවන්න. ඔබ කියවාගෙන යන අතර ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ සඳහන් වන සෑම විටම එය රවුමකින් සලකුණු කරන්න. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය පිළිබඳ ඔබගේ දැනුම වැඩි දියුණු කරගැනීම සඳහා එම බයිබල් කොටස් අධ්‍යයනය කරන්න.

# තුන්වන පරිච්ඡේදය

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය

### අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය පහත සඳහන් කාරණා වලදී ලද ආකාරය පැහැදිලි කිරීමට:

- මැවීමේදී
- ශුද්ධ ලියවිල්ලෙහි
- ඉශ්‍රායෙල්
- සාතන්
- යේසුස්වහන්සේ
- පව්කරුවා
- සභාව
- ඇදහිලිවන්තයෝ  ඔබට හැකි වනු ඇත.

### ප්‍රධාන පදය :

> **නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහිකරවනසේක. (යොහන් 14:26)**

## හැඳින්වීම.

මෙම පරිච්ඡේදයෙහි පරමාර්ථය වනුයේ ලෝකය මැවීමේ සිට නූතන ඇදහිලිවන්තයා තෙක් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය විස්තර කර දීමය.

## මැවීම.

පොළොව මැවීමේදී ශුද්ධාත්මයාණන්වහන්සේ සජීවීව ක්‍රියාකාරී වූ සේක.

> **පොළොව වනාහි පාළුව හිස්ව තිබුණාය: ගැඹුර පිට අන්ධකාරය විය. දෙවියන්වහන්සේගේ ආත්මය ජල මතුයෙහි හැසිරෙමින් සිටිසේක. (උත්පත්ති 1:2)**

> **ඔබ ස්වකීය ආත්මය එවන කල උන් මවනු ලබති: ඔබ පොළෝතලය අලුත්කරන සේක. (ගීතාවලිය 104:30)**

## ශුද්ධ ලියවිල්ල.

දෙවියන්වහන්සේගේ වචනය ලිඛිතව සැපයීමෙහිදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය ක්‍රියාකාරී විලසින් සැපයුනි. ලිඛිත දේව වචනය ශුද්ධ ලියවිල්ල ලෙස හා ශුද්ධ බයිබලය ලෙසට නම් කෙරේ. ලිඛිත වචනය සම්පාදනයෙහිදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය ලද ආකාර :

**එළිදරව්වීම් :**

ශුද්ධාත්මයාණන්වහන්සේ මිනිස් කතෘවරුනට දෙවියන්වහන්සේගේ පණිවුඩය කතාකළසේක :

> **මක්නිසාද කිසි අනාගතවාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලක නොපැමිණියේය. නුමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොලඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථාකළෝය. (2 පේත්‍රුස් 1:21)**

**ආනුභාවය ලබාදීම :**

ලේඛකයෝ නිවැරදිව පණිවුඩය සනිටුහන් කරන පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන්ව මගපෙන්වූ සේක :

> **දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16)**

**අවබෝධ කරදීම.**

මිනිස් හදවතට ශුභාරංචි පණිවුඩය තේරුම් ගැනීම පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේ මිනිස් හදවතට අවබෝධය සපයා දෙනසේක.

> **නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියනලද සියල්ල නුඹලාට සිහිකරවන සේක. (යොහන් 14:26)**

## ඉශ්‍රායෙල්

ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේ තෝරාගනු ලැබුවේ ඔවුන් තුළින් උන්වහන්සේගේ මූලික සැලැස්ම ලොව පුරා ඉටු කරමින් උන්වහන්සේව ජනතාවට එළිදරව් කර දීමේ අරමුණිනි‍ය. මනුෂ්‍ය සංහතිය පාපයෙන් ගලවාගැනීම පිණිස මිදුම්කරුවාණෝ පැමිණියේද ඉශ්‍රායෙල් තුළිනි. ඉශ්‍රායෙල් ජාතිය ඇදහිලිවන්තයන් උදෙසා සාර්ථකත්වයේ මෙන්ම අසාර්ථකත්වයේද උදාහරණ මැනවින් සපයා දෙයි. ඉශ්‍රායෙල්හි අගනගරය වූ යෙරුසලමෙන් ලොව පුරාවට ශුභාරංචි පණිවුඩය ව්‍යාජ්ත විය.

ඉශ්‍රායෙල් ජාතියේ මූලාරම්භයේ පටන් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුනට කළ සේවාව දැකිය හැකිය.
ශුද්ධාත්මයාණන්වහන්සේ :

**ඉශ්‍රායෙල්හි නායකයින් මතට වැඩිසේක :**

මෙම පාඩමාලාවෙහි අත්පොතෙහි ඇතුලත් කළ නොහැකි තරම් ප්‍රමාණයක් උදාහරණ බයිබලයෙහි මේ පිළිබඳව සඳහන් වේ. උපුටාගත් බයිබල් පද කිහිපයක් "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසෙහි සපයා ඇත. පැරණි ගිවිසුම යුගයෙහි මනුෂ්‍යයන්ගේ ජීවිතවල ශුද්ධාත්මයාණන්වහන්සේ ක්‍රියාකළ ආකාරය මෙම අධ්‍යයනයෙන් ඔබහට සැපයෙනු ඇත.

**ඉශ්‍රායෙල්වරුන්ගේ නමස්කාර ස්ථාන මතට වැඩිසේක.**

> **එවිට වලාකුළ සම්මුඛවීමේ කූඩාරම වසා ගත්තේය, ස්වාමීන්වහන්සේගේ තේජසෙන් මණ්ඩපය පිරීගියේය. (නික්මයාම 40:34)**

> **පූජකයන් ශුද්ධස්ථානයේ සිට පිටතට ආ කල ස්වාමීන්වහන්සේගේ ගෘහය වලාපටලයෙන් පිරුණේය. (1 රාජාවලිය 8:10)**

### ඔවුන්ව පොරොන්දු දේශය කරා මග පෙන්වූ සේක.

> **ඔවුන්ට ගුරුකම් දෙන පිණිස ඔබගේ යහපත් ආත්මය ඔබ දුන්සේක, ඔවුන්ගේ මුඛයෙන් ඔබගේ මන්නා ඔබ අහක්කර නොගත් සේක, ඔවුන්ගේ පිපාසයටද ඔබ ඔවුන්ට වතුර දුන් සේක. (නෙහෙමියා 9:20)**

### මහත් පීඩා කාලයේදී ඉශ්‍රායෙල් මතට පැමිණෙනු ඇත.

මහත් පීඩාවේ කාලය යනු අනාගතයෙහිදී පොළොවෙහි ඇතිවන්නාවූ ඉතා කරදරකාරී යුගයකි. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් කෙරෙහි විශේෂ ආරක්ෂාවේ සලකුණක් තබනු ඇත.

> **තවත් දේවදූතයෙක් ජීවමාන දෙවියන්වහන්සේගේ මුද්‍රාව රැගෙන, නැගෙනහිර දිසාවෙන් නගිනවා දුටිමි. ඔහුද ගොඩටත් මුහුදටත් අනතුරුකරන්ට බලය ලත් දේවදූතයන් සතරදෙනාට මහත් ශබ්දයකින් හඬගසා: අපේ දෙවියන්වහන්සේගේ මෙහෙකරුවන්ගේ නළල්වල මුද්‍රා තබන තුරු, ගොඩටවත් මුහුදටවත් ගස්වලටවත් අනතුරු නොකරල්ලායයි කීය. තවද මුද්‍රාකරනු ලැබූවන්ගේ ගණන ඇසිමි, ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ සියලු ගෝත්‍රවලින් මුද්‍රාකරනු ලැබූ අය එක්ලක්ෂ සතලිස් සාරදහසක්ය. (එළිදරව් 7:2-4)**

### දහස් අවුරුදු රජකම් කිරීමේ කාලයෙහිදී ඉශ්‍රායෙල් මතට වඩිනු ඇත.

දහස් අවුරුදු සමය නම් ලොව පුරා සාමය රජයන යේසුස්වහන්සේ ලොව පාලනය කරන්නාවූ වසර දහසක කාල පරිච්ඡේදය වේ.

> **දාවිත්ගේ වංශය කෙරෙහිද යෙරුසලමේ වැසියන් කෙරෙහිද කරුණාවේ හා කන්නලව්කිරීමේ ආත්මය වගුරුවන්නෙමි: ඔවුන් තමුන් විසින් ඇන්නාවූ තැනැත්තා වන මා දෙස බලාසිට, එකම පුත්‍රයෙකු ගැන වැලපෙන්නාක් මෙන් උන්වහන්සේ ගැන වැලපෙනවා ඇත, කුලුඳුලා ගැන ශෝකවෙන්නාක් මෙන් උන්වහන්සේ ගැන ශෝකවෙනවා ඇත. (සෙකරියා 12:10)**

## සාතන්.

ශුද්ධාත්මයාණන්වහන්සේ සතුව සාතන් උදෙසා මෙහෙයක් ඇත. සාතන්ගේ බලය සීමා කොට වලකා තබන ආත්මික බලවේගය නම් ශුද්ධාත්මයාණන්වහන්සේය.

> **එවිට බස්නාහිර සිට ස්වාමින්වහන්සේගේ නාමයටත් නැගෙනහිර සිට උන්වහන්සේගේ තේජසටත් මනුෂ්‍යයෝ භයවන්නෝය. මක්නිසාද ස්වාමීන්වහන්සේගේ හුස්මෙන් පිඹහරින්නාවූ, හිරවෙච් ගලන්නාවූ ජලධාරාවක් මෙන් උන්වහන්සේ එන සේක. (යෙසායා 59:19)**

ලෝකයෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ ඉවත් කරනු ලැබූ කල අන්ත ක්‍රිස්තුස්ගේ ආත්මය සීමා සහිත කාලයකට ලෝකය පාලනය කරනු ඇත. අන්ත ක්‍රිස්තුස් වනුයේ දුෂ්ඨ ලෝක පාලකයෙකි.

> **මක්නිසාද නොපනත්කමේ අභිරහස දැනටම ක්‍රියාකරන්නේය. නුමුත් තමා පහකරනු ලබන තුරු දැන් වලක්වන්නාවූ කෙනෙක් සිටී. එවිට නොපනත්කම් කරන්නා එළිදරව්වන්නේය. ස්වාමී වූ යේසුස්වහන්සේ තමාගේ මුඛයේ හුස්මෙන් ඔහු නසා, තමන්වහන්සේගේ ඊමේ ප්‍රකාශවීමෙන් නාස්තිකරනසේක. ඔහුගේ ඊම සාතන්ගේ ක්‍රියාකිරීමේ හැටියට බොරුවූ සියලු ආකාර ආශ්චර්ය වලින්ද ලකුණු වලින්ද පුදුමවලින්ද, විනාශවෙන්නවුන්ට අධර්මිෂ්ඨකමේ සියලු රැවටිලි වලින්ද යුක්ත වේ: මක්නිසාද ගැළවෙන පිණිස ඔව්හු සැබෑකමට ප්‍රේමවීම පිළිනොගත්තෝය. මේ නිසා සැබෑව විශ්වාස නොකොට අධර්මිෂ්ඨකමට ප්‍රසන්නවූ සියල්ලන්ම විනිශ්චය කරනු ලබන පිණිස, බොරුව විශ්වාස කරන හැටියට දෙවියන්වහන්සේ මුළාවේ ක්‍රියාකිරීමක් ඔවුන්ට එවන සේක. (2 තෙසලෝනික 2:7-12)**

# යේසුස්වහන්සේ.

යේසුස්වහන්සේගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය දැකිය හැකි විය.
යේසුස්වහන්සේ :

## ආත්මයාණන් කරණකොටගෙන ගැබ්ගත්සේක :

දේවදූතයා ඇට උත්තරදෙමින්: ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙනසේක, මහෝත්තමයාණන්ගේ ආනුභාවද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්ට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබනසේක. (ලූක් 1:35)

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තිය මෙසේ විය. උන්වහන්සේගේ මවුවූ මරියා යෝසෙප්ට විවාහබස් දී සිටියදී, ඔවුන් එක්වෙන්ට පළමුවෙන්, ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ඈ ගර්භණීවූ බව දැනගන්නාලදී.
නුමුත් ඔහු මේ කාරණා කල්පනා කරමින් සිටියදී, බලව, ස්වාමීන්වහන්සේගේ දූතයෙක් ස්වප්නයකින් ඔහුට පෙනී: දාවිත්ගේ පුත්‍රවූ යෝසෙප්, නුඹේ භාර්යාවවූ මරියා පාවාගන්ට භය නොවන්න. මක්නිසාද ඈ තුළ පිළිසිඳුනාවූ යමක් ඇද්ද එය ශුද්ධාත්මයාණන් කරණකොටගෙනය. (මතෙව් 1:18, 20)

## ආත්මයාණන්ගේ ආලේපය ලැබූසේක :

යේසුස්වහන්සේ බව්තිස්ම ලැබ එකෙණෙහිම දියෙන් ගොඩනැගුණු සේක. බලව, අහස උන්වහන්සේට විවර විය, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරවියෙකු මෙන් බසිනවාද තමන් පිටට පැමිණෙනවාද උන්වහන්සේ දුටුසේක: (මතෙව් 3:16)

ස්වාමීන්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය: මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේපකළසේක: වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද (ලූක් 4:18)

දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේපකළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසිරුණු බවත්ය. (ක්‍රියා 10:38)

ඔබ ධර්මිෂ්ඨකමට ප්‍රියව අධර්මිෂ්ඨකමට ද්වේෂකළසේක: එබැවින් දෙවියන්වහන්සේ, ඔබගේ දෙවියන්වහන්සේ, ඔබගේ සහකාරයන්ට වඩා ප්‍රීතිය නමැති තෙලයෙන් ඔබ ආලේපකළසේකැයි කියනසේක. (හෙබ්‍රෙව් 1:9)

## ආත්මයාණන් මගින් මුද්‍රා ලැබූසේක :

නැතිව යන කෑම පිණිස නොව සදාකාල ජීවනයට පවතින්නාවූ කෑම පිණිස වැඩකරපල්ලා, එය මනුෂ්‍ය පුත්‍රයා නුඹලාට දෙනසේක. මක්නිසාද පියාණන්වහන්සේ, එනම්, දෙවියන්වහන්සේ විසින් ඔහු මුද්‍රාකොට තිබේයයි කීසේක. (යොහන් 6:27)

## ආත්මයාණන් කරණකොටගෙන මගපෙන්වනු ලැබූසේක :

එකල යේසුස්වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂා කරනු ලබන පිණිස ආත්මයාණන්වහන්සේ විසින් වනාන්තරයට පමුණුවනු ලැබූසේක. (මතෙව් 4:1)

## ආත්මයාණන් මගින් බලවත් කරනු ලැබූසේක :

නුමුත් මම දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන යක්ෂයන් දුරුකරම් නම්, සැබවින්ම දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලා කරා පැමිණ තිබේ. (මතෙව් 12:28)

### ආත්මයාණන් මගින් පූර්ණ කරනු ලැබූසේක :

යේසුස්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණව, යෝර්දානයෙන් හැරී ඇවිත්, යක්ෂයා විසින් පරීක්ෂා කරනු ලබමින්, ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන සතළිස් දවසක් වනයෙහි ගෙනයනු ලැබූසේක. (ලූක් 4:1-2)

මක්නිසාද දෙවියන්වහන්සේ විසින් එවන ලද තැනන්වහන්සේ දෙවියන්වහන්සේගේ වචන කථාකරනසේක. කුමක්හෙයින්ද දෙවියන්වහන්සේ මිම්මක් සහිතව ආත්මයාණන් නොදෙනසේක. (යොහන් 3:34)

### ආත්මයෙන් කැළඹුන සේක.

යේසුස්වහන්සේ ඈ අඬනවාත් ඈ සමග ආ යුදෙව්වරුන් අඬනවාත් දැක ආත්මයෙන් සුසුම්ලා, කැළඹී: (යොහන් 11:33)

### ආත්මයෙන් ප්‍රීතිමත් වූ සේක :

ඒ පැයේදීම උන්වහන්සේ ශුද්ධාත්මයෙන් ප්‍රීතිමත්ව කියනසේක්: ස්වර්ගයටත් පොළොවටත් ස්වාමිවූ පියාණෙනි, ඔබවහන්සේ ප්‍රඥාවන්තයන්ටත් නුවණ ඇත්තන්ටත් මේ කාරණා සඟවා බාලයන්ට එළිදරව්කළ බැවින් ඔබට ස්තුති කරමි. එසේය, පියාණෙනි: මක්නිසාද ඔබගේ කැමැත්ත එසේ විය. (ලූක් 10:21)

### ආත්මය කරණකොටගෙන පුදනු ලැබූ සේක :

කැලලක් නැතිව සදාකාල ආත්මයාණන් කරණකොටගෙන තමන්ම දෙවියන්වහන්සේට පූජාවුණාවූ ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් ජීවමාන දෙවියන්වහන්සේට සේවය කරන පිණිස, මළ ක්‍රියාවලින් නුඹලාගේ හෘදසාක්ෂිය කොපමණ වැඩියෙන් පිරිසිදුකරනු නොලබන්නේද? (හෙබ්‍රෙව් 9:14)

### ආත්මය තුළින් ඔසවනු ලැබූසේක :

මක්නිසාද දෙවියන්වහන්සේ ළඟට අප පමුණුවන පිණිස ධර්මිෂ්ඨවූ ක්‍රිස්තුස්වහන්සේ අධර්මිෂ්ඨයන් උදෙසා පව් ගැන වරක් වධවින්දසේක: උන්වහන්සේ මාංසය සම්බන්ධයෙන් මරනු ලැබ, ආත්මය සම්බන්ධයෙන් ජීවත්කරනු ලැබූසේක. (1 පේත්‍රුස් 3:18)

අපගේ පියවූ දෙවියන්වහන්සේගෙන්ද ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්ද අනුග්‍රහයත් සමාදානයත් නුඹලාට වේවා. (රෝම 1:4)

### එතුමාගේ ගෝලයන්ට ආත්මයාණන් තුළින් අණ ලබා දුන් සේක.

ඔසවාගනු ලැබූ දවස දක්වා, උන්වහන්සේ විසින් කරන්ටත් උගන්වන්ටත් පටන්ගත් සියල්ල ගැන ප්‍රථම පොත සම්පාදනය කළෙමි. (ක්‍රියා 1:2)

## පව්කරුවන්.

පව්කරුවා උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය යේසුස්වහන්සේ විස්තර කළසේක:

එසේවී නුමුත් මම නුඹලාට සැබෑව කියමි: මාගේ අහක්ව යෑම නුඹලාට ප්‍රයෝජනවත්ය. මක්නිසාද මා අහක්ව නොගියොත්, සැනසිලිකාරයාණන්වහන්සේ නුඹලා ළඟට එන්නේ නැත: නුමුත් ගියොත් උන්වහන්සේ නුඹලා වෙතට එවන්නෙමි. උන්වහන්සේ ආ කල, පාපය ගැනද ධර්මිෂ්ඨකම ගැනද විනිශ්චය ගැනද ලෝකයාට අඟවාදෙනසේක. පාපය ගැනයයි කීවේ ඔවුන් මා කෙරෙහි නොඅදහන නිසාය: ධර්මිෂ්ඨකම ගැනයයි කීවේ මාගේ පියාණන්වහන්සේ ළඟට යන බැවින් තවත් නුඹලා මා නොදක්නා නිසාය: විනිශ්චය ගැනයයි කීවේ මේ ලෝකයේ අධිපතියා විනිශ්චයකරනු ලැබ සිටින නිසාය. (යොහන් 16:7-11)

# සභාව.

ශුද්ධාත්මයාණන්වහන්සේ සභාව උදෙසා පරමාර්ථ කිහිපයක් සහිතව මෙහෙකරන සේක. උන්වහන්සේ :

## එය සැකසූසේක :

ඒ නිසා නුඹලා තවත් විදේශියෝවත් ආගන්තුකයෝවත් නොව, ශුද්ධවන්තයන් සමග එක නුවර වැසියෝව දෙවියන්වහන්සේගේ පවුලේ අයවල්ව සිටින්නහුය. නුඹලා ප්‍රේරිතයන්ගේත් ප්‍රොපේතවරුන්ගේත් අත්තිවාරම් පිට ඉදිකරනු ලැබ සිටින්නහුය. ක්‍රිස්තුස් යේසුස්වහන්සේම එහි කොණේ ප්‍රධාන ගලව සිටිනසේක. උන්වහන්සේ තුළ මුළු ගොඩනැගිල්ල හොඳ හැටියට එකතුකරනලදුව, ස්වාමීන්වහන්සේ තුළ ශුද්ධවූ මාළිගාවක්ව සැදීගන යන්නේය. උන්වහන්සේ තුළ නුඹලාත් <u>ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන</u> දෙවියන්වහන්සේගේ වාසය පිණිස එකට ගොඩනගනලද්දහුය. (එපීස 2:19-22)

## එහි නමස්කාරය සඳහා පොලඹවනසේක.

මක්නිසාද චර්මඡේදිතයෝ නම් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන නමස්කාරකරන්නාවූ, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ පාරට්ටුකරගන්නාවූ, මාංසය තුළ විශ්වාසයක් නැත්තාවූ අපිය. (පිලිප්පි 3:3)

## එහි ධර්මදූත මෙහෙය මගපෙන්වන සේක :

එවිට ආත්මයාණන්වහන්සේ පිලිප්ට කථාකොට: නුඹ මේ රථය ළඟට ගොස් එක්වෙයන්නැයි කීසේක. (ක්‍රියා 8:29)

ඔව්හු ආසියාවේදී වචනය කියාදෙන්ට ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු ලැබ, පිරීගිය සහ ගලාතිය පළාත මැදින් ගියෝය: ඔව්හු මිසිය ඉදිරියට ඇවිත්, බිතිනියට යන්ට උත්සාහ කළෝය: නුමුත් යේසුස්වහන්සේගේ ආත්මයාණෝ ඔවුන්ට ඉඩ නුදුන්සේක.
ඔහු දර්ශනය දුටු කල, ඔවුන්ට ශුභාරංචිය දේශනා කරන්ට දෙවියන්වහන්සේ අඬගැසූ බව තේරුම්ගෙන, එකිණෙහිම මකිදෝනියට යන්ට අපි උත්සාහකළෙමුව. (ක්‍රියා 16:6,7,10)

ඔවුන් ස්වාමීන්වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන් කල, ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට: මා විසින් බාර්ණබස්ද සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලායයි කීසේක. මෙසේ ඔව්හු ශුද්ධාත්මයාණන් විසින් යවනලදුව සිලූකියට බැසගොස්, එහිදී නැව් නැගී කුප්‍රසට ගියෝය. (ක්‍රියා 13:2,4)

## එහි සේවකයන් තෝරාපත් කරනසේක :

දෙවියන්වහන්සේ විසින් තමන්ගේම රුධිරයෙන් මිලේට ගත් තමන්ගේ සභාව පෝෂණයකරන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ යම් රැළෙක්හි නුඹලා නායකයන් කොට නියමකළසේක්ද, ඒ මුළු රැළ ගැනත් නුඹලාම ගැනත් ප්‍රවේසම්වෙයල්ලා. (ක්‍රියා 20:28)

## එහි දේශකයන් ආලේප කරන සේක :

මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචන වලින් නොව ආත්මයාණන්වහන්සේගේද බලයේද ප්‍රකාශකිරීමෙන් විය. (1 කොරින්ති 2:4)

## එහි තීරණවලට මගපෙන්වන සේක :

එනම් රූපවලට පූජාකළ දේවලින්ද ලෙයින්ද බොටුව මිරිකා මැරූ සතුන්ගෙන්ද වේශ්‍යාකමින්ද නුඹලා වලකින්ට ඕනෑවා මිස, වෙන කිසි බරක් නුඹලා පිට නොතබන්ට ශුද්ධාත්මයාණන්ටත් අපටත් යහපතැයි පෙනීගියේය. (ක්‍රියා 15:28)

## එය බලයෙන් බව්තිස්ම කරනසේක :

**තවද පෙන්තකොස්ත දවස පැමිණි කල ඔවුන් සියල්ලෝ එක තැනක රැස්ව සිටියෝය. තද හුළඟක් හමන්නාක්මෙන් ශබ්දයක් අහසෙන් හදිසියෙන් පැමිණ, එයින් ඔවුන් හිඳගෙන උන්නාවූ මුළු ගෙය පිරුණේය. ගිනි වැනිවූ දිව් බෙදී යනවා ඔවුන්ට පෙනුණේය: එය ඔවුන් එක් එක්කෙනා කෙරෙහි පිහිටුණේය. ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථාකරන්ට පටන්ගත්තෝය. (ක්‍රියා 2:1-4)**

# ඇදහිලිවන්තයෝ.

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයන්ගේ ජිවිතවල වැදගත් අරමුණක් ඉටුකරනසේක :

## ඒත්තුගන්වයි :

ස්ත්‍රී, පුරුෂයන්ව යේසුස්වහන්සේ වෙතට යොමුවීම සඳහා ඔවුන්ගේ පාප පිළිබඳ ඔවුනට ඒත්තු ගන්වනුයේ ශුද්ධාත්මයාණන්වහන්සේය. ශුද්ධාත්මයාණනන්වහන්සේගේ මෙම මෙහෙය නොමැතිව ඔබට ඇදහිලිවන්තයෙකු වීමට නොහැක.

**උන්වහන්සේ ආ කල, පාපය ගැනද ධර්මිෂ්ඨකම ගැනද විනිශ්චය ගැනද ලෝකයාට අඟවාදෙනසේක. පාපය ගැනයයි කීවේ ඔවුන් මා කෙරෙහි නොඅදහන නිසාය; ධර්මිෂ්ඨකම ගැනයයි කීවේ මාගේ පියාණන්වහන්සේ ළඟට යන බැවින් තවත් නුඹලා මා නොදක්නා නිසාය; විනිශ්චය ගැනයයි කීවේ මේ ලෝකයේ අධිපතියා විනිශ්චයකරනු ලැබ සිටින නිසාය. (යොහන් 16:8-11)**

## අලුත් කරනු ලබයි :

ඔබ ඇදහිලිවන්තයෙකු වූ කල ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ ජීවිතය වෙනස් කරනු ඇත.

**අප විසින්ම කළාවූ ධර්මිෂ්ඨකමේ ක්‍රියාවලින් නොව තමන්වහන්සේගේ දයාව ලෙස නැවත ඉපදීම නැමැති සේදීමෙන්ද ශුද්ධාත්මයාණන්වහන්සේගේ අලුත් කිරීමෙන්ද උන්වහන්සේ අප ගැළවූසේක. (තීතස් 3:5)**

**යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් සැබවක් නුඹට කියමි- යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට කීසේක. නිකොදේමුස් උන්වහන්සේට කථාකොට: මනුෂ්‍යයෙක් මහලුව සිටියදී උපදින්නට පුළුවන් කොහොමද? දෙවෙනි වර මව් කුසට ඇතුල්ව උපදින්ට පුළුවන්දැයි උන්වහන්සේට කීවේය. යේසුස්වහන්සේ උත්තරදෙමින් සැබවක් සැබවක් නුඹට කියමි- යමෙක් වතුරෙන්ද ආත්මයාණන්ගෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙන්ට බැරිය. මාංසයෙන් උපදින දේ මාංසයය; ආත්මයාණන්ගෙන් උපදින දේ ආත්මයය. නුඹලා අලුතෙන් උපදින්ට ඕනැයයි මා කීවාට පුදුම නොවන්න. (යොහන් 3:3-7)**

## පවිත්‍රකරයි :

ගැලවීම තුළින් වෙනස් වුනාවූ ජිවිතය ශුද්ධාත්මයාණන්වහන්සේ රැගෙන ධර්මිෂ්ඨ ලෙස ජිවත්වීමට හැකියාව සපයා දෙයි.

**නුමුත්, ස්වාමින්වහන්සේ විසින් ප්‍රේමකරනු ලබන සහෝදරයෙනි, ආත්මයාණන්වහන්සේගේ පිරිසිදුකිරීමද සැබෑව ඇදහීමද කරණකොටගෙන නුඹලා ගැළවෙන පිණිස දෙවියන්වහන්සේ පටන්ගැන්මේ සිට නුඹලා තෝරාගත් නිසා නුඹලා ගැන දෙවියන්වහන්සේට නිතරම ස්තුති කරන්ට අපි බැඳී සිටිමුව. (2 තෙසලෝනික 2:13)**

## බව්තිස්ම කරයි :

මෙම පාඩම් මාලාවේ හතර වන පරිච්ඡේදයෙහි ශුද්ධාත්ම බව්තිස්මය නම් වූ අත්දැකීම පිළිබද ඉගැන්වේ.

> **ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කතාකරන්ට පටන්ගත්තෝය. (ක්‍රියා 2:4)**

## අප තුළ වැඩ වසයි :

මෙම වැඩ විසීමෙහි පරමාර්ථය වනුයේ ගැලවීමෙන් ඔබ ලද අලුත් ස්වාභාවය ශක්තිමත් කිරීමය.

> **නොහොත් නුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබූ, නුඹලා තුළ ඇත්තාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව බව නොදනිවුද? (1 කොරින්ති 6:19)**
>
> **නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද? (1 කොරින්ති 3:16)**
>
> **එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය; මෙන්න සියල්ලම අලුත්වී තිබේ. (2 කොරින්ති 5:17)**
>
> **නුමුත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරියල්ලා, එවිට නුඹලා මාංසයේ තෘෂ්ණා සම්පූර්ණ කරන්නේ නැතැයි කියමි. මක්නිසාද මාංසය ආත්මයාණන්වහන්සේට විරුද්ධවද ආත්මයාණන්වහන්සේ මාංසයට විරුද්ධවද ආශාකරයි. නුඹලා කැමතිවන දේ නොකරන ලෙස මොව්හු එකිනෙකාට විරුද්ධවෙති. නුමුත් නුඹලා ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබන්නහු නම්, නුඹලා ව්‍යවස්ථාව යටතේ නොවන්නහුය. (ගලාති 5:16-18)**

ස්වාභාවික ලෝකයෙහි කිසියම් පුද්ගලයෙක් වසර ගණනක් ජීවත් වූ පසුව එම පුද්ගලයාගේ චරිත ගුණාංග එම නිවස තුළින් දිස්වේ. එසේම අප තුළ වාසය කරන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ චරිත ගුණාංග අපගේ ආත්මික නිවස තුළින්ද දිස්විය යුතුය.

## ශක්තිමත් කරවයි :

> **උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තිමත් වන පිණිසත්, (එපීස 3:16)**

## එකමුතුකරවයි :

ශුද්ධාත්මයාණන්වහන්සේ, ඇදහිලිවන්තයාව දෙවියන්වහන්සේ සමගත් අනෙක් ඇදහිලිවතුන් සමගත් ආත්මයෙන් එකමුතු කරවයි. මෙය "ආත්මයාණන්වහන්සේගේ එකමුතු බව" ලෙසින් හැඳින්වේ.

> **නුමුත් ස්වාමීන්වහන්සේට එක්වූ තැනැත්තේ එක ආත්මයය. (1 කොරින්ති 6:17)**
>
> **මක්නිසාද ශරීරය එකක්ව බොහෝ අවයව ඇතුවාක්මෙන්ද ශරීරයේ අවයව සියල්ල බොහෝ වුවත් එක ශරීරයක්මෙන් තිබෙන්නාක්මෙන්ද, ක්‍රිස්තුස්වහන්සේත් එසේව සිටිනසේක. මක්නිසාද යුදෙව්වරු නොහොත් ග්‍රීක්වරු වෙත්වා, දාසයෝ නොහොත් නිර්දාසයෝ වෙත්වා, අපි සියල්ලෝ එකම ආත්මයාණන්වහන්සේ තුළ එකම ශරීරයට බව්තීස්මකරනු ලැබ, සියල්ලෝ එකම ආත්මයාණන්ගෙන් පොවනු ලැබීමුව. (1 කොරින්ති 12:12-13)**

## මැදිහත්කාරකම් කරයි :

> **එසේම ආත්මයාණන්වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාර කරන සේක. මක්නිසාද යුතුලෙස යාච්ඤා කරන්නට අප නොදනිමුව; නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම්වලින් අප උදෙසා මැදහත්කම් කරනසේක. (රෝම 8:26)**

නුමුත් ප්‍රේමවන්තයෙනි, නුඹලා වනාහි නුඹලාගේ ඉතා ශුද්ධ ඇදහිල්ල පිට නුඹලාම ගොඩනඟාගනිමින්, ශුද්ධාත්මයාණන්වහන්සේ තුළ සිට යාච්ඤාකරමින්, (යුදස් 20)

සියලු යාච්ඤාවලින්ද ඉල්ලීම්වලින්ද සියලු කාලවලදී ආත්මයාණන් කරණකොටගෙන යාච්ඤා කරපල්ලා. (එපීස 6:18)

## මගපෙන්වයි :

එසේවී නුමුත්, උන්වහන්සේ, එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මගපෙන්වන සේක. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා, පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශකරනසේක. (යොහන් 16:13)

මක්නිසාද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද, එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. (රෝම 8:14)

## ප්‍රේමය විදහා දක්වයි :

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයාට සහ ඇදහිලිවන්තයා තුළින් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය විදහා දක්වයි.

බලාපොරොත්තුව ලජ්ජාවට නොපමුණුවන්නේය; මක්නිසාද අපට දෙන ලද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරවන ලද්දේය. (රෝම 5:5)

## ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට සමාන කොට ස්ථිරකරයි :

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයාව ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට අනුකූලව සමාන කරවයි.

අපි සියල්ලෝද මුහුණ වැස්මක් නැතුව, ස්වාමීන්වහන්සේගේ තේජස කැඩපතකින්මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපය වෙනස්කරනු ලබමුව. (2 කොරින්ති 3:18)

## සත්‍යය හෙළිදරව් කරදෙයි :

නුමුත් දෙවියන්වහන්සේ ස්වකීය ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන අපට ඒ දේ එළිදරව් කළසේක. මක්නිසාද ආත්මයාණන්වහන්සේ සියලු දේ, එසේය, දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් විමසන සේක. (1 කොරින්ති 2:10)

## උගන්වයි :

නුඹලා ගැන වනාහි, නුඹලා උන්වහන්සේගෙන් ලැබූ ආලේපය නුඹලා තුළ පවතින්නේය, යමෙකු විසින් නුඹලාට ඉගැන්වීම ඕනෑ කරන්නේ නැත; එම ආලේපය සියල්ල ගැන නුඹලාට උගන්වන ලෙසද, එය බොරු නොව සත්‍යව තිබෙන ලෙසද, එයින් නුඹලාට ඉගැන්වූ ප්‍රකාරයටද උන්වහන්සේ තුළ පැවතියල්ලා. (1 යොහන් 2:27)

## ගැලවීම පිළිබඳ නිසැකකම ලබාදෙයි :

අපි දෙවියන්වහන්සේගේ දරුවෝයයි ආත්මයාණන්වහන්සේම අපේ ආත්මය එක්ව සාක්ෂිදෙනසේක. (රෝම 8:16)

උන්වහන්සේගේ ආඥා පවත්වන්නා උන්වහන්සේ තුළ පවතියි. උන්වහන්සේද ඔහු තුළ පවතින සේක. උන්වහන්සේ අප තුළ සිටින බව අප දැනගන්නේ උන්වහන්සේ අපට දුන් ආත්මයෙන්ය. (1 යොහන් 3:24)

## නිදහස ලබා දෙයි :

මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස්කළාය. (රෝම 8:2)

ඉදින් ඒ ස්වාමීන්වහන්සේ ආත්මයාණන්වහන්සේය. ස්වාමීන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඇති තැන නිදහස්කම ඇත්තේය. (2 කොරින්ති 3:17)

## සනසවයි :

මෙසේ මුළු යුදයෙහිද ගලිලයෙහිද සමාරියෙහිද සභාව දියුණුවී, සමාදානය ලැබ, ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇතුව හැසිරෙමින් ශුද්ධාත්මයාණන්ගේ පිහිටවීමෙන් වර්ධනය වූවාය. (ක්‍රියා 9:31)

ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්ට ලෝකයාට බැරිය; මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය; මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවති සිටින සේක, නුඹලා තුළෙහි සිටින සේක.
නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියනලද සියල්ල නුඹලාට සිහිකරවනසේක. (යොහන් 14:17,26)

## ප්‍රාණවත්කරවයි.

තවද යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටෙවූ තැනන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසයකරනසේක් නම්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනන්වහන්සේ නුඹලා තුළෙහි වසන තමන්ගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ මරණීය ශරීරයන්ද ජීවත්කරන සේක. (රෝම 8:11)

## කථාකරයි :

ඔවුන් නුඹලා පාවාදෙන්ට ගෙනයන කල කුමක් කියන්නෙමුදැයි කලින් කනස්සලු නොවෙල්ලා. එහෙත් ඒ පැයේදී නුඹලාට යමක් දෙනු ලැබේද ඒක කියාපල්ලා. මක්නිසාද කථාකරන්නේ නුඹලා නොව ශුද්ධාත්මයාණන්වහන්සේය. (මාර්ක් 13:11)

## දෙවියන්වහන්සේගේ බලය විදහා දක්වයි :

මාගේ කථාවත් මාගේ දේශනා කිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචන වලින් නොව ආත්මයාණන්වහන්සේගේද බලයේද ප්‍රකාශකිරීමෙන් විය. එසේ වුනේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරින්ති 2:4-5)

## නමස්කාරයට පොලඹවයි :

දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කළ යුතුයයි කීසේක. (යොහන් 4:24)

## සාක්ෂි දැරීම සඳහා බලයෙන් සරසවයි :

යම්කිසි පුද්ගලයෙකු ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් බව්තිස්ම ලබා තිබෙන බවට ඇති සත්‍ය සාක්ෂිය නම් ඔහු සතු අන්‍යයන්ට සාක්ෂි දැරීමේ බලයයි.

නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කළ නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)

## දීමනා ලබා දී ඵල වර්ධනය කරයි :

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන්හට ආත්මික දීමනා ලබා දෙන සේක. මෙම දීමනා ඔහුට සභාවෙහි කොටසක් ලෙසට කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක වීම සඳහා සපයා දෙන්නාවූ විශේෂ හැකියාවන්ය. ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි ආත්මික ඵල වර්ධනය කරනසේක. ආත්මික ඵල නම් ඇදහිලිවන්තයෙකු තුළ පවතින ශුද්ධාත්මයාණන්වහන්සේගේ ස්වාභාවය වේ. ආත්මික දීමනා සහ ඵල වල ඇති වැදගත්කම අනුව එම මාතෘකා වෙන වෙනම පරිච්ඡේදයකදී සාකච්ඡා කරනු ඇත.

## ස්වයං-පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කට පාඩමින් ලියන්න.

2. ඉශ්‍රායෙල් ජාතිය වෙනුවෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ දෑරූ පරමාර්ථ පහක් සඳහන් කරන්න.

3. මෙම ප්‍රකාශය සත්‍යද අසත්‍යද? පොළොව මැවීමේදී ශුද්ධාත්මයාණන්වහන්සේ එයට සහභාගී වූ සේක.

   මෙම ප්‍රකාශය :______________________

4. එක් එක් පදය සඳහා ගැලපෙන අර්ථදැක්වීම සොයා, පදය ඉදිරියෙන් එහි අංකය සඳහන්කරන්න.

**ශුද්ධ ලියවිල්ල සම්බන්දයෙන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථය.**

| | |
|---|---|
| __________ අවබෝධ කිරීම. | 1. උන්වහන්සේ මිනිස් කතෘවරුනට දේව පණිවුඩය කතාකළ සේක. |
| __________ එළිදරව්කිරීම. | 2. නූතනයෙහි මනුෂ්‍යයන්ට ශුභාරංචිය අවබෝධ කරගැනීමට උන්වහන්සේ සපයන්නාවූ උපකාර සේවාව. |
| __________ ආනුභාවය ලබාදීම | 3. පණිවුඩය නිවැරදිව ලියන පිණිස දෙවියන්වහන්සේ ලේඛකයන්ව මගපෙන්වූසේක. |

5. පාපිෂ්ඨයෙකුගේ ජීවිතය සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථය පැහැදිලි කරන ශුද්ධ ලියවිලි පාඨයක් සඳහන් කරන්න.

6. සාතන් හා සම්බන්ධව බලන කල ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය කුමක්ද?

7. මෙම පරිච්ඡේදයෙහි යේසුස්වහන්සේගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථ එකොළහක් සඳහන් විය. මින් කීයක් ඔබට නම් කළ හැකිද?

8. මෙම පරිච්ඡේදයෙහි සභාව උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථ හතක් සඳහන් විය. මින් කීයක් ඔබට නම් කළ හැකිද?

______________ ______________ ______________ ______________

______________ ______________ ______________ ______________

9. මෙම පරිච්ඡේදයෙහි ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථ විස්සක් සඳහන් විය. මින් කීයක් ඔබට නම් කළ හැකිද?

______________ ______________ ______________ ______________

______________ ______________ ______________ ______________

______________ ______________ ______________ ______________

______________ ______________ ______________ ______________

10. යම්කිසි පුද්ගලයෙකු ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් බව්තීස්මය ලබා ඇති බවට ඇති සත්‍ය සාක්ෂිය කුමක්ද?

________________________________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා.

1. ඉශ්‍රායෙල් ජාතිය උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය පිළිබඳ තව බොහෝ දෑ ඉගෙනීම සඳහා පහත සඳහන් බයිබල් කොටස් අධ්‍යයනය කරන්න.

   උත්පත්ති 41:38

   ගණන් කථාව 11:17; 11:25; 27:18

   විනිශ්චයකාරයාගේ පොත 3:10; 6:34; 11:29; 14:6,19; 15:14-15

   1 සාමුවෙල් 10:10; 11:6; 16:13

   1 රාජාවලිය 18:12

   2 රාජාවලිය 2:15-16

   එසකියෙල් 2:2

   දානියෙල් 4:9; 5:11; 6:3

   මීකා 3:8

   2 ලේකම් 15:1; 24:20

2. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථ පුනරීක්ෂණය කර බලන්න. ඔබගේ ජීවිතයෙහි මෙම අංශවලදී ශුද්ධාත්මයාණන්වහන්සේට ඔබට මෙහෙකිරීමට ඔබ ඉඩ දෙනවාද?

______________________________

______________________________

______________________________

3. සභාව උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙයන් පුනරීක්ෂණය කර බලන්න. ඔබ සහභාගිවන්නාවූ සභාවෙහි සහභාගිකම පිළිබඳව සිතා බලන්න. සභාව ශුද්ධාත්මයාණන්වහන්සේට අරමුණු ඉටුකර ගැනීමට ඉඩ සපයා ඇත්තේ කුමන ආකාරයටද? තව දියුණුවීමක් අවශ්‍ය කුමන අංශ වලින්ද?

______________________________

______________________________

______________________________

# හතරවන පරිච්ඡේදය

## ශුද්ධාත්ම බව්තිස්මය

### අරමුණු:

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් පසු

- බව්තිස්මය අර්ථදැක්වීමට
- ශුද්ධාත්ම බව්තිස්මය පුද්ගලයකු ලැබූ බවට සහතික කිරීම පිණිස ශුද්ධ ලියවිල්ල මගින් එළිදරව් කරනු ලබන විශේෂිත කාරණා තුන කුමක්ද යන්න
- ශුද්ධාත්ම බව්තිස්මය ලබාගන්නේ කෙසේද යන්න
- ශුද්ධාත්ම බව්තිස්මය ලැබුණු බවට පිටතින් හඳුනාගත හැකි ලකුණු මොනවාද යන්න
- ශුද්ධාත්ම බව්තිස්මය ලැබූ බවට සත්‍ය සාක්ෂිය විස්තරකිරීමට
- ශුද්ධාත්ම බව්තිස්මය ලබාගැනීම පිළිබඳව මාර්ගෝපදේශ
- ශුද්ධාත්ම බව්තිස්මයට එරෙහිව යොමුකරන ප්‍රධාන කාරණා හතර කුමක්ද යන්න පිළිබඳව

ඔබට දැනගැනීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය :

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

### හැඳින්වීම.

ශුද්ධවූ බයිබලයේ බව්තිස්මයන් 4 ක් ගැන කථා කරයි. ඒවා නම්:

1. යේසුස්වහන්සේ අත්දැක්කාවූ දුක්විඳීමේ බව්තිස්මය
2. යොහන් බව්තිස්ත ඉදිරිපත් කළාවූ වතුර බව්තිස්මය
3. කිතුනුවන්ගේ වතුර බව්තිස්මය
4. ශුද්ධාත්ම බව්තිස්මය

මෙම පරිච්ඡේදය තුළ වඩාත් සැලකිල්ලක් දක්වනු ලබන්නේ ශුද්ධාත්ම බව්තිස්මය පිළිබඳවය. (අනික් බව්තිස්ම තුන *"ඇදහිල්ලේ පදනම"* යන භාවස්ටයිම් අන්තර්ජාතික පාඨමාලාවේ සඳහන්ව ඇත.

### අර්ථ දැක්වීම

"Baptize" හෙවත් "බව්තිස්ම කිරීම" යන වචනයේ අර්ථය නම් යමක් තුළ සම්පූර්ණයෙන්ම ගිල්වීම හෝ යටටම ගිල්වීමයි.

### බව්තිස්මයේ පොරොන්දුව

මළවුන්ගෙන් නැගිටුනු පසු හා උන්වහන්සේ ස්වර්ගයට ඔසවාගැනීමට පෙර අතර තිබූ කාලයේදී යේසුස්වහන්සේ තම ගෝලයන් හට ඉතා වැදගත් උපදෙස් ලබා දෙන ලදි. එම උපදෙස් නම්:

**බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක. (ලූක් 24:49)**

යේසුස්වහන්සේ යොමුකළ පොරොන්දුව නම් ශුද්ධාත්මයාණන්වහන්සේට වේ: එනම්,

**මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි, එවිට උන්වහන්සේ නුඹලා සමග සදාකල්ම සිටින පිණිස වෙන සැනසිලිකාරයෙකු නුඹලාට දෙනසේක. ඒ සැනසිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්ට ලෝකයාට බැරිය; මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය; මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවති සිටිනසේක. නුඹලා තුළෙහි සිටිනසේක. නුඹලා අනාතව නාරින්නෙමි. නුඹලා වෙතට එමි. (යොහන් 14:16-18)**

මෙය අලුත ලැබුනු පොරොන්දුවක් නොවේ. ශුද්ධාත්මයාණන්වහන්සේ නමැති ත්‍යාගය පැරණි ගිවිසුම් කාලයේ සිටම පොරොන්දු වු ලද්දකි.

**එසේය, උන්වහන්සේ වියවුල් තොල්වලින්ද වෙන භාෂාවකින්ද මේ සෙනගට කථාකරනවා ඇත. උන්වහන්සේ ඔවුන්ට කථාකොට: නිවාඩුව මේය, වෙහෙස වූ අයට නිවාඩු දීපල්ලා; නිෂ්කලංකයත් මේයයි කීසේක. එහෙත් ඔව්හු අසන්ට අකමැතිවූහ. (යෙසායා 28:11-12)**

**ඉන්පසු මාංසයම වූ සියල්ලන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි; නුඹලාගේ පුත්‍රයෝද දූවරුද අනාගතවාක්‍යය කියන්නෝය, නුඹලාගේ මහල්ලෝ ස්වප්න දකින්නෝය, නුඹලාගේ යෞවනයන්ට දර්ශන පෙනෙනවා ඇත. (යොවෙල් 2:28)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබුණු බවට සාක්ෂිය

අප පෙර පරිච්ඡේදය තුළ ඉගෙන ගත් පරිදි ශුද්ධාත්මයාණන්වහන්සේට ඇදහිලිවතුන්ගේ ජිවිත වලට විවිධ අරමුණු කිහිපයක් ඇත. ප්‍රධාන අරමුණක් නම් කිතුනුවන්ව ශුභාරංචිය සඳහා බලය ලත් සාක්ෂිකරුවන් කිරීම පිණිසය.

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

ශුද්ධාත්ම බව්තිස්මයේ සාක්ෂිය ඉතා ක්ෂණිකව අපෝස්තුලුවර පේතෘස්ගේ ජිවිතයේ දක්නට ලැබුනි. පෙන්තකොස්ත දිනයට පෙර පේතෘස් බිය කරණකොටගෙන තමා විසින් යේසුස්වහන්සේ නොහඳුනන බවට ප්‍රකාශ කරන ලදි. එහෙත් ශුද්ධාත්ම බව්තිස්මය ලැබීමෙන් පසුව පේතෘස් මනුෂ්‍යයන් ඉදිරියේ බිය නොවී බලය ලත් සාක්ෂිකරුවකු බවට පත්වීම තුළින් 3000ක පමණ සෙනඟක් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගැළවීම වෙතට ගෙන ඒමට හැකිවිය. මුල් සභාව තුළ ක්‍රියා කළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය කරණකොටගෙන ලොව පුරා ශුභාරංචිය ගෙන යාමට හැකි විය. එබැවින් ක්‍රියා පොත පුරාවටම ශුද්ධාත්ම බව්තිස්මය ලැබීමේ සාක්ෂියක් වන බලවත් සාක්ෂි දැරිමේ වාර්තා සඳහන් කොට තිබේ.

## ශුද්ධාත්මයාණන්වහන්සේ තුළ බව්තිස්මය

නව ගිවිසුමේ කොටස් 7ක් තුළ "බව්තිස්ම කරනවා" නමැති වචනය ශුද්ධාත්මයාණන්වහන්සේ සමග සම්බන්ධකොට යොදාගෙන තිබේ.

ඒවා නම්:

**මම වනාහි පසුතැවිල්ල පිණිස නුඹලා වතුරෙන් බව්තිස්මකරමි. නුමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත්ය. මම උන්වහන්සේගේ වහන් ගෙනයන්ටවත් නොවටිමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන්ද ගින්නෙන්ද නුඹලා බව්තිස්මකරනසේක. (මතෙව් 3:11)**

**මම නුඹලා වතුරෙන් බව්තිස්ම කළෙමි, නුමුත් උන්වහන්සේ නුඹලා ශුද්ධාත්මයාණන්ගෙන් බව්තිස්ම කරනසේකැයි කීය. (මාර්ක් 1:8)**

**මම වනාහි වතුරෙන් බව්තීස්ම කරමි: නුමුත් මට වඩා බලවන්තයා එන සේක, උන්වහන්සේගේ වහන්වල පටිය මුදන්ටවත් මම නොවටිමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන්ද ගින්නෙන්ද නුඹලා බව්තීස්ම කරන සේක. (ලූක් 3:16)**

**මම උන්වහන්සේව නැඳින සිටියෙමි. නුමුත් වතුරෙන් බව්තීස්මකරන්ට මා එවූ තැනන්වහන්සේම මට කථාකොට: ආත්මයාණන් යමෙකු පිට බැස නවතිනවා නුඹ දකින්නෙහිද, ශුද්ධාත්මයෙන් බව්තීස්මකරන්නේ උන්වහන්සේයයි මට කීසේක. (යොහන් 1:33)**

යේසුස්වහන්සේ ශුද්ධාත්ම බව්තීස්මය ගැනද කථා කළ සේක.

**මක්නිසාද යොහන් වතුරෙන් බව්තීස්මකෙළේය: නුමුත් නුඹලා මෙයින් නොබෝ දවසක් ගිය පසු ශුද්ධාත්මයෙන් බව්තීස්මකරනු ලබන්නහුයයි කීසේක. (ක්‍රියා 1:5)**

පේතෘස් විසින් කෝර්නේලියස්ගේ නිවෙස්දී සිදුවුනාවූ කාරණා පිළිබඳව කථා කිරීමේදී ඔහු යේසුස්වහන්සේගේ වචන උපුටා දක්වන ලදි.

**එකල: යොහන් වතුරෙන් බව්තීස්මකෙළේය, නුඹලා ශුද්ධාත්මයෙන් බව්තීස්ම ලබන්නහුයයි ස්වාමින්වහන්සේ කී වචනය මට මතක්විය. (ක්‍රියා 11:16)**

පාවුල්තුමාද ශුද්ධාත්මයාණන්වහන්සේ සම්බන්ධ කර කථා කිරීමේදී බව්තීස්මය නමැති වචනය භාවිත කර ඇත:

**මක්නිසාද යුදෙව්වරු නොහොත් ග්‍රීක්වරු වේත්වා, දාසයෝ නොහොත් නිර්දාසයෝ වේත්වා, අපි සියල්ලෝ එකම ආත්මයාණන්වහන්සේ තුළ එකම ශරීරයට බව්තීස්මකරනු ලැබ, සියල්ලෝ එකම ආත්මයාණන්ගෙන් පොවනු ලැබීමුව. (1 කොරින්ති 12:13)**

කිතුනුවන්ගේ වතුර බව්තීස්මය විස්තර කිරීමට යොදාගන්නා ආකාරයටම ශුද්ධාත්මයාණන් තුළට "බව්තීස්ම කරන්න" යන්න විස්තර කිරීමටද යොදාගත හැකිය. මෙම අවස්ථා දෙකෙහිදීම බව්තීස්මය යනු අභ්‍යන්තරයේ සිදුවන ආත්මික අත්දැකීමක පිටතින් කරනු ලබන සනාථ කිරීමකි.

ජුදෙව්වන්ගේ නියමයට අනුව ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාදෙන ලද්දේ පෙන්තකොස්ත මංගල්‍යය පවත්වන වකවානුව තුළය. එබැවින් ශුද්ධාත්ම බව්තීස්මය නිතරම හඳුන්වන්නේ "පෙන්තකොස්ත අත්දැකීම" යනුවෙන් වන අතර මෙය ලබාදුන් දිනය "පෙන්තකොස්ත දිනය" යනුවෙන්ද හඳුන්වයි.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ස්වර්ගයෙන් පැමිණි පෙරුසලමේ උඩුමහල් මැදුරේ රැස්ව සිටි ඇදහිලිවතුන් සම්පූර්ණයෙන් ගිල්ලුවෝය. මොවුන් යේසුස්වහන්සේ අණ කළ ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීම බලා සිටින ලදි. පේතෘස් ප්‍රකාශ කළේ මෙම අත්දැකීම දෙවියන්වහන්සේගේ පොරොන්දුව ඉෂ්ඨ වීමක් ලෙසටය. "අන්තිම දවස්වලදී මාගේ ආත්මය සියලු මනුෂ්‍යයන් පිට වගුරුවන්නෙමි". මෙය යොවෙල් දිවැසිවරයා පවසා තිබේ.

**ඉන්පසු මාංසමයවූ සියල්ලන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි: නුඹලාගේ පුත්‍රයෝද දූවරුද අනාගතවාක්‍ය කියන්නෝය, නුඹලාගේ මහල්ලෝ ස්වප්න දකින්නෝය, නුඹලාගේ යෞවනයන්ට දර්ශන පෙනෙනවා ඇත. ඒ දවස්වලදී දාසයන් හා දාසීන් කෙරෙහි පවා මාගේ ආත්මය වගුරුවන්නෙමි. (යෝවෙල් 2:28-29)**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැගිරීමට ගැහැණු, පිරිමි, බාල, මහලු ලොකු කුඩා සියලු දෙනාම ලබා ඇතුළත් වන බව පවසා තිබේ. ඔවුන් සිහින දකින්නටත් අනාගතවාක්‍යයන් පවසන්නටත් දර්ශන දකින්ටත් යනවා ඇත. ශුද්ධාත්ම බලය මගින් දාසයන් (පිරිමි) හා දාසීන් (ගැහැණු) යන කොටස් දෙකම බලවත් කරනු ලැබේ. පේතෘස් තමා හට ශුද්ධාත්ම බෞතිස්මය ලැබුනු දින පැවසුවේ :

**පේත්‍රුස් නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබාපල්ලා: එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. මක්නිසාද ඒ පොරොන්දුව නුඹලාටත් නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමිවූ දෙවියන්වහන්සේ යම් පමණ දෙනෙකු උන්වහන්සේ වෙතට කැඳවනසේක්ද දුර සිටින්නාවූ ඒ සියල්ලන්ටත්යයි කියා, (ක්‍රියා 2:38-39)**

පේතෘස් පැවසූ වචනවලට අනුව ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබීමේ පොරොන්දුව තුළින් හෙළිදරව් කරන කාරණා නම්:

එය ජාතීන් වෙත ලබා දුන් පොරොන්දුවකි: "ඔබ වෙතට" (යුදෙව් ජාතිකයන් වෙත)
එය පවුල් වලට ලබා දෙන පොරොන්දුවකි: "ඔබගේ දරුවන්ට"
එය මුළු ලෝකය පුරා විසිරී සිටින සියල්ලන් වෙත ලබා දුන් පොරොන්දුවකි: "ලෝකය පුරා විසිරී සිටින සියල්ලන් වෙත"

## බාහිර සලකුණ

ශුද්ධාත්මයාණන්වහන්සේ පියවි ඇසට නොපෙනේ. යේසුස්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේව සුළඟ සමග සසඳා ඇත.

> **සුළඟ කැමති කැමති තැනට ගසයි, එහි ශබ්දය නුඹට ඇසෙයි, නුමුත් කොතැනින් එන්නේද කියාවත් කොතැනට යන්නේද කියාවත් නුඹ දන්නේ නැත. ආත්මයාණන්ගෙන් ඉපිද සිටින සියල්ලෝම එසේමයයි කීසේක. (යොහන් 3:8)**

සුළඟ නැමති බලවේගය අපට දැක ගත නොහැකි වුවද එමගින් ඇති කරන බලපෑම ඇසිමට හා දැකිමට හැකිය. සුළඟ දසත හමා යනු බලන විට අහසේ වළාකුළු එක පැත්තකට යනු ඇත. පොළොවේ තිබෙන දූවිලි ඉහළට එසවෙනු ඇත. ගස්වල අතු එක පැත්තකට නැවෙනු ඇත. කොළ වලින් ශබ්දයක් එනු ඇත. මුහුදේ රැළි තුළින් ශබ්දයක් එනු ලබයි. මේවා සියල්ල සුළගේ බාහිර සලකුණු වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ සමගද එසේම වේ. ශුද්ධාත්මයාණන්වහන්සේද අපට දකගත නොහැකි පුද්ගලයෙක් වුවද උන්වහන්සේ මගින් ඇති කරනු ලබන බලපෑම ඇසිමට හා දැකිමට හැකිය.

ශුද්ධාත්ම බෞතිස්මය පුද්ගලයන් ලැබූ කල ඔවුන්ට කුමක් සිදුවූයේ ද යන වග නව ගිවිසුමේ ස්ථාන 3 ක සඳහන් කරන අතර ඒවා පහත දැක්වේ :

### 1) පෙන්තකොස්ත දිනයේදී :

පෙන්තකොස්ත දිනයේදී කුමක් සිදුවූයේද යන්න ක්‍රියා 2:2-4 දක්වා කොටස තුළ වාර්තා කරයි.

> **තද සුළඟක් හමන්නාක් මෙන් ශබ්දයක් අහසෙන් හදිසියෙන් පැමිණ එයින් ඔවුන් ඉඳගෙන උන්නාවූ මුළු ගෙය පිරුණේය. ගිනි වැනි වූ දිව් බෙදී යනවා ඔවුන්ට පෙනුණේය. එය ඔවුන් එක්එක්කෙනා කෙරෙහි පිහිටුණේය. ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව ආත්මයාණන් ඔවුන්ට කතාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍යභාෂාවලින් කතාකරන්ට පටන්ගත්තෝය. (ක්‍රියා 2:2-4)**

### 2. කොර්නේලියස්ගේ නිවසේදී

කොර්නේලියස් හා ඔහුගේ පවුලේ අය වෙත පේත්‍රුස් ශුභාරංචිය දේශනා කළ විට, කුමක් සිදුවූයේද යන්න ක්‍රියා 10:44-46 දක්වා කොටසෙහි වාර්තා කරයි.

> **පේත්‍රුස් මේ වචන කථාකරද්දීම වචනය ඇසූ සියල්ලන් කෙරෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ පහළවූසේක. පේත්‍රුස් සමග ආවාවූ චර්මඡේදිත ඇදහිලිවන්තයෝ අන්‍යජාතීන් කෙරෙහිත් ශුද්ධාත්ම දීමනාව වගුරුවනු ලැබූ බැවින් විස්මිතවූවෝය. මක්නිසාද ඔවුන් අන්‍යභාෂාවලින් කථාකරනවාත් දෙවියන්වහන්සේ වර්ණනා කරනවාත් ඔවුන්ට ඇසුණේය. එවිට පේත්‍රුස් උත්තරදෙමින්: අපට ලැබුණාක් මෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබූ මොවුන් බව්තිස්ම කරනු නොලබන පිණිස වතුර තහනම් කරන්ට කාට පුළුවන්දැයි කීවේය. (ක්‍රියා 10:44-46)**

### 3. එපීසයේ දී ගැලවීම ලැබූ සෙනඟ ගැන :

එපීසයේදී ගැලවීම ලැබූ පළමු කණ්ඩායමට කුමක් සිදුවූයේද යන්න ක්‍රියා 19:6 බයිබල් කොටසින් පෙන්වා දෙයි.

**පාවුල් ඔවුන් පිට අත් තැබූ කල ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන් කෙරෙහි පැමිණීසේක. ඔව්හු අන්‍යභාෂාවලින් කථාකරමින් අනාගතවාක්‍ය කීවෝය. (ක්‍රියා 19:6)**

## පොදු සලකුණක් : අන්‍යභාෂාවන්

ඉහත සඳහන් කල අවස්ථා 3 සසදා බලන විට මෙම අවස්ථා 3 ටම පොදුවන එක් බාහිර සලකුණක් තිබේ. එය නම් ශුද්ධාත්ම බෞතිස්මය ලැබුවන් විසින් අන්‍ය භාෂාවන් වලින් කථා කිරීමට පටන් ගත්තෝය. වෙනත් අධිස්වාභාවික සලකුණු මෙහි වාර්තා කර තිබුනත් ඒවා මෙම සිදුවීම් තුනෙහිදීම පෙන්නුම් කර නොමැත.

පෙන්තකොස්ත දිනයේදී විශාල සුළඟක් හමා ගිය අතර ඔවුන් එකිනෙකා මත ගිනි සිළු වැනි දව් දැකගත හැකිවිය. මෙම සිදුවීම අනෙක් අවස්ථාවන් දෙකෙහි වාර්තා කොට නොමැත. එපීසයේ අලුතෙන් ගැලවීම ලැබූ පුද්ගලයන් අනාගතවාක්‍ය පැවසිය. එය කොරනේලියස්ගේ ගෙදර හා පෙන්තකොස්ත දිනය තුල සිදුවීම් සමග වාර්තා නොකරයි.

කොර්නේලියස්ගේ ගෙදර සිටි පුද්ගලයන් සහ ඔහුගේ පවුලේ අය පිළිබඳව අපෝස්තුළුවරුන් දැක්කාවූ පිටස්තර ලකුණ නම් අන්‍යභාෂා වලින් කථා කිරීම විය. අපෝස්තුළුවරුන්ට මෙම පවුලේ අය ශුද්ධාත්ම බෞතිස්මය ලැබූ බවට සාක්ෂිය වුයේ මෙම පිටස්තර ලකුණ විය. එබැවින් මෙම බයිබලිය වාර්තාවන් තුළින් නිගමනය කළ හැකි විශේෂිත කරුණක් නම් අන්‍යභාෂා කථනය නැමැති දීමනාව ශුද්ධාත්ම බෞතිස්මය පුද්ගලයෙකු වෙතට ලබුණු බවට ස්ථිර කරනු ලබන ලකුණක් බවයි.

"අන්‍යභාෂා" නැමැති සලකුණ මනුෂ්‍යයන් දන්නා භාෂාවක් විය හැක. පෙන්තකොස්ත දිනයේදී සිදුවුයේ මෙයයි.

**ඔවුන් සියල්ලෝ විස්මිතව පුදුමවී: බලව, මේ කථාකරන සියල්ලෝ ගලීලයෝ නොවෙද්ද? අප උපන් දේශවල අප එකිනෙකාගේම භාෂාවෙන් ඔවුන් කථාකරනවා කෙසේ අසමුද?**
**(ක්‍රියා 2:7-8)**

එමෙන්ම අන්‍යභාෂා මනුෂ්‍යයන්ට නොතේරෙන භාෂාවක්ද විය. එබැවින් මෙය අන් භාෂාවක් යයි හඳුන්වනු ලැබේ.

**මක්නිසාද අන් භාෂාවකින් කථාකරන්නා මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේට කථාකරන්නේය: ඔහු ආත්මයෙන් රහස් කථාකරන නුමුත් කාටවත් තේරෙන්නේ නැත. (1 කොරින්ති 14:2)**

## අන්‍යභාෂාවන්ගේ අරමුණු

ඇදහිලිවන්තයෙකු ශුද්ධාත්ම බෞතිස්මය ලබා ගැනීමෙන් පසුව ලැබෙන්නාවූ අන්‍යභාෂා සඳහා අරමුණු බොහොමයක් තිබේ. එය කුමක්ද යන්න දැන ගැනීම පිණිස ඔබගේ බයිබලයේ 1 කොරින්ති 14 පරිච්ජේදයට පෙරලා ගන්න. පුද්ගලයෙකු අන්‍යභාෂාවෙන් කථාකිරීමේ සමහර අරමුණු කිහිපයක් නම්:

- දෙවියන්වහන්සේට යාච්ඤා කිරීමට 2 වන පදය

තමාගේ ගොඩනැංවීම උදෙසා : ඔබව ඔබම වර්ධනය කරගැනීම සහ ආත්මික දැනුම වැඩි දියුණු කරගැනීම. 4 පදය:

- මෙය පරිවර්ථනය කරනු ලැබූ කල සභාව ධෛර්යමත් කරවයි. 12-13 පද.
- මැදිහත්කාරකම් කිරීමට - 14 පදය (රෝම 8:26-27 බලන්න.)
- නොඇදහිලිවන්තයිනට සලකුණකි : 22 පදය.
- අනාගතවාක්‍ය සම්පුර්ණවීම : 21 පදය (යෙසායා 28:11-12 බලන්න.)
- ප්‍රශංසාව : 15,17 පද.

## අන් භාෂාව වලට විරුද්ධත්වය පෑම.

සමහරු අන් භාෂාවලින් කතාකිරීමට විරෝධතාවය දක්වති. එවන් විරුද්ධත්වයක් දක්වන කරුණු කිහිපයක් පහතින් දැක්වේ.

### සෑම කිතුබැතියෙකු සතුව ශුද්ධාත්මයාණන්වහන්සේ ඇත:

අසන්නට ලැබෙන සුලභ විරුද්ධත්වයක් නම්, සෑම කිතුබැතියෙකු ගැලවීම ලැබූ කල ශුද්ධාත්මයාණන්වහන්සේද ලබන බවය. ඔහුට තවදුරටත් ශුද්ධාත්ම බව්තිස්මය ලැබීමේ අත්දැකීමක් අවශ්‍ය නොවන බව අදහස් කරයි. එහෙත් අලුත් ගිවිසුමෙහි සැබෑ ඇදහිලිවන්තයන්ව සිටි මිනිසුන්ගේ උදාහරණය බලන්න. ප්‍රේරිතවරු තමුන්ගේ පාප පිලිබඳව පසුතැවිලි වී යේසුස්වහන්සේව මෙසියස්වහන්සේ බවට විශ්වාස කළහ. ඔව්හු යේසුස්වහන්සේගේ මරණය, සොහොනෙහි තැන්පත් තිරීම, මළවුන්ගෙන් උත්ථානවීම සියැසින් දැක සත්‍ය බවට පිළිගත්හ. එහෙත් යේසුස්වහන්සේ තම අනුගාමිකයනට පැවසුවේ :

> **බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක.** (ලූක් 24:49)

උන්වහන්සේ මෙසේ පැවසූසේක :

> **මක්නිසාද යොහන් වතුරෙන් බව්තිස්ම කෙළේය; නුමුත් නුඹලා මෙයින් නොබෝ දවසක් ගිය පසු ශුද්ධාත්මයෙන් බව්තිස්මකරනු ලබන්නහුයයි කීසේක.** (ක්‍රියා 1:5)

උන්වහන්සේ පොරොන්දු වි තිබූ ශුද්ධාත්මයෙන් බව්තිස්ම වීමේ අත්දැකීම ලැබුණේ පෙන්තකොස්ත දිනයේදීය.

> **ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථාකරන්ට පටන්ගත්තෝය.** (ක්‍රියා 2:4)

ප්‍රේරිතවරු කිතුබැතියන්ව සිටි නමුත් පෙන්තකොස්ත දින වන තෙක් ඔවුන් ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් (බව්තීස්මය) පූර්ණකරනු ලැබ නොසිටියහ.

සමාරියේ ජනතාව ශුභාරංචිය දේශනා කරනු ඇසූහ. ඔවුහු විශ්වාස කොට වතුරෙන් බව්තිස්මය ලදහ; නමුත් ඔවුහු ශුද්ධාත්මයාණන්වහන්සේ ලබා නොසිටියහ.

> **සමාරියයන් දෙවියන්වහන්සේගේ වචනය පිළිගත් බව යෙරුසලමේ සිටියාවූ ප්‍රේරිතයෝ අසා, පේත්‍රැස් හා යොහන් ඔවුන් ළඟට යැවුවෝය. ඔව්හු එහි ගොස් ඔවුන්ට ශුද්ධාත්මය ලැබෙන ලෙස ඔවුන් උදෙසා යාච්ඤා කළෝය. මක්නිසාද, ඔවුන් ස්වාමිවූ යේසුස්වහන්සේගේ නාමයට බව්තිස්මකරනු ලැබූවා මිස, ශුද්ධාත්මය ඒ වන තුරු ඔවුන්ගෙන් කිසිවෙකු කෙරෙහි පැමිණී තිබුණේ නැත. ප්‍රේරිතයන් ඔවුන් කෙරෙහි අත් තැබූ කල, ඔවුන්ට ශුද්ධාත්මය ලැබුණේය.** (ක්‍රියා 8:14-17)

සමාරියේ ජනතාවට ශුභාරංචිය ලැබුණේ පිලිප්ගේ සේවාව තුළිනි. ඔව්හු ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබුයේ පේතෘස් සහ යොහන්ගේ සේවාව තුළිනි. ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබීම ගැලවීම ලැබීමට අමතර වූ වෙනස් අත්දැකීමක් විය.

ක්‍රියා 19:1-6 හි පාවුල් එපීස නගරයට ගිය ආකාරයත් තමුන් "ගෝලයන්" යැයි හඳුන්වාගත් සෙනග කොටසක් හමුවූ ආකාරයත් විස්තර කරයි. පාවුල් ඔවුන්ගෙන් ඇසූ පළමු ප්‍රශ්නය වූයේ "ඔබ අදහාගත් පසු ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබූවෝද"? යනුයි.

මනුෂ්‍යයන් ගැලවීම ලැබීමත් සමගම ශුද්ධාත්මයාණන්වහන්සේ ද ලබයි නම් පාවුල් මෙවැනි ප්‍රශ්නයක් ඇසීම මෝඩකමකි. ඔහු එම ප්‍රශ්නය ඇසීමෙන් තහවුරු වනුයේ මිනිසුන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය නොලබා ගැලවීම ලබන බවය. යම්කිසි පුද්ගලයෙකු ගැලවීම ලබන මොහොතෙහිදීම ශුද්ධාත්ම බව්තිස්මය ලැබූවද, ඒ දෙක එකිනෙකට වෙනස් අත්දැකීම් දෙකක් වනු ඇත.

ඔබ මීට පෙර ඉගෙන ගත් පරිදි ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය ලොව මැවීම ආරම්භයේ සිට දැකිය හැක. පැරණි ගිවිසුමෙහි ඉශ්‍රායෙල්හි නායකයන් මතට ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණීම පිළිබඳ පවසයි. එසේම පව්කරුවෙකුව ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන ඒමටද ශුද්ධාත්මයාණන්වහන්සේ ක්‍රියාත්මක වේ.

එනමුත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙම සේවාවන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මට වෙනස්ය. යේසුස්වහන්සේ පහත සදහන් ලෙස ප්‍රකාශ කරමින් එය පැහැදිලි කළසේක.

> **ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්ට ලෝකයාට බැරිය: මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය: මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවතී සිටිනසේක, නුඹලා තුළෙහි සිටිනසේක. (යොහන් 14:17)**

ශුද්ධාත්මයාණන්වහන්සේ ගෝලයන් සමග එකල සිටි නමුත්, ඔවුන් තුළ නොවීය. ඔව්හු ශුද්ධාත්මයෙන් පූර්ණ කරනු ලැබුයේ (බව්තිස්ම) පෙන්තකොස්ත දිනයෙහිදිය.

පව්කරුවෙකුව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ඇදගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහු සමග සිටී. එහෙත් එය උන්වහන්සේ ඔහු තුළ සිටීමට වඩා වෙනස්ය.

පැරණි ගිවිසුම් යුගයේ ආත්මික නායකයන් මතට විශේෂ අවස්ථාවන්හිදී විශේෂ කාර්යයන් උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය වැඩිය සේක. අලුත් ගිවිසුම් යුගයෙහිදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙම බලය ඇදහිලිවතුන් හට සදාකාලිකව ලබා දුනි.

පැරණි ගිවිසුම් යුගයෙහි ආත්මික නායකයන් සමග ශුද්ධාත්මයාණන්වහන්සේ සිටි නමුත් ඔවුන් තුළ නොවීය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙයෙහි පැරණි ගිවිසුම් යුගය හා අලුත් ගිවිසුම් යුගය අතර පවතින වෙනස මෙය වේ.

## සියල්ලෝම අන් භාෂා කථාකරන්නෝද?

අන්භාෂාවට විරුද්ධත්වය පවතින තවත් විරෝධතාවයක් පදනම් කරගෙන ඇත්තේ පාවුල් ඇසූ ප්‍රශ්නයක් වැරදි අයුරින් වටහා ගැනීමෙනි. 1 කොරින්ති 12:30 හි පාවුල් "සියල්ලෝම අන් භාෂා වලින් කථා කරන්නේද ?"යි ප්‍රශ්න කළේය. එම ප්‍රශ්නයට පිළිතුරු වනුයේ "නැත, සියල්ලෝම අන් භාෂා කථා නොකරති". නමුත් මෙතැනදී පාවුල් සාකච්ඡා කරනුයේ ශුද්ධාත්ම බව්තිස්මය නම් අත්දැකීම පිළිබඳව නොව ආත්මික දීමනා එනම් ඇදහිලිවතුනට සභාවෙහිදී භාවිතා කළහැකි දීමනා පිළිබඳවය.

> **ඉදින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝද වෙති. මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්චර්ය කරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුද නානා වර්ග භාෂාද සභාවෙහි පිහිටෙවූසේක. (1 කොරින්ති 12:27-28)**

පාවුල් පවසන්නේ සභාවෙහි සාමාජිකයන් හට සභාවෙහිදී භාවිතා කළහැකි ආත්මික දීමනාවන් පිළිබඳවය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවලින් එකක් නම්, "විවිධ භාෂාවන්ය." එය ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් යුක්තව සභාව උදෙසා අන් භාෂාවලින් විශේෂ පණිවුඩ දීමට ඇති හැකියාවය.

ශුද්ධාත්ම බව්තිස්මයෙහිදී සෑම කෙනෙකුම අන් භාෂා සංකේතය ලබන නමුත්, සියලු දෙනාම "විවිධ භාෂා" විශේෂ දීමනාව නොලබති. (මෙම මාතෘකාව නව වන පරිච්ඡේදයෙහිදී සාකච්ඡාවට යොමුවේ.)

## බිය :

සමහර ඇදහිලිවන්තයෝ ශුද්ධාත්ම බව්තිස්මය ලැබීමට නොසොයන්නේ දෙවියන්වහන්සේගෙන් නොවූ අත්දැකීමක් තමුන්ට හිමි වේ යැයි පවතින බිය නිසාය. බයිබලය මේ පිළිබඳව පවසනුයේ :

> **ඉල්ලාපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ: සොයාපල්ලා, එවිට නුඹලාට සම්බවේ: තට්ටුකරපල්ලා, එවිට නුඹලාට දොර හරිනු ලැබේ, මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලබේ: සොයන්නාට සම්බවේ: තට්ටුකරන්නාට දොර හරනු ලැබේ, නුඹලා අතරෙන් කවර මනුෂ්‍යයෙක් තමාගේ පුත්‍රයා රොටියක් ඉල්ලන්නේ නම්, ඔහුට ගලක් දේද? නොහොත් ඔහු මත්ස්‍යයෙකු ඉල්ලන්නේ නම්, ඔහුට සර්පයෙකු**

**දේද? මෙසේ නපුරුවූ නුඹලා නුඹලාගේ දරුවන්ට යහපත් දේ දෙන්ට දන්නහු නම්, කොපමණ වැඩියෙන් ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ තමන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට යහපත් දේ නොදෙනසේක්ද? (මතෙව් 7:7-11)**

ඇදහිලිවන්තයෙක් ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් යමක් ඉල්ලූ විට, මිහිපිට සිටින යහපත් පියෙකු වාගේම දෙවියන්වහන්සේද ඔහුට හිංසාකාරී දෙයක් නොදෙනු ඇත.

## හැඟීම් දනවන අත්දැකීම :

අන්භාෂාවලට එරෙහිව ඇති තවත් චෝදනාවක් නම්, එය හැඟීම් උපදවන අත්දැකීමක් බවය. ශුද්ධාත්ම බව්තීස්ම අත්දැකීම ලබන බොහෝ ඇදහිලිවන්තයෝ එම අත්දැකීමට තමුන්ගේ චිත්ත ආවේග හැඟීම් මුසු කරමින් අවධාරණය කරති.

මිනිසා චිත්ත ආවේග සහිත ජීවියෙකි. කෙනෙකු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට හැරීමෙන් ඔහුගේ හැගීම් නැති නොවේ. ඔහුට ප්‍රීතිය මෙන්ම දුකද දැනේ. ක්‍රිස්තුස්වහන්සේ වෙතට හැරීම ලැබීම මගින් මිනිසාගේ හැඟීම් සාතන්ගේ පාලනයෙන් නිදහස් වේ. ඉන්පසු එම හැඟීම් දෙවියන්වහන්සේව නමස්කාර කිරීම වෙතට නැවත යොමුවේ.

ශුද්ධ ලියවිල්ලෙහි "ප්‍රීතිය" යන වචනය ඉතා සමීප ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේ හා සමග බැඳේ. ක්‍රියා 13:52 හි සඳහන් පරිදි "ගෝලයෝ මහත් ප්‍රීතියෙන් හා ශුද්ධාත්මයෙන් පූර්ණවූහ." සමහර මනුෂ්‍යයෝ ස්වභාවයෙන්ම පහසුවෙන් තම හැගීම් ප්‍රකාශයට පත් කරති. මෙවන් පුද්ගලයෝ ශුද්ධාත්ම බව්තීස්මයත් සමග හිමිවන මහත් ප්‍රීතියට වැඩියෙන් ප්‍රතිචාර දක්වති. ඔව්හු තම හැඟීම් බලවත්සේ ප්‍රකාශවීමට ඉඩ හරිති. සමහර විට ඔව්හු ශබ්දනැගීමට, සිනහවීමට හෝ තම සිරුර පුරා වින්දනයත් අත් දැකීමට පෙලඹෙති.

එහෙත් මෙවන් වූ හැඟීම් උද්දීපනය වීම ශුද්ධාත්ම බව්තීස්මය ලැබීමේ සංකේතය ලෙස පිළිගත නොහැක. ශුද්ධාත්ම බව්තීස්මය ස්ථිර කරන සලකුණ නම් අන් භාෂාවය. එයට ඇති සාක්ෂිය නම් බලය වේ. ශුද්ධාත්ම බව්තීස්මය ලැබීමට ආවේගශීලි ලෙස සිනහවීම, කෑගැසීම, නැටීම වැනි දෑ අවශ්‍ය නොවේ. කිසියම් පුද්ගලයෙකු ශුද්ධාත්ම බව්තීස්ම අත්දැකීම නිසා ලබන ප්‍රීතියට චිත්තවේග තුළින් ප්‍රතිචාර දැක්වීම එම පුද්ගලයාගේ පෞද්ගලික ආවේගශීලි බව මත රැඳී පවතී.

එනමුත් ශුද්ධාත්මයාණන්වහන්සේට චිත්තවේගී හැඟීම් ඇසුරින් තම ප්‍රීතිය ප්‍රකාශ කරන්නාවූ පුද්ගලයින්ව ඔබ කිසිවිට විවේචනයට ලක් නොකළ යුතුය. දෙවියන්වහන්සේ සමග අත්දැකීම් ලද මනුෂ්‍යයන් චිත්තවේගී හැඟීම් ප්‍රබල ලෙස දැක්වූ අවස්ථාවන් පිළිබඳව බයිබලයේ වාර්තාකොට තිබේ. මනුෂ්‍යයෝ දෙවියන්වහන්සේ ඉදිරියෙහි වෙව්ලූහ, මුහුණින් වැතුරුණහ, කෑගැසූහ, ප්‍රීතිවූහ, නැටූහ.

විවිධ ක්‍රීඩා තරඟ නරඹන කල මනුෂ්‍යයන් එයට දක්වන ප්‍රතිචාර නිරීක්ෂණය කිරීම ඉතා සිත්ගන්නා සුළුය. තරගය නරඹන අතර සමහරු ඝෝෂා කරති, සිනහවෙති, උඩ පනිති, එම තරගය හෝ ක්‍රීඩාව පිළිබඳව මහත් උද්යෝගයෙන් හැසිරෙති. එසේ නම් අපගේ ජීවිතයෙහි බොහෝ පරමාර්ථ ඉටුකර දෙන, මහත් ප්‍රීති උපදවන, ලෝකයට ශුභාරංචිය පැතිරවීමට අපව බලවත් කරන සන්නද්ධ කරන ශුද්ධාත්ම දීමනාව පිළිබඳව අප මීට කොපමණ වැඩියෙන් උද්යෝගිමත් විය යුතු නොවේද.

දාවිත් නම් ගීතිකාකරු මීට එකගතාවය දැක්විය. ඔහු අපට දේව නමස්කාරය ප්‍රීතිමත්, ශබ්දනගා, හැඟීමෙන් යුතුව කළ දෙයක් බවට රූපයක් ඉදිරිපත් කරයි.

**එව්, ස්වාමීන්ට ගායනා කරමු. අපේ ගැළවීමේ පර්වතයට ප්‍රීති ඝෝෂා පවත්වමු. ස්තුති දෙමින් උන්වහන්සේ ඉදිරියට පැමිණෙමු, ගීතිකාවලින් උන්වහන්සේට ප්‍රීතිනාද පවත්වමු. මක්නිසාද ස්වාමීන්වහන්සේ මහත් දෙවිකෙනෙක්ය. සියලු දෙවිවරුන්ට වඩා මහත් රජ කෙනෙක්ය. (ගීතාවලිය 95:1-3)**

**හොරණෑ ශබ්දයෙන් උන්වහන්සේට ප්‍රශංසාකරව්. කුඩා වීණාව හා මහා වීණාවෙන් උන්වහන්සේට ප්‍රශංසාකරව්. රබානෙන් හා නැටීමෙන් උන්වහන්සේට ප්‍රශංසාකරව්. වීණා තතින් හා නළාවෙන් උන්වහන්සේට ප්‍රශංසාකරව්. මහත් ශබ්ද දෙන අත්තලින් උන්වහන්සේට ප්‍රශංසාකරව්. උස් රාව් දෙන අත්තලින් උන්වහන්සේට ප්‍රශංසාකරව්. හුස්ම ඇති සියල්ලෝම ස්වාමීන්ට ප්‍රශංසාකෙරෙත්වා. ස්වාමීන්ට ප්‍රශංසාකරව්. (ගීතාවලිය 150:3-6)**

ශුද්ධාත්ම බව්තීස්මය මගින් ඔබට නුසුදුසු යමක් කිරීමට හෝ ඔබව පාලනයෙන් තොරව ක්‍රියා කිරීමට යොමු කරාවි යයි බිය විය යුතු නොවේ.

අන් භාෂාවෙන් කථාකිරීම ගැන උගන්වන කල "නිශ්ශබ්දව සිටීමටත්" "සංවරව සිටීමටත්" කාලයක් ඇති බව පාවුල් පැවසීය. (1 කොරින්ති 14). ශුද්ධාත්මයාණන්වහන්සේ මනුෂ්‍යයන්ව පාලනයෙන් තොර බවට පත් කරයි නම් පාවුල් මෙම ප්‍රකාශය නොකරනු ඇත. බයිබලය පවසනුයේ :

> **ධර්මවාක්‍ය කියන්නන්ගේ ආත්ම ධර්මවාක්‍ය කියන්නන්ට යටත්ව තිබේ.**
> **(1 කොරින්ති 14:32)**

මෙහි අර්ථය නම් දෙවියන්වහන්සේ දෙන්නාවූ ඕනෑම දීමනාවක් එය භාවිතා කරන්නාගේ පාලනය යටතෙහි පවතින බවය. දෙවියන්වහන්සේ කිසිම දෙයක් වියවුල් ලෙස නුසුදුසු ලෙස නොකරන සේක.

> **මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල්කමේ නොව සමාදානයේ දෙවියන්වහන්සේය: ශුද්ධවන්තයන්ගේ සියලු සභාවන්හි එසේමය. (1 කොරින්ති 14:33)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගැනීම.

ශුද්ධාත්ම බව්තීස්මය ලබාගැනීමට උපදෙස් පහතින් දක්වා ඇත.

### පසුතැවිලි වී බව්තීස්මය ලබන්න :

> **පේත්‍රුස්: නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබාපල්ලා: එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. (ක්‍රියා 2:38)**

### එය ඔබ සඳහා බව විශ්වාස කරන්න :

> **මක්නිසාද ඒ පොරොන්දුව නුඹලාටත් නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමිවූ දෙවියන්වහන්සේ යම් පමණ දෙනෙකු උන්වහන්සේ වෙතට කැඳවනසේක්ද දුර සිටින්නාවූ ඒ සියල්ලන්ටත්යයි කියා, (ක්‍රියා 2:39)**

### එයට ආශාවන්න :

> **මංගල්‍යයේ මහත් දවසවූ අන්තිම දවසේ යේසුස්වහන්සේ නැගිට ශබ්ද පවත්වමින්: යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ. මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයැයි කීසේක. උන්වහන්සේ මෙසේ කීවේ තමන් අදහාගත්තවුන් විසින් ලබන්ට සිටිය ආත්මයාණන් ගැනය. මක්නිසාද යේසුස්වහන්සේ ඒතාක්ම මහිමයට නොපැමිණි බැවින් ඒතාක්ම ආත්මයාණන් නොදෙනලද්දේය. (යොහන් 7:37-39)**

### එය ත්‍යාගයක් ලෙස පිළිගන්න :

ශුද්ධාත්මයාණන්වහන්සේ දැනටමත් ලබා දී ඇත. පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන්වහන්සේ සභාවට පිරිනමන ලදී. ශුද්ධාත්මයාණන්වහන්සේ දීමනාවක් බැවින් උන්වහන්සේ උපයාගැනීම සඳහා ඔබට කළහැකි කිසිත් නොමැත.

> **පේත්‍රුස් නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබාපල්ලා: එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. (ක්‍රියා 2:38)**
>
> **නුඹලාගෙන් මේක පමණක් දැනගන්ට කැමැත්තෙමි: එනම්, නුඹලා ආත්මයාණන්වහන්සේ ලැබුවේ ව්‍යවස්ථාවේ ක්‍රියා කරණකොටගෙනද? නොහොත් ඇදහිල්ලේ පණිවිඩය කරණකොටගෙනද? නුඹලා මෙපමණ අඥාණද?**
> **ඉදින් නුඹලාට ආත්මයාණන්වහන්සේ දෙන්නාවූ, නුඹලා අතරෙහි ආශ්වර්යයන් කරන්නාවූ තැනන්වහන්සේ එසේ කරන්නේ ව්‍යවස්ථාවේ ක්‍රියාවලින්ද? නොහොත් ඇදහිල්ලේ පණිවිඩය කරණකොටගෙනද?**

**මෙසේ කළේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ආබ්‍රහම්ගේ ආශිර්වාදය අන්‍යජාතීන් කෙරෙහි පැමිණෙන පිණිසත්, ඇදහිල්ල කරණකොටගෙන අප විසින් ආත්මයාණන්වහන්සේ නැමති පොරොන්දුව ලබාගන්නා පිණිසත්ය.** (ගලාති 3:2,5,14)

ශුද්ධාත්ම දීමනාව පිළිබඳව දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා කිරීමට අරඹන්න.

## දෙවියන්වහන්සේට යටහත්වන්න :

ස්තුති ප්‍රශංසාවෙන් ඔබගේ දිව දෙවියන්වහන්සේට යටත් කරන්න. ඔබ දෙවියන්වහන්සේට ශබ්දනගා ප්‍රශංසා කරන විට පළමුව ඔබගේ තොල් ගොත ගැසීමට පටන්ගනීවි. ඔබ තවදුරටත් එතුමාට ප්‍රශංසාවෙන් දිව යටහත් කරන විට ඔබ නොදන්නාවූ භාෂාවකින් කතා කිරීමට ආරම්භ වනු ඇත. ශුද්ධාත්ම බව්තීස්මය ලැබූ බවට තහවුරු වන ශාරීරික සලකුණ මෙය වේ.

**උන්වහන්සේ වියවුල් තොල්වලින්ද වෙන භාෂාවකින්ද මේ සෙනඟට කථාකරනවා ඇත. (යෙසායා** 28:11)

**ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථාකරන්ට පටන්ගත්තෝය. (ක්‍රියා** 2:4)

## අනෙකුත් ඇදහිලිවතුන්ගේ යාච්ඤාවල් ඉල්ලා සිටින්න.

කෙනෙකු ඔබ මත අත් තැබීම තුළින් (ක්‍රියා 8,9,19) හෝ අත්තැබීමෙන් තොරව (ක්‍රියා 2,4,10) ශුද්ධාත්මයාණන්වහන්සේව ලැබිය හැකිය. ආත්මයාණන්ගෙන් පූර්ණ වූ කිතුබැතියන් හට ඔබට ශුද්ධාත්ම බව්තීස්මයේ අත්දැකීම ලැබීමට සහාය විය හැකි ආකාරය ඉගෙනීමට පහත සඳහන් බයිබල් පද අධ්‍යයනය කරන්න.

# අත්දැකීමෙහි වැදගත්කම :

ශුද්ධාත්ම බව්තීස්මය නම් අත්දැකීම වැදගත් වනුයේ එමගින් ඔබහට ශුභාරංචි පණිවුඩය සඳහා බලවත් සාක්ෂියක් වීමට හැකියාව සපයන බැවිනි.

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා** 1:8)

**අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය: අන් භාෂාවලින් කථාකරන්නෝය: සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණීය වස ජාතියක් බිවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය: ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාර්ක්** 16:17-18)

ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට විශේෂ ආත්මික දීමනා සපයන අතර ඔබගේ ජීවිතයෙහි ආත්මික ඵල සංවර්ධනය කරන සේක. පාඩමාලාවෙහි ඉතිරි පරිච්ජේදවල මාතෘකා වනුයේ ආත්මික දීමනා හා ඵලය.

## ස්වයං - පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. ශුද්ධාත්ම බව්තීස්මය ලැබීම සඳහා උපදෙස් හයක් ලියන්න.

3. ශුද්ධාත්ම බව්තීස්මයෙහි බාහිර සලකුණ කුමක්ද?

4. ශුද්ධාත්ම බව්තීස්මයෙහි සත්‍ය සාක්ෂිය කුමක්ද? ඔබගේ පිළිතුර තහවුරු කිරීමට බයිබල් පදයක් උපුටා දක්වන්න.

5. "අන් භාෂාවලට" විරුද්ධව ජනතාව අතර පවතින ප්‍රධාන චෝදනා හතර මොනවාද?

6. ශුද්ධ ලියවිලි පදනම් කර ගෙන බලන කල මෙම චෝදනා සාධාරණද? ______________________

7. "බව්තීස්මය" යන පදයෙහි අර්ථය කුමක්ද?

8. මනුෂ්‍යයෝ ශුද්ධාත්මය බව්තීස්මය ලද විට සිදු වූ කාරණා පිළිබඳ ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් ස්ථාන තුනක් නම් කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා.

1. ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව පරණ ගිවිසුමේ 85 වතාවක් වාර්තා ගත කොට තිබේ. ඔබ පරණ ගිවිසුම් කියවීමෙහිදී ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන සඳහන් කර ඇති සෑම අවස්ථාවක් වටාම රවුමක් අඳින්න. මෙම අධ්‍යයනය නව ගිවිසුම් සමයට පෙර ශුද්ධාත්මයාණන්වහන්සේගේ කාර්යය කුමක්ද කියා දැන ගැනීමට ඔබට විශේෂයෙන් උපකාරයක් වනු ලබයි. නව ගිවිසුම් සමයේදී ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන මෙම පොතේ දෙවන පරිච්ඡේදයෙහි සඳහන් කරනු ලබන අධ්‍යයනය සම්පූර්ණ කළහොත් බයිබලයට අනුව ශුද්ධාත්මයාණන්වහන්සේ කවුරුන්ද කියා දැන ගත හැකිවේ.

2. ශුද්ධාත්මයාණන්වහන්සේ නැමැති සැනසිලිකාරයාණන්වහන්සේ අපට ලබාදෙන ලද්දේ පරණ ගිවිසුමේ සඳහන් වන පොරොන්දුව ඉටුවීමක් වශයෙන්ය. ශුද්ධාත්මයාණන්වහන්සේ අපට ලබාදීමේ පොරොන්දු ගැන අධ්‍යයනය කරන්න.

**පරණ ගිවිසුම තුළ :**

යෙසායා 28:11-12
යෝවෙල් 2:28-29
යෙසායා 44:3

**නව ගිවිසුම් තුළ :**

යොහන් 7:38-39; 14:16-18; 15:26; 16:7-11
ක්‍රියා 1:4,5,8; 2:38-39
ගලාති 3:14
ලූක් 24:49

3. ශුද්ධාත්ම බව්තිස්මය ඔබ අත් දැක තිබෙනවාද? එසේ නොමැතිනම් මෙම පරිච්ඡේදය තුළ ඉදිරිපත් කළ කාරණාවන් අනුගමනය කරන්න.

4. අන්‍ය භාෂාවලින් කථාකිරීමේ අරමුණු නැවත මතක් කොට එය ගැන සාකච්ඡා කරන්න. මෙම අරමුණු වලින් කුමන කාරණාවක් ඔබ අන්‍යභාෂා කථනය තුළින් අත්දැක තිබේද?

5. මෙම පාඩම තුළ මෙයට පෙර අන්‍යභාෂා කථනයට විරුද්ධව තිබූ මතයන් ගැන නැවත මතක් කරගන්න. මෙයට පසු අන්‍යභාෂා කථනයට විරුද්ධව මෙවැනි මතයන් ඉදිරිපත් කරන විට එයට ඔබ ප්‍රතිචාර දක්වන ආකාරය ගැන කල්පනා කරන්න.

# පස්වන පරිච්ඡේදය

## ශුද්ධාත්මයාණන්ගේ දීමනාවන්ට හැඳින්වීමක්

### අරමුණු:

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් පසු

- ආත්මික දීමනා අර්ථ දැක්වීමට
- දීමනාවන්ගේ මූලය හඳුනාගැනීමට
- ආත්මික දීමනා හා ස්වභාවික තලෙන්ත අතර වෙනස දැක්වීමට
- ආත්මික දීමනා වල පරමාර්ථ පැහැදිලි කිරීමට
- ආත්මික දීමනා වල අරමුණු පැහැදිලි කිරීමට
- මෙම දීමනා බෙදාහැර ඇති ආකාරය පැහැදිලි කිරීමට
- ආත්මික දීමනා වැරදි ලෙස යොදාගන්නා අවස්ථා හඳුනාගැනීමට
- ආත්මික දීමනා පාවිච්චි කිරීමේ මූලික හේතූන් හඳුනාගැනීමට
- සැබෑ සහ බොරු (ව්‍යාජ) ආත්මික දීමනා අතර වෙනස හඳුනාගැනීමට ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය:

**සහෝදරයෙනි, ආත්මික දීමනා ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි. (1 කොරින්ති 12:1)**

## හැඳින්වීම

යේසුස්වහන්සේ ලෝකයේ කෙලවරවල් දක්වා ශුභාරංචි පණිවිඩය ගෙනයාමේ වගකීම තම ගෝලයන්ට පවරා ගියසේක. ශුද්ධාත්මයාණන්ගේ බලය මෙම කාර්යය සම්පූර්ණ කිරීමට ඔවුන්ට උපකාර වනු ඇත.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

යේසුස්වහන්සේ මෙම අභියෝගය ජයගැනීමේ හැකියාව තම ගෝලයන්ට ලබාදීමෙන් තොරව මහත් වගකීමක් ඔවුන්ට පවරා දුන්නේ නැත. ආත්මික දීමනා යනු ශුභාරංචියේ බලවත් සාක්ෂිකරුවන් වීම උදෙසා ඇදහිලිවන්තයන් බලගැන්වීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ලබා දෙනු ලබන අධිස්වභාවික හැකියාවන්ය.

ආත්මික දීමනාවන් පිළිබඳ විෂය පාවුල් මුල්කාලීන සභාවට ඉගැන්වූ විෂයන්ගෙන් එකකි. ඔහු මෙසේ පැවසුවේය:

> **සහෝදරයෙනි, ආත්මික දීමනා ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි. (1 කොරින්ති 12:1)**

මෙම පරිච්ඡේදයේ ආත්මික දීමනා පිළිබඳ විෂයට හැඳින්වීමක් ලබාදෙයි. මින් පසු ඇති පරිච්ඡේද ඇදහිලිවන්තයන් උදෙසා ඇති විවිධ ආත්මික දීමනා පිළිබඳව සලකා බලනු ඇත. එසේම ඔබේ ආත්මික දීමනාවන් සොයාගැනීමේදී ඔබට උපකාරී වීමට උපදෙස්ද දී තිබේ.

## ආත්මික දීමනා යනු මොනවාද?

“ආත්මික” යන වචනයේ අදහස “ශුද්ධාත්මයාණන්ගේ ගුණාංග විදහා දක්වන හෝ ශුද්ධාත්මයාණන් මගින් පාලනය කරනු ලබන” යන්නයි. “දීමනාවක්” යනු කෙනෙකු විසින් තව කෙනෙකුට නොමිලයේ දෙනු ලබන දෙයකි. ආත්මික දීමනාවක් යනු ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොටසක් ලෙස සේවය කිරීමට ශුද්ධාත්මයාණන් විසින් ඇදහිලිවන්තයෙකුට ලබාදෙන අධිස්වභාවික හැකියාවකි.

ශුද්ධාත්මයාණන්ගේ “දීමනාව” හා ශුද්ධාත්මයාණන්ගේ “දීමනා” අතර වෙනසක් පවතී. ශුද්ධාත්ම “දීමනාව” ලැබුනේ යේසුස්වහන්සේගේ පොරොන්දුවට පිළිතුරක් ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීම සිදුවූ පෙන්තකොස්ත දිනයේදිය (ක්‍රියා 2).

> **මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි, එවිට උන්වහන්සේ නුඹලා සමග සදාකල්ම සිටින පිණිස වෙන සැනසිලිකාරයෙකු නුඹලාට දෙනසේක. ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්ට ලෝකයාට බැරිය. මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය. මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවතී සිටිනසේක. නුඹලා තුළෙහි සිටිනසේක. (යොහන් 14:16-17)**

පොරොන්දුවට පිළිතුරක් වශයෙන් ශුද්ධාත්ම “දීමනාව” මේ වන විටත් ලබා දී තිබේ. ශුද්ධාත්ම “දීමනා” යනු බලවත් ලෙස සේවය කිරීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයන්ට ලබා දෙන අධිස්වභාවික හැකියාවන්ය.

> **ඔව්හු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමින්වහන්සේද ඔවුන් සමග ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිරකළසේක. (මාර්ක් 16:20)**

## දීමනා හා තලෙන්ත

ආත්මික දීමනා සහ ස්වභාවික තලෙන්ත අතර වෙනසක් පවතී. තලෙන්තයක් යනු උපතින්ම ලැබෙන හෝ පුහුණුව තුළින් වර්ධනය කරගනු ලබන ස්වභාවික හැකියාවන්ය. ආත්මික දීමනාවක් යනු උපතින් හෝ පුහුණුව තුළින් ලබාගත නොහැකි අධිස්වභාවික හැකියාවකි. එය විශේෂිත ආත්මික අරමුණු උදෙසා යොදාගැනීමට ශුද්ධාත්මයාණන් විසින් ලබාදෙන විශේෂ හැකියාවකි.

කෙනෙකු ඇදහිලිවන්තයෙකු බවට පත් වූ පසු ස්වභාවික තලෙන්තය ශුද්ධාත්මයාණන් මගින් එකඟවීමක් (අනුමත කිරීම හා ආශිර්වාද කිරීම) සිදුවිය හැකිය. මෙය සිදුවීමෙන් අනතුරුව තලෙන්තය, තලෙන්තයක් මෙන් දීමනාවක් බවටද පත්වේ. උදාහරණයක් ලෙස කෙනෙකු ලබා ඇති පුහුණුව තුළින් ඔහුට පරිපාලනය පිළිබඳ ස්වභාවික තලෙන්තයක් තිබිය හැකිය. ශුද්ධාත්ම බව්තිස්මය ලැබීමෙන් අනතුරුව ශුද්ධාත්මයාණන් මගින් එකඟ වනු ලැබ (අනුමත කර) පරිපාලනයේ ආත්මික දීමනාව තුළ ඔහු පාවිච්චි කරනු ලැබිය හැකිය.

ඉතාම හොඳම ස්වභාවික තලෙන්ත වලට වඩා ආත්මික දීමනා තුළින් ආත්මික හැකියාවන් ලබා දේ. ස්වාමින්වහන්සේගේ කාර්යයන් උදෙසා අප අපගේ සියලුම ස්වභාවික තලෙන්ත පාවිච්චි කළ යුතු වුවත් අපට තවදුරටත් ආත්මික දීමනා අවශ්‍ය වේ.

## දීමනාවන් වල පරමාර්ථය

ශුද්ධාත්ම දීමනා වලින් බලාපොරොත්තු වන දේවල් එපිස 4:12-15 දක්වා සටහන් වේ.

> **එසේ දුන්නේ ඇදහීමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ වූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක්, ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණවීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය. තවද අපි තවත් මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද ප්‍රයෝගයෙන්ද රැවටිලි සහිත උපාමාරුවෙන්ද හටගන්න සියලු ආකාර ඉගැන්වීම් නමැති සුළඟින් ඇත මැත විසිවෙමින් ගෙනයනු ලබන්නාවූ බාලයන් නොවන පිණිසත්, ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය. (එපිස 4:12-15)**

මෙම කොටසට අනුව ශුද්ධාත්මයාණන්ගෙන් බලාපොරොත්තු වන දේවල් නම්

- ශුද්ධවන්තයන්ව සම්පූර්ණ කිරීම

- සේවයේ කාර්යයන්ට අනුබල දීම
- ක්‍රිස්තුස්වහන්සේ හා සභාව ගුණයෙන් වර්ධනය කිරීම

ආත්මික දීමනාවන්ගේ අරමුණු හෙවත් ඉලක්ක නම්: අප,

- ඇදහිල්ලෙන් එක්සත් කරනු ලැබීම
- ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අපගේ දැනුම වර්ධනය කරගැනීම
- ක්‍රිස්තුස්වහන්සේ අපගේ ආදර්ශය කරගනිමින් සම්පූර්ණත්වය තුළ වර්ධනයවීම
- වැරදි ඉගැන්වීම් වලින් රැවටිය නොහැකි වන පරිදි ස්ථාවර වීම
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ආත්මිකව පරිණත වීමයි

## ත්‍රිත්වය හා දීමනා

ශුද්ධාත්මයාණන්වහන්සේ ත්‍රිත්වයේ කොටසක් බව ඔබ මීට පෙර ඉගෙන ගත්තේය. ඇදහිලිවන්තයන් ආත්මික දීමනා තුළින් බලගැන්වීමේ කාර්යයට ත්‍රිත්වයේ සියලුම තැනැන්වහන්සේලා දායක වේ:

> **ඉතින් නානාප්‍රකාර දීමනා ඇත්තේය, නුමුත් එක ආත්මයාණන්වහන්සේය. නානාප්‍රකාර සේවයකිරීම් ඇත්තේය, නුමුත් එක ස්වාමීන්වහන්සේය. නානාප්‍රකාර ක්‍රියාකිරීම් ඇත්තේය, නුමුත් සියල්ලන් තුළෙහි සියල්ල කරවන්නේ එක දෙවියන්වහන්සේය. (1 කොරින්ති 12:4-6)**

ශුද්ධාත්මයාණන්වහන්සේ, දෙවියන්වහන්සේ හා ස්වාමින්වහන්සේ (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ) යන සියලු දෙනාම මෙම කොටස තුළ සඳහන් වේ. ආත්මික දීමනා වලට උන්වහන්සේලාගේ දායකත්වය පහත වගුවේ දැක්වේ:

| **හතරවන පදය** | **පස්වන පදය** | **හයවන පදය** |
|---|---|---|
| ශුද්ධාත්මයාණන් | ස්වාමින්වහන්සේ | දෙවියන්වහන්සේ |
| නානාප්‍රකාර දීමනා | නානාප්‍රකාර පරිපාලනයන් | නානාප්‍රකාර ක්‍රියාකාරිකම් |
| (විවිධ ආකාරයේ දීමනා) | (විවිධ සේවයන්) | (දීමනා පාවිච්චි කරනු ලබන විවිධ ආකාර) |

## ආත්මික ආයුධ

සාතන්ගේ ආත්මික බලවේග වලට එරෙහි ආත්මික සටනේදී ජයග්‍රහණය ලැබීම සඳහා ආත්මික ආයුධ වශයෙන්ද ආත්මික දීමනා සභාවට දී තිබේ:*

> **මක්නිසාද අපේ පොරබැදීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම් වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

ඇදහිලිවන්තයන් නියැලී සිටිනුයේ ආත්මික සටනක වන බැවින් ස්වභාවික අවි ආයුධ වලට වඩා ආත්මික ආයුධ පාවිච්චි කළ යුතුය. ඇතැම් අවස්ථා වලදී මෙම ආයුධ පිළිබඳ වැටහීමක් නොමැතිව ඇදහිලිවන්තයන් ආත්මික සටන් වලට යයි. ඔබ ආයුධ නොමැතිව සටනට යන කිසිම විටක ඔබට සටනින් ජය බලාපොරොත්තු විය නොහැකිය. ආත්මික දීමනා තේරුම්ගැනීම වැදගත් වන්නේ මේ නිසාය. ඒවා දෙවියන්වහන්සේ සපයා ඇති ආත්මික ආයුධ වලින් කොටසකි.

---

* "ආත්මික උපක්‍රම: ආත්මික සටන සඳහා අත්පොතක්" ලෙස නම් කළ ආත්මික සටන් නමැති විෂය පිළිබඳ වෙනම පාඨමාලාවක් හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් පවත්වනු ලැබේ.

# දීමනා බෙදාහැරීම

සෑම ඇදහිලිවන්තයෙකුටම අවම වශයෙන් එක් දීමනාවක් හෝ තිබේ:

> **දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට ලැබුණු දීමනාවේ හැටියට එයින් එකිනෙකාට සේවය කරපල්ලා.** (1 පේතෘස් 4:10)

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. නුමුත් ඒ එකම වූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදා දෙමින්, මේ සියල්ල කරවනසේක.** (1 කොරින්ති 12:7, 11)

සෑම ඇදහිලිවන්තයෙකුටම අවම වශයෙන් එක් ආත්මික දීමනාවක් හෝ ඇති බැවින් අපගේ දීමනාව හඳුනාගෙන එය පාවිච්චි කිරීමේ වගකීම අප සතුය.

ඔබව විනිශ්චය කරනු ලබන්නේ ඔබට ඇති ආත්මික දීමනා සංඛ්‍යාව අනුව නොවේ. ඔබව විනිශ්චය කරනු ලබනුයේ ඔබට දී ඇති ආත්මික දීමනාව හෝ දීමනා පාවිච්චි කිරීමේදී ඔබ දක්වන විශ්වාසවන්තභාවය අනුවය. මතෙව් 25:14-30 හි සඳහන් තලෙන්ත පිළිබඳ උපමාව මෙම සත්‍ය තහවුරු කරයි.

ආත්මික දීමනා බොහොමයක් තිබේ, නමුත් කිසිම ඇදහිලිවන්තයෙකුට සියලුම ශුද්ධාත්ම දීමනා නැත:

> **සියල්ලෝම ප්‍රේරිතයෝද? සියල්ලෝම අනාගතවක්තෘවරුද? සියල්ලෝම ගුරුවරුද? සියල්ලෝම ආශ්චර්යකරන්නෝද? සුවකිරීමේ දීමනා සියල්ලන්ටම ඇත්තේද? සියල්ලෝම අන් භාෂාවලින් කථාකරන්නෝද? සියල්ලෝම තේරුම්කර දෙන්නෝද?** (1 කොරින්ති 12:29-30)

කෙනෙකුට එක දීමනාවකට වඩා තිබිය හැකි නමුත් කිසිවෙකුටවත් සියලුම ශුද්ධාත්ම දීමනා නැත. යමෙකුට එසේ තිබුණේ නම්, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අනෙකුත් පුද්ගලයන්ගේ අවශ්‍යතාවයක් ඔහුට නොදැනෙනු ඇත.

# ආත්මික දීමනා වැරදි ලෙස භාවිතා කිරීම

දෙවියන්වහන්සේගෙන් ලැබෙන ආත්මික දීමනාවක් වැරදි ලෙස භාවිතා කළ හැකිය. දීමනාවක් "වැරදි ලෙස" භාවිතා කිරීම යනු එය නිවැරදි ලෙස යොදා නොගැනීමයි. ඔබට පහත ආකාරයන්ට ආත්මික දීමනා වැරදි ලෙස යොදාගත හැකිය:

## ඔබට දී ඇති දීමනා පාවිච්චි නොකිරීම:

අපෝස්තුලුවර පාවුල් තිමෝතිට මෙසේ පැවසුවේය:

> **වැඩිමහල්ලන්ගේ අත්තැබීම ඇතුව අනාගතවාක්‍යයෙන් නුඹට දෙනලද නුඹ තුළ තිබෙන දීමනාව ව්‍යවහාර නොකර නොසිටින්න.** (1 තිමෝති 4:14)

> **ඒ කාරණය නිසා මාගේ අත්තැබීම කරණකොටගෙන නුඹ තුළ තිබෙන දෙවියන්වහන්සේගේ දීමනාව පුබුදු කරන හැටියට නුඹට සිහිකරවමි.** (2 තිමෝති 1:6)

## ඔබට දී නොමැති දීමනා භාවිතා කිරීමට උත්සාහ කිරීම:

පේත්‍රැස් හා යොහන් සමාරියේ සේවය කරන අතරතුරදී ඔවුන් තුළින් ප්‍රකාශ වූ බලවත් දීමනා ලබාගැනීමට අවශ්‍ය වූ සීමොන් නම් මිනිසෙක් ඔවුන්ට හමුවූහ. සීමොන් මෙම දීමනා ලබාගැනීමට මුදල් ලබාදුන්නේය. පේත්‍රැස් ඔහුට මෙසේ පැවසුවේය:

> **නුමුත් පේත්‍රැස් ඔහුට කථාකොට: දෙවියන්වහන්සේගේ දීමනාව මුදලට ගන්ට නුඹ සිතූ බැවින් නුඹේ මිල නුඹ සමග විනාශවේවා. මේ කාරණයෙහි කොටසක්වත් පංගුකාරකමක්වත් නුඹට නැත. මක්නිසාද දෙවියන්වහන්සේ ඉදිරියෙහි නුඹේ සිත හරි නැත.** (ක්‍රියා 8:20-21)

ආත්මික දීමනාවන් පැමිණෙන්නේ ශුද්ධාත්මයාණන්ගෙනි. වෙනත් කිසිම ආකාරයකින් ඒවා ලබාගත නොහැකිය. ඔබට යම් ආත්මික දීමනාවක් අවශ්‍ය බව හෝ කිසියම් දීමනාවක් පාවිච්චි කිරීමට අවශ්‍ය බව ඔබට තීරණය කළ නොහැකිය. ශුද්ධාත්මයාණන්වහන්සේ එය ඔබට ලබාදිය යුතුය.

තවත් අවස්ථාවකදී උත්තම පූජකයාගේ පුතුන් හත්දෙනා අපෝස්තුලුවර පාවුල්ගේ හාස්කම් දැක, අශුද්ධ ආත්ම පළවා හැරීමට මෙම දීමනාව යොදාගැනීමට උත්සාහ කළහ:

> **නුමුත් නපුරු ආත්මය උත්තරදෙමින්: යේසුස්වහන්සේ අඳුනමි, පාවුල්ද දනිමි: නුමුත් නුඹලා කවුරුදැයි ඔවුන්ට කීවේය. නපුරු ආත්මය වැහී සිටි මනුෂ්‍යයා ඔවුන් පිටට පැනනැගී දෙදෙනාම දමනයකොට, ඔවුන් පරදවාදැම්මේය, මෙසේ ඔව්හු නිර්වස්ත්‍රව තුවාලවී, ඒ ගෙයින් පලා ගියෝය. (ක්‍රියා 19:15-16)**

ශුද්ධාත්මයාණන්ගේ ආලේපයෙන් තොරව දීමනාවක් පාවිච්චි කිරීමට උත්සාහ කිරීම අනතුරුදායක විය හැකිය.

## දීමනා නිසි පරිදි භාවිත නොකිරීම:

1 කොරින්ති 12-14 දක්වා ආත්මික දීමනා නිසි ලෙස භාවිත කිරීම ගැන පාවුල් කතා කරයි. මෙම පරිච්ඡේද වල ඇති ඉගැන්වීම් සාරාංශ කිරීමට ඔහු මෙසේ පවසයි:

> **මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල්කමේ නොව, සමාදානයේ දෙවියන්වහන්සේය, ... නුමුත් සියල්ල ඔබිනා ලෙසද පිළිවෙළින්ද කරනු ලැබේවා. (1 කොරින්ති 14:33, 40)**

දෙවියන්වහන්සේ වියවුල්කමේ දෙවිකෙනෙක් නොව. වියවුල් බව ඇතිවන ස්ථානයේ ආත්මික දීමනා නිසි පරිදි භාවිත කර නැත. ඔබ මිනිසුන්ට විධාන කිරීමට, ධනය ඉපයීමට හෝ අන් අයට සේවය කිරීමට වඩා ඔබ ඒවා ඔබේම ආත්මික තෘප්තිය උදෙසා යොදාගන්නා විටද ආත්මික දීමනා වැරදි ලෙස භාවිත විය හැකිය.

1 කොරින්ති 12-14 දක්වා ආත්මික දීමනා භාවිත කිරීමට පාවුල් ලබා දී ඇති උපදෙස් වියවුල්භාවය වළක්වයි. මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසේදී මේ පිළිබඳව අධ්‍යයනය කිරීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත.

## ඔබේ දීමනා පිළිබඳව පාරට්ටු කරගැනීම:

ඔබ ඔබේ දීමනා පිළිබඳව "පාරට්ටු" කරගන්නා විට එය අනෙකුත් දීමනාවන්ට වඩා උසස් යැයි ඔබ සලකයි. ඔබ දීමනාව දුන් තැනැත්තාට වඩා දීමනාව උසස් ලෙස දැකීමට පටන්ගනී.

# එක් උල්පතකින් දීමනා රැසක්

එක් උල්පතකින් පැමිණෙන දීමනා රැසක් ඇති බව බයිබලයේ සඳහන් වේ. ආත්මික දීමනාවන්ගේ උල්පත ශුද්ධාත්මයාණන්වහන්සේය. උන්වහන්සේ ඇදහිලිවන්තයන්ගේ ජීවිත වලට මෙම දීමනා ලබා දී ඒවා ක්‍රියාත්මක කරවනසේක:

> **ඉතින් නානාප්‍රකාර දීමනා ඇත්තේය, නුමුත් එක ආත්මයාණන්වහන්සේය. නානාප්‍රකාර සේවයකිරීම් ඇත්තේය, නුමුත් එක ස්වාමීන්වහන්සේය. නානාප්‍රකාර ක්‍රියාකිරීම් ඇත්තේය, නුමුත් සියල්ලන් තුළෙහි සියල්ල කරවන්නේ එක දෙවියන්වහන්සේය. නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. (1 කොරින්ති 12:4-7)**
>
> **එහෙයින් අපට දෙනලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගතකීම නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු. සේවය නම් අපගේ සේවයෙහි යෙදී සිටිමු. උගන්වන්නා තමාගේ ඉගැන්වීමටත්, උපදේශ දෙන්නා තමාගේ උපදේශ දීමටත් භාරවේවා. දෙන තැනැත්තේ ත්‍යාගවන්තකමෙන්ද ආණ්ඩුකරන තැනැත්තේ උනන්දුකමෙන්ද කරුණාව පෙන්වන තැනැත්තේ ප්‍රසන්න ලීලාවෙන්ද එසේ කෙරේවා. (රෝම 12:6-8)**

ආත්මික දීමනාවන්ට ඇත්තේ එක උල්පතක් වන නමුත් දීමනා රැසක් තිබේ. කිසිදු දීමනාවක් තව එකකට වඩා වැඩියෙන් වැදගත් නැත. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ ඔබගේ ස්ථානය මනුෂ්‍ය ශරීරයේ කොටස් වලට සමාන කර තිබේ. මනුෂ්‍ය ශරීරය තුළ ඇස වැනි කුඩා කොටසකට පවා වැදගත් කාර්යයක් ඇති ලෙසම පෙනුමෙන් "කුඩා" ලෙස පෙනෙන දීමනාවන් සභාවේ ක්‍රියාකාරිත්වය තුළ ඉතා වැදගත් වේ. ඇතැම් දීමනාවන්ට වැඩි වගකීම් පැවරේ, නුමුත් කිසිදු දීමනාවක් තව එකකට වඩා වැදගත් නැත.

මිනිස් සිරුරේ ඇතැම් කොටස් වලට අනෙක් කොටස් වලට වඩා වගකීම් පැවරී ඇත. උදාහරණයක් ලෙස ඇස ඔබ අවට ඇති දේවල් නැරඹීමේ හැකියාව ඔබට ලබාදේ. ඔබ ඇවිදින විට එය ඔබට මගපෙන්වයි. එය කියවීමේ, දේව මැවිල්ල නැරඹීමේ හා රසවිඳීමේ අවස්ථාව ඔබට ලබාදෙයි. ඇසට වැඩි වගකීමක් පැවරී ඇත, නමුත් ඔබ ඇවිදින විට සමබරතාව ලබාදෙන ඔබේ පයේ මහපට ඇඟිල්ලට වඩා එය වැදගත් නොවේ. ඔබට ඇවිදීමට දෙපා නොතිබුනේ නම්, ඇවිදින විට දෑසෙන් ලැබෙන මගපෙන්වීමෙන් ප්‍රයෝජනයක් නැත. ඔබ කියවන දේ තේරුම්ගැනීමට ඔබට මොළයක් නොමැතිනම් ඇසෙන් ලැබෙන කියැවීමේ හැකියාවෙන් ඵලක් නැත.

ඇතැම්විට ඇදහිලිවන්තයන් අන් අයගේ ආත්මික දීමනා නිසි ලෙස හඳුනානොගත් විට සභාව තුළ වැරදි වැටහීම් ඇති වේ. උදාහරණයක් ලෙස කෙනෙකුට දීමේ දීමනාව තිබිය හැකි අතර ඔහු තරම් ත්‍යාගශීලි ලෙස නොදෙන කෙනෙකුව ඔහුට තේරුම් ගත හැකි නොවනු ඇත. නැතිනම්, කෙනෙකුට පරිපාලනයේ දීමනාව තිබිය හැකි අතර එතරම් සංවිධානාත්මකව කටයුතු නොකරන පුද්ගලයන් පිළිබඳව ඔහු නොඉවසිලිවන්ත වනු ඇත.

සෑම ඇදහිලිවන්තයෙක්ම විවිධ දීමනා ඇති අනෙක් ඇදහිලිවන්තයන් සමග එක්ව කටයුතු කිරීම සඳහා තම ආත්මික දීමනා යොදාගත යුතුය. මෙය සිදුවන විට, සභාව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වශයෙන් බලවත් ලෙස ක්‍රියාත්මක වෙයි.

## දීමනාවන්ගේ ගබඩාකරුවෝ

ඔබ ආත්මික දීමනාවන්ගේ ගබඩාකරුවකු පමණි. ගබඩාකරුවකු යනු තමන් කටයුතු කරන දේවල් පිළිබඳ හිමිකාරිත්වයක් නැති කෙනෙකි. ඔහු පාවිච්චි කරනුයේ වෙනත් කෙනෙක් ඔහුට දී ඇති දේවල්ය. ඔහු ඒවා පාවිච්චි කරනුයේ ඔහුට ඒවා ලබාදුන් තැනැත්තා උදෙසාය. ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ගබඩාකරුවෙකි :

> **මනුෂ්‍යයෝ අප ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයන් මෙන්ද දෙවියන්වහන්සේගේ රහස්වල ගබඩාකාරයන් මෙන්ද ගණන්ගනිත්වා. (1 කොරින්ති 4:1)**

ආත්මික දීමනා යනු ඔබ ගබඩාකරුවකු ලෙස කටයුතු කරන "සේවාවන්"ගෙන් කොටසකි. යේසුස්වහන්සේ උදෙසා බලවත් ලෙස සේවය කිරීමට ශුද්ධාත්මයාණන් විසින් ඔබට ඒවා දී තිබේ :

> **දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට ලැබුණු දීමනාවේ හැටියට එයින් එකිනෙකාට සේවය කරපල්ලා. (1 පේත්‍රැස් 4:10)**

ගබඩාකරුවකු ලෙස ඔබට ලබාදී ඇති දීමනාවන් පාවිච්චි කිරීමේදී ඔබ පෙන්වන විශ්වාසවන්තභාවයට අනුව ඔබ විනිශ්චය කරනු ලබනු ඇත :

> **ඇරත් මෙහිදී ගබඩාකාරයෙන්ගෙන් ඕනෑකරන්නේ එක එක මනුෂ්‍යයා විශ්වාසව සිටීමය. (1 කොරින්ති 4:2)**

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා

ආත්මික දීමනාවන් හඳුනාගත හැකි ප්‍රධාන බයිබල් පාඨ පහත දක්වා ඇත. ඔබ මීළඟ පරිච්ඡේද අධ්‍යයනය කිරීමට පෙර මේවා කියවන්න. මෙම පද විවිධාකාර දීමනා හඳුන්වා දෙයි.

- රෝම 12:1-8
- 1 කොරින්ති 12:1-31
- එපීස 4:1-16
- 1 පේත්‍රැස් 4:7-11

මෙම දීමනාවන් විවිධ ආකාරයෙන් සේවය කිරීමට දෙවියන්වහන්සේගෙන් ලැබෙන හැකියාවන් බව මතක තබාගන්න. අප සියලු දෙනාගේම ජීවිත වලින් මෙම දීමනා ප්‍රකාශ වීමට යම් හැකියාවක් තිබිය හැකි නමුත් අපට මෙම දීමනා ඇති බව ඉන් අදහස් නොවේ. උදාහරණයක් ලෙස සෑම ඇදහිලිවන්තයෙක්ම දෙවියන්වහන්සේගේ කාර්යයන් උදෙසා දශයෙන් කොටස් හා සම්මාදම් මුදල් වලින් දායක විය යුතුය. නමුත් ත්‍යාගශීලීභාවයේ දීමනාව යනු දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මගින් අනුබල දෙන අසාමාන්‍ය ත්‍යාගශීලී භාවයකි. දේව වචනයට අනුව සෑම ඇදහිලිවන්තයෙකුටම යම් ප්‍රමාණයක ඇදහිල්ලක් තිබේ. නමුත් ඇදහිල්ලේ දීමනාව යනු සාමාන්‍ය කිතුනුවකුගේ මට්ටමෙන් එපිටට ගිය විශේෂ හැකියාවකි.

## දීමනාවන් අද දවස උදෙසාද?

බයිබලයේ සඳහන් සියලුම දීමනාවන් අද දවසේ සභාව උදෙසා නොවන බව ඇතැම් පුද්ගලයන් පවසයි. අනාගතවාක්‍ය, අන්‍යභාෂා, හාස්කම් හා තවත් සමහරක් දීමනා මුල් කාලීන සභාව උදෙසා පමණක් බව ඔවුන් විශ්වාස කරයි. සභාව පිහිටුවා නව ගිවිසුම රචනා කිරීමෙන් පසුව ඇතැම් ආත්මික දීමනා තවදුරටත් අවශ්‍ය නොවූ බව මොවුන් පවසයි. ඔවුන් බොහෝවිට තම විශ්වාසය පැහැදිලි කිරීමට 1 කොරින්ති 13:10 යොදාගනී.

**නුමුත් සම්පූර්ණ එක පැමුණුණාම මඳක්ව තිබෙන දේ නැතිවන්නේය. (1 කොරින්ති 13:10)**

දෙවියන්වහන්සේගේ වචනයේ සම්පූර්ණ එළිදරව්ව ලියා අවසන් වූ පසු අන්‍යභාෂා කතාකිරීම, තේරුම් කරදීම හා අනාගතවාක්‍ය පැවසීම තවදුරටත් අවශ්‍ය නොවූ බව ඔවුන් පවසයි. සභාව පිහිටුවීමෙන් අනතුරුව ලකුණු හා හාස්කම් තුළින් සහතික කිරීම් තවදුරටත් අවශ්‍ය නොවූ බව ඔවුන් පවසයි.

ඔවුන්ට හසුකරගත හැකි කරුණ නම් “පහව යන” හෝ නැතිව යන දෙයක් ලෙස එම පරිච්ඡේදයේම දැනගැන්මද සටහන්ව තිබීමයි :

**ප්‍රේමය කිසිකලක පහවන්නේ නැත. අනාගතවාක්‍යකීම් වුවත්, නැතිවන්නේය. භාෂාවුවත් නවතින්නේය. දැනගැන්ම වුවත් නැතිවන්නේය. (1 කොරින්ති 13:8)**

අන්‍යභාෂා කතාකිරීම, තේරුම් කිරීම හා අනාගතවාක්‍ය තවදුරටත් අවශ්‍ය නොවූ බව පැවසීමට අප මෙම පදය යොදාගන්නේනම්, දැනගැන්මත් තවදුරටත් අවශ්‍ය නොවන බවත් අප පැවසිය යුතුය.

සැබවින්ම මෙම පරිච්ඡේදයේ සඳහන් වන්නේ “සම්පූර්ණ” දේව රාජ්‍යය පෘථිවිය මත පිහිටුවනු ලබන අනාගතය ගැනය. එසේනම් සම්පූර්ණ දෙය පැමිණෙන තුරු අපට ඕනෑම ආත්මික දීමනාවක් අවශ්‍ය විය හැකිය. මක්නිසාද එවිට ...

**තවද, මෙන්න දෙවියන්වහන්සේගේ මණ්ඩපය මනුෂ්‍යයන් සමගය. උන්වහන්සේ ඔවුන් සමග වාසයකරනසේක. ඔව්හු උන්වහන්සේගේ සෙනඟ වන්නෝය. දෙවියන්වහන්සේම ඔවුන් සමග සිට ඔවුන්ගේ දෙවියන්වහන්සේ වනසේක. (එළිදරව් 21:3)**

අනාගතවාක්‍ය, අන්‍යභාෂා කතාකිරීම් හෝ ඒවා තේරුම්කරදීම් තුළින් පණිවිඩ ලබාදෙන දෙවියන්වහන්සේ සමග අප වාසය කරන බැවින් ඒවායෙන් කියවෙන පණිවිඩ අපට තවදුරටත් අවශ්‍ය නොවනු ඇත. අප දැනගැන්මේ උල්පත සමග ජීවත්වන බැවින් අපට තවදුරටත් ප්‍රඥාවේ වචනය හෝ දැනගැන්මේ දීමනාව අවශ්‍ය නොවේ. අපට ආත්ම විමසීමේ දීමනාව අවශ්‍ය නොවේ. මන්ද ...

**බැටළුපැටවාණන්ගේ ජීවන පොතෙහි ලියනලද්දවුන් මිස අපවිත්‍ර දෙයක්වත් පිළිකුල්වූ බොරුවූ දෙයක් කරන්නෙක්වත් කිසිසේත් එහි ඇතුල් නොවන්නේය. (එළිදරව් 21:27)**

එහිදී තවදුරටත් සුවකිරීමේ දීමනා අවශ්‍ය නොවේ. මන්ද ...

**එහි වීථිය මැද ... ගඟේ මේ පැත්තේද ඒ පැත්තේද ... ජීවන වෘක්ෂය තිබුණේය. ඒ ... ජාතීන්ගේ සුවවීම පිණිසය. (එළිදරව් 22:2)**

එසේම එපීස 4:12-15 දක්වා ඇති ආත්මික දීමනා වල පරමාර්ථය සහ ඒවායේ අරමුණුද මතකයේ තබාගන්න. ඒවායින් බලාපොරොත්තු වන දේවල් නම් :

- ශුද්ධවන්තයන් සම්පූර්ණ කිරීම
- සේවයේ කාර්යයන්ට අනුබල දීම
- ක්‍රිස්තුස්වහන්සේ හා සභාව ගොඩනැංවීමයි.

ආත්මික දීමනා ලබාදීමේ පරමාර්ථ අදටත් වලංගු වේ. ශුද්ධවන්තයන් තවමත් සම්පූර්ණ කරනු ලැබිය යුතුය, පෘථිවියේ සීමාවන් දක්වා සේවයේ කාර්යයන්ට තවදුරටත් අනුබල දෙනු ලැබිය යුතුය. එසේම ක්‍රිස්තුස්වහන්සේ හා සභාව තවදුරටත් ගොඩනැංවිය යුතුය.

මෙහි අරමුණු නම්, අප ...

- ඇදහිල්ලෙන් එක්සත් කරනු ලැබීම
- ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අපගේ දැනුම වර්ධනය කරගැනීම
- ක්‍රිස්තුස්වහන්සේ අපගේ ආදර්ශය කරගනිමින් සම්පූර්ණත්වය තුළ වර්ධනය වීම
- වැරදි ඉගැන්වීම් වලින් රැවටිය නොහැකි වන පරිදි ස්ථාවර වීම
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ආත්මිකව පරිණත වීමයි.

දෙවියන්වහන්සේ මෙම පරමාර්ථ හා අරමුණු ඇතිව ආත්මික දීමනා ලබාදී මේවා ළඟා කරගැනීමෙන් තොරව එම දීමනා නැවත අරගන්නේ නැත.

- සියලුම ඇදහිලිවන්තයන් ඇදහිල්ලෙන් එක්සත් කරනු ලැබ තිබේද?
- සෑම කෙනෙකුම ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ දැනුමෙන් සම්පූර්ණයෙන්ම වර්ධනය වී තිබේද?
- අප සියලු දෙනා සම්පූර්ණද?
- අපගේ සභාවේ සාමාජිකයන් වැරදි ඉගැන්වීම් වලින් රැවටිය හැකි නොවන සේ ස්ථාවරද?
- අපගේ සභාවේ සියලුම සාමාජිකයන් ආත්මිකව පරිණත වී තිබේද?

මෙම සියලුම ප්‍රශ්න වලට පිළිතුර "නැත" යන්නයි. මෙම අරමුණු තවම ළඟාකරගෙන නැත. මේ හේතුවෙන් ආත්මික දීමනාවන් අද දවස උදෙසාද වන බව අප දනිමු. දෙවියන්වහන්සේ ආත්මික දීමනාවන් ලබාදුන්නේ සභාව තුළ නිශ්චිත අරමුණු ළඟාකර ගැනීමටය. මෙම අරමුණු ළඟාකර ගැනීමෙන් තොරව දෙවියන්වහන්සේ මෙම දීමනා නැවත අරගන්නේ නැත. "මක්නිසාද දෙවියන්වහන්සේගේ දීමනාද කැඳවීම්ද වෙනස් නොවන්නේය" (රෝම 11:29) යනුවෙන් බයිබලයේද සඳහන් වේ. මෙහි අදහස නම් දෙවියන්වහන්සේ ආත්මික දීමනාවක් හෝ කැඳවීමක් ලබාදුන් පසු තම අදහස වෙනස්කර එය ආපසු නොගන්නා බවයි.

## දීමනා භාවිත කිරීමේ රහස

1 කොරින්ති 13 දී අපෝස්තුලුවර පාවුල්, ශුද්ධාත්මයාණන්ගේ දීමනා පාවිච්චි කිරීමේ රහස දක්වා තිබේ. 1 කොරින්ති 12:31දී ඔහු මෙම විෂය හඳුන්වා දෙයි. ඔහු ඇතැම් ආත්මික දීමනා සඳහන් කර ඉන්පසු මෙසේ පැවසුවේය ...

**... තවද ඊටත් වඩා උතුම් මාර්ගයක් මම නුඹලාට පෙන්වමි.** (1 කොරින්ති 12:31)

1 කොරින්ති 13 වන පරිච්ඡේදය තුළ "වඩා උතුම් මාර්ගය" පිළිබඳව විස්තර කරයි. ඔබේ බයිබලයේ මුළු පරිච්ඡේදයම කියවන්න. ආත්මික දීමනා භාවිත කිරීමේ රහස මෙම පරිච්ඡේදයේ දැක්වේ. එම රහස ප්‍රේමයයි. ඔබට අනාගතවාක්‍ය පැවසීම, සුවකිරීමේ, ඇදහිල්ලේ, ත්‍යාගශීලිබවේ හා වෙනත් දීමනා ඔබට තිබිය හැකි නමුත් ප්‍රේමයෙන් තොරව මෙම දීමනා භාවිත කිරීමෙන් ඒවායෙන් බලපෑමක් සිදු නොවේ.

ප්‍රේමයෙන් තොරව පාවිච්චි කළ විට දීමනාවන්ගෙන් කිසිදු ප්‍රයෝජනයක් නොවේ. අන්‍යභාෂාවන්ගෙන් කතා කිරීම මහත් ශබ්දයෙන් යුතු ගාලගෝට්ටියක් මෙන් වේ. ප්‍රේමයෙන් තොරව භාවිත කෙරේනම් සෑම දීමනාවකම වටිනාකමක් නැති වේ. "ඒවායින් කිසි ප්‍රයෝජනයක් නැත". දීමනාවන් පාවිච්චි කළ හැකි "වඩා උතුම් මාර්ගය" ප්‍රේමයයි. දීමනාවන් දෙවියන්වහන්සේගේ ප්‍රේමය අප වටා සිටින අය වෙත ගලා යන දිය පහරක් බවට පත්වේ. බලවත් ලෙස ආත්මික දීමනාවන් පාවිච්චි කිරීමේ රහස ප්‍රේමයයි.

## අනතුරු ඇඟවීමක් : සාතන්ගේ රැවටීම

සාතන් ශුද්ධාත්මයාණන්ගේ දීමනා ව්‍යාජ ලෙස යොදාගනී. ව්‍යාජ දෙයක් යනු සැබෑ යමක් අනුකරණය කරන දෙයක් වන නමුත් එය සත්‍ය නොවේ. සාතන් රැවටිලිකාරයෙකි. ඔහු ඇතැම්විට දේවදූතයෙකු ලෙසද පෙනී සිටින බව බයිබලය සඳහන් කරයි (2 කොරින්ති 11:14). අවසාන කාලයේදී අන්ත ක්‍රිස්තුස් ලෙස හඳුන්වන සාතන් ව්‍යාජ ක්‍රිස්තුස්වරයෙකුව පැමිණෙනු ඇත (1 යොහන් 2:18, 22).

ව්‍යාජ දීමනාවන් බොහෝවිට ලැබෙනුයේ ගුප්ත දේවල් තුළිනි. උදාහරණයක් ලෙස අනාගතය පිළිබඳව හා නොදන්නා දේවල් පිළිබඳව කලින් පැවසීමට උත්සාහ කරන මන්ත්‍රකරුවන් දැනගැනීමේ වචනය ව්‍යාජ ලෙස යොදාගනී. මන්ත්‍රකරුවකු යනු දෙවියන්වහන්සේගෙන් නොවන වෙනත් අධිස්වභාවික මාධ්‍යයන් තුළින් දේවල් දැනගැනීමට හා යම් යම් දේ සිදුකිරීමට උත්සාහ කරන කෙනෙකි. ඔවුන්ගේ මාධ්‍යය සාතන්ය. මනස කියවීම තුළින් ආත්ම විමසීමේ දීමනාව ව්‍යාජ ලෙස යොදාගැනීම සිදුකෙරේ.

සාතන් හාස්කම් පවා ව්‍යාජ ලෙස සිදුකරන අතර (නික්මයාම 7) අන්ත ක්‍රිස්තුස් විසින්ද ඒවා සිදුකරනු ඇත (එළිදරව් 13:14). බයිබලය බොරු අනාගතවක්තෘවරු පිළිබඳවද කතා කරයි (ක්‍රියා 13:6-12). ගැටලුව නම්, ඔබ මෙම ව්‍යාජ දේවල් සත්‍යයෙන් වෙන්කර හඳුනාගන්නේ කෙසේද යන්නයි.

ව්‍යාජ දේවල් තුළින් ශුද්ධාත්මයාණන්ගේ දීමනා තුළින් බලාපොරොත්තු වන දේවල් ඉටු නොවේ. එපිස 4:12-15 දක්වා නැවත කියවන්න. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඕනෑම ආත්මික දීමනාවකින් මෙම පරමාර්ථ හා මෙම අරමුණු ළඟා කර ගනී.

ව්‍යාජ දීමනා බයිබලය යේසුස්වහන්සේ පිළිබඳව පවසන දේවල් සමග එකඟ නොවේ. කෙනෙකු දීමනාවක් තුළින් සේවය කරන විට ඔවුන් යේසුස්වහන්සේ පිළිබඳව පවසන්නේ මොනවාද? එය දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය සමග එකඟවේද?

> **නුමුත් සර්පයා තමාගේ ප්‍රයෝගයෙන් ඒව රැවටුවාක් මෙන් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි පවතින අවංකකමෙන්ද පිරිසිදුකමෙන්ද යම් විධියකින් නුඹලා වෙන්කොට නුඹලාගේ සිත් දූෂ්‍යකරනු ලැබේදෝ කියා භයවෙමි. මක්නිසාද එන්නාවූ තැනැත්තේ අප දේශනා නොකළ වෙන යේසුස් කෙනෙකු ගැන දේශනා කෙරේනම්, නොහොත් නුඹලා නොලැබූ වෙන ආත්මයක්වත් නුඹලා පිළිනොගත් වෙන ශුභාරංචියක්වත් නුඹලා ඔහුගෙන් පිළිගන්නහු නම්, ඔහු ගැන ඉවසීම හොඳය. (2 කොරින්ති 11:3-4)**

ඔවුන්ගේ පෞද්ගලික චරිත ලක්ෂණ තුළින්ද ඔබට ව්‍යාජ දේ කරන අය හඳුනාගත හැකිය. මේවා 2 පේත්‍රැස් 2 හා යූද් පොතෙහි දක්වා තිබේ. ව්‍යාජ දේ සත්‍යයෙන් වෙන්කර හඳුනාගැනීමේදී ඔබට උපකාර වන පිණිස ඔබගේ බයිබලයෙන් මෙම පරිච්ඡේද අධ්‍යයනය කරන්න.

# ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ආත්මික දීමනා හා ස්වභාවික තලෙන්ත අතර වෙනස කුමක්ද?

3. ආත්මික දීමනාවන් තුළින් බලාපොරොත්තු වන පරමාර්ථ 3 ලියන්න.

4. ආත්මික දීමනාවන්ගේ අරමුණු 5 ලියන්න.

5. හැමකෙනෙකුටම එක් ආත්මික දීමනාවක් හෝ තිබේද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට එක් බයිබල් පදයක් සඳහන් කරන්න.

6. ආත්මික දීමනා වැරදි ලෙස භාවිත කරන අවස්ථා 4 ලියන්න.

7. ආත්මික දීමනාවන්ගේ උල්පත කවුරුන්ද?

8. ආත්මික දීමනාවන් භාවිත කිරීමේ රහස කුමක්ද?

9. ඔබ ශුද්ධාත්මයාණන්ගේ සැබෑ දීමනා සාතන්ගේ ව්‍යාජ දීමනාවන්ගෙන් වෙන්කර හඳුනාගන්නේ කෙසේද?

10. ආත්මික දීමනා යනු මොනවාද?

11. සෑම ආත්මික දීමනාවක්ම අද දවස උදෙසාද නොඑසේනම් ඇතැම් ඒවා මුල් කාලීන සභාව උදෙසා පමණක්ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

12. ආත්මික "දීමනා" හා ශුද්ධාත්ම "දීමනාව" අතර වෙනස කුමක්ද?

13. සෑම ප්‍රකාශයක්ම කියවන්න. ප්‍රකාශය සත්‍ය නම් ඒ ඉදිරියේ ඇති තිත් ඉරමත "ස" අකුර ලියන්න. ප්‍රකාශය අසත්‍යය නම් ඒ ඉදිරියේ ඇති හිස්තැන මත "අ" අකුර ලියන්න.

අ. _____ මිනිස් තලෙන්ත ආත්මික දීමනා නොවේ.

ආ. _____ ආත්මික දීමනා ඔබට උපතේදී ලැබී ඇත.

ඇ. _____ දෙවියන්වහන්සේ ආත්මික දීමනා ලබාදෙන්නේ විශේෂයෙන්ම ඔබගේම සතුට උදෙසාය.

ඈ. _____ සභාව ස්ථිර ලෙස පිහිටුවා ඇති බැවින් දෙවියන්වහන්සේගේ බලයේ අධිස්වභාවික ලකුණු අද දවස උදෙසා තවදුරටත් අදාල නොවේ.

ඉ. _____ "සම්පූර්ණවූ දෙය" දැනටමත් පැමිණ තිබෙන බැවින් අපට තවදුරටත් අන්‍යභාෂා කතාකිරීම්, ඒවා තේරුම්කරදීම් හා අනාගත වාක්‍ය කීම් අවශ්‍ය නොවේ.

ඊ. _____ කිසිම තනි කිතුනුවෙකුට සියලුම දීමනා නැත.

උ. _____ අපට අපගේ දීමනා තෝරාගත නොහැකිය.

ඌ. _____ අප අපගේ දීමනා පාවිච්චි කරන ආකාරය පිළිබඳව දෙවියන්වහන්සේට ගණන් දිය යුතුය.

එ. _____ ප්‍රේමයෙන් තොරව පාවිච්චි කරන දීමනා වලින් බලපෑමක් ඇති නොවේ.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. 2 පේත්‍රුස් 2 හා යූද් පොත අධ්‍යයනය කරන්න. "බොරු ප්‍රොපේතවරුන්ගේ" හා "රහසින් ඇතුල්වූ මිනිසුන්ගේ" පෞද්ගලික චරිත ලක්ෂණ ලැයිස්තුගත කරන්න. මොවුන් ව්‍යාජ දේවල් සිදුකරන මිනිසුන්ය. මොවුන් සැබෑ ඇදහිලිවන්තයන් නොවන අතර දෙවියන්වහන්සේගේ මිනිසුන් රැවටීමට බොරු දීමනා යොදාගනී.

2. ආත්මික දීමනා මෙන්ම ස්වභාවික තලෙන්තද දෙවියන්වහන්සේ විසින් පාවිච්චි කරනු ඇත. පහත බයිබල් පද දෙස බලන්න. ඒවායේ සඳහන් නම් හා ඔවුන්ගේ ස්වභාවික තලෙන්ත ලයිස්තුගත කරන්න.

## ස්වභාවික තලෙන්ත

| බයිබල් පදය | නම | තලෙන්තය |
|---|---|---|
| උත්පත්ති 4:20 | ________________ | ____________________ |
| උත්පත්ති 4:2 | ________________ | ____________________ |
| උත්පත්ති 4:21 | ________________ | ____________________ |
| උත්පත්ති 4:22 | ________________ | ____________________ |
| උත්පත්ති 25:27 | ________________ | ____________________ |

3. පහත සඳහන් බයිබල් පද අධ්‍යයනය කර වාක්‍ය සම්පූර්ණ කරන්න.

   ආත්මික දීමනා ගැන දැනගැනීම වැදගත් වන්නේ පහත කරුණු නිසාය.

   අ. ඒවායේ පාවිච්චිය උදෙසා අප දෙවියන්වහන්සේට ___________________ වනු ඇත. අප ______________________ ය.

   (1 පේත්‍රුස් 4:10; 1 කොරින්ති 4:1-2; මතෙව් 25:14-30).

   ආ. අප ඒවා උදෙසා ____________________ වන අතර ඒවා __________________

   (1 තිමෝති 4:14; 1 කොරින්ති 12:1)

4. 1 කොරින්ති 13 ප්‍රේමයේ ගුණාංග සඳහන් වේ. සපයා ඇති හිස්තැන තුළ සෑම ගුණාංගයක්ම සඳහන් බයිබල් පදය ලියන්න. පළමු හිස්තැන ඔබට අනුගමනය කිරීමට උදාහරණයක් ලෙස දක්වා තිබේ.

_5___ ඉවසීම
_____ ගුණවන්තකම
_____ ඊර්ෂ්‍යා නොවීම
_____ පාරට්ටු කර නොගැනීම
_____ උඩඟු නොවීම
_____ අශෝබන ලෙස නොහැසිරීම
_____ තමාගේම කාරණා සොයන්නේ නැතිකම
_____ කෝපනොවීම
_____ නපුර ගණන් නොගැනීම
_____ අධර්මිෂ්ඨකමට ප්‍රීති නොවීම
_____ සැබෑව සමග ප්‍රීතිවීම

_____ සියල්ල දරාගැනීම
_____ සියල්ල විශ්වාස කිරීම
_____ සියල්ල බලාපොරොත්තුවීම
_____ සියල්ල ඉවසන්නේය

ඔබට ප්‍රේම කිරීමට අපහසු කෙනෙකුගේ නමක් ලියන්න. ඉහත සඳහන් ගුණාංග දෙස බලන්න. මෙම පුද්ගලයාට ප්‍රේම කිරීමට ඔබට අවශ්‍ය විශේෂ ගුණාංග ලියා දක්වන්න.

මට ____________________________ ට ප්‍රේම කිරීමට අපහසුතා පවතී.

ඔහුට / ඇයට ප්‍රේම කිරීමට මට පහත සඳහන් විශේෂිත ගුණාංග අවශ්‍ය වේ:

---

5. 1 කොරින්ති 12-14 දක්වා දීමනාවන් නිසි ලෙස පාවිච්චි කිරීම පිළිබඳව පාවුල් සාකච්ඡා කළ කරුණු අධ්‍යයනය කිරීමට පහත සටහන යොදාගන්න.

I. ඔබට ආත්මික දීමනා පිළිබඳ දැනුමක් තිබිය යුතුය: 1 කොරින්ති 12:1

II. ආත්මික දීමනා රැසක් තිබේ, නමුත් ඒවා පැමිණෙන්නේ එක් ආත්මයාණන්ගෙනි: සෑම දීමනාවක් තුළදීම ත්‍රිත්වයේ දෙවියන්වහන්සේ ක්‍රියාත්මක වේ. 1 කොරින්ති 12:4-11

III. ආත්මික දීමනා පාවිච්චි කිරීමේදී අප ශරීරයක් ලෙස ක්‍රියා කළ යුතුය: සෑම කොටසක්ම අනෙක් කොටස් සමග එක්සත්ව සිටිය යුතුය. 1 කොරින්ති 12:12-31.

අ. ශරීරය තුළ බෙදීම් (අසමගිතා) නොතිබිය යුතුය. අප සියලු දෙනා එකිනෙකා ගැන සැලකිය යුතුය: 1 කොරින්ති 12:25-26

ආ. දෙවියන්වහන්සේ සභාව තුළ ආත්මික දීමනා සලසා ඇත්තේ පිළිවෙළකටය: 1 කොරින්ති 12:28

ඇ. හැමකෙනෙකුටම ඇත්තේ එකම දීමනාව නොවේ: 1 කොරින්ති 12:28-30

ඈ. අප ආත්මික දීමනාවන්ට ආශා විය යුතුය: 1 කොරින්ති 12:31; 14:1

ඉ. සෑම දීමනාවක්ම පාවිච්චි කිරීමේ ප්‍රධාන කරුණ ප්‍රේමයයි: 1 කොරින්ති 13

ඊ. දීමනාවක් සභාව ගොඩනැංවිය යුතුය: 1 කොරින්ති 14:12

IV. ඔබට අන්‍යභාෂ දීමනාව තිබේ නම්, තේරුම්කර දීමේ දීමනාව උදෙසා යාච්ඤා කරන්න: 1 කොරින්ති 14:1-13

අ. වචන තේරුමක් නැතිව ආත්මයෙන් ප්‍රශංසා කිරීම හා තේරුමක් ඇතිව ප්‍රශංසා කිරීම යන දෙකම නමස්කාරයේ කොටස්ය: 1 කොරින්ති 14:14-15

ආ. නොඇදහිලිවන්තයන් සිටින තැනකදී අන් අයට වැටහෙන වචන කතා කිරීම වැදගත් වේ: 1 කොරින්ති 14:16-19

ඇ. අන්‍යභාෂා කතාකිරීම නොඇදහිලිවන්තයන් උදෙසා ලකුණකි: 1 කොරින්ති 14:22-25

ඈ. අනාගතවාක්‍ය ඇදහිලිවන්තයන්ට ප්‍රයෝජයක් ලබා දේ: 1 කොරින්ති 14:22-25

V. නමස්කාර මෙහෙය තුළ සියලුම දේවල් නිසි පිළිවෙළට සිදුවිය යුතුය. අන්‍යභාෂා තේරුම්කරදීමේ දීමනාව ඇති අයකු නොමැති විට අන්‍යභාෂා දීමනාව පාවිච්චි නොකළ යුතුය: 1 කොරින්ති 14:26-31

අ. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළින් සේවය කරන විට ඔබට පාලනයක් නැති වන්නේ නැත. නිසි පරිදි දීමනා පාවිච්චි කිරීමට ඔබට පාලනයක් තිබේ: 1 කොරින්ති 14:32

ආ. ව්‍යාකූල බව දෙවියන්වහන්සේගෙන් පැමිණෙන දෙයක් නොවේ. 1 කොරින්ති 14:33

VI. අන්‍යභාෂා කතාකිරීම තහනම් නොකළ යුතු අතර ඔබ අනාගතවාක්‍ය පැවසීමට ආශා විය යුතුය: 1 කොරින්ති 14:39

VII. අඥාන ලෙස ප්‍රශ්න ඇසීම නමස්කාර මෙහෙයේ කොටසක් නොවිය යුතුය: 1 කොරින්ති 14:34-35, 37-38

VIII. දීමනා නිසි පරිදි පාවිච්චි කිරීමට ප්‍රධාන උපදේශය: හැම දෙයක්ම විනීතව හා පිළිවෙළකට සිදුකිරීමට ඉඩ හරින්න: 1 කොරින්ති 14:40

# හයවන පරිච්ඡේදය

## ශුද්ධාත්මයාණන්ගේ විශේෂ දීමනා

### අරමුණු:

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්,

- මෙම අධ්‍යයනයේදී ආත්මික දීමනා බෙදන්නාවූ කොටස් හතරක් නම් කිරීමට.
- ශුද්ධාත්මයාණන්ගේ විශේෂ දීමනා හඳුනාගැනීමට
- අනාගතවක්තෘවරයෙකු වීමේ විශේෂ දීමනාව හා අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව අතර ඇති වෙනස පැහැදිලි කිරීමට
- ගුරුවරයෙකු වීමේ විශේෂ දීමනාව හා ඉගැන්වීමේ දීමනාව අතර ඇති වෙනස පැහැදිලි කිරීමට  ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද, සමහරුන් අනාගතවක්තෘවරුන්ද, සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද, සමහරුන් සභාපාලකයන්ද, සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. (එපීස 4:11)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමට පෙර පහත සඳහන් බයිබල් කොටස් කියවන්න. මෙම කොටස් තුළ ශුද්ධාත්මයාණන්ගේ දීමනා සඳහන් වේ.

-රෝම 12:1-8
-1 කොරින්ති 12:1-31
-එපීස 4:1-16
-1 පේත්‍රුස් 4:7-11

මෙම අත්පොතේ උප ග්‍රන්ථය කොටසේ ඉහත බයිබල් පද සඳහන් කර ඇත.

අධ්‍යයනය පහසුව සඳහා අප දීමනා ප්‍රධාන කොටස් හතරකට බෙදා දක්වා ඇත.

-විශේෂ දීමනා
-වාචික (කතා කිරීමේ) දීමනා
-සේවය කිරීමේ දීමනා
-ලකුණු පිළිබඳ දීමනා

බයිබලය තුළ දීමනා මෙලෙස බෙදා දක්වා නැත. අප එසේ සකස් කර ඇත්තේ විවිධාකාර දීමනා පහසුවෙන් මතක තබා ගැනීමට ඔබට උපකාර කිරීම සඳහාය. මෙම පරිච්ඡේදයේ සාකච්ඡා කරනුයේ විශේෂ දීමනා පිළිබඳවය. මීට පසුව එන පරිච්ඡේද තුළ කතාකිරීමේ, සේවය කිරීමේ හා ලකුණු පිළිබඳ දීමනා ගැන පැහැදිලි කරනු ඇත.

## ශරීරය තුළ තැන්පත් කර ඇත

මීට පෙර පරිච්ඡේදය තුළින් ආත්මික දීමනාවන්ගේ ඒකත්වය හා විවිධත්වය පැහැදිලි කළේය. බොහෝ විවිධාකාර දීමනා පවතින නමුත්, ඒ සියල්ලටම ඇත්තේ එක් උල්පතකි. එම උල්පත

ශුද්ධාත්මයාණන්වහන්සේය. දෙවියන්වහන්සේ සභාව තුළ සෑම ඇදහිලිවන්තයෙකුටම විශේෂිත ස්ථානයක් ලබා දී ඇත.

> **නුමුත් දෙවියන්වහන්සේ තමන්ගේ කැමැත්ත ලෙස ඒ සියලු අවයවයන් වෙන වෙනම ශරීරයේ තැබූසේක. (1 කොරින්ති 12:18)**

සෑම සාමාජිකයෙකුටම දෙවියන්වහන්සේ තමා උදෙසා තෝරා ඇති ස්ථානයක් පවතී. ශුද්ධාත්මයාණන්ගේ දීමනා තුළින් සභාව තුළ ඔහුගෙන් විශේෂයෙන් බලාපොරොත්තුවන දේ සම්පූර්ණ කිරීමේ කාර්ය තුළ ඔහු යොදවා තිබේ.

සෑම ඇදහිලිවන්තයෙක්ම දෙවියන්වහන්සේ තමා උදෙසා තෝරා ඇති ස්ථානය පුරවමින් ඔහුගේ ආත්මික දීමනා පාවිච්චි කරන විට, සභාව සුමටව ක්‍රියාත්මක වේ. දෙවියන්වහන්සේ එය, හිසේ සිට පා ඇඟිලි දක්වා සෑම සාමාජිකයෙකුම තම කාර්ය දන්නා හා එය ක්‍රියාත්මක කරන මිනිස් සිරුරේ ක්‍රියාකාරීත්වයට සමාන කළ සේක (1 කොරින්ති 12:1-31). ඔබ මෙම ආත්මික දීමනා අධ්‍යයනය කරන විට මිනිස් සිරුරේ සෑම සාමාජිකයෙකුම වැදගත් වන ලෙසට සභාව තුළ සෑම දීමනාවක්මත් එක ලෙස වැදගත් වන බව මතක තබා ගන්න.

> **නුඹ මට ඕනෑ නැතැයි අතට කියන්ට ඇසටවත්, නුඹලා මට ඕනෑ නැතැයි පාදවලට කියන්ට හිසටවත් නුපුළුවන. එසේය, ශරීරයේ වඩා ඕනෑකරන්නේ වඩා දුර්වලව පෙනෙන අවයවයෝය. (1 කොරින්ති 12:21-22)**

ඔබ ආත්මික දීමනා අධ්‍යයනය කරන විට, ඒවා ස්වභාවික හැකියාවන් නොවන බවද මතක තබා ගන්න. ඒවා ඇදහිලිවන්තයන් කිතුනු සේවයෙහි යෙදීම උදෙසා වූ ශුද්ධාත්මයාණන්ගෙන් ලැබෙන හැකියාවන්ය.

(සටහන: මෙම පරිච්ඡේදය තුළත් ඉදිරි පරිච්ඡේද තුන තුළත් සෑම ආත්මික දීමනාවක්ම සාකච්ඡා කිරීමෙන් අනතුරුව "තවදුරටත් අධ්‍යනය සඳහා" යෝජනා ඉදිරිපත් කර තිබේ. මෙසේ සිදු කර ඇත්තේ, ඊළඟ දීමනාව වෙත යාමට පෙර පළමු දීමනාව සම්පූර්ණයෙන් අධ්‍යයනය කිරීමට ඔබට අවස්ථාව ලබා දීම සඳහාය.)

## විශේෂ දීමනා

ආත්මික දීමනාවන්ගේ පළමු කොටස අපි "විශේෂ දීමනා" ලෙස හඳුන්වමු. මෙම දීමනා සඳහා අප මෙම මාතෘකාව යොදාගන්නේ මේ සෑම දීමනාවක්ම සභාවේ විශේෂ නායකත්ව ස්ථානයක් වන බැවිනි.

> **උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. (එපීස 4:11)**

මෙම නායකත්ව ස්ථානයන් ඇතැම් විට සභාව තුළ "නිලතල" ලෙස හඳුන්වයි. "නිලයක්" යනු වගකීමක් හා රාජකාරියක් ඇති ස්ථානයකි. මෙම විශේෂ නායකත්ව දීමනාවන් නම්:

-ප්‍රේරිතයන්
-අනාගතවක්තෘවරු
-ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්
-සභාපාලකයන්
-ගුරුවරු

# ප්‍රේරිතයන්

**මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්වර්යකරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුද නානා වර්ග භාෂාද සභාවෙහි පිහිටෙවු සේක. (1 කොරින්ති 12:28)**

**උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. (එපීස 4:11)**

ප්‍රේරිතයෙකු යනු විවිධ ස්ථාන වල හා විවිධ සංස්කෘතීන් තුළ නව සභාවන් ගොඩනැගීමට හා අධීක්ෂකයෙකු ලෙස සභාවන් ගණනාවක් බලාගැනීමේ විශේෂ හැකියාවක් ඇති පුද්ගලයෙකි. ප්‍රේරිතයෙක් යන්නෙහි අදහස, “මුළු බලය හා ආධිපත්‍යය ඇතිව කෙනෙකු උදෙසා ක්‍රියා කිරීමට යවන ලද, නියෝජිතයෙකුය”. ඇදහිලිවන්තයන්ගේ සංවිධානාත්මක සභාවන් වර්ධනය කිරීම තුළින් ලෝකය පුරා ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට විශේෂ ආධිපත්‍යයක් හෝ බලයක් ප්‍රේරිතයෙකුට ඇත. සභාව තුළ ප්‍රේරිතවරු හැඳින්වීමට නූතනයේ භාවිත කරන වචන වනුයේ මිෂනාරිවරු හා සභා රෝපණය කරන්නන් යන ඒවාය.

බයිබලය ප්‍රේරිතවරු වර්ග තුනක් ගැන කතා කරයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේව හඳුන්වනු ලැබුවේ ප්‍රේරිතවරයෙකු ලෙසයි.

**එහෙයින්, ස්වර්ගිය කැඳවීමකට පංගුකාරවූ ශුද්ධවූ සහෝදරයෙනි, අපේ ඇදහිල්ලේ ප්‍රේරිතයාණන් සහ උත්තම පූජකයාණන්වූ යේසුස්වහන්සේ කල්පනාකරපල්ලා. මෝසෙස් දෙවියන්වහන්සේගේ මුළු ගෘහයෙහි විශ්වාසව සිටිසේම මුන්වහන්සේද තමන්ව පත්කළ තැනැන්වහන්සේට විශ්වාසව සිටිසේක. (හෙබ්‍රෙව් 3:1-2)**

යේසුස්වහන්සේගේ ගෝලයන් දොළොස්දෙනා හඳුන්වනු ලැබුවේ ප්‍රේරිතයන් ලෙසයි.

**ප්‍රේරිතයන් දොළොස්දෙනාගේ නාමවල් මේය: පළමුවෙනුව පේත්‍රුස් නම්ලත් සීමොන් සහ ඔහුගේ සහෝදරවූ අන්ද්‍රැය. සෙබදීගේ පුත්‍රවූ යාකොබ් සහ ඔහුගේ සහෝරදවූ යොහන්ය. (මතෙව් 10:2)**

ප්‍රේරිතයන් දොළොස්දෙනාට විශේෂ කාර්යයක් විය. ඔවුන් සභාව ගොඩනැගීමේ කොටසක් විය. අන් කිසිදු ඇදහිලිවන්තයෙකුට කිසිදාක පැවරිය නොහැකි කාර්යයක් ඔවුන්ට තිබුණු අතරම, ශුද්ධාත්මයාණන්ගේ පොදු ප්‍රේරිතවර දීමනාවක්ද තිබේ.

**උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද....... (එපීස 4:11)**

මෙම පාඨයට අනුව ප්‍රේරිතයන් තෝරාගනු ලබන්නේ දෙවියන්වහන්සේ විසිනි. පාවුල් නැවත වරක් මෙය තහවුරු කරයි.

**මෙසේ දෙවියන්වහන්සේ, පළමුකොට ප්‍රේරිතයන්ද .... සභාවේ පිහිටවූ සේක. (1 කොරින්ති 12:28)**

කෙනෙකුට ප්‍රේරිතවර දීමනාව ඇති බව තහවුරු කරන විශේෂ ලකුණු බයිබලයේ සඳහන් වේ.

**සැබවින් ලකුණුවලින්ද පුදුමවලින්ද බලවත් ක්‍රියාවලින්ද ප්‍රේරිතයෙකුගේ ලකුණු සියලු ආකාර ඉවසීම ඇතුව නුඹලා අතරෙහි කරනලද්දේය. (2 කොරින්ති 12:12)**

**තවද ප්‍රේරිතයන්ගේ අත්වලින් බොහෝ හාස්කම්ද පුදුමද සෙනග අතරේ කරනලද්දේය. ඔවුන් සියල්ලෝ එක්සිත්ව සාලමොන්ගේ ද්වාරමණ්ඩපයෙහි සිටියෝය. (ක්‍රියා 5:12)**

සභාව තුළ ප්‍රේරිතයන්ගේ විශේෂ නායකත්වය ක්‍රියා පොත තුළින් විස්තර කෙරේ.

**යුදයෙන් සමහර දෙනෙක් ඇවිත්: මෝසෙස්ගේ නියෝගය ලෙස නුඹලා චර්මඡේදකරනු නොලැබුවොත් නුඹලාට ගැළවෙන්ට නුපුළුවනයි සහෝදරයන්ට ඉගැන්වුවෝය. එහෙයින් පාවුල්ද**

බාර්ණබස්ද ඔවුන් සමග මහත් භේදයක් සහ වාදයක් ඇතිවූ කල්හි, පාවුල් සහ බාර්ණබස්ද ඔවුන්ගෙන් තවත් සමහරෙක්ද මේ ප්‍රශ්නය ගැන ප්‍රේරිතයන් සහ වැඩිමහල්ලන්ගෙන් විචාරන පිණිස යෙරුසලමට යන්ට නියම කරනු ලැබුවෝය. (ක්‍රියා 15:1-2)

ඔව්හු නුවරින් නුවරට ගමන්කරද්දී යෙරුසලමේ සිට ප්‍රේරිතයන් විසින්ද වැඩිමහල්ලන් විසින්ද පනවන ලද නියෝග පවත්වන්ට ඔවුන්ට භාරදුන්නෝය. මෙසේ සභාවෝ ඇදහිල්ලෙහි ස්ථිරව, දවස්පතා ගණනින් වැඩිවූහ. (ක්‍රියා 16:4-5)

ප්‍රේරිතවරු සභාවන් නඟා සිටුවීම තුළින් ශුභාරංචි පණිවුඩය පතුරුවා හැරියහ. ඔවුන් මෙම සභාවන්ට නායකත්වය දෙන අතර ඔවුන්ගේ සේවාවන් තුළ විශේෂ ආත්මික ලකුණු පෙන්නුම් කෙරේ. ප්‍රේරිතයෙකුවීම උදෙසා කැඳවීම හා ආශාව පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙනි.

මනුෂ්‍යයන් කෙරෙන්වත් මනුෂ්‍යයා කරණකොටගෙනවත් නොව, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ පියවූ දෙවියන්වහන්සේ කරණකොටගෙන ප්‍රේරිතයෙක් වන පාවුල් නම් මා විසින්ද, (ගලාති 1:1)

මෙම විශේෂ දීමනාව සාමාන්‍යයෙන් හඳුනාගනු ලබන්නේ වෙනත් ස්ථාන වලට ප්‍රේරිතයන් යැවීම සිදු කරන ප්‍රාදේශීය සභාවන් විසිනි:

අන්තියෝකියේ පිහිටි සභාවෙහි ප්‍රොපේතවරු සහ ගුරුවරු සිටියෝය. එනම්, බාර්ණබස් සහ නිගර් නම් සිමියොන්ද කිරේනියේ ලූකියස්ද දේශාධිපතිවූ හෙරොද් සමග ඇතිදැඩිවුණාවූ මානායින්ද සාවුල් ද යන අයවල්ය. ඔවුන් ස්වාමින්වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන්කල, ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට, මා විසින් බාර්ණබස්ද සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලායයි කීසේක. එවිට ඔව්හු නිරාහාරයෙන් හිඳ යාච්ඤාකොට ඔවුන් පිට අත්තබා, ඔවුන් පිටත්කර හැරියෝය. (ක්‍රියා 13:1-3)

වෙනත් අය වැඩ කර නොමැති ස්ථාන වල සේවය කිරීමට ආශාවක් දක්වයි.

එසේය, වෙන කෙනෙකුගේ අත්තිවාරම පිට ගොඩ නොනගන පිණිස ක්‍රිස්තුස්වහන්සේගේ නාමය සඳහන්කරනු ලැබූ තැන්වල නොව, උන්වහන්සේ ගැන ආරංචි නොලැබූ අය දකින්නෝය. උන්වහන්සේ ගැන නෑසූ අය තේරුම්ගන්නෝයයි ලියා තිබෙන ලෙස, ශුභාරංචිය දේශනාකරන්ට අභිප්‍රායකෙළෙමි. (රෝම 15:20-21)

නුමුත් නුඹලාගේ ඇදහිල්ල වැඩිවන විට, අපේ අත්වලට සුදානම්ව තිබෙන අනුන්ගේ මායිමේ වැඩ ගැන පාරට්ටු නොකොට, නුඹලාට එහායින් තිබෙන පළාත්වලට ශුභාරංචිය දේශනාකරන පිණිස වර්ධනයවීමට ඇත්තාවූ අපේ මායිමේ ප්‍රමාණය ලෙස නුඹලා නිසා විශාලකමක් ලබන්නෙමුයයි බලාපොරොත්තුවෙමුව. (2 කොරින්ති 10:16)

ක්‍රිස්තුස්වහන්සේ උදෙසා මිනිසුන් දිනා ගැනීමට වෙනත් සංස්කෘතීන්වලට හා ජීවන රටාවන්ට හුරු වීමට ප්‍රේරිතයන් කැමැත්තක් දක්වයි.

මක්නිසාද මම සියල්ලන්ගෙන් නිදහස්ව සිටියෙම් නුමුත් වැඩිදෙනෙකු දිනාගන්නා පිණිස සියල්ලන්ට මා දාසයෙක් කරගතිමි. යුදෙව්වරුන් දිනාගන්නා පිණිස යුදෙව්වරුන් අතරෙහි යුදෙව්වෙකු මෙන්ද ව්‍යවස්ථාව යටතේ නොසිටින මම ව්‍යවස්ථාවට යටත්වූවන් දිනාගන්නා පිණිස, ව්‍යවස්ථාව යටතේ සිටින්නන්ට ව්‍යවස්ථාව යටතේ සිටින කෙනෙකු මෙන්ද වුණෙමි. මම ව්‍යවස්ථාව නැත්තවුන් දිනාගන්නා පිණිස, ව්‍යවස්ථාව නැත්තන්ට ව්‍යවස්ථාව නැති කෙනෙකු මෙන් වුණෙමි. එහෙත් දෙවියන්වහන්සේ කෙරෙහි ව්‍යවස්ථාවක් නැතුව නොව ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ව්‍යවස්ථාවට යටත්ව සිටිමි. දුර්වලයන් දිනාගන්නා පිණිස දුර්වලයන්ට දුර්වලයෙක් වුණෙමි, සියලු ආකාර-යෙන්ම සමහරෙකු ගළවන පිණිස මම සියල්ලන්ට සියල්ල වුණෙමි. තවද ශුභාරංචියේ පංගුකාරයෙක් වෙන පිණිස ශුභාරංචිය උදෙසා සියල්ල කරමි. (1 කොරින්ති 9:19-23)

ප්‍රේරිතයන්, තමාගෙන් තොරව වුවද සභාව ඉදිරියට ගෙන යා හැකි නායකයන් පුහුණු කිරීමෙන් සභාව වර්ධනය කරයි.

ඔව්හු ඒ නුවර ශුභාරංචිය දේශනාකොට, බොහෝ දෙනෙක් ගෝලයන් කර, ලුස්ත්‍රාවටද, ඉකෝනියටද අන්තියෝකියටද හැරී ඇවිත්, අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ

**දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනෑයයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට, ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාදකළෝය. ඔව්හු සභාවක් සභාවක් පාසා ඔවුන්ට වැඩිමහල්ලන් පත්කොට, නිරාහාරයෙන් ඉඳ යාච්ඤාකොට තමුන් අදහාගත් ස්වාමින්වහන්සේට ඔවුන් භාරදී, (ක්‍රියා 14:21-23)**

දිගටම සේවය කිරීම සඳහා හා නව සභාවන් උදෙසා සුදුසුකම්ලත් නායකයන් නඟා සිටුවීම ප්‍රේරිතයන්ගේ වගකීම් බව මෙම බයිබල් පාඨයෙන් එළිදරව් කරයි.

ප්‍රේරිතවර දීමනාවේ මුද්‍රාව හෙවත් සාක්ෂිය නම් අන් අයගේ ජීවිත තුළ එමගින් ඇතිකරන ආත්මික ප්‍රතිඵලයයි. පාවුල් තමා විසින් ගොඩනැගූ කොරින්තියේ සභාවට මෙසේ ලිවේය.

**මක්නිසාද ස්වාමින්වහන්සේ තුළ මාගේ ප්‍රේරිතකමේ මුද්‍රාව නම් නුඹලාය. (1 කොරින්ති 9:2ආ)**

ඇදහිලිවන්තයන්ගේ සහභාගිත්වයන් වර්ධනය කර ඒවා සභා ශරීරය ලෙස ගොඩනැගීමේ හැකියාව ප්‍රේරිතවර දීමනාවේ මුද්‍රාවයි.

රැවටිලිකාර වන නමුත් ඔවුන්ගේ කාර්යයන් තුළින් හඳුනාගත හැකි ව්‍යාජ ප්‍රොපේතවරුන් පිළිබඳ අනතුරු අඟවයි.

**එබඳු මනුෂ්‍යයෝ බොරු ප්‍රේරිතයෝය, ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයන්ගේ වෙස් ගන්නාවූ වංචාකාර සේවකයෝය. ඒක පුදුමයක් නොවේ, මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ, ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය. (2 කොරින්ති 11:13-15)**

## තවදුරටත් අධ්‍යනය සඳහා

ප්‍රේරිතවර දීමනාව තිබූ අය පිළිබඳ උදාහරණ කිහිපයක් නව ගිවිසුම ඉදිරිපත් කරයි. වැඩිදුර අධ්‍යයනය සඳහා මෙම බයිබල් පද යොදා ගන්න.

-පාවුල් : ගලාති 1:1
-අන්ද්‍රෝනිකස් හා යුනියස් : රෝම 16:7
-අපොල්ලස් : 1 කොරින්ති 4:6,9
-යාකොබ් : ගලාති 1:9
-යේසුස්වහන්සේගේ ප්‍රේරිතයන් : ශුභාරංචි පොත්, ක්‍රියා පොත

# අනාගතවක්තෘවරු

**මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්චර්යකරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුද නානා වර්ග භාෂාද සභාවෙහි පිහිටෙවූ සේක. (1 කොරින්ති 12:28)**

**උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන් ද සමහරුන් අනාගතවක්තෘවරුන් ද කොට දුන් සේක. (එපීස 4:11)**

අනාගතවක්තෘමය දීමනා දෙකක් තිබේ. එකක් නම්, අනාගතවක්තෘවරයෙකුවීමේ විශේෂ දීමනාවයි. අනෙක නම් අනාගතවාක්‍ය පැවසීමේ දීමනාවයි. පොදුවේ ගත් විට, අනාගතවාක්‍ය යන්නෙන් දැක්වෙන්නේ දෙවියන්වහන්සේගේ විශේෂ ආනුභාවය යටතේ කතා කිරීමයි. එනම් දෙවියන්වහන්සේගෙන් ක්ෂණිකව පණිවුඩයක් ලැබ දිව්‍යමය ආලේපලත් ප්‍රකාශයක් තුළින් එය උන්වහන්සේගේ ජනයාට පැවසීම ඇති විශේෂ හැකියාවයි. මේ මට්ටම දක්වා, මෙම අර්ථ දැක්වීම අනාගතවක්තෘවරයෙකු වීමේ විශේෂ නායකත්ව තත්වයට මෙන්ම, අනාගතවාක්‍ය පැවසීමේ දීමනාවට ද අදාළ වේ.

නමුත් කෙනෙකු අනාගතවාක්‍ය පැවසූ පමණින්ම ඔහු අනාගතවක්තෘවරයෙකු නොවේ. මුළු සභාවටම අනාගතවාක්‍ය පැවසීමේ දීමනාවට ආශාවෙන ලෙස පාවුල් පැවසුවේය.

**ප්‍රේමය අනුව පලයල්ලා, ආත්මික දීමනාවලටද ආශාවෙයල්ලා, ප්‍රධානකොට ධර්මවාක්‍ය කියන්ට ආශාවෙයල්ලා. (1 කොරින්ති 14:1)**

**මක්නිසාද සියල්ලන් ඉගෙනගන්නා පිණිසත්, සියල්ලන් ධෛර්යවෙන පිණිසත්, සියල්ලන්ට එක්කෙනෙකු බැගින් ධර්මවාක්‍ය කියන්ට පුළුවන. (1 කොරින්ති 14:31)**

නමුත් හැමකෙනෙකුම අනාගතවක්තෘවරයෙකු නොවන බව පාවුල් දැක්වූයේය. ඔහු මෙසේ ඇසුවේය.

**සියල්ලෝම ප්‍රේරිතයෝද? සියල්ලෝම අනාගතවක්තෘවරුද? සියල්ලෝම ගුරුවරුද? (1 කොරින්ති 12:29)**

අනාගතවක්තෘවරයෙකුවීමේ හා අනාගතවාක්‍ය පැවසීම අතර වෙනස පහත පාඨය තුළ දැක්වේ.

**පසුවදා අපි පිටත්ව කායිසාරියට ඇවිත්, සත්දෙනාගෙන් එක්කෙනෙක්වූ එවැන්ජලිස්ත පිලිප්ගේ ගෙට පැමිණ ඔහු සමග නැවති සිටියෙමුව. ප්‍රොපේතවාක්‍ය කියන්නාවූ කන්‍යා දූවරු සතරදෙනෙක් ඔහුට සිටියෝය. බොහෝ දවස් අප එහි නැවතුණු අතර, අගබස් නම් එක් අනාගතවක්තෘ කෙනෙක් යුදයෙන් ඇවිත්, අප වෙතට පැමිණ පාවුල්ගේ ඉඟපටිය රැගෙන තමාගේම අත්පා බැඳගෙන, යුදෙව්වරු මේ ඉඟපටිය අයිතිවූ මනුෂ්‍යයා යෙරුසලමේදී මේ ආකාරයෙන් බැඳ අන්‍යජාතීන්ගේ අත්වලට පාවාදෙන්නෝයයි ශුද්ධාත්මයාණන්වහන්සේ කියනසේකැයි කීවේය. (ක්‍රියා 21:8-11)**

පිලිප්ගේ දියණියන්ට අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව පැවතුණි. නමුත් අගබස් යනු අනාගතවාක්‍ය පැවසූ කෙනෙක් පමණක් නොව, සභාවේ නායකත්වය දැරූ කෙනෙක් ද විය. දෙවියන්වහන්සේ පාවුල්ගේ සේවය සඳහා නායකත්වය දෙන කෙනෙකු ලෙස අගබස්ව පාවිච්චි කළ සේක. අගබස් යෙරුසලමේ සිදුවන්නට යන දේවල් පිළිබඳව පාවුල්ට ආත්මික මඟපෙන්වීම් ලබා දුන්නේය. (ක්‍රියා 21:11).

අනාගතවක්තෘවරයෙකු වීමේ විශේෂ දීමනාව ඇති අය දෙවියන්වහන්සේගේ ආනුභාවය යටතේ කතාකිරීම පමණක් සිදු නොකරයි. ඔවුන් සභාවේ අධිකාරී නිලයන් හා නායකත්ව තත්වයන්ද උසුලයි. බාර්ණබස් හා පාවුල්ව දෙවියන්වහන්සේ කැඳවා තිබූ විශේෂ සේවයට මඟපෙන්වීමට අනාගතවක්තෘවරු හා ගුරුවරු නායකයන් ලෙස යොදාගත් අයුරු දැක්වෙන ක්‍රියා 13:1-4 තුළින් මෙය තහවුරු කරයි.

පැරණි ගිවිසුම තුළ මඟපෙන්වීම ලබා ගැනීමට මිනිසුන් අනාගතවක්තෘවරු වෙතට ගියහ. ශුද්ධාත්ම පූර්ණත්වයේ දීමනාව ඒ කාලයේදී ලැබී තිබුණේ නැත. දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අති ශුද්ධ ස්ථානය තුළින් වැසී තිබුණේය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම නිසා, අපට දැන් දේව අභිමුඛයට ළඟා වීමේ හැකියාව ඇත. ශුද්ධාත්ම දීමනාව ලබා දී තිබේ. එසේම ඔබ කලින් ඉගෙනගත් පරිදි මඟපෙන්වීම උන්වහන්සේගේ අරමුණු වලින් එකකි.

**මක්නිසාද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද, එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. (රෝම 8:14)**

ආත්මික මඟපෙන්වීම ලබා ගැනීමට අනාගතවක්තෘවරයෙකු වෙත යාම තවදුරටත් අවශ්‍ය නොවේ. මෙය ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරීත්වයන්ගෙන් එකකි. සෑම ඇදහිලිවන්තයෙක්ම දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ගේ මඟපෙන්වීම ලබන අකාරය ඉගෙන ගත යුතුය. ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලැබීමෙන් අනතුරුව අනාගතවක්තෘවරුන්ගෙන් මඟපෙන්වීම සෙවූ ඇදහිලිවන්තයන් පිළිබඳ වාර්තාවන් නව ගිවිසුම තුළ නොමැත.

නමුත් දෙවියන්වහන්සේ දැනටමත් ශුද්ධාත්මයාණන් තුළින් ඇදහිලිවන්තයෙකුට දී ඇති මඟපෙන්වීමක් තහවුරු කිරීමට තවමත් මෙම දීමනාව යොදා ගන්නා සේක. අගබස් හා පාවුල් සම්බන්ධ සිදුවීමේදී සිදු වූයේ මෙයයි. තමා යෙරුසලමට යා යුතු බව පාවුල් ඒ වන විටත් දැන සිටියේය. අගබස්ගේ අනාගතවාක්‍ය එහිදී ඔහුට සිදුවන දේ එළිදරව් කළේය. එය පාවුල්ට යෙරුසලමට යනවාද නොයනවාද යන්න තීරණය කිරීමට මඟපෙන්වීම උදෙසා දෙන ලද අනාගතවාක්‍යයක් නොවිය.

අනාගතවක්තෘවරයෙකු විසින් දිව්‍යමය ආනුභාවය යටතේ කතා කරනු ලබන වචන අනාගතවාක්‍ය ලෙස හැඳින්වේ. අනාගතවාක්‍ය පැවසීම යනු දෙවියන්වහන්සේගෙන් වන දැනමුතුකමේ වර්ධනයවීමේ හා සැනසිල්ලේ වදන් විවෘතව ප්‍රකාශකර සිටීමයි.

**නුමුත් ධර්මවාක්‍ය පවසන්නා වර්ධනවීමද දැනමුතුකමද සැනසීමද පිණිස මනුෂ්‍යයන්ට කථාකරන්නේය. (1 කොරින්ති 14:3)**

අනාගතවාක්‍ය පැවසීම ඇදහිලිවන්තයන් වර්ධනය කිරීම තුළින් ඇදහිලිවන්තයන්ට පමණක් නොව එය නොඇදහිලිවන්තයන්ට ද සේවය කරයි. අනාගතවාක්‍ය තුළින් නොඇදහිලිවන්තයන්ගේ පාපය පිළිබඳ ඒත්තු ගන්වා ඔවුන්ව ස්වාමින්වහන්සේ වෙතට හැරවීමට හේතුවක් වේ.

**නුමුත් සියල්ලෝ ධර්මවාක්‍ය කියත් නම්, නොඇදහන්නෙක් හෝ නුගත් කෙනෙක් හෝ පැමිණිකල, සියල්ලන් විසින් ඔහුගේ වරද හඟවාදී, සියල්ලන් විසින් ඔහු විනිශ්චය කරනු ලබන්නේය. ඔහුගේ සිතේ රහස් එළිදරව්වන්නේය. මෙසේ ඔහු සැබවින් දෙවියන්වහන්සේ නුඹලා අතරෙහියයි ප්‍රකාශකරමින්, මුහුණින් වැටී දෙවියන්වහන්සේට නමස්කාරකරන්නේය. (1 කොරින්ති 14:24-25)**

මිනිසුන් පසුතැවිල්ලට ගෙන ඒම අනාගතවක්තෘවරුන්ගේ අරමුණු වලින් එකකි.

**නුමුත් ඔවුන් ස්වාමින්වහන්සේ වෙතට හරවන පිණිස උන්වහන්සේ ප්‍රොපේතවරුන් ඔවුන් අතරට එවූසේක. ඒ ප්‍රොපේතවරුන් ඔවුන්ට අවවාදකළ නමුත් ඔව්හු ඇහුම්කන් නුදුන්නෝය. (2 ලේකම් 24:19)**

අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව අනර්ඝ දීමනාවක් ලෙස බයිබලය ප්‍රකාශ කරන අතර හා අන්‍යභාෂා කතා කිරීමේ දීමනාවට වඩා ආශාවිය යුතු දීමනාවක් ලෙස දක්වා තිබේ.

**ප්‍රේමය අනුව පලයල්ලා, ආත්මික දීමනාවලටද ආශාවෙයල්ලා, ප්‍රධානකොට ධර්මවාක්‍ය කියන්ට ආශාවෙයල්ලා. මක්නිසාද අන් භාෂාවකින් කථාකරන්නා මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේට කතාකරන්නේය. ඔහු ආත්මයෙන් රහස් කතාකරන නමුත් කාටවත් තේරෙන්නේ නැත. නුමුත් ධර්මවාක්‍ය පවසන්නා වර්ධනවීමද දැනමුතුකමද සැනසීමද පිණිස මනුෂ්‍යයන්ට කථාකරන්නේය. (1 කොරින්ති 14:1-3)**

**නුඹලා සියල්ලන් අන් භාෂාවලින් කථාකරනවාට කැමැත්තෙමි. නුමුත් නුඹලා ධර්මවාක්‍ය කියනවාට ඊට වඩා කැමැත්තෙමි. අන් භාෂාවලින් කතාකරන්නා සභාවේ වර්ධනයවීම පිණිස තේරුම්කර නොදෙතොත් ඔහුට වඩා ධර්මවාක්‍ය කියන්නා උතුම්ය. (1 කොරින්ති 14:5)**

**එබැවින්, මාගේ සහෝදරයෙනි, ධර්මවාක්‍ය කියන්ට ආශාවෙයල්ලා, අන් භාෂාවලින් කථාකිරීමත් තහනම් නොකරල්ලා, (1 කොරින්ති 14:39)**

සැබෑ අනාගතවාක්‍ය පැවසීම සැමවිටම ශුද්ධාත්මයාණන්වහන්සේ පාලනය යටතේ වන අතර අවධානය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙත යොමු කරන සේක.

**සහෝදරයෙනි, ආත්මික දීමනා ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි. නුඹලා අන්‍යදෘෂ්ටින්ව සිටියදී යම්සේ ගෙන යනු ලැබුවහුද එලෙසෙම නුඹලා ගොළු දේවතාරූප වෙතට ගෙනයනු ලැබූ බව නුඹලා දන්නහුය. එබැවින් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන කථාකරන්නාවූ කිසිවෙක් යේසුස්වහන්සේ ශාපලත් කෙනෙකැයි නොකියන බවත්, ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන මිස, යේසුස්වහන්සේ ස්වාමීන්වහන්සේයයි කියන්ට කිසිවෙකුට නුපුළුවන් බවත් නුඹලාට දන්වමි. (1 කොරින්ති 12:1-3)**

අනාගතවාක්‍ය දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය වෙනුවට භාවිත කිරීමක් නොවේ. අනාගතවාක්‍ය කීම් නැතිව යන නමුත් දේව වචනය සදාකල්ම පවතින බව බයිබලය පවසයි.

**... අනාගතවාක්‍ය කීම් වුවත් නැතිවන්නේය ... (1 කොරින්ති 13:8)**

**නුමුත් ස්වාමින්වහන්සේගේ වචනය සදාකාලේටම පවතින්නේය. මේ වනාහි නුඹලාට දේශනාකරනලද ශුභාරංචි වචනයය. (1 පේතෘස් 1:25)**

බයිබලය බොරු අනාගතවක්තෘවරු ගැන අනතුරු අඟවයි (මතෙව් 24:11,24; මාර්ක් 13:22). “බොරු අනාගතවක්තෘවරයා” ලෙස හඳුන්වනු ලබන පුද්ගලයෙකු ලෝක අවසානයේදී සිදුවන සිදුවීම් තුළින් ප්‍රකාශ වනු ඇත (එළිදරව් 13:11-17; 16:13; 19:20; 20:10).

ව්‍යාජ අනාගතවක්තෘවරු සිටින බැවින්, සැබෑ අනාගතවාක්‍යයන් හඳුනා ගැනීමට ක්‍රම කිහිපයක් දේව වචනයේ සඳහන් වේ. ඔබට පහත දේවල් තුළින් ඒවා හඳුනාගත හැකිය.

## 1. ධර්මයානුකූල වැරදි:

> **එහෙයින් අපට දෙනලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගතකීම් නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු. (රෝම 12:6)**

"ඇදහිල්ලේ ප්‍රමාණයට" යන වාක්‍ය ඛණ්ඩයෙන් අදහස් වනුයේ ඇදහිල්ල සමග ඇති නියම සම්බන්ධතාවයයි. සැබෑ අනාගතවාක්‍ය හඳුනාගැනීමේ මාර්ගය නම් ඒවා කිතුනු ඇදහිල්ල පිළිබඳව බයිබලයේ සඳහන් මූලික ධර්මයන් සමග එකඟවනවාද නැද්ද යන්නයි. උදාහරණයක් ලෙස, ව්‍යාජ අනාගතවක්තෘවරු ක්‍රිස්තුස්වහන්සේගේ දේවත්වය ප්‍රකාශ නොකරයි.

> **ප්‍රේමවන්තයෙනි, බොහෝ බොරු ප්‍රොපේතවරු ලෝකයට පැමිණ සිටින බැවින් සියලු ආත්ම විශ්වාස නොකොට, ඒ ආත්ම දෙවියන්වහන්සේගෙන්දැයි පරීක්ෂාකරපල්ලා, මෙයින් නුඹලා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ දැනගන්නහුය. එනම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාංසයෙන් යුක්තව ආ බව ඒත්තුගන්නාවූ සෑම ආත්මයෝ දෙවියන්වහන්සේගෙන්ය. යේසුස්වහන්සේ ඒත්තු නොගන්නාවූ සියලු ආත්මයෝ දෙවියන්වහන්සේගෙන් නොවෙති. එන්නේයයි නුඹලා ඇසුවාවූ, දැනටම ලෝකයෙහි සිටින්නාවූ විරුද්ධ-ක්‍රිස්තුස්ගේ ආත්මය මේය.**
> (1 යොහන් 4:1-3)

ව්‍යාජ අනාගතවක්තෘවරු ලිංගික සදාචාර විරෝධි දේවල් පිළිබඳව හා ඒවාට අවසරදීම පිළිබඳව උගන්වයි:

> **නුමුත් සෙනඟ අතරේ බොරු ප්‍රොපේතවරුද සිටියෝය. එලෙසම විනාශක ධර්මභේද රහසින් උපදවමින්ද තමුන්ම මිලේටගත් ආචාරීන්වහන්සේව එපාකරමින්ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවාගන්නාවූ බොරු ගුරුවරු නුඹලා අතරෙන් වන්නෝය. ඔවුන්ගේ සල්ලාලකම් අනුව බොහෝ දෙනෙක් යනවා ඇත. ඔවුන් නිසා සත්‍යතාවේ මාර්ගයට අපහාස පැමිණෙන්නේය. තණ්හාව නිසා ඔවුන් වංචා වචනවලින් නුඹලා වෙළඳාමක් කරගන්නවා ඇත. පුරාණයේ සිට පවතින ඔවුන්ගේ විනිශ්චය ප්‍රමාද නොවන්නේය. ඔවුන්ගේ විනාශයද නිදා නොගනියි.**
> (2 පේත්‍රුස් 2:1-3)

ව්‍යාජ දිවැසිවරු මිනිසුන් දේව වචනයට කීකරුවීමෙන් ඉවතට ගෙනයාමට උත්සාහ කරයි (ද්විතීය කතාව 13:1-5). මේ ආකාරයේ දිවැස්වැකි කිතුනු ඇදහිල්ල සමග නිසි ලෙස සම්බන්ධ නොවේ.

## 2. රැවටිලිකාර ලකුණු:

බොරු දිවැසිවරු පුදුම සහගත ලකුණු වලින් මිනිසුන් මුළාකරති.

> **නොයෙක් බොරු අනාගතවක්තෘවරු නැගිට බොහෝ දෙනෙකු මුළාකරන්නෝය.**
> **මක්නිසාද බොරු ක්‍රිස්තුවරුද බොරු අනාගතවක්තෘවරුද නැගිට පුළුවන් නම් තෝරාගනු ලැබුවන් පවා මුළා කරන ලෙස මහත් ලකුණුද පුදුමද දක්වන්නෝය. (මතෙව් 24:11, 24)**

## 3. නරක ඵල:

ඕනෑම සේවයක සැබෑ පරීක්ෂාව ආත්මික ඵල ප්‍රකාශ කිරීමයි.

> **බොරු අනාගතවක්තෘවරුන්ගෙන් ප්‍රවේසම්වෙයල්ලා, ඔව්හු බැටළු වේශයෙන් නුඹලා ළඟට එති, නුමුත් ඇතුළතින් ඔව්හු කෲරවූ වෘකයෝය. ඔවුන්ගේ ඵලවලින් නුඹලා ඔවුන් ඇඳින ගන්නහුය. මනුෂ්‍යයෝ කටුගස්වලින් මිදික ඵලවත් ගොකටුවලින් අත්තික්කා ඵලවත් නෙළාගනිද්ද?**
> **(මතෙව් 7:15-16)**

එකළොස්වන පරිච්ඡේදයේදී ඔබ ශුද්ධාත්ම ඵල ගැන ඉගෙන ගන්නවා ඇත. මේවා සැබෑ දිවැසිවරයෙකු ළඟ තිබෙන ආත්මික ගුණාංගයන්ය.

## 4. වැරදි ප්‍රකාශකිරීම්:

තමා දිව්‍යමය බව හා ක්‍රිස්තුස්වහන්සේට සමාන බව ප්‍රකාශකරන දිවැසිවරයා බොරු දිවැසිවරයෙකි.

> **එකල යමෙක් කතාකොට: බලව, ක්‍රිස්තුස්වහන්සේ මෙතනය නොහොත් එතනයයි නුඹලාට කියන්නේ නම් විශ්වාස නොකරල්ලා, මක්නිසාද බොරු ක්‍රිස්තුවරුද බොරු අනාගතවක්තෘවරුද නැගිට පුළුවන් නම් තෝරාගනු ලැබූවන් පවා මුළා කරන ලෙස මහත් ලකුණුද පුදුමද දක්වන්නෝය. (මතෙව් 24:23-24)**

## 5. සම්පූර්ණ නොවූ අනාගතවාක්‍ය:

සැබෑ දිවැසිවරයෙකු හඳුනාගත හැකි අවසාන පරීක්ෂණය නම් ඔහු පවසා ඇති අනාගතවාක්‍ය සම්පූර්ණ වී ඇතිද, නැද්ද, යන්න හඳුනා ගැනීමයි.

> **එහෙත් කියන්ට මා විසින් අණ නොකළ වචනයක් මාගේ නමින් හිතුවක්කාරකමින් කථාකරන්නාවූ නොහොත් අන් දෙවිවරුන්ගේ නාමයෙන් කථාකරන්නාවූ අනාගතවක්තෘ කෙනෙක් වේ නම් ඒ තෙමේ මරනු ලබන්නේය. ඉඳින් ස්වාමින්වහන්සේ නොකී වචනය අපි කෙසේ දනිමුදැයි නුඹේ සිතින් කියන්නෙහි නම්, අනාගතවක්තෘ ස්වාමින්වහන්සේගේ නාමයෙන් කථාකරන දේ ඉෂ්ටනොවන්නේ නම්, නොපැමිණෙන්නේ නම්, ඒ වනාහි ස්වාමින්වහන්සේ නොකී කාරණයය, ඒ අනාගතවක්තෘතෙමේ ඒක හිතුවක්කාරකමින් කීවේය. ඔහුට භයනොවන්නැයි මට කීසේක. (ද්වීතීය කථාව 18:20-22)**

## තවදුරටත් අධ්‍යයනය සඳහා:

අනාගතවාක්‍ය ඇතිවිය හැකි ආකාර 3 කි.

| | |
|---|---|
| -මනුෂ්‍ය ආත්මය තුළින් | : යෙරමියා 23:16; එසකියෙල් 13:2,3 |
| -නපුරු හා බොරුකාර ආත්ම තුළින් | : යෙසායා 8:19-20; 1 රාජාවලිය 22:22; මතෙව් 8:29; ක්‍රියා 16:17; |
| -ශුද්ධාත්මයාණන් තුළින් | : 2 සාමුවෙල් 23:2; යෙරමියා 1:9; ක්‍රියා 19:6; 21:11; |

අනාගතවාක්‍ය ශුද්ධාත්මයාණන් වෙතින්ද නැද්ද යන්න තිරණය කිරීමට අප ඒවා විනිශ්චය කළයුතු වන්නේ මේ නිසාය.

අනාගතවක්තෘවරු හා අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව පිළිබඳ ඔබගේ දැනගැන්ම වැඩිකර ගැනීමට ඔබට අධ්‍යයනය කළ හැකි පැරණි හා නව ගිවිසුම් දිවැසිවරු පිළිබඳ උදාහරණ රැසක් බයිබලයේ සඳහන් වේ. ඔබ මෙම බයිබල් පද අධ්‍යයනය කරන විට, දිවැසිවරයෙකුවීමේ විශේෂ දීමනාව (නායකත්වය) පැවති අය, දිවැස්වැකි පැවසීමේ දීමනාව පැවති අයගෙන් වෙන්කර හඳුනාගැනීමට උත්සාහ කරන්න.

## පැරණි ගිවිසුම් දිවැසිවරු :

| | |
|---|---|
| ආබ්‍රහම් | -උත්පත්ති 20:7 |
| මෝසෙස් | -ද්වීතියකථාව 34:9 |
| හබක්කුක් | -හබක්කුක් 1:1 |
| යෙසායා | -2 රාජාවලිය 19:2 |
| මීකා | -මතෙව් 2:5-6 |
| හොෂෙයා | -මතෙව් 21:15 |
| ඒප්‍රායිම් | -හොෂෙයා 9:8 |
| ජෝවෙල් | -ක්‍රියා 2:16 |
| යෙරමියා | -යෙරමියා 1:5 |
| ගාද් | -1 සාමුවෙල් 22:15 |
| සෙකරියා | -සෙකරියා 1:1 |
| අහිජා | -1 රාජාවලිය 11:29 |
| සාමුවෙල් | -1 සාමුවෙල් 3:20 |

| | |
|---|---|
| යේහු | -1 රාජාවලිය 16:7 |
| නාතාන් | -2 සාමුවෙල් 7:2 |
| මිකායා | -1 රාජාවලිය 22:7-8 |
| යෝනා | -2 රාජාවලිය 14:25 |
| ඉද්දෝ | -2 ලේකම් 13:22 |
| අසූර් | -යෙරමියා 28:1 |
| එසකියෙල් | -එසකියෙල් 2:1-5 |
| හනනියා | -යෙරමියා 28:17 |
| දානියෙල් | -මතෙව් 24:15 |
| බාලාම් | -2 පේත්‍රුස් 2:15-16 |
| ආමොස් | -ක්‍රියා 7:42-43 |
| ෂෙමායා | -2 ලේකම් 12:5 |
| එලිෂා | -1 රාජාවලිය 19:16 |
| එලියා | -1 රාජාවලිය 18:22 |
| හග්ගයි | -හග්ගයි 1:1 |
| දාවිත් | -ක්‍රියා 2:29-30 |
| ආරොන් | -නික්මයාම 7:1 |
| අසරියා | -2 ලේකම් 15:8 |
| ඔබෙද් | -2 ලේකම් 15:8 |
| ආසාප් | -ගීතාවලිය 78:2 |

## පැරණි ගිවිසුම් දිවැසිවරයන් (කාන්තාවන්):

| | |
|---|---|
| මිරියම් | -නික්මයාම 15:20 |
| දෙබෝරා | -විනිශ්චයකාරයා 4:4 |
| හුල්දා | -2 රාජාවලිය 22:14 |
| නෝවදියා | -නෙහෙමියා 6:14 |
| යෙසායාගේ බිරිඳ | -යෙසායා 8:3 |

## නව ගිවිසුම් දිවැසිවරු :

| | |
|---|---|
| යේසුස්වහන්සේ | -මතෙව් 21:11 |
| යොහන් බව්තිස්ත | -මතෙව් 11:7-11 |
| අගබස් | -ක්‍රියා 11:27-28; 21:10 |
| යුදස් | -ක්‍රියා 15:32 |
| සීලස් | -ක්‍රියා 15:32 |
| අන්තියෝකියේ නායකයන් | -ක්‍රියා 13:1 |

## නව ගිවිසුම් දිවැසිවරියන් (කාන්තාවන්) :

| | |
|---|---|
| ආනා | -ලූක් 2:36 |
| පිලිප්ගේ දියණියෝ | -ක්‍රියා 21:8-9 |

සභාව එකතු වන විටදී දිවැසිවැකි පිළිබඳ උපදෙස් අධ්‍යයනය කරන්න. 1 කොරින්ති 14:29-31

# ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් (එවැන්ජලිස්තවරු)

**උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. (එපීස 4:11)**

ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුට මිනිසුන් හා ස්ත්‍රීන් ප්‍රතිචාර දක්වා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිවයුතු සාමාජිකයන් බවට පත්වන ආකාරයට නොඇදහිලිවන්තයන් සමග ශුභාරංචිය බෙදාගැනීමේ

විශේෂ හැකියාවක් ඇත. එවැන්ජලිස්තවරයා යන වචනයේ අදහස "ශුභාරංචිය ගෙන එන තැනැත්තා" යන්නයි.

ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් පිළිබඳව නව ගිවිසුම තුළ තුන් වතාවක් සඳහන් වේ. එපීස පොතේ එය විශේෂ දීමනාවක් ලෙස දක්වා තිබේ.

**උන්වහන්සේ... සමහරුන් ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද... කොට දුන් සේක. (එපීස 4:11)**

ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකුගේ කාර්ය ඉටු කරන ලෙස තිමෝතිට පැවරුණි:

**නුමුත් නුඹ සියලු කාරණාවලදී, සිහි ඇතුව සිටපන්න. දුක් ඉවසාපන්න, ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුගේ වැඩේ කරපන්න, නුඹේ සේවය සම්පූර්ණකරපන්න. (2 තිමෝති 4:5)**

සෑම ඇදහිලිවන්තයෙකුම "ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ කාර්ය කරමින්" අන් අය සමග ශුභාරංචිය බෙදාගත යුතු වුවත්, දෙවියන්වහන්සේ ඇතැම් අයට ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුවීමේ විශේෂ දීමනාව ලබා දෙන සේක. පිලිප් ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුවීමේ දීමනාව පැවති කෙනෙකි.

**පසුවදා අපි පිටත්ව කායිසාරියට ඇවිත්, සත්දෙනාගෙන් එක්කෙනෙක්වූ එවැන්ජලිස්ත පිලිප්ගේ ගෙට පැමිණ ඔහු සමග නැවතී සිටියෙමුව. (ක්‍රියා 21:8)**

සැබවින්ම නව ගිවිසුම තුළ ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකු ලෙස හැඳින්වූ එකම පුද්ගලයා පිලිප්ය. මෙම දීමනාවට ඔහු තුළ තිබූ බව, ක්‍රිස්තුස්වහන්සේ සමග ඔහුගේ මුල් කාලීන අත්දැකීම් වලින් ප්‍රකාශ වේ. පිලිප්ට යේසුස්වහන්සේ හමුවූ විට ඔහු මුලින්ම කළේ එම ආරංචිය නාතානියෙල් සමග බෙදා ගැනීමය.

**පිලිප් නතානියෙල් දැක: යම් කෙනෙකු ගැන මෝසෙස් විසින් ව්‍යවස්ථාවෙහිත් අනාගතවක්තෘවරුන් විසිනුත් ලියන ලද්දේද උන්වහන්සේ අපට සම්බවුසේක. උන්වහන්සේ යෝසෙප්ගේ පුත්‍රවූ නාසරීය යේසුස්යයි ඔහුට කීවේය. නතානියෙල්ද නාසරෙත් නුවරින් යම් යහපතක් එන්ට පුළුවන්දැයි ඔහුට කීවේය. ඇවිත් බලාපන්නැයි පිලිප් ඔහුට කීවේය. (යොහන් 1:45-46)**

පසුකාලීනව පිලිප් ආත්මික කුසගිනිව සිටි ග්‍රීකයන් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන ආවේය.

**එවිට ඔව්හු ගලීලයේ බෙත්සයිදාවේ පිලිප් වෙතට පැමිණ, මහතාණෙනි, අපි යේසුස්වහන්සේ දකින්ට කැමැත්තෙමුයයි කීවෝය. පිලිප් ඇවිත් අන්ද්‍රෑට කීවේය. ඇන්ද්‍රෑද පිලිප්ද ඇවිත් යේසුස්වහන්සේට කීවෝය. (යොහන් 12:21-22)**

පිලිප් ගෝලයෙකු ලෙස තෝරාගෙන තිබූ අතර (මතෙව් 10:3) ශුද්ධාත්මයාණන් පැමිණෙන විට උඩුමහල් මැදුරේද සිටියේය (ක්‍රියා 1:13). මනුෂ්‍යයන් විසින් පිලිප්ව සභාවේ උපස්ථායකයෙකු ලෙස පත් කරන ලදී (ක්‍රියා 6:1-6). නමුත් දෙවියන්වහන්සේ ඔහුව ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකු (එපීස 4:11-12) ලෙස පත් කරන ලදී.

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

පිලිප්ගේ සේවය පිලිබඳව තවදුරටත් අධ්‍යයනය කිරීම. මෙම ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකුවීමේ විශේෂ දීමනාව පිළිබඳ ඔබේ දැනුම පුළුල් කරනු ඇත.

| | |
|---|---|
| -ඔහුගේ පණිවුඩය | -ක්‍රියා 8:35 |
| -මුදවාගැනීම්, හාස්කම්, සුවකිරීම් | -ක්‍රියා 8:5-8 |
| -බව්තිස්ම කිරීම් | -ක්‍රියා 8:12, 36-39 |
| -දේශනාකිරීම් (දේව රාජ්‍යය) | -ක්‍රියා 8:12 |
| -නිවස හරියාකාරව සකස් කිරීම | -ක්‍රියා 21:8-9 |
| -ශුභාරංචිය ව්‍යාප්ත කිරීම උදෙසා සංචාරය කිරීම | -ක්‍රියා 8:4-5, 26, 40 |
| -කණ්ඩායම් ඒත්තු ගැන්වීමේ හැකියාව | -ක්‍රියා 8:6 |
| -මුළු මහත් නගර කැළඹවීම | -ක්‍රියා 8:8 |
| -තනි පුද්ගලයන්ට සේවය කිරීම | -ක්‍රියා 8:27-38 |
| -දෙවියන්වහන්සේ විසින් ගෙන යනු ලැබීම | -ක්‍රියා 8:26, 39 |

-දේව වචනය පිළිබඳ වූ දැනීම -ක්‍රියා 8:30-35
-සේවයේ බලවත් බව හා මිනිසුන්ගේ ප්‍රතිචාර නිසා ප්‍රසිද්ධියට පත්ව සිටීම -ක්‍රියා 8:5-6, 8, 12, 35-39

## සභාපාලකයන්

**උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. (එපීස 4:11)**

මෙය නව ගිවිසුම තුළ "සභාපාලකයන්" යන වචනය පාවිච්චි කළ යුතු එකම අවස්ථාව මෙය විය. "සභාපාලකයා" යන ග්‍රීක් වචනයේ සැබෑ තේරුම එඬේරා යන්නයි (නව ගිවිසුම මුලින්ම ලියැවුණේ ග්‍රීක් භාෂාවෙනි.). සභාපාලකයන් යනු ඇදහිලිවන්තයන් කණ්ඩායමකගේ ආත්මික සුභසාදනය උදෙසා දිගු කාලීන පෞද්ගලික වගකීමක් දරන නායකයන්ය. වචනයේ අදහස එඬේරා යන්න බැවින්, යේසුස්වහන්සේ මිනිසුන්ට "සභාපාලකයෙකු" හෝ "එඬේරෙකු" ලෙස දුන් ආදර්ශය සභාපාලකවරු අනුගමනය කළ යුතුය.

**ඉතින් සදාකාල ගිවිසුමේ ලේ කරණකොටගෙන බැටළුවන්ගේ මහත් එඬේරා වන අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේව මළවුන් කෙරෙන් නැවත ගෙනාවාවූ සමාදානයේ දෙවියන්වහන්සේ, (හෙබ්‍රෙව් 13:20)**

**එවිට ප්‍රධාන එඬේරාණන් ප්‍රකාශවන කල්හි නුඹලා තේජසේ නොමැළවෙන්නාවූ ඔටුන්න ලබන්නහුය. (1 පේත්‍රුස් 5:4)**

යේසුස්වහන්සේද තමන්ව යහපත් බැටළු එඬේරාණෝ ලෙස හැඳින්වූ අතර යොහන් 10:1-18 දක්වා එඬේරාණන්ගේ ඇතැම් කාර්යයන් දැක්වූ සේක.

බයිබලය සභාවේ නායකයෙකුගේ (බිෂොප්) නිලය සඳහන් කරයි (1 තිමෝති 3). යේසුස්වහන්සේ ගැන පවසා ඇති පහත සඳහන් වචන නිසා මෙය සභාපාලකයන්ටද අදාළ වන බව බොහෝ දෙනා විශ්වාස කරති.

**මක්නිසාද නුඹලා බැටළුවන් මෙන් මුළාවයමින් සිටියහුය. නුමුත් දැන් නුඹලාගේ ආත්මවල එඬේරාද රැකවලාද වෙතට හැරී ඇවිත් සිටින්නහුය. (1 පේත්‍රුස් 2:25)**

මුල්කාලීන සභාවේ නායකත්ව තත්වයන් වූ නායකයන්, වැඩිමහල්ලන් හා උපස්ථායකයන් සඳහා අවශ්‍ය වූ ආත්මික සුදුසුකම් සභාපාලකයෙකු ලෙස මෙම මිනිසුන්ට නායකත්වය දෙන පුද්ගලයා තුළද තිබිය යුතුය. 1 තිමෝති 3:1-13 දක්වා වූ මෙම සුදුසුකම් පිළිබඳව අධ්‍යයනය කරන්න.

සභාපාලකවරයෙකුගේ ආත්මික වගකීම් නම් තම සේවය යටතේ සිටින අයව ආත්මිකව පෝෂණය කර රැක බලා ගැනීමයි. මෙය මූල්‍යමය ඉපයීමක් උදෙසා පමණක් නොව නිවැරදි අභිප්‍රායන් ඇතිව කළ යුතුය.

**දෙවියන්වහන්සේ විසින් තමන්ගේම රුධිරයෙන් මිලේටගත් තමන්ගේ සභාව පෝෂණයකරන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ යම් රැළෙක්හි නුඹලා නායකයන් කොට නියම කළසේක්ද, ඒ මුළු රැළ ගැනත් නුඹලාම ගැනත් ප්‍රවේසම්වෙයල්ලා. (ක්‍රියා 20:28)**

**නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලාගනිමින්, බලාත්කාරය නිසා නොව දේව කැමැත්ත ලෙස සතුටු සිතින්ද, නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද, නුඹලාගේ භාරයට දෙනලද්දවුන් කෙරෙහි අධිපතිකම්කරන්නාක්මෙන් නොව නුඹලාම රැළට ආදර්ශව සිටිමින්ද එය රැකබලාගනිල්ලා. එවිට ප්‍රධාන එඬේරාණන් ප්‍රකාශවන කල්හි නුඹලා තේජසේ නොමැළවෙන්නාවූ ඔටුන්න ලබන්නහුය. (1 පේත්‍රුස් 5:2-4)**

"සභාපාලක" යන වචනය පැරණි ගිවිසුම තුළ යොදාගෙන ඇත්තේ යෙරමියා පොතේ පමණි. මෙහිදී දෙවියන්වහන්සේ සභාපාලකවරුන්ට විශේෂ අනතුරු ඇඟවීම් ලබා දෙන සේක.

**... පාලකයෝද මට විරුද්ධව කැරලිගැසුවෝය..... (යෙරමියා 2:8)**

**මක්නිසාද එඬේරු මෝඩවී ස්වාමින්වහන්සේගෙන් නොවිචාරා සිටියෝය. ඔව්හු දියුණු නුණෝය. ඔවුන්ගේ සියලු රැළවල්ද විසිර ගියෝය. (යෙරමියා 10:21)**

**බොහෝ එඬේරු මාගේ මිදිවත්ත නාස්තිකළෝය. ඔව්හු මාගේ කොටස පාගාදැමුවෝය, මාගේ ප්‍රිය කොටස පාළු කාන්තාරයක් කළෝය. ඔව්හු එය පාළුවක් කළෝය. එය පාළුවක්වී, මා ඉදිරියෙහි වැලපෙන්නේය, කවුරුවත් සිතට නොගන්න නිසා මුළු දේශය පාළුකරනලද්දේය. (යෙරමියා 12:10-11)**

**මාගේ ගොදුරු බිමේ බැටළුවන් නැතිකරන්නාවූ විසුරුවාදමන්නාවූ එඬේරුන්ට දුක්වේයයි ස්වාමින්වහන්සේ කියනසේක. එබැවින් ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමින්වහන්සේ මාගේ සෙනඟ පෝෂණයකරන එඬේරුන්ට විරුද්ධව මෙසේ කියනසේක. නුඹලා මාගේ බාටළුවන් බලා නොගෙන, ඔවුන් විසුරුවා පන්නාදැමුවහුය. බලව, නුඹලාගේ ක්‍රියාවල නපුරුකමට නුඹලාට දඬුවම් කරන්නෙමියි ස්වාමින්වහන්සේ කියනසේක. (යෙරමියා 23:1-2)**

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

1 තිමෝති 3:1-13 දක්වා සඳහන් නායකයෙකු හෝ උපස්ථායකයෙකු වීමට අවශ්‍ය කරුණු අධ්‍යයනය කරන්න. සභාපාලකයෙකු ලෙස සේවය කරන කෙනෙකුටද අදාළ වේ. යොහන් 10:1-18 දක්වා සඳහන් යහපත් බැටළු එඬේරාණන් ලෙස යේසුස්වහන්සේගේ චරිත ලක්ෂණ අධ්‍යයනය කරන්න.

# ගුරුවරුන්

**... සමහරුන් ගුරුවරුන් ද කොට දුන් සේක. (එපීස 4:11)**

**මෙසේ දෙවියන්වහන්සේ ... තුන්වෙනුව ගුරුවරුන් ද ... සභාවේ පිහිටවූ සේක. (1 කොරින්ති 12:28)**

**... උගන්වන්නා තමන්ගේ ඉගැන්වීමටත්, (රෝම 12:7)**

සෑම ඇදහිලිවන්තයෙකුටම ඉගැන්වීමේ විශේෂ දීමනාව ලැබී නැත. පාවුල් මෙසේ ඇසුවේය.

**... සියල්ලෝම ගුරුවරුද? (1 කොරින්ති 12:29)**

මෙම ප්‍රශ්නයට ඔහුගේ පිළිතුර “නැත” යන්නයි. දෙවියන්වහන්සේ ඇතැම් අයට ඉගැන්වීමේ විශේෂ දීමනාව දෙන සේක.

අනාගතවක්තෘවරයෙකුවීමේ දීමනාව අනාගතවාක්‍ය පැවසීමේ දීමනාවෙන් වෙනස් වන ලෙසම ගුරුවරයෙකුවීමේ විශේෂ දීමනාව ඉගැන්වීමේ දීමනාවෙන් වෙනස් වේ. ක්‍රියා 13:1-4 සඳහන් සභාවේ විශේෂ නායකත්වයන් දැරූ ගුරුවරු (අනාගතවක්තෘවරුන්ද ඇතුළුව) පාවුල්ගේ හා බාර්ණබස්ගේ සේවයට මඟපෙන්වූ ආකාරය ඔබට මතක් කරගත හැකිය. සෑම ඇදහිලිවන්තයෙකුටම ගුරුවරයෙකු වීමේ විශේෂ දීමනාව හෝ ඉගැන්වීමේ දීමනාව ලැබී නැත. නමුත් සෑම ඇදහිලිවන්තයෙක්ම මූලික ශුභාරංචි පණිවුඩය ඉගැන්වීමේ කාර්යයට දායක විය යුතුය.

**මක්නිසාද කාලය ප්‍රකාරයට නුඹලා ගුරුවරයෝව සිටින්ට යුතුව තිබියදීත්, දෙවියන්වහන්සේගේ වාක්‍යවල මුල් ගුරුකම් නැවත යමෙකු විසින් නුඹලාට උගන්වන්ට ඕනෑව තිබේ. නුඹලා දැඩි ආහාර නොව කිරි ඕනෑකරන අයව සිටින්නෝය. (හෙබ්‍රෙව් 5:12)**

ඕනෑම පරිණත ඇදහිලිවන්තයෙකුම තමාට ඉගැන්වීමේ විශේෂ දීමනාව තිබුණත් නැතත් ශුභාරංචිය ඉගැන්වීමේ නිරත විය යුතුය (මේ හේතුවෙන් මෙම ක්ෂේත්‍රයේ වැඩිදුර උපදෙස් ලබා ගැනීම සඳහා හාවස්ට්ටයිම් අන්තර්ජාතික ආයතනය “ඉගැන්වීමේ ක්‍රමවේද” නමින් වෙනම පාඨමාලාවක් පවත්වයි).

බයිබලය බොරු ගුරුවරු ගැන අනතුරු අඟවයි. මොවුන් ඉගැන්වීමේ දීමනාව පවතින බව කියා සිටියත්, දෙවියන්වහන්සේගේ සැබෑ වචනය උගන්වන්නේ නැති පුද්ගලයන්ය.

**නුමුත් සෙනඟ අතරේ බොරු ප්‍රොපේතවරුද සිටියෝය. එලෙසම විනාශක ධර්මභේද රහසින් උපදවමින්ද තමුන්ම මිලේටගත් ආචාරීන්වහන්සේව එපාකරමින්ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවාගන්නාවූ බොරු ගුරුවරු නුඹලා අතරෙන් වන්නෝය (2 පේතෘස් 2:1)**

**මක්නිසාද, ඔවුන් සාරවත් ඉගැන්වීම නොඉවසා, කසන කන් ඇතුව, තමුන්ගේ ආශාවල් ලෙස තමුන්ටම ගුරුවරුන් රැස්කරගෙන, සත්‍යයට කන්නොදී, ප්‍රබන්ධවලට හැරීයන කාලය පැමිණෙන්නේය. (2 තිමෝති 4:3-4)**

**නුඹේ මුල් පියා පව්කළේය. නුඹේ තානාපතියෝද මට විරුද්ධව වරදකළෝය. (යෙසායා 43:27)**

2 පේත්‍රුස් 2 වන පරිච්ඡේදය තුළ හා යුද් පොත තුළ ඔබට බොරු ගුරුවරු හඳුනාගත හැකි පෞද්ගලික චරිත ලක්ෂණ කිහිපයක් දක්වා තිබේ.

වැරදි ධර්මයන් මෙන්ම ඉගැන්වීමේදී වැරදි අභිප්‍රායන්ද පැවතිය හැකිය.

**ඔවුන්ගේ කට පියවන්ට ඕනෑය, ඔව්හු නීච ලාභය නිසා යුතු නැති දේ උගන්වමින් මුළු පවුල් පෙරළති. (තීතස් 1:11)**

දේව වචනය ඉගෙනගත් පුද්ගලයන් අන් අයට ඉගැන්වීමට සමත් විශ්වාසවන්ත ඇදහිලිවන්තයන්ට ඉගැන්විය යුතුය.

**වාක්‍ය ඉගෙනගන්නා උගන්වන්නාට සියලු යහපත් දෙයින් දේවා, (ගලාති 6:6)**

**බොහෝ සාක්ෂිකරුයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදීපන්න. (2 තිමෝති 2:2)**

මෙය නොනවත්වා කෙරෙන ඉගැන්වීමේ රටාවයි. මෙය අනුගමනය කළ හොත් ලෝකය තුළ ශුභාරංචිය පැතිරයාම නොනවත්වී වැඩි වනු ඇත.

ඉගැන්වීමේ ආත්මික දීමනාව ඇති පුද්ගලයන් මනුෂ්‍ය ප්‍රඥාවෙන් උගන්වන්නේ නැත.

**අප විසින් ඒ දේවල් කථාකරන්නෙත් මනුෂ්‍ය ප්‍රඥාව කරණකොටගෙන උගන්වනලද වචනවලින් නොව ආත්මික දේවල් ආත්මික දේ සමග සමානකර බලමින් ආත්මයාණන්වහන්සේ විසින් උගන්වනලද වචනවලින්ය. (1 කොරින්ති 2:13)**

ගුරුවරයෙකුට දෙවියන්වහන්සේ වෙතින් වන තේරුම්ගැනීමක් හා ප්‍රඥාවක් තිබිය යුතුය. පාවුල් පහත සඳහන් අයට අනතුරු අඟවයි.

**තමුන් කියන්නේ කිමෙක්ද කියාවත් නිසැකකොට, සහතික කරන්නේ කුමන දේ ගැනද කියාවත් තේරුම්නොගෙන, සිටින නුමුත් ඔව්හු ව්‍යවස්ථාවේ ගුරුවරු වෙන්ට කැමැත්තෝය. (1 තිමෝති 1:7)**

ප්‍රඥාවෙන් යුක්තව ඉගැන්වීමේ වැදගත්කම ඔහු අවධාරණය කරයි:

**අන්‍යජාතීන් අතරේ තිබෙන මේ රහසේ තේජස් සම්පත කිමෙක්ද කියා දෙවියන්වහන්සේ ශුද්ධවන්තයන්ට දන්වන්ට කැමතිවූ සේක. ඒ වනාහි තේජසේ බලාපොරොත්තුව වන නුඹලා තුළ සිටින ක්‍රිස්තුස්වහන්සේය, අපි නම්, ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු මනුෂ්‍යයන් සම්පූර්ණ කොට ඔප්පු කරන පිණිස සියලු මනුෂ්‍යයන්ට දැනමුතුකම් දෙමින්ද සියලු මනුෂ්‍යයන්ට සියලු ආකාර ප්‍රඥාවෙන් උගන්වමින්ද උන්වහන්සේ ප්‍රකාශ කරමුව. (කොලොස්සි 1:27-28)**

ගුරුවරු තමන් උගන්වන දේවල් අනුව ජීවත් විය යුතුය.

**අනිකෙකුට උගන්වන්නාවූ නුඹ නුඹටම උගන්වාගන්නේ නැද්ද? සොරකම් නොකළ යුතුයැයි දේශනාකරන්නාවූ නුඹ සොරකම් කරනවාද? කාමමිථ්‍යාචාරය නොකළ යුතුයයි කියන්නාවූ නුඹ**

**කාමමිථ්‍යාචාරය කරනවාද? දේවරූපවලට පිළිකුල් කරන්නාවූ නුඹ දේවගෘහයන් කොල්ලකනවාද (රෝම 2:21-22)**

ගුරුවරුන් තමන් ඉගැන්වූ දේවල් මත පදනම්ව විනිශ්චය කරනු ලැබේ.

**මාගේ සහෝදරයෙනි, (ගුරුවරු වන) අපට, වඩා බරපතළ විනිශ්චය පැමිණෙන බව දැන, බොහෝ දෙනෙක් ගුරුවරු වෙන්ට නොසොයල්ලා. (යාකොබ් 3:1)**

### තවදුරටත් අධ්‍යයනය සඳහා :

නව ගිවිසුමේ ගුරුවරු පිළිබඳ උදාහරණයන් අධ්‍යයනය කරන්න. ඔබ සිතන ආකාරයට ගුරුවරයෙකු වීමේ විශේෂ දීමනාව ඇත්තේ කාටද? (සභාවේ නායකත්ව තත්වයන්) ඉගැන්වීමේ දීමනාව පමණක් තිබිය හැක්කේ කාටද?

- -අපොල්ලස් : ක්‍රියා 18:24-25
- -අකිලා හා ප්‍රිස්කිලා : ක්‍රියා 18:26
- -පාවුල් : ක්‍රියා 20:20-21, 27; 21:28
- -නම් නොකළ : ක්‍රියා 13:1
- -පේත්‍රුස් : ක්‍රියා 5:28-29

*"ඉගැන්වීමේ ක්‍රමවේද"* නමැති හාවස්ට්ටයිම් අන්තර්ජාතික ආයතනයේ පාඨමාලාව හදාරන්න. ශ්‍රේෂ්ඨ ගුරුවරයාණන් වූ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් යොදාගත් ක්‍රමෝපායන් පිළිබඳව එම පාඨමාලාවේ අවධානය යොමු කරයි.

## එක්ව ක්‍රියා කරන නායකත්වය

නායකත්වය පිළිබඳ විශේෂ දීමනාවන් පහ සභාවේ සේවය තුළ එක්ව ක්‍රියා කරයි.

**ප්‍රේරිතයන් :-** විවිධ ප්‍රදේශ කරා ශුභාරංචි පණිවුඩය ගෙන ගොස් ඇදහිලිවන්තයන්ගේ කණ්ඩායම් ගොඩනඟයි. ශුභාරංචිය පැතිරවීමේදී සහය වීම උදෙසා දෙවියන්වහන්සේ ආශ්චර්යමත් ලකුණු හා පුදුම ක්‍රියා ලබා දෙන සේක. ප්‍රේරිතයා තමා ගොඩනඟන සභාවට විශේෂ නායකත්වයක් ලබා දෙයි.

**අනාගතවක්තෘවරු :-** මොවුන්ද සභාවට නායකත්වය ලබා දෙයි. ශුද්ධාත්ම ආනුභාවය තුළින් දෙවියන්වහන්සේගෙන් විශේෂ පණිවුඩ ලබා දීම මොවුන්ගේ කාර්යයන්ගෙන් එකකි.

**ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් :-** මිනිසුන් ප්‍රතිචාර දක්වා ඇදහිලිවන්තයන් බවට පත් වන ආකාරයකින් ශුභාරංචි පණිවුඩය සන්නිවේදනය කරයි. ඔවුන් තනි පුද්ගලයන්ට හෝ කණ්ඩායම් වලට සේවය කළ හැකි නමුත්, ඔවුන්ගේ සේවය සැමවිටම නව ඇදහිලිවන්තයන් බිහි කරයි. මෙම ඇදහිලිවන්තයන් ඉන් අනතුරුව තම ආත්මික වර්ධනයට මඟ පෙන්වන සභාවේ ප්‍රේරිතයන් අනාගතවක්තෘවරු, සභාපාලකවරු හා ගුරුවරු යටතට පත් වේ. ක්‍රියා 8 වන පරිච්ඡේදයේ සඳහන් පිලිප්ගේ උදාහරණය මෙය පෙන්නුම් කරයි. ඔහු සමාරිතයන් සභාවට ගෙනා අතර ඉන් අනතුරුව වැඩිදුර ඉගැන්වීම් සඳහා ඔවුන් ප්‍රේරිතයන් වෙතට යොමු කළේය.

**සභාපාලකවරු :-** දිගු කාලීන නායකත්වයක් ලබා දෙන අතර ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ගේ පණිවුඩය තුළින් අදහාගත් අය පිළිබඳ සැලකිලිමත් වෙයි. ප්‍රේරිතයන්ගේ සේවය තුළින් ඇදහිලිවන්තයන් බවට පත්වූ අයට ඔවුන් පාලක සේවය ලබා දේ. ඔවුන්ගේ සේවය එඬේරෙකු තම බැටළුවන් කෙරෙහි දක්වන ආදරණීය සැලකිල්ල විදහා දක්වයි.

**ගුරුවරු :-** ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් විසින් සිදුකළ ශුභාරංචිය ඉදිරිපත් කිරීමෙන් ඔබ්බට ගිය උපදෙස් ලබා දෙයි. ආත්මිකව පරිණත වීමට ඇදහිලිවන්තයන්ට උගන්වයි. මොවුන් අන් අයට ඉගැන්වීමට සමත් විශ්වාසවන්ත මිනිසුන්ව පුහුණු කරයි.

විශේෂ නායකත්ව දීමනා සහිත අයගේ ප්‍රධාන වගකීම තම ආත්මික දීමනා හඳුනාගනිමින් ඒවා පාවිච්චි කිරීමට අනෙකුත් ඇදහිලිවන්තයන්ව පුහුණු කිරීමයි (එපීස 4:11-16). ආත්මික දීමනා සභාව තුළ එක්ව ක්‍රියාත්මක වන ආකාරය පහත වගුවේ දැක්වේ.

දෙවියන්වහන්සේ

|

ප්‍රේරිතයන්, අනාගතවක්තෘවරු, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්, සභාපාලකවරු, ගුරුවරු
ලබාදෙන සේක.

|

ශුද්ධවන්තයන් සම්පූර්ණ කිරීම/සේවයේ යෙදවීම උදෙසාය
ඔවුන්

| |
|---|
| සේවය කරයි | වර්ධනය කරයි |

|

එහි ප්‍රතිඵල

එක්සත් බව දැනගැන්ම සම්පූර්ණත්වය

|

ඒ අනුව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය

| | |
|---|---|
| තවදුරටත් බාලයන් නොවනු ඇත.<br>(වැරදි ඉගැන්වීම්) | උන්වහන්සේ තුළ වර්ධනය වනු ඇත.<br>(සත්‍ය) |

|

අවසන් ප්‍රතිඵලය

ශරීරයේ සියලු කොටස් ප්‍රේමයෙන් යුතුව බලවත් ලෙස ක්‍රියාත්මකවීම

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කළ විශේෂ නායකත්ව දීමනා පහ ලියා දක්වන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

3. මේවා "විශේෂ දීමනා" ලෙස හැඳින්වෙන්නේ ඇයි?

______________________________________________

______________________________________________

4. සෑම ප්‍රකාශයන්ම කියවන්න. ප්‍රකාශය සත්‍ය නම් ඒ ඉදිරියේ ඇති හිස් තැන මත "ස" ලකුණ යොදන්න. ප්‍රකාශය අසත්‍ය නම් ඒ ඉදිරියේ ඇති හිස් තැන මත "අ" ලකුණ යොදන්න.

a. ______________ අනාගතවාක්‍ය පවසන සෑම කෙනෙකුටම අනාගතවක්තෘවරයෙකු වීමේ විශේෂ දීමනාව පැවතීම අවශ්‍ය නොවේ.

b. ______________ උගන්වන සෑම කෙනෙකුටම ගුරුවරයෙකු වීමේ විශේෂ දීමනාව පැවතීම අවශ්‍ය නොවේ.

c. ______________ සෑම ඇදහිලිවන්තයෙක්ම අන් අයට ශුභාරංචිය ඉගැන්විය යුතුය. නමුත් සෑම ඇදහිලිවන්තයෙකුටම ඉගැන්වීමේ දීමනාව පවතිනවා යන්න මින් අදහස් නොවේ.

5. පළමු ලැයිස්තුවේ ඇති විශේෂ දීමනාව දෙස බලන්න. දෙවන ලැයිස්තුවේ ඇති අර්ථදැක්වීම කියවන්න. ආත්මික දීමනාව විස්තර කරන අර්ථදැක්වීමේ අංකය හිස්තැන මත ලියන්න. පළමු හිස්තැන ඔබට උදාහරණයක් ලෙස පුරවා තිබේ.

| පළමු ලැයිස්තුව | දෙවන ලැයිස්තුව |
| --- | --- |
| ___2__ අනාගතවක්තෘවරයා | 1. නව සභාවන් වර්ධනය කිරීමට හා ඒවා බලාගැනීමට වෙනත් කෙනෙකු උදෙසා ක්‍රියා කිරීමට ආධිපත්‍ය ඇතිව යවන ලැබේ. |
| ______ ප්‍රේරිතයා | 2. දෙවියන්වහන්සේගේ ක්ෂණික පණිවුඩ උන්වහන්සේගේ ජනතාවට සන්නිවේදනය කිරීම උදෙසා විශේෂ ආනුභාවයක් යටතේ කතා කරයි. එසේම නායකත්ව තත්වයක් ද වේ. |

| | |
|---|---|
| ______ සභාපාලකවරයා | 3. නොඇදහිලිවන්තයන් ප්‍රතිචාර දක්වා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිවයුතු සාමාජිකයන් බවට පත්වන පරිදි ඔවුන් සමග ශුභාරංචිය බෙදා ගනී. “ශුභ ආරංචිය ගෙන එන්නා” ය |
| ______ ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් | 4. ඇදහිලිවන්තයන්ගේ ආත්මික දියුණුව උදෙසා දිගුකාලීන නායකත්වයන් ලබා දෙයි. වචනයේ අර්ථය එඬේරා යන්නයි. |
| ______ ගුරුවරු | 5. උගන්වනු ලබන දේ ඉගෙනගෙන අදාළ කරගන්නා පරිදි දේව වචනය සන්නිවේදනය කරයි. නායකත්ව තත්වයක් ද වේ. |

6. මීළඟ පරිච්ඡේද වලදී අධ්‍යයන පහසුව සඳහා ආත්මික දීමනා කොටස් කර ඇති ප්‍රධාන කාණ්ඩ හතර මොනවාද?

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

මෙම පරිච්ඡේදය තුළ සෑම දීමනාවක්ම සාකච්ඡා කිරීමෙන් අනතුරුව තවදුරටත් අධ්‍යයනය සඳහා යෝජනා ඉදිරිපත් කර තිබේ. මෙය සිදු කර තිබුණේ අනෙක් දීමනාව වෙත යාමට පෙර එක් එක් දීමනාව පිළිබඳ ඔබගේ අධ්‍යයනයන් සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව ලබා දීමටය. විශේෂ දීමනා සහිත ඇදහිලිවන්තයන් දෙවියන්වහන්සේ සභාව තුළ පත් කර ඇති නායකයන්ය. නමුත් බයිලයේ සඳහන් සභා නායකත්ව තත්වයන් මේවා පමණක්ම නොවේ.

උපස්ථායකයන්ගේ හා වැඩිමහල්ලන්ගේ නිලයන් නව ගිවිසුමේ දක්වා තිබේ. බිෂොප් නායකයාගේ තත්වයද සඳහන් කර තිබේ. ඇතැම් සභාවන් බිෂොප් නායකයා යනු සභාපාලකයාම ලෙස සලකයි. අනෙකුත් සභාවන් එය වෙනම නිලයක් සේ සලකයි. මෙම නකායකත්ව අප අධ්‍යයනය කළ නායකත්වය පිළිබඳ විශේෂ දීමනාව නොවේ. ඒවා ස්වාමින්වහන්සේගේ මෙහෙයවීම යටතේ මුල් කාලීන සභාව තුළ ඇති කරන ලද විශේෂ නිලයන්ය.

මුල්කාලීන සභාවන් පිළිබඳ වාර්තා දෙවියන්වහන්සේ විසින් සුරක්ෂිත කොට ඇත්තේ සභා ව්‍යුහයේදී අපට අනුගමනය කිරීමට උදාහරණයක් ලෙසිනි. මෙම නිලයන්ද අද දවසේ සභාව තුළ ක්‍රියාත්මක විය යුතුය. මෙම නිලයන්ගේ අරමුණ මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කළ විශේෂ නායකත්ව දීමනාවන්ට උපකාර කිරීමයි. එනම්, ප්‍රේරිතයන්, අනාගතවක්තෘවරු, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්, සභාපාලකවරු හා ගුරුවරුය. මෙම නායකත්ව තත්වයන් අධ්‍යයනය කිරීමට පහත සටහන යොදා ගන්න.

### සභාවේ නිලතල

| නිලය | බයිබල් පද | රාජකාරීන් |
|---|---|---|
| නායකයන් ( බිෂොප්) | 1 තිමෝති 3:1-7<br>පිලිප්පි 1:1<br>තීතස් 1:5-9<br>1 පේත්‍රුස් 5:2-3 | බොහෝ අය බිෂොප් නම් නායකයා යනු සභාපාලකයා ලෙසම සලකයි. මෙම බයිබල් පද ද ඔහු ඇදහිලිවන්තයන් කණ්ඩායම් පිළිබඳව දිගු කාලීන සැලකිල්ලක් දැක්විය යුතු බව දක්වයි. |
| උපස්ථායකයන් | 1 තිමෝති 3:8-13<br>පිලිප්පි 1:1<br>ක්‍රියා 6:1-7 | උපස්ථායකයන්ට සේවය කිරීමේ හා උපකාර කිරීමේ කාර්යයක් ඇති බව මෙම පද පෙන්නුම් කරයි. |
| උපස්ථායිකාවන් | 1 තිමෝති 3:11<br>රෝම 16:1-2 | උපස්ථායිකාවන් විශේෂ ලෙස බයිබලයේ සඳහන් නොවේ. ඇතැම් සභාවන් උපස්ථායකයන්ගේ භාර්යාවන්ට හා සේවය කිරීමේ හා උපකාරකිරීමේ කාර්යයයේ යෙදෙන කාන්තාවන්ට මෙම පදය යොදා ගනී. |
| වැඩිමහල්ලන් | ක්‍රියා 20:17, 28-32<br>ක්‍රියා 14:23; 15<br>ක්‍රියා 16:4; 11:30<br>1 තිමෝති 5:17<br>1 පේත්‍රුස් 5:1-4<br>තීතස් 1:5<br>යාකොබ් 5:14 | වැඩිමහල්ලන් සභාව තුළ හා තීරණගන්නා විට නායකත්වය දරන බව, ඇදහිලිවන්තයන්ගේ අවශ්‍යතාවයන්ට සේවය කරන බව හා ප්‍රාදේශීය ඇදහිලිවන්ත කණ්ඩායම් වර්ධනය කිරීමට හා ඔවුන් පිළිබඳ සැලකිලිමත් වීමට උපකාර කරන බව මෙම පද තුළින් දැක්වේ. |

සටහන: "වැඩිමහල්ලන්" යන වචනය බයිබලයේ ප්‍රථම වරට දැක්වෙන්නේ නික්මයාම 3:16 ඉශ්‍රායෙලයේ නායකයන් හැඳින්වීමටය. බයිබලය පුරා ඉශ්‍රායෙලයේ වැඩිමහල්ලන් ගැන සඳහන් වාර බොහොමයකි. මෙම වැඩිමහල්ලන් මුල් සභාව තුළ වැඩිමහල්ලන් ලෙස හැඳින්වූ නායකත්ව තත්වයෙන් වෙනස් වේ. අප මෙහි සඳහන් කළ සියලුම පදවල දැක්වෙන්නේ ඉශ්‍රායෙලයේ වැඩිමහල්ලන් ගැන නොව සභාවේ වැඩිමහල්ලන් ගැනය.

දෙවියන්වහන්සේ සභාව තුළ නියම කර ඇති විශේෂ නායකත්ව දීමනා සමග වැඩිමහල්ලන් ක්‍රියාත්මක වන ආකාරය නිරීක්ෂණය කරන්න. වැඩිමහල්ලන් දෙවියන්වහන්සේ සභාව තුළ පත් කළ

අනාගතවක්තෘවරු, ප්‍රෝජේතවරු, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්, සභාපාලකයන් හා ගුරුවරු යන විශේෂ නායකයන්ගෙන් වෙන්ව සභාව ගෙනයාම සිදු නොකළ යුතුය. සභාවේ විශේෂ නායකයන් පත්කර ඇත්තේ දෙවියන්වහන්සේය. වැඩිමහල්ලන් තෝරාගන්නේ මනුෂ්‍යයන්ය.

## සුදුසුකම්:

සභාවේ මෙම නිලයන් දරන අය විසින් සපුරාලිය යුතු විශේෂ සුදුසුකම් බයිබලයේ සඳහන් වේ.

### නායකයන් හා වැඩිමහල්ලන්:

-නිර්දෝෂ විය යුතුය. (යහපත් පිළිගැනීමක් තිබිය යුතු අතර දේව වචනයට විරුද්ධව ක්‍රියාකරන්නෙක් නොවිය යුතුය) : 1 තිමෝති 3:2; තිතස් 1:6,7

-එක භාර්යාවකට පුරුෂයා විය යුතුය (විවාහක නම්, එක් සහකාරියක් පමණක් සිටිය යුතුය) : 1 තිමෝති 3:2, තිතස් 1:6

-පමණ දැන ක්‍රියා කළ යුතුය (සෑම දෙයකදීම මධ්‍යස්ථ විය යුතුය) : තිතස් 1:8, 1 තිමෝති 3:2

- සන්සුන් සිතක් ඇතිව සිටීම (ජීවිතයේ සෑම අංශයකම හා හැසිරීමේ පමන දැන ක්‍රියා කිරීම): තිතස් 1:8,

-සිහියද, පිළිවෙළක් ද පැවතිය යුතුය. (දුරදර්ශිය සිහි නුවණ ඇත්තේය, ප්‍රඥාවන්ත හා ප්‍රායෝගික වේ) : 1 තිමෝති 3:2, තිතස් 1:8

-ආගන්තුක සත්කාරයට කැමතිය (නිවස අන් අයට විවෘතය) : 1 තිමෝති 3:2, තිතස් 1:8

-ඉගැන්වීමට සමත්ය. (දේව වචනය අන් අයට සන්නිවේදනය කිරීමේ හැකියාව ඇත) : 1 තිමෝති 3:2, තිතස් 1:9

-මුද්‍රිකපානයට ඇබ්බැහි නොවූවකු විය යුතුය : 1 තිමෝති 3:3, තිතස් 1:7

-ඉවසිලිවන්තය (ඉක්මනින් කිපෙන්නේ නැත) : 1 තිමෝති 3:3

-හිතුවක්කාර කෙනෙකු නොවිය යුතුය (තමාගැන පමණක් හිතන හා තමාගේම ක්‍රමයට වැඩ කරන කෙනෙක් නොවේ) : තිතස් 1:7

-නව ඇදහිලිවන්තයෙකු නොවිය යුතුය (ඇදහිලිවන්තයෙකු ලෙස පරිණත වූ අත්දැකීම් ලත් අයකු විය යුතුය) : 1 තිමෝති 3:6

-යහපතට ප්‍රේම කරයි (දෙවියන්වහන්සේට හා උන්වහන්සේගේ අරමුණට වටිනා සෑම දෙයකටම සහයෝගය දක්වයි) : තිතස් 1:8

-ධර්මිෂ්ඨය (මිනිසුන් සමග කටයුතු කිරීමේදී සාධාරණය) : තිතස් 1:8

-වචනය තදින් අල්ලා ගෙන සිටී : තිතස් 1:9

-ශුද්ධය (ධර්මිෂ්ඨය, පවිත්‍රය) : තිතස් 1:8

-නින්දිත ලාභයට ගිජු නොවිය යුතුය (මුදල් ඉපයීමට තෘෂ්ණාව ඇත්තෙකු නොවිය යුතුය, මුදලට ප්‍රේම නොකරන්නෙකි) : තිතස් 1:7, 1 තිමෝති 3:3

-තමාගේම පවුල හොඳින් හසුරුවා ගනී. (තම පවුල තුළදී නායකත්ව හැකියාව පෙන්නුම් කළ යුතුය) : 1 තිමෝති 3:4-5

-ඇදහිලිවන්ත දරුවන් ඇතිව සිටිය යුතුය (දෙවියන්වහන්සේට ප්‍රතිචාර දැක්වූ සහ කැරලිකාර නොවූ දරුවන් සිටිය යුතුය) : තීතස් 1:6

-පිටත අයගෙන් යහපත් සාක්ෂියක් ඇතිව සිටිය යුතුය (නොඇදහිලිවන්තයන් අතර යහපත් සාක්ෂියක් ඇතිව සිටිය යුතුය) : 1 තිමෝති 3:7

## උපස්ථායකයන් :

-සන්සුන් විය යුතුය (ගෞරවය ලැබිය යුතු අතර බැරෑරුම් මනසක් හා චරිතයක් පැවතිය යුතුය) : 1 තිමෝති 3:8

-දෙයාකාර කතා නැති අය විය යුතුය (ව්‍යාකූල වාර්තා ඉදිරිපත් නොකරයි) : 1 තිමෝති 3:8

-බොහෝ මුද්‍රිකපානයට ඇබ්බැහි නොවූවකු විය යුතුය : 1 තිමෝති 3:8

-නින්දිත ලාභයට ගිජු නොවිය යුතුය (මුදල් ඉපයීමට තණ්හා නොවේ) : 1 තිමෝති 3:8

-ඇදහිල්ලේ රහස පිරිසිදු හෘද සාක්ෂියකින් දරන අය විය යුතුය : 1 තිමෝති 3:9

-සෝදිසිකරනු ලැබුවෙක් විය යුතුය. (ආත්මික පරීක්ෂාවන් හා පෙලඹවීම් තුළින් ගොස් විශ්වාසවන්තභාවය ඔප්පු කළ අයෙකු විය යුතුය) : 1 තිමෝති 3:10

-නිර්දෝෂ කෙනෙකු විය යුතුය (මෙහෙයවීමේදී දූෂිත ක්‍රියාවලට වන්දි නොගෙවූ කෙනෙක්) : 1 තිමෝති 3:12

-දරුවන්ද ගෙදරවාසීන්ද හොඳින් හසුරුවන්නෙකු විය යුතුය. (පවුල් ජීවිතය තුළින් නායකත්වය පෙන්නුම් කළ යුතුය) : 1 තිමෝති 3:12

-ඔප්පු කරනු ලැබූ (නව ඇදහිලිවන්තයෙකු නොව ඇදහිලිවන්තයෙකු ලෙස ඔප්පු කරනු ලැබූ අයෙකු විය යුතුය) : 1 තිමෝති 3:6

## උපස්ථායිකාවන් :

-කාන්තාවකි : 1 තිමෝති 3:11

-සන්සුන්ය (ගෞරවය ලබන අතර බැරෑරුම් මනසක් හා චරිතයක් පෙන්නුම් කරයි) : 1 තිමෝති 3:11

-කේලාම් නොකියයි (අපවාදාත්මක ලෙස අන් අය ගැන කතා නොකරයි) : 1 තිමෝති 3:11

-පමණ දැන හැසිරෙයි (සෑම දෙයකදීම මධ්‍යස්ථය) : 1 තිමෝති 3:11

-සියල්ලේදී විශ්වාසවන්තය (ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකදීම විශ්වාස කළ හැකි අතර ඔවුන් මත රඳා පැවතිය හැකිය) : 1 තිමෝති 3:11

-බොහෝ දෙනෙකුට උපකාර කරන්නෙකි (අන් අයට සේවය කළ යුතු අතර ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ක්‍රියා කළ යුතුය) : රෝම 16:2

# සභාවේ ව්‍යුහය

බයිබලයට අනුව සභාවේ ව්‍යුහය පහත සටහනේ දැක්වේ.

සභාව

|

විශේෂ නායකත්ව දීමනා

|

ප්‍රේරිතයන්

|

අනාගතවක්තෘවරු

|

ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්

|

සභාපාලකයන්

|

ගුරුවරු
(එපිස 2:20-22)

|

(නායකයන්, උපස්ථායකයන් හා වැඩිමහල්ලන් යන විශේෂ නිලයන්ගේ හා සභාවේ දෙවියන්වහන්සේ තබා ඇති තත්වය තුළ තම ආත්මික දීමනා පාවිච්චි කිරීම තුළින් ශරීරයේ සෑම සාමාජිකයෙකුගේම සහයෝගය මොවුන්ට හිමිවේ)

|

ප්‍රේරිතයන් හා අනාගතවක්තෘවරු විසින් දමන ලද පදනම
එපිස 2:20

|

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නමැති පර්වතය මත ගොඩනැගේ
මතෙව් 16:18, 1 කොරින්ති 3:11, එපිස 2:20

# හත්වෙනි පරිච්ඡේදය.

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ වාචික දීමනාවන් (කතාකරන).

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසානයෙහි ඔබට

- වාචික දීමනාවන් පහ හඳුනාගැනීමට.
- වාචික දීමනා අර්ථ දැක්වීමට.
- ප්‍රඥාවේ වචනය සහ දැනගැන්මේ වචනය අතර වෙනස හඳුන්වාදීමට හැකි වනු ඇත.

## ප්‍රධාන පදය :

**නමුත් දෙවියන්වහන්සේ තමන්ගේ කැමැත්ත ලෙස ඒ සියලු අවයවයන් වෙන වෙනම ශරීරයේ තැබූ සේක. (1 කොරින්ති 12:18)**

## හැඳින්වීම.

දීමනා පහක් "වාචික දීමනා". ලෙස නම් කර ඇත්තේ එම දීමනා කතාව සම්බන්ධ දීමනා බැවිනි. එම වාචික දීමනා පහ නම්:

- ධර්මවාක්‍ය (අනාගතවාක්‍ය)
- ඉගැන්වීම
- උපදේශය
- ප්‍රඥාවේ වචනය.
- දැනගැන්මේ වචනය.

මින් පළමුවන වාචික දීමනා දෙක වන අනාගතවාක්‍ය සහ ඉගැන්වීම විශේෂ දීමනා දෙකකට සමානය. නමුත් අනාගතවාක්‍ය පැවසීම සහ ඉගැන්වීමේ වාචික දීමනාව අනාගතවක්තෘවරයාගේ සහ ගුරුවරයාගේ නායකත්ව දීමනාවලට වඩා වෙනස්ය.

## ධර්මවාක්‍ය පැවසීම.

**තවත් කෙනෙකුට ධර්මවාක්‍ය කීමද... දෙනලද්දේය. (1 කොරින්ති 12:10)**

ධර්මවාක්‍ය පැවසීමේ දීමනාව සහිත පුද්ගලයා දෙවියන්වහන්සේගෙන් ලැබෙන විශේෂ ආනුභාවයෙන් යුතුව එතුමාගේ ජනතාව උදෙසා දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන පණිවුඩය සන්නිවේදනය කරයි.

අනාගතවක්තෘවරයෙකුවීමේ විශේෂ දීමනාව යටතේ අනාගතවාක්‍යය/ධර්මවාක්‍යය පිළිබඳව විස්තර සාකච්ඡා කළෙමු. එහිදී අනාගතවක්තෘවරයෙකු විසින් දෙන්නාවූ ධර්මවාක්‍ය සම්බන්ධව පැවසූ කරුණු සියල්ලම ධර්මවාක්‍ය පැවසීමේ දීමනාව සම්බන්ධයෙන්ද අදාළ වේ.

යම් කෙනෙකු හට ධර්මවාක්‍ය පැවසීමේ දීමනාව තිබීමෙන් ඔහුට අනාගතවක්තෘවරයෙකු වීමේ විශේෂ දීමනාව ලැබී තිබේයයි කල්පනා කළ නොහැක. මීට පෙර ඔබ ඉගෙනගත් පරිදි දෙවියන්වහන්සේ සභාවෙහි නායකත්වයෙහි අනාගතවක්තෘවරු ලෙස (ඔවුන් සතුව ධර්මවාක්‍ය පැවසීමේ දීමනාවද පවතී) පත් කළ කොටසක් සිටිති.

ධර්මවාක්‍ය පැවසීමේ දීමනාව සහිත පුද්ගලයෝ අනාගතවක්තෘවරු මෙන්ම ධර්මවාක්‍ය පැවසුවද ඔවුනට නායකත්වයෙහි විශේෂිත ස්ථානයක් වන අනාගතවක්තෘ පදවිය හිමි නොවේ. ඔව්හු ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවය යටතේ විශේෂ පණිවුඩ බෙදා ගනිති.

# ඉගැන්වීම

**එහෙයින් අපට දෙන ලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගතකීම නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු. සේවය නම් අපගේ සේවයෙහි යෙදී සිටිමු. උගන්වන්නා තමාගේ ඉගැන්වීමටත්, ...... භාරවේවා. (රෝම 12:6-7)**

ඉගැන්වීම නම් විෂය ඉගැන්වීමේ විශේෂ දීමනාව නම් කොටස යටතෙහි ආවරණය කළෙමු. එහිදී සාකච්ජා කළ සියලුම කාරණා ඉගැන්වීමේ දීමනාවටද බලපාන නමුත් නායකත්ව ස්ථානය ඇතුලත් නොවේ.

ධර්මවාක්‍ය පැවසීම හා අනාගතවකතෘවරයා අතර පැවති වෙනස මෙන්ම ඉගැන්වීමේ වාචික දීමනාව හිමි පුද්ගලයා හා විශේෂ දීමනාවක් ඇති ගුරුවරයා අතර ද වෙනසක් පවතී. දෙවියන්වහන්සේ සභාවෙහි විශේෂ නායකත්වය සඳහා ගුරුවරු (ඉගැන්වීමේ දීමනාව සහිත) පත්කරන සේක.

# උපදෙස්දීම.

**එහෙයින් අපට දෙන ලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගතකීම නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු.**
**උපදේශ දෙන්නා තමාගේ උපදේශ දීමටත් භාරවේවා. දෙන තැනැත්තේ ත්‍යාගවන්තකමෙන්ද ආණ්ඩුකරන තැනැත්තේ උනන්දුකමෙන්ද කරුණාව පෙන්වන තැනැත්තේ ප්‍රසන්න ලීලාවෙන්ද එසේ කෙරේවා. (රෝම 12:6,8)**

උපදෙස් දීමේ දීමනාව නම් කිසිවෙකු අවශ්‍යතාවයෙන් පෙළෙන මොහොතෙහිදී ඔවුනට සමීප වීමට හා දේව වචනයෙන් නිවැරදිව උපදෙස් සපයා දීමට ලැබෙන හැකියාවය. “උපදෙස් දීම” යනු වචනාර්ථයෙන් ගත් කල අදහස් වනුයේ කෙනෙක්ව පැත්තකට කැඳවාගෙන, අවවාදකිරීම, නිර්දේශකිරීම, වැරදි පෙන්වාදීම, දිරිගැන්වීම හෝ සැනසීමය.

උපදෙස්දීම යනු ප්‍රඥාවන්ත වූ ආත්මික අනුශාසනා දීමය. මෙම දීමනාව සහිත පුද්ගලයෝ මනුෂ්‍යයන් හට උපකාර කරන්නාවූ වචන, සහනය ගෙන දෙන, සැනසුම සපයන, දිරිගන්වන වචන මගින් මෙහෙකරති. නූතනයෙහි මෙම දීමනාව “උපදේශන දීමනාව” ලෙස නම් කළ හැකිය.

උපදෙස්දීම සභාවන් උදෙසා ප්‍රේරිතවරුන්ගේ සේවය නොකඩවා කර ගන යෑමේ එක් අංගයක් විය:

**ඔව්හු ඒ නුවර ශුභාරංචිය දේශනා කොට, බොහෝ දෙනෙක් ගෝලයන් කර, ලුස්ත්‍රාවටද, ඉකෝනියටද අන්තියෝකියටද හැරී ඇවිත්: අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනෑයයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට, ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාදකළෝය. (ක්‍රියා 14:21-22)**

උපදෙස්දීම කළයුතු ආකාරය බයිබලය මෙසේ උගන්වාදෙයි :

## තම දරුවනට පියෙකු විසින් කරන ලෙස:

**එසේය, තමන්වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත් නුඹලා කැඳවන දෙවියන්වහන්සේට ඔබිනලෙස නුඹලා හැසිරෙන හැටියට (1 තෙසලෝනික 2:11)**

## ඉවසීමෙන් යුක්තව උපදෙස් සැපයීමෙන් :

**වචනය දේශනා කරපන්න; කලටත් අකලටත් වැඩේ යෙදී සිටපන්න; සියලු ආකාර ඉවසිලිවන්තකමෙන් සහ ඉගැන්වීමෙන් තරවටුකර, අවවාදකර, අනුශාසනාකරපන්න කියාය. (2 තිමෝති 4:2)**

## යහපත් බයිබලීය දේව ධර්මය පදනම් කරගත් :

**තවද ඔහු සාරවත් ගුරුකමින් අවවාදකරන්ටත් විරුද්ධවාදීන් නිශ්ශබ්දකරන්ටත් පුළුවන්වන පිණිස ඉගැන්වීමට එකඟවූ විශ්වාස වචනය තදින් අල්ලාගෙන සිටින්ට ඕනෑය. (තීතස් 1:9)**

**සියලු ආධිපත්‍ය බලයෙන් යුක්තව :**

> **මේ දේවල් සියලු ආකාර බලය ඇතුව කියා, අවවාදකොට, තරවටුකරපන්න. කිසිවෙකුට නුඹ සුළුකොට සිතන්ට ඉඩනාරින්න. (තිතස් 2:15)**

**අවසාන කාලය ළඟාවත්ම වැඩි වශයෙන් :**

> **සමහරුන්ගේ පුරුද්ද සේ අපේම රැස්වීම අත් නැර, ඒ දවස ළංවන බව නුඹලාට පෙනෙන ප්‍රකාරයට වඩ වඩා එකිනෙකාට අවවාදකරමු. (හෙබ්‍රෙව් 10:25)**

**තවදුරටත් අධ්‍යයනය සඳහා:**

බයිබලයෙහි උපදෙස්දීමේ දීමනාව සහිත වූ පුද්ගලයන් පිළිබඳ උදාහරණ ඇත. එම දීමනාව පිළිබද වඩා හොඳින් වටහා ගැනීම සඳහා පහත සඳහන් පාඨ අධ්‍යයනය කරන්න.

| | |
|---|---|
| බාර්ණබස් : | ක්‍රියා 11:22-24. |
| ජුදස් සහ සීලස් : | ක්‍රියා 15:32 |
| පාවුල් : | ක්‍රියා 14:22; 2 කොරින්ති 9:5, 1 තෙසලෝනික 4:1 |
| ජුද් : | ජුද් 3. |

කෙනෙකු තවත් පුද්ගලයෙකුට උපදෙස්දීම කළ යුත්තේ කුමන ආකල්පයක් සහිතවද? 1 තෙසලෝනික 2:11 සහ 5:14 බලන්න.

---

උපදෙස් දුන් කල මනුෂ්‍යයන්ව කුමක් කිරීමට දිරිගන්වන ලද්දෝද?

1 පේතෘස් 5:1-2 : ______________________________

2 තිමෝති 4:1-4 : ______________________________

1 තෙසලෝනික 2:11-12 : ______________________________

2 තෙසලෝනික 3:12 : ______________________________

පහත සඳහන් පද අධ්‍යයනය කොට වගුව සම්පූර්ණ කරන්න.

| | **කවුද** | **දිරිගැන්වූයේ කාවද.** |
|---|---|---|
| ක්‍රියා 14:21-22 | ____________ | ____________ |
| ක්‍රියා 16:40 | ____________ | ____________ |
| ක්‍රියා 20:1 | ____________ | ____________ |
| 2 කොරින්ති 1:3-7 | ____________ | ____________ |

# ප්‍රඥාවේ වචනය

**කෙසේදයත්: ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට ප්‍රඥාවේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන තවත් කෙනෙකුට දැනගැනීමේ වචනයද (1 කොරින්ති 12:8)**

ප්‍රඥාවේ වචනය නම් විශේෂිත අවශ්‍යතාවයක් සඳහා දැනුම භාවිතා කර ගත හැක්කේ කෙලෙසද කියා දැනගන්නා පිණිස නව දැක්මක් ගැඹුරින් ලැබීමට ඇති හැකියාවයි. ඕනෑම අවස්ථාවකදී මෙම දීමනාව ඇති පුද්ගලයා හට ප්‍රඥාවන්ත විසඳුමක් සොයා ගැනීම සඳහා පවතින දැනුම අදාළ කරගත යුත්තේ කෙලෙසද කියා දැන ගත හැක.

ප්‍රඥාවේ දීමනාව නම් පියවි ඇසින් සාමාන්‍ය මිනිසාට දැකිය නොහැකි, පුද්ගලයන් පිළිබඳ හා සිදුවීම් පිළිබඳ දිව්‍යමය ගැඹුරු දැක්මකි. දෙවියන්වහන්සේගෙන් ලද මෙම ප්‍රඥාව යමක් කළයුතු ආකාරය සහ කළ යුත්තේ කුමක්ද යන කරුණු සමග මුසුව ක්‍රියාත්මක වේ. මෙම දීමනාව "ප්‍රඥාවේ දීමනාව" ලෙස නම් නොකෙරේ. එයට හේතුව දෙවියන්වහන්සේගේ සම්පූර්ණ ප්‍රඥාව කෙනෙකුට මෙමගින් නොලැබෙන බැවිනි. එය දෙවියන්වහන්සේගේ අනන්ත වූ ප්‍රඥාවෙන් සුළු කොටසක් වන ප්‍රඥාවේ වචනයක් පමණි.

ප්‍රඥාවේ වචනයේ දීමනාව අධ්‍යාපනය තුළින් හිමිවන දෙයක් නොවේ. එවන් ප්‍රඥාවේ උල්පත දෙවියන්වහන්සේය.

**ඒ වනාහි ඔවුන් ප්‍රේමයෙහි සම්බන්ධවී, තේරුම් ගැනීමේ සම්පූර්ණ සහතිකය නැමැති සියලු සම්පත භුක්තිවිඳිමින්, ඔවුන්ගේ සිත් සනසනු ලබන පිණිසත්, දෙවියන්වහන්සේගේ රහස වන ක්‍රිස්තුස්වහන්සේ දැනගන්නා පිණිසත්ය. ඒ තැනන්වහන්සේ තුළ ප්‍රඥාවෙත් දැනගැන්මෙත් සියලු වස්තු නිධානකර ඇත්තේමය. (කොලොස්සි 2:2-3)**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ "දෙවියන්වහන්සේගේ ප්‍රඥාව" ලෙසට නම් කරනු ලැබුසේක.

**නුමුත් කැඳවනු ලැබූ යුදෙව්වරුන්ට සහ ග්‍රීක්වරුන්ටත් දෙවියන්වහන්සේගේ බලය සහ දෙවියන්වහන්සේගේ ප්‍රඥාවත්ය.**
**නුමුත් උන්වහන්සේ කරණකොටගෙන නුඹලා ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින්නහුය. ඒ තැනැන්වහන්සේ දෙවියන්වහන්සේගෙන් අපට ප්‍රඥාව එනම් ධර්මිෂ්ඨකමද ශුද්ධකමද මිදීමද කරනු ලැබුසේක. (1 කොරින්ති 1:24,30)**

දේව භක්තික ප්‍රඥාව ලෝකයෙහි ප්‍රඥාවට සමාන නොවේ.

**නුමුත් නුඹලාගේ සිත්වල තික්ත ඊර්ෂ්‍යාවද පක්ෂවාදිකමද තිබේ නම්, පාරට්ටුකරමින් සත්‍යයට විරුද්ධව බොරු නොකියල්ලා. ඒ ප්‍රඥාව ඉහළින් පැමිණෙන එකක් නොව භූමිකව මාංසිකව යක්ෂාකාරව තිබේ. මක්නිසාද ඊර්ෂ්‍යාවත් පක්ෂවාදී කමත් ඇති තැන, අවුල්කමත් සියලු නපුරු ක්‍රියාවලුත් ඇත්තේය. නුමුත් ඉහළින් පැමිණෙන ප්‍රඥාව පළමුකොට පිරිසිදුව, ඊළගට සමාදානව, ඉවසිවන්තව, යටහත්ව, දයාවෙනුත් යහපත් ඵලවලිනුත් පූර්ණව, අපක්ෂවාදීව, අවංකව තිබේ. (යාකොබ් 3:14-17)**

ඔබ සතුව ප්‍රඥාවේ වචනය නම් දීමනාව නොතිබුණද, ආත්මික ප්‍රඥාව දියුණු කරගැනීමට ඉඩ කඩ ඇත. දේව වචනය අධ්‍යයනය කිරීමෙන් ඔබට එය ලබාගත හැකිය.

**ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන ගැළවීම පිණිස නුඹ නැණවත්කරන්ට පුළුවන්වූ ශුද්ධලියවිලි නුඹ බාල වයසේ පටන් දැනගෙන සිටින බවත් දැන, ඒවායෙහි පිහිටා සිටපන්න. (2 තිමෝති 3:15)**

ඔබට ප්‍රඥාව දෙන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටිය හැක :

**නුමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩු නම්, වරද නොතබන්නාවූ, බොහෝකොට සියල්ලන්ට දෙන්නාවූ දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා: එවිට ඔහුට එය දෙනු ලැබේ. (යාකොබ් 1:5)**

දේව භක්තික ජීවිතයක් ගත කරන කෙනෙකුහට ප්‍රඥාව හිමිවේ.

**මක්නිසාද ප්‍රඥාව දෙන්නේ ස්වාමීන්වහන්සේය: උන්වහන්සේගේ මුඛයෙන් දැනගැන්මද ඥානයද පැමිණෙන්නේය. උන්වහන්සේ අවංක තැනැත්තන්ට හරි ප්‍රඥාව රැස්කර තබනසේක. සෘජුලෙස හැසිරෙන්නන්ට උන්වහන්සේ පලිහක් වනසේක. (හිතෝපදේශය 2:6-7)**

නමුත් මතක තබාගත යුතු දෙය නම් සියළු ඇදහිලිවතුන්ට ලබාගත හැකි ආත්මික ප්‍රඥාව, ප්‍රඥාවේ වචනය නම් දීමනාව හා සමාන නොවේ. ප්‍රඥාවේ වචනය නම් දීමනාව දෙවියන්වහන්සේ විසින් ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් මිනිසාට ලබාදෙන විශේෂ හැකියාවකි.

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

පාවුල් ප්‍රඥාව පිළිබඳ සඳහන් කර ඇති පාඨ අධ්‍යයනය කර බලන්න. 1 කොරින්ති 2:1-13. ඔහු ලියන්නාවූ ප්‍රඥාවන් දෙක අතර පවතින වෙනස්කම් මොනවාද? ප්‍රඥාවේ වචනය ඔහුගේ ජීවිතයෙහි ක්‍රියාත්මක විය. 2 පේත්‍රුස් 3:15-16; 1 කොරින්ති 2:4-8 බලන්න.

ස්තේපන්ගේ සේවයෙහි ප්‍රඥාව ක්‍රියාත්මක විය. ක්‍රියා 6:3,10

පැරණි ගිවිසුමෙහි ප්‍රඥාව පිළිබඳව හොඳම උදාහරණය නම් සාලමොන් රජය: 1 රාජාවලිය 3:5-28.

හිතෝපදේශ පොත අධ්‍යයනය කරන්න. එය සාලමොන් රජ විසින් ලියන ලද ආත්මික ප්‍රඥාවෙහි ප්‍රායෝගික අදාළ කරගැනීමකි.

යාකොබ් 3:17 අධ්‍යයනය කරන්න. දේව භක්තික ප්‍රඥාවෙහි චරිත ගුණාංග ලැයිස්තුවක් සාදන්න.

ප්‍රඥාවේ වචනය ක්‍රියාත්මක වීම පිළිබඳව පහත සඳහන් උදාහරණ අධ්‍යයනය කරන්න.

- ලූක් 2:40-52; 21:15
- ක්‍රියා 5:26-33

(එම ප්‍රකාශයෙහි අන්තර්ගත ප්‍රඥාව නිරීක්ෂණය කරන්න. "මිනිසාට වඩා අප දෙවියන්වහන්සේට කීකරුවිය යුතුය.")

- ද්විතිය කථාව 34:9
- නික්මයාම 36:1-2

# දැනගැන්මේ වචනය

**කෙසේදයත්; ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට ප්‍රඥාවේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන තවත් කෙනෙකුට දැනගැනීමේ වචනයද (1 කොරින්ති 12:8)**

දැනගැන්මේ වචනය යනු අනෙක් අයට අවබෝධ නොවන නොදන්නාවූ කාරණා වටහාගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවය යටතේ ලැබෙන හැකියාවය. ප්‍රඥාවේ වචනය මෙන්ම මෙයද "දැනගැන්මේ දීමනාව" ලෙසින් නම් නොකෙරේ. එය "දැනගන්මේ වචනය" නම් දීමනාවයි. එය දෙවියන්වහන්සේගේ සම්පූර්ණවූ දැනගැන්ම නොව එතුමාගේ දැනීමෙන් සුළු කොටසක් පමණක් වේ.

මෙම ආත්මික දැනගැන්මෙහි මුල් උල්පත දෙවියන්වහන්සේය :

**ඒ තැනන්වහන්සේ තුළ ප්‍රඥාවෙත් දැනගැන්මෙත් සියලු වස්තු නිධානකර ඇත්තේමය. (කොලොස්සි 2:3)**

**මනුෂ්‍යයෙකුගේ කාරණා මනුෂ්‍යයා තුළ තිබෙන ඔහුගේ ආත්මය හැර මනුෂ්‍යයන් අතරේ වෙන කවරෙක් දන්නේද? එසේම දෙවියන්වහන්සේගේ කාරණා දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මිස වෙන කිසිවෙක් නොදනියි. නමුත් දෙවියන්වහන්සේ විසින් අපට දෙන ලද දේ අප විසින් දැනගන්නා පිණිස ලෝකයේ ආත්මය නොව දෙවියන්වහන්සේගෙන් වූ ආත්මය ලැබීමුව. අප විසින් ඒ දේවල් කථාකරන්නේත් මනුෂ්‍ය ප්‍රඥාව කරණකොටගෙන උගන්වන ලද වචනවලින් නොව**

**ආත්මික දේවල් ආත්මික දේ සමග සමානකර බලමින් ආත්මයාණන්වහන්සේ විසින් උගන්වනලද වචනවලින්ය. නුමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළිනොගනියි. ඒවා ඔහුට මෝඩකමය; ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය. (1 කොරින්ති 2:11-14)**

දැනගැන්මේ වචනය නම් දිමනාවෙහිදී ලැබෙන දැනීම හෙළිදරව් වන්නාවූ දැනුමකි. එහි තේරුම නම් එම දැනුම දෙවියන්වහන්සේ විසින් එළිදරව් කර දෙන්නක් බවය. එම දැනුම අධ්‍යාපනය තුළින් හෝ අධ්‍යයනය කිරීමකින් ලබාගත් දැනුමක් නොවේ.

යේසුස්වහන්සේ ආත්මික ප්‍රශ්නයක් පේත්‍රුස්ට ඉදිරිපත් කළ විට, ඔහු දැනගැන්මේ වචනයකින් එයට පිළිතුරු සැපයිය. එවිට යේසුස්වහන්සේ කතාකොට :

**යේසුස්වහන්සේ උත්තරදෙමින්: සීමොන් බර්-යෝනා, නුඹ ආශිර්වාද ලද්දෙක්ය. මක්නිසාද ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ මිස මාංසය හා රුධිරය මේක නුඹට එළිදරව් නොකළේය. (මතෙව් 16:17)**

දැනගැන්මේ වචනය නම් දිමනාව ඉතා යටහත් පහත්ව ක්‍රියාත්මක කළ යුතුවේ. මන්ද ඔබ පවසන දෙය ඔබගේම දැනගැන්ම නොව දෙවියන්වහන්සේ ඔබට සපයා දෙන දැනුමකි. දැනුමෙහි උල්පත එතුමාය.

**දේවතාවන්ට පුදනලද දේවල් ගැනය. අප සියල්ලන්ටම ඥානය ඇති බව දනිමුව. ඥානය උඩගුකම උපදවයි, නමුත් ප්‍රේමය වැඩ සිද්ධකරයි. යමෙක්, තමා යමක් දන්නේයයි සිතයි නම්, ඔහු දැනගන්ට ඕනෑ ලෙස තවම දැනගෙන නැත; (1 කොරින්ති 8:1-2)**

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

දැනගැන්මේ වචනය තවදුරටත් අධ්‍යයනය සඳහා අලුත් ගිවිසුමෙහි උදාහරණ :

| | |
|---|---|
| යේසුස් | යොහන් 1:48; 4:17-18 ; 11:14. |
| සීමොන් | ලූක් 2:25-35 |
| අනනියස් සහ සප්පිරා | ක්‍රියා 5:1-11 |
| පාවුල් | ක්‍රියා 27:13-44 |
| පේත්‍රුස් | ක්‍රියා 5:1-10; 8:23; 10:19 |
| අනනියස් | ක්‍රියා 9:1-18 |

මෙම කොටසෙහි අනනියස් පිළිබඳව පහත කරුණු බලන්න.

| | |
|---|---|
| - ඔහු පාවුල් සිටි ස්ථානය දැන සිටියේය | 11 පදය |
| - ඔහු යාච්ඤා කරමින් සිටිබව දැන සිටියේය | 11 පදය |
| - ඔහු දර්ශනයක් දුටු බව දැන සිටියේය | 12 පදය |
| - ඔහු තෝරාගත් භාජනයක් බව දැන සිටියේය | 15 පදය |
| - ඔහු දුක් විඳින්නට යන බව දැන සිටියේය | 16 පදය |
| - ඔහු සාක්ෂිකරුවෙකු වන බව දැන සිටියේය | 15 පදය |

## ස්වයං-පරීක්ෂණය.

1. කටපාඩමින් ප්‍රධාන පදය ලියන්න.

_______________________________________________

2. වාචික දීමනා පහ මොනවාද?

__________ __________ __________ __________ __________

3. පළමු ලැයිස්තුවේ දී ඇති වාචික දීමනා කියවා බලන්න. දෙවන ලැයිස්තුවේ ඇති අර්ථ කථන බලන්න. දීමනාවට ගැළපෙන අර්ථ කථනයේ අංකය දීමනාව ඉදිරියෙන් සලකුණු කරන්න.

| 1 වන ලැයිස්තුව | 2 වන ලැයිස්තුව |
|---|---|
| _______ උපදෙස්දීම | 1. දෙවියන්වහන්සේගේ ආනුභාවය යටතේ එතුමාගේ ජනතාව වෙතට පණිවුඩයක් එසැණින්ම සපයා දෙමින් කතාකරයි. |
| _______ ධර්මවාක්‍යය | 2. උපදේශනයේ හා සහනයේ වචන. |
| _______ ප්‍රඥාවේ වචනය | 3. අන් අයව දේව වචනයෙහි පුහුණු කිරීමට හැකියාව. |
| _______ ඉගැන්වීම | 4. විශේෂිත අවශ්‍යතාවයකට අනුව දැනුම අදාළ කරගත හැකි ක්‍රමය දැනීමට ගැඹුරු දැක්ම. |
| _______ දැනගැන්මේ වචනය | 5. අනෙක් අයට වටහාගත නොහැකි කරුණු අවබෝධ කරගෙන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවය යටතේ එය අන්‍යයන් සමග බෙදා ගැනීමට පවතින හැකියාව. |

4. නිවැරදි පිළිතුර වටා රවුමක් අඳිමින් මෙම වාක්‍යය සම්පූර්ණ කරන්න : ඇදහිලිවතුන් ප්‍රඥාවේ වචනයක් හෝ දැනගැන්මේ වචනයක් ලබා දෙනුයේ...

   අ. ඔවුන් කියවා ඇති දෙයක් නැවත උච්චාරණය කිරීමෙනි.
   ආ. දෙවියන්වහන්සේ ඔවුනට පැවසීමට යයි කියන දෙයක් පිළිබඳ සිතමින් උත්සහ දැරීමෙනි.
   ඇ. ඔවුනට ශුද්ධාත්මයාණන්වහන්සේ දුන්නාවූ වචනය කතාකිරීමෙනි.

5. මෙම ප්‍රකාශය සත්‍යයද අසත්‍යයද? ප්‍රඥාවේ වචනය හා දැනගැන්මේ වචනය යන දීමනා දෙකම එකය. මෙම ප්‍රකාශය ______________ ය.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

කරුණාකර සලකන්න.

මෙම වාචික දීමනා එකිනෙක සාකච්ඡා කරන අතර තුර තවදුරටත් අධ්‍යයනය සඳහා පාඩ ඒ හා සමගම ඉදිරිපත් කර ඇත. ඊළඟ අධ්‍යයනයට යාමට පෙර එක් එක් දීමනාව පිළිබඳ අධ්‍යයනය සම්පූර්ණ කරන පිණිස එසේ කළ බව සලකන්න.

# අටවෙනි පරිච්ඡේදය.

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවයකිරීමේ දීමනා.

### අරමුණ :

මෙම පරිච්ඡේදය අවසානයෙහිදී ඔබට

- ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවයකිරීමේ දීමනා නවය හඳුනා ගැනීමට
- සේවයකිරීමේ දීමනා හා උපකාරක දීමනා අතර වෙනස පැහැදිලි කිරීමට
- පරිපාලන දීමනාව හා නායකත්ව දීමනාව අතර වෙනස පැහැදිලි කිරීමට
- ඇදහිල්ලේ දීමනාව හා ඇදහිල්ලේ ඵල අතර වෙනස හඳුනාගැනීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය:

**නුඹලා අතරේ ප්‍රධානියා වෙන්ට කැමති කවරෙක් නුමුත් සියල්ලන්ගේ දාසයා වන්නේය.**
(මාර්ක් 10:44)

### හැඳින්වීම

අප "මෙහෙකිරීමේ දීමනා" "සේවයේ දීමනා" නමින් හඳුන්වන ආත්මික දීමනා නවයක් පවතී. මෙම දීමනා ප්‍රේරිත, අනාගතවක්තෘ, ධර්මදූත, පාලක හා ගුරුවරු වැනි විශේෂ නිලතල නොවේ. එසේම මෙම දීමනා සභාව ඉදිරියේ දේව වචනයෙන් සේවය කිරීමට යොදාගන්නා වාචික දීමනාවද නොවේ. එසේම ඒවා සලකුණු සහිත දීමනාවද නොවේ. (මීළඟ පරිච්ඡේදයෙහිදී ඔබ ඉගෙන ගනු ඇත.) සලකුණු දීමනා ශුභාරංචියෙහි සත්‍යතාවය තහවුරු කිරීම සඳහා දෙන දීමනාය.

මෙම දීමනා නවය සභාවට අවශ්‍ය ආකෘතිය, සංවිධානය සහ ආත්මික මෙන්ම ප්‍රායෝගික සහය සැපයීමෙන් "සේවය" ලබා දෙයි. "සේවා දීමනා" නවය නම්:

| | |
|---|---|
| - ආත්ම විමසීම | - උපකාර කිරීම |
| - නායකත්වය | - සේවය |
| - පරිපාලනය | - කාරුණිකවීම |
| - ඇදහිල්ල | - ආගන්තුක සත්කාරය |
| - දීම | |

### ආත්ම විමසීම

**නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. කෙසේදයත්: ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට ප්‍රඥාවේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන තවත් කෙනෙකුට දැනගැනීමේ වචනයද එම ආත්මයාණන්වහන්සේ තුළ වෙන කෙනෙකුට ඇදහිල්ලද, එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙකුට සුව කිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආශ්චර්ය කිරීමද, තවත් කෙනෙකුට ධර්මවාක්‍ය කීමද, වෙන කෙනෙකුට ආත්මවල් විමසීමද, තවත් කෙනෙකුට නානා වර්ග භාෂාද, තවත් කෙනෙකුට භාෂා තේරුම්කර දීමද දෙනලද්දේය.** (1 කොරින්ති 12:7-10)

ආත්ම විමසීම නම් මනුෂ්‍යයන්ව, දේව ධර්ම, සහ අවස්ථාවන් අගැයීමකට ලක් කොට එය දෙවියන්වහන්සේගෙන්ද නැතහොත් සාතන්ගෙන්ද දැයි දැනගැනීමට ඇති හැකියාවය. ආත්ම විමසීම, විවේචනාත්මක ආත්මය සමග කිසිවිටක පටලවා නොගන්න. මෙම දීමනාව ආත්මික දීමනාවකි. ආත්මික කාරණා ස්වාභාවික මනසින් විමසිය නොහැක.

**නුමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළිනොගනියි. ඒවා ඔහුට මෝඩකමය. ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය. නුමුත් ආත්මික තැනැත්තේ සියල්ල විමසයි, නුමුත් ඔහුම කිසිවෙකු විසින් විමසනු නොලබයි.**
**(1 කොරින්ති 2:14,15)**

මෙම දීමනාව ආත්ම විමසීමට පමණක් සීමා වී තිබේ. එය සාමාන්‍යයෙන් පොදුවේ කාරණා විමසීමක් නොවේ. මෙම දීමනාව මගින් සභාවට වැරදි අරමුණු සහිතව පැමිණෙන අය, වැරදි ධර්ම, සහ වැරදි ආකල්ප මගින් සභාව දෙකඩ කිරීමට මාන බලන අයව හඳුනාගනු ලැබේ.

සභාවට එරෙහිව පවතින සතුරෝ ස්වාභාවික දෑසින් බලා හඳුනාගත නොහැකි බැවින් ආත්ම විමසීමේ දීමනාව ඉතා වැදගත්ය. සතුරාව හඳුනාගත හැක්කේ ආත්මික විමසීමකින් පමණකි.

**මක්නිසාද අපේ පොරබැදීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ඨකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

සාතන් භාවිතා කරන්නාවූ එක් උපක්‍රමයක් නම් රැවටීමය. එබැවින් ආත්ම විමසීම ඉතා වැදගත්ය:

**මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ. ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය. (2 කොරින්ති 11:14-15)**

ස්වාමිවූ යේසුස්වහන්සේගේ පැමිණීම ආසන්නවත්ම, රැවටිලිකාරකමේ ආත්මය වැඩිවනු ඇත:

**එහෙත් පසු කාලවලදී සමහරු මුළාකරවන ආත්මයන්ද යක්ෂයන්ගේ ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලි ලෙස කියනසේක.**
**(1 තිමෝති 4:1)**

ප්‍රේරිත වූ පේත්‍රුස් අනතුරු අඟවමින් පවසනුයේ:

**නුමුත් සෙනග අතරේ බොරු ප්‍රොපේතවරුද සිටියෝය. එලෙසම විනාශක ධර්මභේද රහසින් උපදවමින්ද, තමුන්ම මිලේටගත් ආචාරීන්වහන්සේව එපාකරමින්ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවාගන්නාවූ බොරු ගුරුවරු නුඹලා අතරෙන් වන්නෝය. ඔවුන්ගේ සල්ලාලකම් අනුව බොහෝ දෙනෙක් යනවා ඇත: ඔවුන් නිසා සත්‍යතාවේ මාර්ගයට අපහාස පැමිණෙන්නේය.**
**(2 පේත්‍රුස් 2:1-2)**

ඔබ සතුව ආත්ම විමසීමේ දීමනාව නොමැති නම්, ඔබට ආරක්ෂාවක් නැතුව නොවේ. දෙවියන්වහන්සේ ආත්ම පරීක්ෂාකර බැලීමට ක්‍රමයක් සපයා ඇත. ඔබ සතුව ආත්ම විමසීමේ දීමනාව ඇතත් නැතත් මෙම පරීක්ෂණය වලංගු වේ.

**ප්‍රේමවන්තයෙනි, බොහෝ බොරු ප්‍රොපේතවරු ලෝකයට පැමිණ සිටින බැවින් සියලු ආත්ම විශ්වාස නොකොට ඒ ආත්ම දෙවියන්වහන්සේගෙන්දැයි පරීක්ෂා කරපල්ලා, මෙයින් නුඹලා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ දැනගන්නහුය. එනම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාංසයෙන් යුක්තව ආ බව ඊත්තුගන්නාවූ සෑම ආත්මයෝ දෙවියන්වහන්සේගෙන්ය. යේසුස්වහන්සේ ඊත්තු නොගන්නාවූ සියලු ආත්මයෝ දෙවියන්වහන්සේගෙන් නොවෙති. එන්නේයයි නුඹලා ඇසුවාවූ, දැනටම ලෝකයෙහි සිටින්නාවූ විරුද්ධ-ක්‍රිස්තුස්ගේ ආත්මය මේය. (1 යොහන් 4:1-3)**

යහපත හා නපුර අතර විමසා බැලීම සඳහා ඔබගේ ආත්මික සංවේදීතාවය භාවිතා කිරීමට ඔබට ඉගෙන ගත හැකිය. මෙම ආත්මික සංවේදී බව වර්ධනය කරගත හැක්කේ දේව වචනය අධ්‍යයනය කිරීමෙනි.

**ඉතින් කිරි බොන සෑමදෙනම ළදරුවන් බැවින් ඔව්හු ධර්මිෂ්ඨකමේ වචනය ගැන අසමර්ථව සිටිති. නුමුත් දැඩි ආහාර ඕනෑවන්නේ යහපත සහ අයහපත විමසාබලන්ට ව්‍යවහාරයෙන් පුරුදු පුහුණුවූ ඉන්ද්‍රියයන් ඇති, සම්පූර්ණවූ තැනැත්තන්ටය. (හෙබ්‍රෙව් 5:13-14)**

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

ආත්ම විමසීමේ දීමනාව භාවිතා කළ අවස්ථාවන් පිළිබඳ උදාහරණ පහත සඳහන් පාඩ වලින් ලබාගත හැක.

- යේසුස්වහන්සේ  මතෙව් 16:21-23; යොහන් 1:47; ලූක් 9:55
- පාවුල්  ක්‍රියා 13:6-12; 16:16-18
- පේත්‍රුස්  ක්‍රියා 5:1-11; 8:18-24

(ක්‍රියා 8:18-24 හි ආත්ම විමසීමේ දීමනාව භාවිතා කිරීමෙහි එක් අපේක්ෂිත ප්‍රතිඵලය කුමක් විද?)

# නායකත්වය

**එහෙයින් අපට දෙන ලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගතකීම නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු.**
**උගන්වන්නා තමාගේ ඉගැන්වීමටත්, උපදේශ දෙන්නා තමාගේ උපදේශ දීමටත් භාරවේවා. දෙන තැනැත්තේ ත්‍යාගවන්තකමෙන්ද, ආණ්ඩුකරන තැනැත්තේ උනන්දුකමෙන්ද, කරුණාව පෙන්වන තැනැත්තේ ප්‍රසන්න ලීලාවෙන්ද එසේ කෙරේවා. (රෝම 12:6,8)**

නායකත්වය නම් ආත්මික දීමනාව යනු දෙවියන්වහන්සේගේ පරමාර්ථයට අනුකූලවූ ඉලක්ක තැබීමටත් එම ඉලක්ක අන්‍යයන් සමග සන්නිවේදනය කිරීමටත් ඇති හැකියාවය. මෙම දීමනාව සහිත පුද්ගලයා දේව මහිමය උදෙසා එම ඉලක්ක සපුරා ලීමට අනෙක් මනුෂ්‍යයන්ව පොලඹවා මගපෙන්වනු ඇත.

රෝම 12 හි නායකත්වය සඳහන් කොට ඇත. මෙම දීමනාව සඳහා අවශ්‍ය සුදුසුකම නම් එම තැනැත්තා උනන්දුවෙන් යුක්තව මගපෙන්වීමය. උනන්දුවෙන් යුක්තව යන පදයෙන් සනිටුහන් කරන්නේ භාරගත් වැඩය නිරන්තර සැලකිල්ලෙන් යුක්තව නිසියාකාරව ඉටුකිරීමට ප්‍රයත්න දැරීම යන්නය. එහි අර්ථය නම්, කාර්යශූර, අවධානය යොමු කරන, දිගටම නොසැලී සිටීම යනුයි.

නායකත්ව දීමනාව සහිත පුද්ගලයෝ තමුන්ගේම නිවස නිසියාකාරව පාලනය කළ යුතුවේ.

**නුමුත් යමෙක් තමාගේම පවුල හසුරුවාගන්ට නොදන්නේ නම් ඔහු දෙවියන්වහන්සේගේ සභාව ප්‍රවේසම් කරන්නේ කෙසේද? (1 තිමෝති 3:5)**

පරිපාලන දීමනාව සහිත පුද්ගලයා පිළිබඳව මෙය සත්‍යයකි. සභාවේ නායකයන් හට ඇදහිලිවන්තයෝ ගෞරව කළ යුතුය.

**තවද, සහෝදරයෙනි, නුඹලා අතරෙහි වෙහෙසගන්නාවූ, ස්වාමීන්වහන්සේ තුළ නුඹලා කෙරෙහි ප්‍රධානකම් කරන්නාවූ, නුඹලාට දැනමුතුකම් දෙන්නාවූ තැනැත්තන් දැනගෙන, ඔවුන්ගේ වැඩේ නිසා ප්‍රේමයෙන් ඔවුන් ඉතා උතුම් කොට සලකන ලෙස අපි නුඹලාගෙන් ඉල්ලමුව. තම තමුන් අතරේ සමාදානයෙන් සිටපල්ලා. (1 තෙසලෝනික 5:12-13)**

අපට පවසා ඇත්තේ :

**නුඹලාගේ ප්‍රධානියෝ ගණන්දෙන්ට සිටින්නන් මෙන් නුඹලාගේ ආත්ම ගැන රැක බලා සිටිති. ඔවුන් සුසුම්ලමින් එසේ කළොත් නුඹලාට අලාභ බැවින්, සුසුම්ලමින් නොව ප්‍රීතියෙන් එසේ කරන පිණිස ඔවුන්ට කීකරුව යටත්වෙයල්ලා. (හෙබ්‍රෙව් 13:17)**

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

මෝසෙස්, යෝෂුවා හා දාවිත් ශ්‍රේෂ්ඨ නායකයන්ගෙන් තිදෙනෙකි. මෝසෙස්ගේ කථාව නික්මයාම පොතේ සිට ද්විතිය කථාව දක්වා ව්‍යාප්තව පවතී. යෝෂුවාගේ කථාව යෝෂුවා පොතෙහි සඳහන් වේ. දාවිත් පිළිබඳව ඔබ හට 1 හා 2 සාමුවෙල් පොත්වල කියවිය හැකිය.

අනෙකුත් ශ්‍රේෂ්ඨ නායකයන් නම් :

- නෙහෙමියා : නෙහෙමියා පොත
- එස්රා : එස්රා, නෙහෙමියා පොත්
- පේත්‍රුස් : ක්‍රියා පොත

## පරිපාලනය

> **මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්චර්ය කරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුද නානා වර්ග භාෂාද සභාවෙහි පිහිටෙවුසේක. (1 කොරින්ති 12:28)**

පරිපාලන දීමනාව බයිබලයෙහි නම් කොට ඇත්තේ "ආණ්ඩු කිරීම" ලෙසිනි. පරිපාලන දීමනාව සහිත පුද්ගලයා හට උපදෙස් දීමට, මග පෙන්වීමට, සංවිධානය කිරීමට, අන්‍යයන් වෙනුවෙන් තීරණ ගැනීමට හැකියාව තිබේ. පරිපාලන යන වචනයෙහි අර්ථය නැවක මගපෙන්වන කපිතාන් කෙනෙකුගේ කාර්යභාරයට සමානය. බයිබලයෙහි මෙම කටයුතු දෙක සඳහාම එකම පදයක් භාවිතා කොට තිබේ.

> **ගිදොන්හි සහ අර්වද්හි වැසියෝ නුඹේ හබල්කාරයෝව සිටියෝය. එම්බා තීර්, නුඹ තුළ සිටි නුඹේ ප්‍රඥාවන්තයෝම නුඹේ නාවිකයෝව සිටියෝය. (එසකියෙල් 27:8)**

මෙම දීමනාව සහිත පුද්ගලයා මග පෙන්වීමට හා තීරණ ගැනීමට වගකියනු ලැබේ. නැවක කපිතාන් වරයෙකු මෙන්, ඔහු එම නැවේ හිමිකරුවා නොවුවත්, ගමන යෑම සඳහා මගපෙන්වීමේ වගකීම ඔහුට භාර වී තිබේ.

නායකත්ව දීමනාව හා පරිපාලන දීමනාව යන දෙකම ආත්මික ඉලක්ක ඉටු කර ගැනීම සඳහා සංවිධානාත්මක දක්ෂතා ක්‍රියාවට නැංවීම සිදුවේ. බොහෝ අවස්ථාවලදී එකම ඇදහිලිවන්තයා සතුව නායකත්ව හා පරිපාලන දීමනා දෙකම පිහිටිය හැක. යම් කිසිවෙකු සතුව පරිපාලන දීමනාව පැවතියද ඔහු සතුව නායකත්ව දීමනාව නොමැති නම් ඔහුට එම දීමනාව සහිත කෙනෙකුගේ සහාය ලබාගත යුතුවේ.

පරිපාලන දීමනාව සහිත පුද්ගලයා හට මගපෙන්වීමට, සංවිධානය කිරීමට, තීරණ ගැනීමට හැකියාව පවතී. එහෙත් නායකත්ව දීමනාවෙන් තොරව ඔහුට මනුෂ්‍යයන්ව පොළඹවා ඉලක්ක අත්පත් කරගැනීමට හැකියාව නොපවතී.

සභාපාලකවරු සහ ගුරුවරු සතුව බොහෝවිට නායකත්වයේ ආත්මික දීමනාව පවතී. ඔව්හු හට මනුෂ්‍යයන්ව ආත්මික ඉලක්ක අත්පත් කරගැනීමට පෙලඹවිය හැකිය. නුමුත් බොහෝ විට ඔවුන් සතුව පරිපාලන දීමනාව නොමැත. එබැවින් ඔව්හු පෙලඹවීම ලබා දුන්නාද ඉලක්ක අත්පත් කරගැනීමට සංවිධානාත්මකව ක්‍රියා කිරීමට අපොහොසත් වෙති.

පාවුල් සහ තිතස් අතර පැවති සම්බන්ධතාවයෙන් පරිපාලන දීමනාව ක්‍රියාත්මක වන ආකාරය පෙන්නුම් වේ. පාවුල් සතුව පැවති දීමනාවලට අමතරව ප්‍රේරිතවරයෙකු වීමේ විශේෂ නායකත්ව දීමනාවක් ඔහු සතුවිය. ඔහු ක්‍රීතයෙහි සභාවක් පිහිටුවීය, පසුව තිතස් එය සංවිධානය කොට මඟපෙන්වීය.

> **මා එන විට නුඹ ක්‍රීතෙහි නැවැත්වූ කාරණය නම්, අඩුව තිබුණු දේවල් නුඹ විසින් පිළිවෙළට යොදන පිණිසත් මා නුඹට ආඥාකළ ලෙස නුවරක් පාසා වැඩිමහල්ලන් පත්කරන පිණිසත්ය. (තීතස් 1:5)**

පාවුල් ක්‍රීතයෙහි සභාවට පරිපාලකයෙකු ලෙස තිතස්ව පත්කළේය. එහෙත් සභාවන්හි බලය තවමත් තිබුණේ පාවුල් අතේය. තිතස් පරිපාලන නිලධාරියා ලෙස පාවුල්ගේ උපදෙස් ක්‍රියාත්මක කළේය. මෙම ඡේදයට අනුව පරිපාලනයෙහි එක් ක්‍රියාවක් නම් අනෙක් ඇදහිලිවන්තයන්ව සභාවේ නායකත්වය සඳහා පුහුණු කිරීමය.

### තවදුරටත් අධ්‍යයනය සඳහා :

ක්‍රියා 6:1-7 විස්තර කර ඇති ගැටලුව අධ්‍යයනය කරන්න. ගැටලුව කුමක්ද? නායකත්ව දීමනාව භාවිතා කළේ කවුද? පරිපාලන දීමනාව තිබෙන්නට ඇත්තේ කා සතුවද?

ලූක් 14:28-30 කියවන්න. සැලසුම් කිරීමේ හා සංවිධානය කිරීමේ වටිනාකම බලන්න. මෙය හොඳ පරිපාලනයක කොටසකි.

උත්පත්ති 37 සිට 50 දක්වා යෝසෙප්ගේ ජීවිතය අධ්‍යයනය කරන්න. යෝසෙප් සතුව පරිපාලනමය දීමනාව විය. ඔහු ඵාරාවෝ වෙනුවෙන් මිසරය සංවිධානය කොට මගපෙන්විය. ක්‍රියා 7:9-10 බලන්න.

## ඇදහිල්ල

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. කෙසේදයත්: ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට ප්‍රඥාවේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන තවත් කෙනෙකුට දැනගැනීමේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ තුළ වෙන කෙනෙකුට ඇදහිල්ලද, එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙකුට සුව කිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආශ්චර්ය කිරීමද, (1 කොරින්ති 12:7-9)**

ඇදහිල්ලේ දීමනාව සතු පුද්ගලයා හට අපහසු අවස්ථාවන්හිදී දෙවියන්වහන්සේ විශ්වාස කිරීමටත් අති ස්වාභාවික අයුරින් එතුමා කෙරෙහි ස්ථිරව නිසැකකමින් සිටීමටත් හැකියාව ඇත. විශේෂ අවශ්‍යතා සැපිරීම සඳහා එය විශේෂ ඇදහිල්ලකි. දෙවියන්වහන්සේ කළ නොහැකි කාර්යයන් ඉටු කරන බව ඔහු දනී. ඔහු අවට සිටින අනෙකුත් ඇදහිලිවන්තයන් මෙය විශ්වාස නොකරන කල පවා ඔහු තම ඇදහිල්ල ක්‍රියාවට නංවයි. බයිබලය මෙවන් ඇදහිල්ල අර්ථ දක්වනුයේ :

> **ඇදහිල්ල නම් බලාපොරොත්තුවන දේවල් ගැන සහතිකයය, නොදක්නා දේවල් ගැන ඔප්පුවය. (හෙබ්‍රෙව් 11:1)**

ඇදහිල්ල අපට අනාගතයෙහි පොරොන්දු වී ඇති දෙය, නොපෙනෙන දෙය, සත්‍ය බවට නිසැකකම සපයයි.

ඇදහිල්ලේ වර්ග කිහිපයක් පවතී. ස්වාභාවික ඇදහිල්ල නම් මීට පෙර ස්ථායි බවට ඔප්පු වී ඇති කරුණු කෙරෙහි රඳවන විශ්වාසයයි. බයිබලය, පවිත්‍රකරවන ඇදහිල්ල පිළිබඳව පවසයි (ගලාති 2:20), ආරක්ෂක ඇදහිල්ල (එපීස 6:16) සහ ගළවන්නාවූ ඇදහිල්ල (රෝම 5:1) පවසයි.

ඇදහිල්ලට විවිධ මට්ටම් ඇති බව බයිබලය හෙළිකරයි. තම ඇදහිල්ල භාවිතා නොකළ මනුෂ්‍යයන් ඇදහිල්ල නොමැති අය ලෙසට යේසුස්වහන්සේ කතා කළ සේක. (මතෙව් 17:17). උන්වහන්සේ මද ඇදහිලි ඇති අය පිළිබඳව කතා කළසේක. (මතෙව් 6:30; 8:26; 14:31; ලූක් 12:28) එසේම ශ්‍රේෂ්ඨ ඇදහිල්ලෙන් යුත් අය පිළිබඳව පැවසූ සේක. (මතෙව් 8:10; 15:28; ලූක් 7:9).

බයිබලය අපට උගන්වන්නේ දෙවියන්වහන්සේ එක එක මනුෂ්‍යයා හට ත්‍යාගයක් ලෙසට යම් ප්‍රමාණයක ඇදහිල්ලක් දී ඇති බවය. (රෝම 12:3 ) අප ගැළවීම ලබා සිටින්නේද ඇදහිල්ලෙන් බව එය උගන්වයි (එපීස 2:8). එනමුත් ඇදහිල්ලේ දීමනාව නම් ඔබගේ ජීවිතයෙහි සියලුම ක්ෂේත්‍ර කෙරෙහි දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට ඔබට ඇති විශේෂ අසාමාන්‍ය හැකියාවය. මෙම ඇදහිල්ල කළ නොහැකි දෙයක් නොදනී. දෙවියන්වහන්සේට කළහැකි කාරණා පිළිබඳව එම ඇදහිල්ල සීමා නොකරයි.

**ඇදහිල්ලේ දීමනාව නොමැති අයහට තම ඇදහිල්ල වැඩි කරගත හැකි ක්‍රමය බයිබලය අපට පවසයි.**

> **මෙසේ ඇසීමෙන් ඇදහිල්ලද ක්‍රිස්තුස්වහන්සේගේ වචනයෙන් ඇසීමද පැමිණෙන්නේය. (රෝම 10:17)**

ගලාති 5:22 හි ඇදහිල්ල ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලයක් ලෙසද සඳහන්ව ඇත. එසේම දීමනාවක් ලෙසද සඳහන් කර ඇත. ආත්මික දීමනාවක් විලසින් ඇදහිල්ල බලය හා බැඳේ. ඵලයක් ලෙසට එය චරිතය හා බැඳේ. දීමනාවක් ලෙසට ඇදහිල්ල ක්‍රියාවකි. එය අපහසු කාර්යයන් හමුවේ ඇදහිල්ලෙන් ක්‍රියා කිරීමට හැකියාවකි. ඵලයක් ලෙසට ඇදහිල්ල ආකල්පයකි. පරිණතවීමේ ක්‍රියා දාමය ඔස්සේ

ස්වාභාවික ඵල සංවර්ධනය වන්නාක් මෙන් ඇදහිල්ල නම් ඵලයද ආත්මික වර්ධනය ඔස්සේ පරිණත වන්නකි.

### තවදුරටත් අධ්‍යයනය සඳහා :

හෙබ්‍රෙව් 11 අධ්‍යයනය කරන්න. ශ්‍රේෂ්ඨ ඇදහිල්ලක් සහිත අය පිළිබඳව බොහෝ ආදර්ශ මෙම පරිච්ඡේදයෙහි ඇතුලත්වේ. එක් එක් පුද්ගලයා පිළිබඳව ලැයිස්තුවක් සාදන්න.

- ආබ්‍රහම් ඇදහිල්ලේ මිනිසෙක් ලෙස හැඳින්විය : රෝම 4:16-21: හෙබ්‍රෙව් 11:18-19.
- ස්තේපන් සතුව ඇදහිල්ලේ දීමනාව තිබෙන්නට ඇත. ක්‍රියා 6:5-8
- බාර්ණබස් සතුව එය තිබෙන්නට ඇත. ක්‍රියා 11:22-24
- පාවුල් මහත් ඇදහිල්ලක් විදහා දැක්විය. ක්‍රියා 27.
- ඇදහිල්ල කළ නොහැකි දෙය අවධාරණය කරයි. 1 කොරින්ති 13:2

## දීම

> **එහෙයින් අපට දෙන ලද අනුග්‍රහය ලෙස.........දෙන තැනැත්තේ ත්‍යාගවන්ත කමෙන්ද... එසේ කෙරේවා. (රෝම 12:6,8)**

දීමේ දීමනාව සහිත පුද්ගලයා හට ස්වාමීන්වහන්සේගේ සේවය සඳහා ද්‍රව්‍යමය වශයෙන් හා මූල්‍යමය වශයෙන් දීමට විශේෂ හැකියාවක් ඇත. ඔහු එය ප්‍රීතියෙන් හා මහත් උනන්දුවෙන් සිදු කරයි. දීමේ දීමනාවට ස්වාමීන්වහන්සේගේ කාර්යය උදෙසා තම කාලය, ශක්තිය, හැකියාව දීම ද ඇතුලත්ය. දීමේ දීමනාව සඳහා තිබිය යුතු එකම සුදුසු කම නම් ඔහු එය සරල බවින් යුතුව ඉටු කිරීම පමණකි. මෙහි සරලව යනු නිදහසේ සතුටු සිතින් දීමකි.

සියලු කිතුනුවන් ස්වාමීන්වහන්සේගේ සේවයට දිය යුතුය.

> **කනගාටුවෙන්වත් ඕනෑම නිසාවත් නොව එක් එක්කෙනා තම තමාගේ සිතින් නියමකරගත් ලෙස දේවා. මක්නිසාද සතුටු සිතින් දෙන්නාට දෙවියන්වහන්සේ ප්‍රේම කරනසේක. (2 කොරින්ති 9:7)**

සියලු කිතුබැතියන් තම ආදායමෙන් දසයෙන් කොටස දිය යුතුය. දසයෙන් කොටස නම් උපයාගත් සියලු දෙයින් 10% කි. ඇදහිලිවන්තයෝ දසයෙන් කොටස නොදෙයි නම් එය දෙවියන්වහන්සේගෙන් සොරකම් කිරීමක් වැනිය.

> **මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේගෙන් කොල්ලකනවා ඇද්ද? නුඹලා නම් මාගෙන් කොල්ලකන්නහුය. එහෙත්: අපි කෙසේ ඔබවහන්සේගෙන් කොල්ලකෑවෙමුදැයි නුඹලා අසන්නහුය. ඔතුවලින් සහ එසවීම් පූජාවලිනුත්ය. (මලාකි 3:8)**

තම ආදායමෙන් දසයෙන් කොටස දෙන අයට දෙවියන්වහන්සේ විශේෂ ආශිර්වාදයක් පොරොන්දු වී ඇත.

> **මාගේ ගෘහයෙහි භෝජන තිබෙන පිණිස නුඹලා ගබඩාගෙට ඔතු සියල්ල ගෙනවුත්, මා විසින් නුඹලාට අහසේ කවුළු ඇර ඉඩම් මදිවෙන තරම් නුඹලාට ආශිර්වාදයක් වගුරුවා දෙන්නේ නැද්ද කියා එයින් මා සෝදිසි කර බලාපල්ලායයි සේනාවල ස්වාමීන්වහන්සේ කියනසේක. නුඹලාගේ භූමියේ ඵල නාස්ති නොකරන ලෙස, ඒවා කාදමන්නාට නුඹලා උදෙසා තර්ජන කරන්නෙමි: කෙතේ නුඹලාගේ මිදිවැලත් අකාලයේ එහි ඵල නොහෙළන්නේයයි සේනාවල ස්වාමීන්වහන්සේ කියනසේක. නුඹලා වාසනාවන්තයෝයයි සියලු ජාතීන් කියනවා ඇත. මක්නිසාද නුඹලා ප්‍රියකරු දේශයක් වන්නහුයයි සේනාවල ස්වාමීන්වහන්සේ කියනසේක. (මලාකි 3:10-12)**

මෙම කොටස අනුව දෙන අයට පොරොන්දු වී ඇත්තේ :

1. දෙවියන්වහන්සේගෙන් නම් නොකරන ලද ආශිර්වාද, එම ආශිර්වාද කොතරම් විශාලද යත් දරාගැනීමට බැරි පමණ වේ. 10 පදය.
2. තම ආදායම සපයා දෙන කාර්යයෙහි ආශිර්වාද. 11 පදය
3. ඔව්හු ලෝකයෙහි ජාතීන්ට ආශිර්වාදයක් වනු ඇත. 12 පදය.

4. ඔවුන්ගේම දේශය (ජාතිය) ආශිර්වාද ලබනු ඇත. 12 පදය.

දෙවියන්වහන්සේ ආර්ථිකව ඔබට ආශිර්වාද කරනුයේ ඔබ දෙන්නාවූ පදනම මතය. උන්වහන්සේ ඔබට මුදල් සපයා දෙන්නේ ස්වාමීන්ගේ වැඩට ඔබ මුදල් දීම සඳහාය.

**මසුරුලෙස වපුරන්නා මසුරු ලෙස කපාගන්නේය; නොමසුරුව වපුරන්නා නොමසුරුව කපාගන්නේය. තවද නුඹලා සියලු දේවලදී නිතරම පූර්ණකම ලැබ සියලු යහපත් ක්‍රියා සඳහා පූර්ණව සිටින පිණිස නුඹලාට සියලු අනුග්‍රහය වැඩිකරදෙන්ට දෙවියන්වහන්සේට පුළුවන. (2 කොරින්ති 9:6,8)**

යේසුස්වහන්සේ මෙලෙසද පොරොන්දු වී ඇත.

**දීපල්ලා, එවිට නුඹලාටත් දෙනු ලැබෙන්නේය; ඔව්හු ඔබමින් සොලවමින් උතුරුවමින් නුඹලාගේ ඔඩොක්කුවලට හොඳකාර මැනදෙන්නෝය. මක්නිසාද නුඹලා යම් මිම්මකින් මැනදෙන්නහුද එයින්ම නැවත නුඹලාටත් මැනදෙනු ලැබෙන්නේයයි කීසේක. (ලූක් 6:38)**

දීම සඳහා ඔබ මුදල් හෝ භාණ්ඩ සපයා ගත යුතු ක්‍රමය එපීස පොතේ විස්තර කර ඇත.

**සොරකම්කළාවූ අය තවත් සොරකම් නොකෙරේවා. ඒ වෙනුවට හිඟ අයට දෙන්ට පුළුවන්වෙන පිණිස, තමාගේ අත්වලින් යහපත් වැඩක් කරමින් වීර්යකෙරේවා. (එපීස 4:28)**

පිලිප්පි සභාවේ දීම පිළිබඳ පාවුල් විශේෂයෙන් සඳහන් කරයි.

**නුමුත් මට සියල්ලම ලැබී, පූර්ණව සිටිමි. නුඹලා විසින් එවන ලද දේවල් එපප්‍රොදිතස්ගෙන් ලැබ පිරී සිටිමි. ඒවා දෙවියන්වහන්සේට මිහිරි සුවඳක්ව, ප්‍රියවූ ප්‍රසන්නවූ පූජාවක්ව තිබේ. (පිලිප්පි 4:18)**

ඔවුන්ගේ දීම පූජාවක් බැවින් දෙවියන්වහන්සේ ඒ පිළිබඳ ප්‍රසන්න වන බව පාවුල් පැවසීය. ඉන්පසුව දීමට ලැදි එම ඇදහිලිවතුන්ට ඔහු පවසුවේ :

**මාගේ දෙවියන්වහන්සේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තමන්ගේ තේජස් සම්පතේ ප්‍රකාරයට නුඹලාගේ සියලු හිඟකම් සම්පූර්ණකරනසේක. (පිලිප්පි 4:19)**

මෙම පොරොන්දුව දෙන ලද්දේ ස්වාමින්වහන්සේගේ සේවයට දුන්නාවූ පුද්ගලයන් හටය. නමුත් මතක තබාගත යුතු කරුණ නම් : සියලු ඇදහිලිවතුන් දිය යුතු අතර එසේ කිරීමෙන් ඔව්හු ආශිර්වාද ලබතත්. දීමේ දීමනාව සහිත පුද්ගලයා හට ස්වාමින්වහන්සේට ඉතා සතුටුව දීමට විශේෂ හැකියාවක් ඇත. විශේෂ පෙලඹවීමකින් ඔහු දීම ඉටු කරයි.

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

ස්වාමින්වහන්සේට අසාමාන්‍ය අයුරින් දීමේ දීමනාව පෙන්වූ බයිබලයේ සඳහන් ආදර්ශ කිහිපයක් පහතින් දැක්වේ. ඔවුන් සතුව, දීමේ ආත්මික දීමනාව තිබෙන්නට ඇත.

- වැන්දඹුව: මාර්ක් 12:1-44; ලූක් 21:1-4
- මරියා: යොහන් 12:3-8
- ගලාතියේ සභාව: ගලාති 4:15
- පිලිප්පියේ සභාව: පිලිප්පි 4:10-18
- මකිදෝනියේ සභාව: 2 කොරින්ති 8:1-7

දීම සඳහා පෙලඹවීම පැමිණිය යුත්තේ කොතැනින්ද? මතෙව් 6:3; එපීස 4:28; 1 කොරින්ති 13:3 බලන්න.

# උපකාරකයන්

**මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්චර්ය කරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුද නානා වර්ග භාෂාද සභාවෙහි පිහිටෙවුසේක. (1 කොරින්ති 12:28)**

උපකාරක දීමනාව ඇති පුද්ගලයෙකු අන් අයට ස්වාමින්වහන්සේගේ සේවය ඉටු කිරීමට සහය ලබා දෙනු ඇත. ඔවුන්ගේ ආත්මික දීමනා තව වැඩි දියුණු කර ගැනීමට සහාය දෙනු ඇත. දේවස්ථානය රැකබලාගැනීමේ සිට සංගීත වාදකයෙකු හෝ දේව සේවයෙහි, සභාවෙහි වැඩකටයුතු වල කුමනාකාරයෙන් හෝ උපකාර කිරීම උපකාරක දීමනාවට ඇතුලත්ය. පාවුල් ෆීබි නම් කාන්තාවක් රෝමයට යවමින් එහි සභාවට පැවසුවේ ඇයට උපකාර කිරීමේ දීමනාවෙන් සහාය වන ලෙසය.

**කෙංක්‍රයේ තිබෙන සභාවෙහි මෙහෙකාරියෙක්වූ ෆේබී නම් අපගේ සහෝදරී ශුද්ධවන්තයන්ට ඔබිනාලෙස නුඹලා විසින් ස්වාමින්වහන්සේ තුළ පිළිගනු ලබන ලෙසත්, ඈට නුඹලාගෙන් ඕනෑකරන කවර කාරණයකදී නුමුත් උපකාරකරන ලෙසත්, නුඹලාට ඈ භාරකරමි. මක්නිසාද ඈ බොහෝ දෙනෙකුගේද මාගේද උපකාරකාරියෙක්ව සිටියාය. (රෝම 16:1-2)**

ප්‍රිසිලා හා අකිලා පාවුල් හට උපකාරක දීමනාවෙන් සහාය ලබාදෙන්නට ඇති. ඔහු ඔවුන් පිළිබද පවසන්නේ:

**ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මාගේ හවුල් වැඩකාරයන්වූ, මාගේ ජීවිතය උදෙසා තමුන්ගේ බෙල්ල දුන්නාවූ ප්‍රිස්කාටද අකිලාටද ආචාරකරපල්ලා. (රෝම 16:3)**

උපකාරක දීමනාව නම් මොනයම් අයුරින් හෝ වෙනයම් කෙනෙකුට උපකාර කිරීම හෝ සහාය වීමය. එය තව කෙනෙකුගේ සහායකයා මෙන් සේවය කිරීමක් වැනිය.

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

- තබීතා (දොර්කස්) හට උපකාරක කිරීමේ දීමනාව තිබිය : ක්‍රියා 9:36
- කාන්තාවෝ යේසුස්වහන්සේගේ සේවයේදී උපකාර කළහ : මාර්ක් 15:40-41
- උපකාරය, සංවිධානය කිරීමේ අංගයෙන් විය හැකිය: නික්මයාම 18:23; ගණන් කථාව 11:17
- උපකාරක සේවාව, දුර්වල අයට සහාය විය හැකිය. ක්‍රියා 20:35.

# සේවයෙහි යෙදීම

**එහෙයින් අපට දෙනලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගත කීම නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු. සේවය නම් අපගේ සේවයෙහි යෙදී සිටිමු. (රෝම 12:6-7)**

මෙම පදයෙහි “සේවයෙහි” යන පදයෙහි අර්ථය මෙහෙ කිරීමය. සේවයෙහි යෙදීමේ දීමනාව නම් ස්වාමින්වහන්සේගේ වැඩ වල ප්‍රායෝගික වැඩ කටයුතු ඉටු කිරීමට ඇති හැකියාවය. සේවා දීමනාව ඇති පුද්ගලයා ආත්මික ඉලක්ක සපුරාගැනීම සඳහා දිනපතා කිරීමට අවශ්‍ය වැඩ කටයුතු වලින් අන් අයව නිදහස් කරයි.

සේවය කිරීම, උපකාරක සේවයට වඩා වෙනස්ය. සේවා දීමනාව සතු පුද්ගලයා අනෙක් පුද්ගලයාගේ වගකීම තමාට ගෙන ඔහුගේ ආත්මික දීමනාව ක්‍රියා කිරීම සඳහා ඔහුගේ කාර්ය භාරයෙන් මුදා හරියි.

උපකාරක දීමනාව සහිත පුද්ගලයා අනෙකුත් පුද්ගලයෙකු හට ඔහුගේ සේවය කිරීමේදී සහාය සපයයි. උදාහරණයක් ලෙස දේව මෙහෙයකදී සංගීත කණ්ඩායම දේවගැතිතුමා හට ආත්මික ඉලක්ක සපුරාලීමට සහාය දක්වයි. නුමුත් සංගීත කණ්ඩායම පාලකවරයාව ඔහුගේ වගකීමෙන් නිදහස් නොකරති: ඒ වෙනුවට ඔහුට තම ආත්මික අරමුණු ඉටු කරගැනීමට සහාය සපයති.

මෙහෙකිරීමේ, සේවක දීමනාව සහිත පුද්ගලයා සභාපාලකවරයාව සභාව තුළ අවශ්‍යතාවයන්ගෙන් පෙළෙන අයට ආහාර බෙදා දීමේ වගකීමෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කරනු ඇත. මෙයට උදාහරණයක් ලෙස මුල් කාලීන සභාවෙහි මේසවල “සේවය” කිරීමට සමහර ඇදහිලිවතුන් යෙදී සිට ප්‍රේරිතයන්ව වඩා වැදගත් ආත්මික කාර්යයන් සඳහා නිදහස් කිරීම දැකිය හැක.

> **ඒ දවස්වලදී ගෝලයන්ගේ ගණන වැඩිවෙන කල, දවස්පතා කෙරුණු උපස්ථානයේදී හෙල්ලීන යුදෙව්වරුන්ගේ වැන්දඹුවන් නොසලකනු ලැබූ නිසා හෙබ්‍රෙව්වරුන්ට විරුද්ධව කෙඳිරීමක් විය. එවිට දොළොස්දෙනා ගෝල සමූහයා කැඳවා ඔවුන්ට කථාකොට: අප විසින් දෙවියන්වහන්සේගේ වචනය හැරදමා මේසවල සේවයකිරීම සුදුසු නැත. එහෙයින්, සහෝදරයෙනි, මේ වැඩට අප විසින් පත් කරන පිණිස යහපත්යයි ප්‍රසිද්ධවූ, ආත්මයෙන්ද ප්‍රඥාවෙන්ද පූර්ණවූ මනුෂ්‍යයන් සත්දෙනෙකු නුඹලා අතරෙන් සොයාගනිල්ලා. අපි වනාහි යාච්ඤාවෙහිද වචනයේ මෙහෙකිරීමෙහිද ස්ථිරලෙස යෙදී සිටින්නෙමුයයි කීවෝය. (ක්‍රියා 6:1-4)**

සේවය කිරීමට යෙදවූ අය සතු ගුණාංග බලන්න. ඔව්හු අවංකවූත් ශුද්ධාත්මයාණන්ගෙන් හා ප්‍රඥාවෙන් පූර්ණ වූත් අය විය යුතුය.

> **ඔනේසිපොරස්ගේ පවුලට ස්වාමින්වහන්සේ කරුණාකරනසේක්වා. මක්නිසාද, ඔහු නොයෙක් වර මා ප්‍රාණවත්කළේය, මාගේ යදම් ගැනත් ඔහු ලජ්ජා නුණේය: ඔහු රෝමයට ආ කල බොහෝ උත්සාහයෙන් මා සොයා මා සම්බවෙන්ට ආවේය. (ඒ දවසේදී ඔහුට ස්වාමින්වහන්සේගෙන් දයාව ලැබෙන්ට ස්වාමින්වහන්සේ සලස්වන සේක්වා.) ඔහු එපීසයෙහිදී කොපමණ දේවලින් සේවයකළේද කියා නුඹ හොඳහැටි දන්නෙහිය. (2 තිමෝති 1:16-18)**

සේවයෙහි දීමනාවට අනෙක් අයගේ බර උසුලා ගැනීමද ඇතුලත් වේ.

> **එකිනෙකාගේ බර උසුලා, එසේ ක්‍රිස්තුස්වහන්සේගේ ව්‍යවස්ථාව සම්පූර්ණ කරපල්ලා. (ගලාති 6:2)**

සේවයෙහි යෙදෙන අය තුළ තිබිය යුතු ආකල්පය යේසුස්වහන්සේ මෙලෙස විස්තර කර තිබේ.

> **උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: අන්‍යජාතීන්ගේ රජවරු ඔවුන් කෙරෙහි අධිපතිකම් පවත්වති: ඔවුන් කෙරෙහි බලය පවත්වන්නෝ වනාහි උපකාරකාරයෝයයි කියනු ලබති. නුමුත් නුඹලා එසේ නොව, නුඹලා අතරෙන් වඩා උත්තමයා බාලයා මෙන් වේවා. ප්‍රධානයා උපස්ථානකරන්නා මෙන් වේවා. වඩා උතුම් කවුද? කෑමට හිඳින තැනැත්තාද? නොහොත් උපස්ථානකරන්නාද? කෑමට හිඳින තැනැත්තේ නොවේද? නුමුත් මම වනාහි නුඹලා මධ්‍යයෙහි උපස්ථානකරන්නා මෙන් වෙමි. (ලූක් 22:25-27)**

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

සේවයෙහි උදාහරණය :

- දේව දූතයෝ : හෙබ්‍රෙව් 1:14:4:11: මාර්ක් 1:13
- මේසවල මෙහෙකිරීම : යොහන් 2,5,9: ලූක් 10:40

## කරුණාව පෙන්වීම

**එහෙයින් අපට දෙනලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ... කරුණාව පෙන්වන තැනැත්තේ උනන්දුකමෙන්ද කරුණාව පෙන්වන තැනැත්තේ ප්‍රසන්න ලීලාවෙන්ද එසේ කෙරේවා. (රෝම 12:6,8)**

"කරුණාව" යනු දයානුකම්පාවය. එනම් ඔබට අනෙක් පුද්ගලයාගේ තත්වය අවබෝධකරගත හැකිවීමය. කරුණාවේ දීමනාව සතු පුද්ගලයා හට දුක් වේදනා විදින තැනැත්තාව හඳුනාගත හැකි වන අතර ඔවුනට උපකාර කිරීමට හැකියාව ලැබේ.

කරුණාවේ දීමනාවට ක්‍රියාවන් මෙන්ම ආකල්පයන්ද ඇතුලත්ය. මෙය ලූක් 10:30-37 හි සඳහන් යහපත් සමාරිතයාගේ කතාවෙන් පෙන්නුම් වේ. සමාරිතයා සොරුන්ගෙන් පහර කෑමට ලක්වූ පීඩිතයා පිළිබඳ අනුකම්පාවක් දැක්වූවා පමණක් නොව, ඔහුට උපකාර කිරීමට යම් ක්‍රියා මාර්ගයක්ද ගත්තේය.

මෙම දීමනාව ප්‍රීතියෙන් යුක්තව ඉටු කළ යුතු සේවාවකි. එහි අවශ්‍යතාවය වනුයේ "ප්‍රසන්න ලීලාවෙන්" සේවය කිරීමය. මෙම පදයෙහි ප්‍රසන්න ලීලාව යනු ඕනෑම අවශ්‍යතාවයකින් වේදනාවකින් පෙළෙන කෙනෙකු හැකි ඉක්මනින් ඉන් මුදාගැනීමට ප්‍රීතියෙන් සූදානමින් සිටීමය.

පහත සඳහන් සිදුවීම් වලදී යේසුස්වහන්සේ දැක්වූ අනුකම්පාවත් ගෝලයන්ගේ ආකල්පයත් සංසන්දනය කර බලන්න.

| බයිබල් පාඨය | යේසුස්වහන්සේ | ගෝලයෝ |
|---|---|---|
| මතෙව් 15:23-28 කානානිය කාන්තාව | දුව සුවකළසේක | පිටත්කර හැරියෝය |
| මාර්ක් 8:1-9 මහත් සමූහය. | කන්ට දුන්සේක. | පිටත්කර හැරියෝය. |
| මතෙව් 20:31-34 අන්ධ මනුෂ්‍යයෝ | සුවකළසේක. | ඔවුන්ව නිශ්ශබ්ද කිරීමට උත්සාහ කළහ. |
| මාර්ක් 10:48-49 අන්ධ බර්තමේයුස් | සුවකළසේක. | ඔහුව නිශ්ශබ්ද කිරීමට උත්සාහ කළෝය. |

### තවදුරටත් අධ්‍යයනය සඳහා :

කරුණාව දැක්වීමේ දීමනාව පිළිබඳ පහත සඳහන් උදාහරණ අධ්‍යයනය කරන්න.

- යේසුස්වහන්සේ, සුව කිරීම සම්බන්ධව : මතෙව් 9:27-30; 15:21-28;17:14-18; 20:30-34 මාර්ක් 10:46-53; ලූක් 17:1-14.
- යහපත් සමාරිතයා : ලූක් 10:30-37.
- දොර්කස් : ක්‍රියා 9:36-42.

## ආගන්තුක සත්කාරය

**කොඳුරන්නේ නැතුව එකිනෙකාට ආගන්තුක සත්කාරකරපල්ලා. දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට ලැබුණු දීමනාවේ හැටියට එයින් එකිනෙකාට සේවයකරපල්ලා. (1 පේත්‍රුස් 4:9-10)**

ආගන්තුක සත්කාරය නම් සභාවෙහි සමහර සාමාජිකයන් හට, අවශ්‍යතාවයන්ගෙන් පෙළෙන අය උදෙසා ආහාර පාන හා නවාතැන් පහසුකම් ලබාදීමට ඇති විශේෂ හැකියාවය. මෙම දීමනාව භාවිතා කිරීම

සඳහා අවශ්‍ය වන සුදුසුකම නම් කෙඳිරීමෙන් තොරව ඉටු කිරීමය. කොඳුරමින් වැඩ කිරීම නම් එය කිරීමට වීම ගැන තරහකින් ක්‍රියා කිරීමය.

වංචාකාර නොවූ සැබෑ ප්‍රේමයෙහි සංකේතයක් නම් ආගන්තුක සත්කාරය වේ.

**නපුරට පිළිකුල්කොට යහපතට ඇලුම්වෙයල්ලා. ශුද්ධවන්තයන්ගේ ඕනෑකම්වලදී උපකාරකරපල්ලා; ආගන්තුක සත්කාරයට ලැදිව සිටපල්ලා. (රෝම 12:9,13)**

බිෂොප් වරයෙකු (ප්‍රධානියෙකු) සඳහා එක් සුදුසුකමක් වනුයේ ආගන්තුක සත්කාරයට ලැදිකමය.

**එහෙයින් නායක තෙමේ නිර්දෝෂිවූ, එක භාර්යාවකට පුරුෂයාවූ, පමණ දැන හැසිරෙන්නාවූ, සිහියද පිළිවෙළක්ද ඇත්තාවූ, ආගන්තුක සත්කාරයට කැමතිවූ, උගන්වන්ට සමර්ථවූ කෙනෙක්ව සිටින්ට ඕනෑය. (1 තිමෝති 3:2)**

**මක්නිසාද නායකයා දෙවියන්වහන්සේගේ ගබඩාකාරයෙක් මෙන් නිදොස්වූ, හිතුවක්කාර නොවූ, නොකිපෙන්නාවූ, බේබද්දෙක් නොවූ, ගහගන්නෙක් නොවූ, නින්දිත ලාභයට ගිජු නොවූ, ආගන්තුක සත්කාරයට කැමතිවූ, යහපතට ප්‍රේමකරන්නාවූ, සන්සුන් සිතක් ඇත්තාවූ, ධර්මිෂ්ඨවූ, ශුද්ධවූ, පමණ දැන ක්‍රියාකරන්නාවූ කෙනෙක්ව සිටින්ට ඕනෑය. (තීතස් 1:7-8)**

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

ආගන්තුක සත්කාරයේ දීමනාව තිබූ එක් කාන්තාවක් නම් ලිදියාය : ක්‍රියා 16:14-15

රෝමයේදී ගායස් පාවුල්ට නවාතැන් සැපයුවේය. රෝම 16:23

ආගන්තුක සත්කාරය පෙන්වීමේදී බලාපොරොත්තු නොවන දේ අත්දැකීමට ඉඩ ඇත. එය හෙබ්‍රෙව් 13:1-2 කියවා සොයා බලන්න.

ආබ්‍රහම් සහ සාරා මෙය අත් දුටුවෝය. උත්පත්ති 18.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

_______________________________________________

_______________________________________________

2. සේවක දීමනා නවය නම් කරන්න.

____________________ ____________________

____________________ ____________________

____________________ ____________________

____________________ ____________________

____________________

3. මෙම දීමනා සේවා දීමනා ලෙස නම් කර ඇත්තේ මන්ද?

_______________________________________________

_______________________________________________

4. නායකත්ව දීමනා හා පරිපාලන දීමනා අතර වෙනස කුමක්ද?

_______________________________________________

_______________________________________________

5. උපකාරක දීමනා හා සේවා දීමනා අතර වෙනස කුමක්ද?

_______________________________________________

_______________________________________________

6. පළමුවන ලැයිස්තුවේ ඇති සේවා දීමනාව කියවන්න. දෙවන ලැයිස්තුවේ ඇති අර්ථ දැක්වීම කියවා බලා ගැළපෙන දීමනාව ඉදිරියෙන් අර්ථ දැක්වීමේ සුදුසු අංකය ලියන්න.

| **ලැයිස්තු අංක 1** | **ලැයිස්තු අංක 2** |
|---|---|
| ________සේවාව | 1. මනුෂ්‍යයෝ, දේව ධර්ම හා සිදුවීම් අගැයීමකට ලක් කොට එය දෙවියන්වහන්සේගෙන් දැයි විමසා බැලීමට ඇති හැකියාවය. |
| ________උපකාරක | 2. විශේෂ ඉලක්ක සපුරා ගැනීමට අන් අයව පෙලඹවීමට ඇති හැකියාව |
| ________නායකත්වය | 3. වෙන කෙනෙකු උදෙසා මගපෙන්වීම කිරීම. |

_________පරිපාලනය 4. විශ්වාස කිරීමට ඇති විශේෂ හැකියාව.

_________දීම. 5. දීමට ඇති විශේෂ හැකියාව

_________අනුකම්පාව දැක්වීම 6. අන් අයගේ සේවාවන් සඳහා සහාය දැක්වීම.

_________ආත්ම විමසීම 7. විශේෂ කරුණාවක් දැක්වීම

_________ඇදහිල්ල 8. ආහාර පාන හා නවාතැන් පහසුකම් සැපයීම.

_________ආගන්තුක සත්කාරය 9. අනෙක් අයව ප්‍රායෝගික වැඩ කිරීමෙන් නිදහස් කොට මුදාහැරීම.

7. පහත සඳහන් ප්‍රකාශනය සත්‍යද අසත්‍යද?

ස්වාමීන්වහන්සේගේ සේවය සඳහා මුදල් දීමට අවශ්‍යවන්නේ දීමේ දීමනාව ලැබූ අය පමණකි: මෙම ප්‍රකාශය__________________________ය.

8. ඇදහිල්ල අර්ථ දක්වන්න.

______________________________________________________________

9. ඇදහිල්ලේ දීමනාව හා ඇදහිල්ලේ ඵලය අතර වෙනස කුමක්ද?

______________________________________________________________

10. අපගේ ඇදහිල්ල වැඩි කරගත හැක්කේ කෙසේද?

______________________________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා.

සේවා දීමනා නවය සඳහා එක් එක් දීමනාවට අවශ්‍ය කරුණු තවදුරටත් අධ්‍යයනය යටතේ ඉදිරිපත් කරන ලදී. එසේ කරන ලද්දේ එක් එක් සේවා දීමනාව පිළිබඳව අධ්‍යයනය සම්පූර්ණ කිරීමෙන් පසු ඊළඟ දීමනාවට යෑම සඳහාය.

මෙම පාඩමෙහිදී සාකච්ඡාවට භාජනය නොවූ ඇදහිලිවතුන් හට දෙන ලද වෙනත් දීමනා බයිබලයෙහි සඳහන් වේ. එම දීමනාවන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ලෙස නියත ලෙසම සඳහන් නොවේ. එම හේතුව නිසා එවන් දීමනා ශුද්ධාත්ම දීමනා යටතේ සාකච්ජා නොවිය.

### බ්‍රහ්මචාරී බව.

බ්‍රහ්මචාරීබව නම් ක්‍රිස්තියානි සේවය උදෙසා තනිකඩ වූ ජිවිත ගෙවීමට දෙවියන්වහන්සේ විසින් කිසියම් පුද්ගලයෙකු හට දෙන්නාවූ හැකියාවය. 1 කොරින්ති 7:7-8 හි පාවුල් මෙම දීමනාව පිළිබඳ සඳහන් කරයි. බ්‍රහ්මචාරීබව අවශ්‍යතාවයක් නොවේ. (1 තිමෝති 4:1-5 බලන්න.) එය දීමනාවක් මිස, නිකායක් මගින් හෝ සභාවක් මගින් කෙනෙකු පිට පැවරිය යුතු අවශ්‍යතාවයක් නොවේ. බ්‍රහ්මචාරී දීමනාව සතු පුද්ගලයන් තුලින් සභාව දිරිගැන්වේ. (1 කොරින්ති 7:32-35 බලන්න)

### මැදිහත්කාරකම.

මැදිහත්කාරකමේ දීමනාව නම්, දිගු කාලීනව, දිනපතාම මහත් උද්යෝගයෙන් යුතුව යාච්ඤා කිරීම සඳහා දෙවියන්වහන්සේ දෙන්නාවූ විශේෂ හැකියාවකි. මැදිහත්කාරකම් කිරීම නම්, අනෙක් අය උදෙසා ආයාචනා කිරීමය. මැදිහත්කරුවෝ මනුෂ්‍යයන්ගේ, නායකයන්ගේ, සේවාවන්ගේ හා ජාතීන්ගේ අවශ්‍යතා උදෙසා යාච්ඤා කරති.

මැදිහත්කාරකම ආත්මික දීමනාවක් ලෙස හඳුන්වා නොමැති වුවත් එය දීමනාවක් ලෙස ක්‍රියාත්මක කිරීමට ශුද්ධාත්මයන්වහන්සේ සපයා ඇති බවට සාක්ෂි දැකිය හැක. (රෝම 8:26-27 බලන්න) මැදිහත්කාරකමේ යාච්ඤාවෙහි පරමාර්ථ කිහිපයක් හඳුනාගැනීම සඳහා පහත සඳහන් පාඨ කිහිපය අධ්‍යයනය කරන්න.

- යාකොබ් 5:14-16
- 1 තිමෝති 2:1-2
- එපීස 6:19
- ගණන්කථාව 14:17-19
- ක්‍රියා 7:60

### හස්තකර්මාන්තය.

"හස්තකර්මාන්තය" නම් තවත් දීමනාවක් ඇත. එනම් ස්වාමීන්වහන්සේගේ කාර්යය උදෙසා අලංකාර දෑ නිමවීමට ඇති හැකියාවය. ස්වාමීන්වහන්සේගේ ගෘහය අලංකාර කිරීමට හා පූජකවරුන්ගේ වස්ත්‍ර සෑදීමට සඳහා දෙවියන්වහන්සේගෙන් විශේෂ දක්ෂකම් හිමි වූවන් පිළිබඳව උදාහරණ දැකිය හැක.

(නික්මයාම 28:3፡ නික්මයාම 31:3-6)

# නවවෙනි පරිච්ඡේදය.

## සලකුණු පිළිබඳ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා.

### අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ශුද්ධාත්මයාණන්වහන්සේගේ සලකුණු දීමනා හතර හඳුනාගැනීමට.
- හාස්කම්වල පරමාර්ථ පැහැදිලි කිරීමට.
- ශාරීරික රෝග භාවයට හේතු පහක් නම් කිරීමට
- අන්‍යභාෂා දීමනාව හා ශුද්ධාත්ම බව්තිස්මයෙහි භෞතික සංකේතය ලෙසට අන්භාෂාවලින් කතාකිරීම අතර වෙනස හඳුනා ගැනීම
- අන්භාෂා දීමනාව භාවිතා කිරීම හා සම්බන්ධ බයිබලීය උපදෙස් සාකච්ඡාකිරීමට හැකි වනු ඇත.

### ප්‍රධාන පදය :

**පළමුවෙන් ස්වාමීන්වහන්සේ කරණකොටගෙන කියනලද්දාවූ, ඇසූවන් විසින් අපට ස්ථිරකර දුන්නාවූ මෙපමණ මහත් ගැළවීම අපි නොසලකා සිටියොත් කොහොම ගැළවෙමුද? දෙවියන්වහන්සේත් ලකුණුවලින්ද පුදුමවලින්ද අනේකාකාර ආශ්චර්යවලින්ද ස්වකීය කැමැත්ත ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවලින්ද ඊට සාක්ෂිදුන්සේක. (හෙබ්‍රෙව් 2:3-4)**

## හැඳින්වීම

අපි සලකුණු දීමනා ලෙසට හඳුන්වන දීමනා හතරක් ඇත. ඒවාට සලකුණු දීමනා යයි නම් දී ඇත්තේ ඒවා දෙවියන්වහන්සේගේ වචනය තහවුරු කිරීමට උන්වහන්සේගේ බලය කරණකොටගෙන ඇදහිලිවන්තයන් තුළින් ක්‍රියාකරන්නාවූ අධි ස්වාභාවික වූ සලකුණු වීම නිසාය.

**ඔව්හු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමීන්වහන්සේද ඔවුන් සමග ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිරකළසේක. ආමෙන්. (මාර්ක් 16:20)**

සලකුණු දීමනා ඇදහිලිවතුන් උදෙසා මෙන්ම , ඔවුන් තුළින්ද සුවවීම්, හාස්කම් හා අන්‍ය භාෂා මගින් ලැබෙන පණිවුඩ හා එම පණිවුඩවල පරිවර්තනය යනාදිය වේ. මෙවන් අධි ස්වාභාවික දීමනා දෙවියන්වහන්සේ වැඩවසන බවට නොඇදහිලිවන්තයන්ට "සලකුණක්" සේද වේ.

"සලකුණු දීමනා" හතර නම්:

- හාස්කම්
- සුවවීම්
- අන්‍ය භාෂාව
- අන්භාෂා පරිවර්තනය වේ.

# හාස්කම්

**නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. ...එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙකුට සුව කිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආශ්චර්ය කිරීමද, (1 කොරින්ති 12:7-10)**

හාස්කමේ දීමනාව සහිත පුද්ගලයෙකු තුළින්, දෙවියන්වහන්සේ ස්වාභාවික සිදුවිය නොහැකි කාරණා ඉටු කරන සේක. මෙවන් අධි ස්වාභාවික වූ ක්‍රියාවන් සාතන්ගේ බලයට වඩා දෙවියන්වහන්සේගේ බලය අතිමහත් බව පෙන්නුම් වන සලකුණකි.

හාස්කම්, නිශ්චිත වූ ආත්මික පරමාර්ථ කිහිපයක් ඉටුකරයි. දෙවියන්වහන්සේ ශුභාරංචි පණිවුඩය තහවුරු කිරීමට හාස්කම් යොදාගන්නා සේක.

**පළමුවෙන් ස්වාමින්වහන්සේ කරණකොටගෙන කියනලද්දාවූ, ඇසූවන් විසින් අපට ස්ථිරකර දුන්නාවූ මෙපමණ මහත් ගැළවීම අපි නොසලකා සිටියොත් කොහොම ගැළවෙමුද? දෙවියන්වහන්සේත් ලකුණුවලින්ද පුදුමවලින්ද අනේකාකාර ආශ්චර්යවලින්ද ස්වකීය කැමැත්ත ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවලින්ද ඊට සාක්ෂිදුන්සේක. (හෙබ්‍රෙව් 2:3-4)**

හාස්කම් මනුෂ්‍යයන් හට යේසුස්වහන්සේව විශ්වාස කොට සදාකාල ජීවනය හිමි කර ගැනීමට සලස්වයි.

**මේ පොතෙහි ලියා නැති වෙනත් බොහෝ හාස්කම් යේසුස්වහන්සේ ගෝලයන් ඉදිරියෙහි කළසේක. නුමුත් මේවා ලියනලද්දේ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්වහන්සේ බව නුඹලා විශ්වාසකරන පිණිසත් විශ්වාසකොට උන්වහන්සේගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය. (යොහන් 20:30-31)**

හාස්කම් දෙවියන්වහන්සේ විසින් සේවය කරන පුද්ගලයාව අනුමත කිරීමට ද යොදා ගනී. යේසුස්වහන්සේගේ සේවාව හාස්කම් මගින් අනුමත විය.

**හෙතෙම රාත්‍රියේ උන්වහන්සේ ළඟට ඇවිත්: රබ්බි, ඔබ දෙවියන්වහන්සේ කෙරෙන් ආවාවූ ගුරුවරයෙකැයි අපි දනිමුව. මක්නිසාද තමා සමග දෙවියන්වහන්සේ නැත්නම් ඔබ කරන්නාවූ මේ හාස්කම් කරන්ට කිසිවෙකුට නුපුළුවනැයි කීවේය. (යොහන් 3:2)**

**ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙනි, මේ වචන අසාපල්ලා-නුඹලාම දන්නා ලෙස නුඹලා අතරේ දෙවියන්වහන්සේ විසින් නාසරීය යේසුස්වහන්සේ ලවා කරවනලද බලවත් ක්‍රියාවලින්ද පුදුම වලින්ද ලකුණුවලින්ද දෙවියන්වහන්සේ විසින් ඒත්තුගනු ලැබූ මනුෂ්‍යයෙක්වූ එම යේසුස්වහන්සේ, (ක්‍රියා 2:22)**

දෙවියන්වහන්සේ, ප්‍රේරිතවරුන්ගේ සේවාව හාස්කම් මගින් තහවුරු කළසේක :

**මක්නිසාද ශරීරය එකක්ව බොහෝ අවයව ඇතුවාක්මෙන්ද, ශරීරයේ අවයව සියල්ල බොහෝ වුවත් එක ශරීරයක්ව තිබෙන්නාක්මෙන්ද, ක්‍රිස්තුස්වහන්සේත් එසේව සිටිනසේක. (1 කොරින්ති 12:12)**

හාස්කම් විවිධාකාර වේ. යේසුස්වහන්සේ භෞතික කාරණා කෙරෙහි ආශ්චර්යමත් පාලනය පෙන්වාදෙමින් හාස්කම් කළසේක.

**උන්වහන්සේ නැගිට සුළඟට තරවටුකොට: නිශ්ශබ්දවෙව, නිශ්චලවෙවයි මුහුදට කීසේක. එවිට සුළඟ නැවතී, මහත් නිශ්චලයක් විය. (මාර්ක් 4:39)**

ශාරීරික සුවවීම් හා යක්ෂයන් දුරුවීම ද හාස්කම් වේ:

**දෙවියන්වහන්සේ පාවුල්ගේ අත්වලින් අපූරුවූ ආශ්චර්යයන් කෙරෙවූසේක. ඔහුගේ ශරීරයෙන් පිස්නාකඩවත් රෙදිකඩවත් ලෙඩුන් ළඟට ගෙනගිය පමණින් රෝග ඔවුන්ගෙන් පහවිය, නපුරු ආත්මයෝද දුරුව ගියෝය. (ක්‍රියා 19:11-12)**

පාවුල්ගේ දෑතින් සිදුවූ හාස්කම් "විශේෂ හාස්කම්" ලෙස නම් කර තිබේ. සාමාන්‍ය හාස්කම් වලින් පාවුල්ගේ හාස්කම් වෙන්කොට දැක්වීමට මෙලෙස "විශේෂ හාස්කම්" යැයි යෙදීම මගින් මුල් කාලීන

සභාවෙහි හාස්කම් කෙතරම් සුලබ දෙයක් දැයි දැකගත හැකිය. මුල් කාලීන සභාවෙහි උපත සිදුවුයේද මහත් වු ශ්‍රේෂ්ඨ බලය විදහා දැක්වීමෙනි. එකල ආශ්චර්යමත් ක්‍රියා, පුදුම සහ සලකුණු කෙතරම් පොදු සාමාන්‍ය කාරණා ලෙස කොතරම් පැවතියදා කියතොත් මෙලෙස විශේෂ කොට දැක්වීමට අවශ්‍යතාවයක් පැන නැගුණි.

පුදුම සහ සලකුණු අත්‍යවශ්‍යයෙන්ම කිසියම් සේවාවක් හෝ පුද්ගලයෙකු දෙවියන්වහන්සේගෙන් බවට සනාථ කිරීමට සාක්ෂියක් නොවේ. කෙසේවෙතත් යක්ෂයාද හාස්කම් තුළින් මිනිසා මුළා කරවයි.

> **මක්නිසාද, ඔව්හු සර්වපරාක්‍රමවූ දෙවියන්වහන්සේගේ මහත් දවසේ යුද්ධයට මුළු ලෝකයේ රජුන් රැස්කරනු පිණිස, ඔවුන් ළඟට යන්නාවූ, හාස්කම් කරන්නාවූ යක්ෂයින්ගේ ආත්මයෝය. (එළිදරව් 16:14)**

> **ඔහුගේ ඊම සාතන්ගේ ක්‍රියාකිරීමේ හැටියට බොරුවූ සියලු ආකාර ආශ්චර්ය වලින්ද ලකුණුවලින්ද පුදුමවලින්ද, විනාශවෙන්නවුන්ට අධර්මිෂ්ඨකමේ සියලු රැවටිලිවලින්ද යුක්තවේ. මක්නිසාද ගැළවෙන පිණිස ඔව්හු සැබෑකමට ප්‍රේමවීම පිළිනොගත්තෝය. මේ නිසා සැබෑව විශ්වාස නොකොට අධර්මිෂ්ඨකමට ප්‍රසන්නවූ සියල්ලන්ම විනිශ්චය කරනු ලබන පිණිස, බොරුව විශ්වාස කරන හැටියට දෙවියන්වහන්සේ මුළාවේ ක්‍රියාකිරීමක් ඔවුන්ට එවන සේක. (2 තෙසලෝනික 2:9-12)**

මෙම පදවලින් පෙන්නුම් වනුයේ මනුෂ්‍යයෝ දේව වචනය තුළ හොඳින් මුල්බැස නොමැති කමින් සාතන්ගේ හාස්කම් තුළින් රැවටෙන බවය.

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

1. පැරණි ගිවිසුම් හාස්කම් :

- නික්මයාම පොතේ සිට ද්විතිය කතාව පොත දක්වා කියවන්න. මෝසෙස්ගේ කාලය තුළ සිදුවූ හාස්කම් 26 ඔබට හඳුනාගත හැකිදැයි සොයා බලන්න.

- 1 සහ 2 රාජාවලිය පොත් කියවන්න. එළියා හා එළිෂාගේ කාලය තුළ සිදුවූ හාස්කම් 21 නම් කරන්න.

2. අලුත් ගිවිසුම් හාස්කම් :

- මතෙව්, මාර්ක්, ලූක් හා යොහන් පොත් අධ්‍යයනය කරන්න. යේසුස්වහන්සේ කළාවූ හාස්කම් නම් කරන්න.
- ක්‍රියා පොත අධ්‍යයනය කරන්න. ප්‍රේරිතවරුන් තුළින් හා අනෙකුත් සේවකයන් තුළින් මුල් කාලීන සභාවෙහි දෙවියන්වහන්සේ ඉටු කළාවූ හාස්කම් නම් කරන්න.
- ක්‍රියා 9:36-41 කියවන්න. මෙහි සඳහන් හාස්කම කුමක්ද? මෙම හාස්කමෙහි ප්‍රතිඵලය කුමක්ද? (ක්‍රියා 9:42)
- රෝම 15:18-19 ට අනුව, අන්‍යජාතීන් දෙවියන්වහන්සේට කීකරු වීමට සැලැස්වූ, පාවුල්ගේ සේවයෙහි දක්නට ලැබුණු කාරණාව කුමක්ද?
- 2 කොරින්ති 12:12 කියවන්න. හාස්කමේ දීමනාව හා බැඳී පවතින අනෙක් ආත්මික දීමනා කුමක්ද?
- ක්‍රියා 19:11-12 දක්වා දක්නට ලබෙන හාස්කම් දෙක මොනවාද?

# සුවකිරීම.

**නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය... එම ආත්මයාණන්වහන්සේ තුල තවත් කෙනෙකුට සුවකිරීමේ දීමනාවද... දෙනලද්දේය. (1 කොරින්ති 12:7-9)**

සුවකිරීමේ දීමනාව සතුවූ ඇදහිලිවන්තයා හට දෙවියන්වහන්සේගේ බලය ඔහු තුළින් ගලාගොස් අසනීප පුද්ගලයාව වෙන කිසි ස්වාභාවික ක්‍රම භාවිතා නොකොට නැවත යථා තත්වයට ගෙන ඒමට හැකියාව ඇත. "සුවවීම" යනු යහපත් අතට හැරීමය.

මෙවන් අයුරින් සුව කිරීම "දිව්‍ය සුවය" යනුවෙන් නම් කරනුයේ ස්වාභාවික ක්‍රම උපයෝගි කර නොගෙන දෙවියන්වහන්සේගේ දිව්‍යමය බලයෙන්ම පමණක් සුව කරනු ලැබීම නිසාය.

බයිබලයෙහි වාර්තා වී ඇති සියළුම සුවවීම් ක්ෂණිකවම සම්පූර්ණයෙන්ම සිදුවූ ශාරීරික සුවවීම්ය. සෑම ඇදහිලිවන්තයෙකුගේම සේවය හා සමග තිබිය යුතු ආත්මික සලකුණක් නම් ශාරීරික සුවය වේ.

**අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය: අන් භාෂාවලින් කථාකරන්නෝය. සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණීය වස ජාතියක් බිව්ත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය: ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාර්ක් 16:17-18)**

ශාරීරික සුවය ලබා දිම සඳහා දෙවියන්වහන්සේ විසින් සභාවේ වැඩි මහල්ලන්ද පාවිච්චි කරනු ලැබේ.

**නුඹලා අතරෙහි යමෙක් රෝගාතුරව සිටින්නේද? ඔහු සභාවේ වැඩිමහල්ලන්ට හඬගසාවා: ඔව්හු ස්වාමින්වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේපකොට, ඔහු උදෙසා යාච්ඤාකරත්වා. එවිට ඇදහිල්ලේ යාච්ඤාවෙන් රෝගාතුරයාට සුවය ලැබේ. ස්වාමීන්වහන්සේ ඔහු නැගුටුවනවා ඇත. පාපයන්කර තිබේ නම්, ඒවා ඔහුට කමාකරනු ලැබේ. (යාකොබ් 5:14-15)**

සියළු ඇදහිවන්තයින් හට රෝගීන් උදෙසා යාච්ඤා කළ හැකිය. සභාවේ වැඩිමහල්ලන්ටද රෝගීන් උදෙසා යාච්ඤා කළ හැකිය. නමුත් සුව කිරීමේ දීමනාව සහිත ඇදහිලිවන්තයාව විශේෂ ලෙසත් නිරන්තරයෙන්ද මෙම සේවා ක්ෂේත්‍රය උදෙසා දෙවියන්වහන්සේ විසින් භාවිතා කරනු ඇත.

මෙම දීමනාවෙහි නම බහුවචනයෙන් එනම් "සුවකිරීමේ දීමනා" ලෙස සඳහන් වේ. මෙයට හේතුව නම් සුවකිරීමේ විවිධ දීමනා ඇතිවීමත්, සුවකිරීමේ විවිධ ක්‍රම පැවතිමත් සුවකිරීමේ දීමනා භාවිතා කරන ආකාර විවිධ වීමත්ය. දෙවියන්වහන්සේ සමහර ඇදහිලිවන්තයින්ව විශේෂ ලෙස යම් ආකාරයේ රෝග සුව කිරීම සඳහා පාවිච්චි කරනසේක. උදාහරණ ලෙසට බයිබලයෙහි සඳහන් වනුයේ පාවුල්ව විශේෂ ආශ්චර්යමත් සුවකිරීම් සඳහා (ක්‍රියා 19:11-12) දෙවියන්වහන්සේ පාවිච්චි කළ බවය. සමහර ඇදහිලිවතුන්හට අන්ධ හෝ ගොළු අයට සුවවීම සඳහා යාච්ඤා කිරීමට ආලේපයක් තිබිය හැක. තවත් සමහරු පොදුවේ සියලු ආකාර රෝග සඳහා යාච්ඤා කිරීමට යොදා ගනු ඇත.

ශාරීරික සුවයට අමතරව සුවකිරීමට අපිරිසිදු ආත්ම දුරු කරලිමද ඇතුලත් වේ. (යක්ෂයන් පලවා හැරීම)

**යෙරුසලම අවට නුවරවලින් සමුහයෝ රෝගීන්ද අශුද්ධාත්මවලින් පීඩිතවූවන්ද ගෙන රැස්වූවෝය. ඔවුන් සියල්ලෝද සුවකරනු ලැබුවෝය. (ක්‍රියා 5:16)**

සුවය ලැබීමට එක රහසක් නම් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම වේ. රෝගියා හට මෙහෙකරන්නාවූ පුද්ගලයාගේ ඇදහිල්ල කරණකොටගෙන දිව්‍ය සුවය ඇතිවිය හැක. යේසුස්වහන්සේ ගැහැණු ළමයෙකුව මරණීන් නැගිටුවා සුව කළසේක.

**නුමුත් සමුහයා පිටකරනු ලැබූ විට උන්වහන්සේ ඇතුල්වී, ඇගේ අත ඇල්ලූසේක: යෞවනි නැගිට්ටාය. එහි කීර්තිය ඒ රට මුළුල්ලෙහි පතළවිය. (මතෙව් 9:25)**

එම දැරිය මියගොස් සිටි බැවින් ඇගේ සුවය උදෙසා ඇදහිල්ල ඇට තිබිය නොහැකි විය. ඇයට සුවය ලැබුණේ යේසුස්වහන්සේගේ ඇදහිල්ල හා මෙහෙකිරීම තුළිනි.

රෝගාතුරව සිටින පුද්ගලයාගේ ඇදහිල්ල හේතු කොට ගෙනද සුවය ඇතිවිය හැකිය.

> **යේසුස්වහන්සේ හැරී ඈ දැක: දියණියෙනි, ධෛර්යවත්වෙයන්න; නුඹේ ඇදහිල්ල නුඹ සුව කළේයයි කීසේක. ඒ ස්ත්‍රිය ඒ පැයේ පටන් සුවපත්වූවාය. (මතෙව් 9:22)**

රෝගාතුරයාගේ මෙන්ම මෙහෙ කරන්නාගේද එක්සත් ඇදහිල්ල හේතුවෙන්ද සුවය ඇතිවිය හැක.

> **උන්වහන්සේ ගෙට පැමිණි කල ඒ අන්ධයෝ උන්වහන්සේ ළඟට ආවෝය. මට මේක කරන්ට පුළුවන කියා නුඹලා විශ්වාස කරනවාදැයි යේසුස්වහන්සේ ඔවුන්ගෙන් ඇසූසේක. එසේය, ස්වාමීනියි ඔව්හු කීවෝය. එවිට උන්වහන්සේ ඔවුන්ගේ ඇස් අතගා නුඹලාගේ විශ්වාසයේ ප්‍රකාරයට නුඹලාට වේවයි කීසේක. (මතෙව් 9:28-29)**

යේසුස්වහන්සේට මෙම හාස්කම සිදුකිරීමට හැකියාව සතුවිය. උන්වහන්සේට කළ හැකි බව එතුමා දැනසිටි සේක. උන්වහන්සේගේ ඇදහිල්ල අන්ධ මිනිසුන්ගේ ඇදහිල්ල හා මුසුව සුවය ගෙන දුනි.

සුවකිරීමේ "දීමනා" ලෙසට බහුවචනයෙන් භාවිතා කිරීමට තවත් හේතුවක් නම් සුව වීම විවිධ බයිබලීය ක්‍රම තුළින් පැමිණීමය. උදාහරණ ලෙසට සුවය, පවසන ලද වචනයක් තුළින් පැමිණීමට හැකිය.

> **සියයකට මුලාදැනියා උත්තරදෙමින්: ස්වාමීනි, මාගේ පියස්ස යටට ඔබගේ ඊමට මම නොවටිමි. වචන මාත්‍රයක් කිව මැනව, එවිට මාගේ මෙහෙකරුවාට සුවවන්නේය. (මතෙව් 8:8)**

> **උන්වහන්සේ ස්වකීය වචනය එවා ඔවුන් සුවකොට ඔවුන්ගේ විනාශවලින් මුදාහරිනසේක. (ගීතාවලිය 107:20)**

සුවවීම අත් තැබීම මගින්ද ඇතිවිය හැක :

> **ඉර බසින කල අනේකාකාර රෝගවලින් පීඩිතවූ රෝගකාරයන් ඇති සියල්ලෝම උන්වහන්සේ වෙතට ඔවුන් ගෙනාවෝය; උන්වහන්සේ ඔවුන් එකිනෙකා පිට අත් තබා, ඔවුන් සුවපත් කළසේක. (ලූක් 4:40)**

> **...ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාර්ක් 16:18)**

> **දෙවියන්වහන්සේ පාවුල්ගේ අත්වලින් අපූරුවූ ආශ්චර්යයන් කෙරෙවූසේක. (ක්‍රියා 19:11)**

ස්වාමීන්වහන්සේගේ නාමයෙන් තෙල් ආලේප කිරීම තුළින්ද සුවය පැමිණිය හැක :

> **නුඹලා අතරෙහි යමෙක් රෝගාතුරව සිටින්නේද? ඔහු සභාවේ වැඩිමහල්ලන්ට හඬගසාවා; ඔව්හු ස්වාමීන්වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේපකොට, ඔහු උදෙසා යාච්ඤාකරත්වා. එවිට ඇදහිල්ලේ යාච්ඤාවෙන් රෝගාතුරයාට සුවය ලැබේ, ස්වාමීන්වහන්සේ ඔහු නැගුටුවනවා ඇත. ඔහු පාපයන් කර තිබේ නම්, ඒවා ඔහුට කමා කරනු ලැබේ. (යාකොබ් 5:14-15)**

සුවකිරීමේ දීමනාව සහිත පුද්ගලයෙකුගේ සෙවනැල්ලෙන් පවා සුවය හිමි වී තිබේ.

> **එහෙයින් පේත්‍රුස් එන විට ඔහුගේ සෙවණැල්ල පමණවත් යම් රෝගියෙකු පිට වැටෙන පිණිස ඔව්හු ඔවුන් පිටත වීථිවලට ගෙනැවිත් ඇඳන්වලද යහන්වලද තැබුවෝය. යෙරුසලම අවට නුවරවලින් සමූහයෝ රෝගීන්ද අශුද්ධාත්මවලින් පීඩිතවූවන්ද ගෙන රැස්වූවෝය. ඔවුන් සියල්ලෝද සුවකරනු ලැබුවෝය. (ක්‍රියා 5:15-16)**

යේසුස්වහන්සේ දුක් විඳ අපගේ සියලු දුබලතා උසුලාගත් බැවින් අපට දිව්‍යමය සුවය අත් විඳිය හැක.

**නුමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය, පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමිණුණේය; උන්වහන්සේගේ පහරවලින් අපට සුවය ලැබී තිබේ. (යෙසායා 53:5)**

යේසුස්වහන්සේ කල්වාරියෙහිදී දුක් විඳිනු ලැබුවේ අපව පාපයෙන් මුදාගැනීමට පමණක් නොව අපව රෝගයෙන්ද මුදාගැනීම පිණිසය. උන්වහන්සේ අපගේ රෝග සුව කරනු පිණිස කස පහර ලදසේක. උන්වහන්සේ අප සුවය ලබන පිණිස හා පාපයෙන් මිදෙන පිණිස දුක් වින්දසේක.

සුවකිරීමේ දීමනාව සහිත පුද්ගලයන් මෙහෙකිරීමෙහිදී මතක තබා ගත යුතු කරුණක් නම් මෙහෙය ලබන සැම කෙනෙකුම සුවය නොලබන බවය. පාවුල් තමා සමග සේවය කරන හවුල් සේවකයන් රෝගීව සිටින බවත් ඔහුගේ මෙහෙ කිරීමෙන් ඔව්හු සුවය ලබා නොතිබුණ බවත් සනිටුහන් කරයි.

**...එරස්තස් කොරින්තියෙහි නැවතුණේය. නුමුත් ත්‍රොපිමස් ලෙඩවූ බැවින් මිලේතසෙහි නවත්වා ආවෙමි. (2 තිමෝති 4:20)**

පාවුල් සතුව සුවකිරීමේ දීමනාව මෙන්ම හාස්කම් දීමනාද විය. එහෙත් මොනයම් හේතුවක් නිසා හෝ ත්‍රෝපිමස් ඔහුගේ මෙහෙය යටතේ සුව නොවීය. එසේම පාවුල්තුමා තිමෝති හට තිබූ රෝගී තත්වයක් පිළිබඳ සඳහන් කරමින් මෙසේ පැවසීය:

**නුඹම පිරිසිදුව සිටපන්න. මින්මතු වතුරම බොන්නෙක් නොව්, නුඹේ ආමාශය උදෙසාද නොයෙක්විට පැමිණෙන නුඹේ දුර්වලකම් නිසාද, මුද්‍රිකපානය ටිකක් භාවිතාකරපන්න.
(1 තිමෝති 5:23)**

පාවුල්තුමා මෙහෙකළාවූ සැම කෙනෙකුම සුව වුයේ නැති බැවින් ඔහු සුවකිරීමේ දීමනාව භාවිතා කිරීම නවතා දැමුවේ නැත. එය කිසියම් ඉවැන්ජලිස්තවරයෙක් තමාගේ ප්‍රචාරක කටයුතු වලට සවන් දුන් සැම අයෙකුම දෙවියන්වහන්සේ වෙතට ඒමට ප්‍රතිචාර නොදැක්වූ බැවින් ඉන්පසු ශුභාරංචි ප්‍රකාශ කිරීම නවතා දැමීමක් වැනිය. පාවුල් ශුභාරංචිය ප්‍රකාශ කළ හැකි කෙනෙකුම ශුභාරංචියට සුභවාදී ප්‍රතිචාරයක් දැක්වූයේ නැත. සුවවීම උදෙසා යාච්ඤා කළ හැම පුද්ගලයෙකුම සුවය ලැබුවේද නැත. නුමුත් දෙවියන්වහන්සේ ඔහුව කැඳවා තිබූ කාර්යය ඔහු දිගටම ඉටු කලේය. ඔහු ශුභාරංචිය ප්‍රකාශකොට, සුවය උදෙසා යාච්ඤා කිරීමෙන් අනතුරුව ප්‍රතිඵල දෙවියන්වහන්සේගේ හස්තයට භාරදී සිටියේය.

අප යාච්ඤා කරන්නාවූ සැම පුද්ගලයෙකුම සුව නොවීමට හේතු ඇත. මෙම මාතෘකාව හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "මුහුන් වැනි වූ ශුභාරංචි ප්‍රකාශක සේවය" නම් පොතෙහි විස්තරාත්මකව සඳහන් වේ. සුව කිරීම හා ශුභාරංචි ව්‍යාප්තිය කෙරෙහි එහි බලපෑම එම පොතේ විස්තර කර දෙයි.

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

- විස්තරාත්මක අධ්‍යයනයක් සඳහා " හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "ශරීරය උදෙසා සටන" නම් පාඨමාලාව ලබාගන්න.

- යේසුස්වහන්සේගේ සුව කිරීමේ මෙහෙය පිළිබඳ ඉගෙනීමට මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන් පොත අධ්‍යයනය කරන්න. උන්වහන්සේ කළාවූ සුව කිරීම් වල ලැයිස්තුවක් සාදන්න. එම සුව කිරීම් සිදුකළ ක්‍රමයත් එම ලැයිස්තුවේ සඳහන් කරන්න.

- මුල් කාලීන සභාවෙහි සුවකිරීමේ දීමනාව ක්‍රියාත්මක වූ අයුරු අධ්‍යයනය කිරීමට ක්‍රියා පොත කියවා බලන්න. සුවවූ රෝග වල ආකාරයත්, සුවකිරීමට යොදා ගත් ක්‍රමත් සටහන් කරගන්න.

ක්‍රියා පොතෙහි සඳහන් සුව කිරීමේ දීමනාව මෙහෙය සඳහා දෙවියන්වහන්සේ තෝරාගත් විවිධ මනුෂ්‍යයන්ව බලන්න.

| | |
|---|---|
| - ක්‍රියා 3:1-11 | පේත්‍රුස් සහ යොහන් (ප්‍රේරිත) |
| - ක්‍රියා 5:15;9:32-34 | පේත්‍රුස් (ප්‍රේරිත) |
| - ක්‍රියා 8:5-7 | පිලිප් ( ඉවැන්ජලිස්තවරයා හා උපස්ථායක) |
| - ක්‍රියා 9:17-18 | අනනියස් (නොදන්නාවූ ඇදහිලිවන්තයා) |
| - ක්‍රියා 14:8-10; 28:7-9 | පාවුල් (ප්‍රේරිත) |

පහත සදහන් පද අධ්‍යයනය කරන්න. දෙවියන්වහන්සේ සුව කිරීම් සිදුකිරීමට හේතු කිහිපයක් නම් කරන්න. යොහන් 9:1-3; ක්‍රියා 3:1-10; 4:4; පිලිප්පි 2:25-27.

## අන්භාෂා දීමනාව

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. කෙසේදයත්; තවත් කෙනෙකුට නානා වර්ග භාෂාද ...දෙනලද්දේය. (1 කොරින්ති 12:7-10)**

අන් භාෂා දීමනාව නම් ඔබ කිසිදිනක ඉගෙනගෙන නොමැති භාෂාවකින් දෙවියන්වහන්සේගේ ජනතාව උදෙසා උන්වහන්සේගේ පණිවුඩයක් ලබාගැනීමට හා එය සන්නිවේදනය කිරීමට ඇති හැකියාවය. “අන්භාෂා” යනු යම්කිසි භාෂාවකි. මෙය “වාචික” දීමනාවක් ලෙස නොව “සලකුණු” දීමනාවක් ලෙස නම් කොට ඇත්තේ සලකුණක් ලෙස දී ඇති බව බයිබලය පැහැදිලිව ප්‍රකාශ කොට ඇති බැවිනි.

අන් භාෂා දීමනාවෙන් යමෙක් කතාකරන කල එම භාෂාව අසාගෙන සිටින වෙනයම් පුද්ගලයෙකු හට එය හඳුනාගත හැකි භාෂාවක් විය හැක.

> **මේ ශබ්දය ඇසුණු කල සමූහයා එකතුව ඇවිත් වියවුල් විය. මක්නිසාද එකිනෙකා තම තමාගේ භාෂාවෙන් ඔවුන් කථාකරනවා ඇසුවේය. ඔවුන් සියල්ලෝ විස්මිතව පුදුමවී: බලව, මේ කථාකරන සියල්ලෝ ගලිලයෝ නොවෙද්ද? අප උපන් දේශවල අප එකිනෙකාගේම භාෂාවෙන් ඔවුන් කථාකරනවා කෙසේ අසමුද? (ක්‍රියා 2:6-8)**

එසේම එය මනුෂ්‍යයා විසින් නොදන්නාවූ භාෂාවක්ද විය හැක. මෙය නොදන්නා භාෂාවකින් කතාකිරීම ලෙසද හැඳින්වේ.

> **මක්නිසාද අන් භාෂාවකින් කථාකරන්නා මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේට කථාකරන්නේය; ඔහු ආත්මයෙන් රහස් කථා කරන නුමුත් කාටවත් තේරෙන්නේ නැත. (1 කොරින්ති 14:2)**

ඔබ මීට පෙර ඉගෙනගත් පරිදි අන් භාෂාවලින් කතා කිරීම ශුද්ධාත්ම බව්තිස්මය ලැබීමේ බාහිර භෞතික ලක්ෂණයකි. එහෙත් මෙම අන්භාෂාවලින් කතාකිරීම, අන්භාෂා දීමනාවට වඩා වෙනස්ය. අන්භාෂා දීමනාව නම් එය කථාකරන තැනැත්තා නොදන්නා භාෂාවකින් සභාව උදෙසා දෙවියන්වහන්සේගේ පණිවුඩය ගෙන ඒමට ඇති විශේෂ හැකියාවය.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මයෙහි බාහිර සාධකයක් ලෙස අන්භාෂා කතාකිරීම මෙන්ම අන්භාෂා දීමනාව ලැබීමේ පරමාර්ථ නම්:

**දෙවියන්වහන්සේට යාච්ඤාව කිරීම සඳහා :** 1 කොරින්ති 14:2

**තමාව ගොඩනංවා ගැනීම සඳහා :** 1 කොරින්ති 14:4; ගොඩනංවා ගැනීම යනු උසස් කරගැනීම නොවේ, එහෙත් දිරිගැන්වීම, දියුණු වීම, හා වර්ධනය වීමයි. යෙසායා 28:11-12 මෙය ආත්මික නැවුම් කිරීම ලෙසද සදහන් වේ.

**මැදිහත්කාරකම් කිරීම සඳහා :** යාච්ඤාවෙන් මැදිහත්කාරකම් කිරීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයා හට අන්භාෂාවෙන් කථාකිරීමට සලස්වන සේක. “මැදිහත්කාර කම” යනු වෙනයම් කෙනෙකු උදෙසා යාච්ඤා කිරීමය. ශුද්ධාත්මයාණන්වහන්සේ යාච්ඤා කළ යුතු කෙසේද කියාත් කුමක් සඳහාද කියාත් දන්නා සේක. 1 කොරින්ති 14:1; රෝම 8:26,27 බලන්න.

**ප්‍රශංසාව සඳහා** : ක්‍රියා 10:46; 1 කොරින්ති 14:15

**අනාගතකීම සම්පූර්ණවීම සඳහා** : 1 කොරින්ති 14:21; යෙසායා 28:11-12

අන්භාෂා දීමනාව සඳහා අමතර පරමාර්ථ දෙකක්ද ඇත. අන්භාෂා දීමනාව සහිත පුද්ගලයා සභාව උදෙසා පණිවුඩයක් දී එය පරිවර්තනය කළ පසු:

**එමගින් සභාවේ ගොඩනැංවීමක් සිදුවේ** : 1 කොරින්ති 14:12-13.

**අන්‍ය-භක්තිකයිනට ලකුණක් වේ:** 1 කොරින්ති 14:22. අන්‍ය-භාෂා දීමනාව සහ ඒ සමග පැමිණෙන පරිවර්තනය කර දීමේ දීමනාව "සලකුණු දීමනා" යැයි නම් කරනුයේ එබැවිනි.
සභාවෙහි අන්‍ය භාෂා දීමනාව භාවිතා කිරීම සඳහා නියමිත උපදෙස් සපයා දී තිබේ.

1. සියලු දෙනාම එක විට කතා නොකළ යුතුය. 1 කොරින්ති 12:30.

2. සභාව ගොඩනැංවීමක් සඳහා අන්‍ය භාෂා දීමනාව කැටුව පරිවර්තනය කර දීම සිදුවිය යුතුය. අසා සිටින්නන් හට ලද පණිවුඩය අවබෝධ වනුයේ එවිටය. 1 කොරින්ති 14:1-5.

3. එබැවින් පරිවර්තනය කිරීමට කෙනෙකු නොමැති නම් අන්භාෂා දීමනාව සතු ඇදහිලිවන්තයා නිශ්ශබ්දව සිටිය යුතුය. 1 කොරින්ති 14:28.

4. අන් භාෂා දීමනාව සහිත පුද්ගලයා තමාටම පරිවර්ථන දීමනාවද ලැබෙන ලෙසට යාච්ඤා කළ යුතුය. 1 කොරින්ති 12:13.

5. සභාවෙහිදී අන් භාෂා පරිවර්ථන දීමනාව සතු කෙනෙකු නොමැති කළ තේරෙන භාෂාවෙන් කතාකිරීම අන්භාෂා කතාවට වඩා වැදගත් වේ. 1 කොරින්ති 14:18-19.

6. පරිවර්තනය කිරීමේදී වරකට එක් අයෙකු පමණක් එය කළ යුතුය: 1 කොරින්ති 14:27.

7. අන් භාෂා දීමනාව සහිත පුද්ගලයා හට එය පාලනය කළ හැකිය: 1 කොරින්ති 14:32-33.

8. අන්භාෂාවෙන් කතාකිරීම නොවැලැක්විය යුතුය. 1 කොරින්ති 14:39-40.

9. ඉතාමත්ම වැදගත් කාරණාව නම්, සභාවෙහි දේව මෙහෙයෙහි පිළිවෙල සුරැකීමය. මෙම දීමනාව හෝ වෙනයම් දීමනාවක් මගින් දේව මෙහෙය තුළ වියවුලක් ඇති නොවිය යුතුය. 1 කොරින්ති 14:40.

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

- 1 කොරින්ති 12-14 දක්වා අධ්‍යයනය කරන්න. මෙම පරිච්ඡේද ආත්මික දීමනාවල භාවිතය පිළිබඳව සාකච්ඡා කරන අතර 14 වෙනි පරිච්ඡේදයෙහි අන්භාෂා දීමනාව හා එහි පරිවර්ථන දීමනාව කෙරෙහි අවධාරණය යොමු කරයි.

- 1 කොරින්ති 14:5 කියවන්නඃ අන්භාෂා දීමනාව පරිවර්තනය සමග මුසු වීම සමාන කර ඇත.

- මෙම දීමනාවෙහි පරමාර්ථ මොනවාද? 1 කොරින්ති 14:4,5,22 බලන්න.

- සභාව රැස්වූ කළ මෙම දීමනාව භාවිතය සඳහා දී ඇති උපදෙස් මොනවාද? 1 කොරින්ති 14:26-28 බලන්න.

- අන්භාෂා දීමනාව නොඇදහිලිවතුනට සලකුණකි. පහතින් දී ඇති ඡේදවලට අනුව එහි සඳහන් නොඇදහිලිවන්තයෝ කවුරුන් විද? ඔව්හු කොහි සිට පැමිණි අයවුවෝද යන්න බලන්න.

| | කවුද? | කොතැනින්ද? |
|---|---|---|
| ක්‍රියා 2:2-13 | ____________ | ____________ |
| ක්‍රියා 10:24-28 | ____________ | ____________ |
| ක්‍රියා 19:1-7. | ____________ | ____________ |

# අන් භාෂා පරිවර්තනය

**නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය...තවත් කෙනෙකුට භාෂා තේරුම්කර දීමද දෙනලද්දේය. (1 කොරින්ති 12:7-10)**

අන් භාෂා පරිවර්තනය නම් කෙනෙකු අන් භාෂාවෙන් පැවසූ පණිවුඩය තේරුම් යන භාෂාවකින් පරිවර්තනය කොට ප්‍රකාශ කිරීමට ඇති විශේෂ හැකියාවය. ශුද්ධාත්මයාණන්වහන්සේ පරිවර්තන දීමනාව ඇති පුද්ගලයා හට පණිවුඩයෙහි අර්ථය දෙන සේක. එය භාෂාවන් ඉගෙනීමෙන් දැන ගෙන කරන පරිවර්තනය කිරීමක් නොවේ. එය ශුද්ධාත්මයාණන්වහන්සේගේ එළිදරව් කිරීමෙන් සිදුවන්නකි. පරිවර්තනය වචනයෙන් වචනය පරිවර්තනය කිරීමක් නොව පණිවුඩයෙහි සාරාංශයක් ඉදිරිපත් කිරීමකි. එබැවින් අන්භාෂා පරිවර්තනය මුල් පණිවුඩයට වඩා ප්‍රමාණයෙන් හා ආකෘතියෙන් වෙනස් විය හැක.

මෙම දීමනාවෙහි අරමුණ වනුයේ අන් භාෂා දීමනාව සහිත පුද්ගලයා විසින් දෙන ලද පණිවුඩයට පරිවර්තනයක් ලබාදීමය.

**යමෙක් අන් භාෂාවකින් කථාකෙරේ නම්, දෙදෙනෙක් නොහොත් වැඩි වුණොත් තුන්දෙනෙක් පමණක් එක්කෙනෙක් පාසා එක්කෙනෙක් එසේ කෙරේවා; එක්කෙනෙක් තේරුම්කර දේවා. (1 කොරින්ති 14:27)**

අන් භාෂා දීමනාව සමගම භාෂා පරිවර්තනය කර දීමේ දීමනාවද ක්‍රියාත්මක විය යුතුය. එබැවින් අන් භාෂාවකින් සැපයූ පණිවුඩයක් පරිවර්තනය වුවහොත් පමණක් සභාවට ආශිර්වාද හිමි වනු ඇත:

**නුඹලා සියල්ලන් අන් භාෂාවලින් කථා කරනවාට කැමැත්තෙමි, නුමුත් නුඹලා ධර්මවාක්‍ය කියනවාට ඊට වඩා කැමැත්තෙමි. අන් භාෂාවලින් කතා කරන්නා සභාවේ වර්ධනයවීම පිණිස තේරුම්කර නොදෙතොත් ඔහුට වඩා ධර්මවාක්‍ය කියන්නා උතුම්ය. (1 කොරින්ති 14:5)**

අන්‍යභාෂා පරිවර්තනය කිරීමේ දීමනාව සහිත පුද්ගලයෙකු සභාවෙහි නොසිටී නම් අන් භාෂා දීමනාව සහිත පුද්ගලයා නිශ්ශබ්දව සිටිය යුතුය :

**තේරුම්කරදෙන කෙනෙක් නැත්නම්, ඔහු සභාවේදී නිශ්ශබ්ද වේවා; තමාටත් දෙවියන්වහන්සේටත් කථාකෙරේවා. (1 කොරින්ති 14:28)**

අන්භාෂා දීමනාව සහිත පුද්ගලයා භාෂා පරිවර්තන දීමනාවද ලැබෙන පිණිස යාච්ඤා කළ යුතුය.

**එබැවින් අන්භාෂාවකින් කථාකරන්නා තේරුම් කරදෙන්ට පුළුවන්වන ලෙස යාච්ඤාකෙරේවා. (1 කොරින්ති 14:13)**

## තවදුරටත් අධ්‍යයනය සඳහා :

- 1 කොරින්ති 14 අධ්‍යයනය කොට අන් භාෂා පරිවර්තනය කිරීමේ දීමනාව පිළිබඳ තව දුරටත් උපදෙස් ලබාගන්න.

- අන්භාෂා පණිවුඩය පරිවර්තනය කළ විට එහි ප්‍රතිඵලය විය යුත්තේ කුමක්ද? 1 කොරින්ති 14:5 බලන්න.

- පරිවර්තකයෙක් නොමැති විට කුමක් සිදුවිය යුතුද? 1 කොරින්ති 14:28 බලන්න.

- අන්‍යභාෂාව පරිවර්තනය කරන්නේ කවුද? 1 කොරින්ති 14:13 හා 27 බලන්න.

- අන්‍යභාෂා දීමනාවට පරිවර්තනය අවශ්‍ය නොවන්නේ කුමන අවස්ථාවලදීද? ක්‍රියා 2:4-8; 10:44-8; 19:6 බලන්න.

# කාර්යක්ෂම සේවා රටාව

මෙම පරිච්ඡේදයෙන් විවිධ ආත්මික දීමනා පිළිබඳ අධ්‍යයනය අවසන් වේ. අධ්‍යයන පරමාර්ථ අනුව සිදුකළාවූ වෙන් කිරීම් නම්:

- විශේෂ දීමනා - වාචික දීමනා
- සේවක දීමනා - සලකුණු දීමනා.

පහත සඳහන් වගුව ඇසුරින් සභාවක කාර්යක්ෂම සේවාවක් සඳහා එක් එක් අංශය එකිනෙකට ගැලපෙනුයේ කොහේදැයි පෙන්නුම් වේ.

## විශේෂ දීමනා :

ප්‍රේරිතයෝ
අනාගතවක්තෘවරු
ශුභාරංචි ප්‍රකාශකයන් ☞ **දෙවියන්වහන්සේගේ ජනතාව සන්නද්ධ කරන පිණිස**
සභාපාලක
ගුරුවරු

## වාචික දීමනා

අනාගතවාක්‍යය
ඉගැන්වීම
**දෙවියන්වහන්සේගේ සත්‍ය පැහැදිලි කරදීමට** ☞ දිරිගැන්වීම
ප්‍රඥාවේ වචනය
දැනගැන්මේ වචනය

## සේවා දීමනා

මෙහෙකිරීම
උපකාරක සේවා
නායකත්වය
පරිපාලනය
දීම ☞ **දෙවියන්වහන්සේගේ වැඩය ඉටුකිරීමට**
දයානුකම්පා දැක්වීම
ආත්ම විමසීම
ඇදහිල්ල
ආගන්තුක සත්කාරය

## සලකුණු දීමනා

අන් භාෂා
අන් භාෂා පරිවර්තනය
**දෙවියන්වහන්සේගේ ආධිපත්‍ය පිහිටුවීමට** ☞ භාස්කම්
සුවය.

## ස්වයං - පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________

______________________________

2. සලකුණු දීමනා හතර මොනවාද?

______________________________

______________________________

______________________________

______________________________

3. යොහන් 20:30-31 ට අනුව, හාස්කමේ දීමනාවෙහි පරමාර්ථ දෙක මොනවාද?

______________________________

______________________________

4. පළමු ලයිස්තුවේ ඇති සලකුණු දීමනා බලන්න. දෙවන ලැයිස්තුවේ ඇති අර්ථ දැක්වීමට ගැලපෙන දීමනාව ඉදිරියෙන් අර්ථ දැක්වීමේ අංකය ලියන්න.

| **1 වෙනි ලැයිස්තුව** | **2 වන ලැයිස්තුව.** |
|---|---|
| _________සුවකිරීම | 1. ස්වාභාවයෙන් සිදුවිය නොහැකි බලවත් වූ ක්‍රියා. |
| _________අන්භාෂා | 2. ස්වාභාවික ක්‍රම භාවිතා නොකොට දෙවියන්වහන්සේගේ බලයෙන් සුවය නැවත ලබාදීම. |
| _________පරිවර්තනය | 3. කථාකරන පුද්ගලයා නොදන්නාවූ භාෂාවකින් කතාකිරීම. |
| _________හාස්කම් | 4. අන්භාෂාවෙන් කතාකළාවූ පණිවුඩයක් තේරුම් යන භාෂාවකින් වටහාදීම. |

5. පහත සඳහන් ප්‍රකාශන කියවා බලා එය සත්‍යය නම් ඉදිරියෙන් ස යන්නද අසත්‍ය නම් අ යන්නද ලියන්න.

a._______ශුද්ධාත්ම බව්තිස්මය සමගම අන් භාෂාවෙන් කතාකිරීම හා අන්භාෂා දීමනාව යන දෙකම එක සමානය.

b.______අන් භාෂා පරිවර්තනය කිරීමට කෙනෙකු සභාවෙහි නොමැති කල අන් භාෂා දීමනාවද සතු පුද්ගලයා නිශ්ශබ්දව සිටිය යුතුය.

c.______අන්භාෂා දීමනාව සහිත පුද්ගලයා ඔහුගේම පණිවුඩය පරිවර්තනය නොකළ යුතුය.

d.______අන්භාෂා දීමනාව සතු පුද්ගලයා හට තමාව පාලනය කර ගත නොහැක.

e.______අන් භාෂා පරිවර්තකයෙකු සභාවෙහි නොමැති විටදී අන් භාෂාවේ දීමනාව භාවිතා කිරීමට වඩා තේරෙන භාෂාවෙන් කතාකිරීම වඩා වැදගත්ය.

f.______එකම පණිවුඩය එකම වේලාවේ කිහිප දෙනෙකුටම පරිවර්තනය කළ හැකිය.

g._______යම් කිසිවෙකු සතුව සුවකිරීමේ දීමනාව ඇත්නම් ඔහු මෙහෙකරන සැම කෙනෙකුම සුවය ලබනු ඇත.

h.______රෝගීන් උදෙසා යාච්ඤා කළ යුත්තේ සුවකිරීමේ දීමනාව සතු පුද්ගලයන් පමණකි.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

සලකුණු දීමනා හතර සඳහා එක් එක් දීමනාවට පසුව තවදුරටත් අධ්‍යයනය සඳහා යෝජනා ඉදිරිපත් කෙරුනි. මෙලෙස සිදුකලේ ඊලග දීමනාවන්ට යෑමට පෙර එක් එක් සලකුණු දීමනාව පිළිබඳ සම්පූර්න අධ්‍යයනයක් කිරීමටය. අවසාන යෝජනාව ලෙස ඉදිරිපත් කරනුයේ යේසුස්වහන්සේගේ සේවයෙහි ශුද්ධාත්ම දීමනා සියල්ල දක්නට ලැබුණු ආකාරය පිළිබඳ ඔබ අධ්‍යයනය කරන ලෙසටය. පහතින් සපයා ඇති යේසුස්වහන්සේගේ ජීවිතයෙහි මෙහෙයෙහිදී දක්නට ලැබුන ශුද්ධාත්ම දීමනා සනාථ කරන්නාවූ බයිබල් පද ඔබ හට උපකාරී වනු ඇත.

ඔබ මෙම අධ්‍යයනය අවසන් කළ පසුව මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන් පොත් කියවන්න. යේසුස්වහන්සේගේ සේවයෙහිදී ශුද්ධාත්ම දීමනා දක්නට ලැබූ අවස්ථාවන් එම අධ්‍යනයට එකතු කරගන්න.

## යේසුස්වහන්සේගේ ජිවිතයෙහි දක්නට ලැබූ ශුද්ධාත්ම දීමනා

| | |
|---|---|
| - භාස්කම් | ක්‍රියා 2:22 |
| - සුවකිරීම | ක්‍රියා 10:38 |
| - ප්‍රඥාවේ වචනය | 1 කොරින්ති 1:24,30 |
| - දැනගැන්මේ වචනය | යොහන් 1:45-50; 4:18; 11:14 |
| - ආත්ම විමසීම | යොහන් 1:45-50; 6:61 |
| - අනාගතකිම/අනාගතවාකතෘ | මතෙව් 24. |
| - ඉගැන්වීම/ගුරුවරයා | මතෙව් 4:23;9:35;26:55; මාර්ක් 6:6;14:49; ලූක් 5:17;13:10,22;21:37 |
| - දිරිගැන්වීම | ලූක් 3:18 |
| - කරුණාව (දයානුකම්පාව) | මතෙව් 20:30-34. |
| - ප්‍රේරිත | හෙබ්‍රෙව් 3:1 |
| - ධර්මදූත ප්‍රකාශක | යොහන් 10:16 |
| - පාලක | යොහන් 10:11 |
| - නායක | යොහන් 13:15-16;මාර්ක් 10:42-45 |
| - පරිපාලක | ලූක් 10:1-17 |
| - ඇදහිල්ල | ලූක් 8:49-56 |
| - දීම | යොහන් 10:11 |
| - උපකාරකිරීම | යොහන් 17:6-10 |
| - සේවය කිරීම | යොහන් 13:4-16;මාර්ක් 10:42-45 |
| - ආගන්තුක සත්කාරය | යොහන් 21:9-13 (එතුමාට නිවසක් නොමැති වුවත් - ආගන්තුක සත්කාරය දැක්වීය) |

අන්භාෂා සහ පරිවර්තනය : යේසුස්වහන්සේගේ ජිවිතයෙහි දක්නට නොලැබුනු ආත්මික දීමනා දෙක මෙපමණකි. එය අවශ්‍ය නොවූයේ එතුමා වචනයද දෙවියන්වහන්සේද වූ බැවිනි. දෙවියන්වහන්සේ වෙතින් මිනිසා කරා පණිවුඩයක් ගෙන ඒමට අන්භාෂාව හෝ පරිවර්තනය එතුමා හට අවශ්‍ය නොවීය.

# දහවන පරිච්ජේදය

## ඔබගේ ආත්මික දීමනා සොයාගැනීම

### අරමුණු :

මෙම පරිච්ජේදය අවසානයෙහි ඔබට

- ඇදහිලිවන්තයෙකු හට තමාගේ ආත්මික දීමනා සොයාගැනීමෙහි ඇති වැදගත් කම පැහැදිලි කිරීමට.
- ඇදහිලිවන්තයෙකු හට ආත්මික දීමනා සොයාගත හැකි ක්‍රමය පැහැදිලි කිරීමට.
- ඔබගේ ආත්මික දීමනා හඳුනාගැනීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය:

> **ඒ කාරණය නිසා මාගේ අත්තැබීම කරණකොටගෙන නුඹ තුළ තිබෙන දෙවියන්වහන්සේගේ දීමනාව පුබුදු කරන හැටියට නුඹට සිහිකරවමි. (2 තිමෝති 1:6)**

## හැඳින්වීම

මීට පෙර පරිච්ජේද වලින් සෑම ඇදහිලිවන්තයෙකු සතුව අඩු තරමින් එක් ආත්මික දීමනාවක් හෝ පවතින බව ඔබ ඉගෙන ගත්තෙහිය. මෙම පරිච්ජේදයෙහි ඔබගේ දීමනා හඳුනාගත හැකි ක්‍රමයත් ඒවා භාවිතා කිරීමට ආරම්භ කළ හැකි ආකාරයත් පැහැදිලි කරනු ඇත.

## ආත්මික දීමනා සොයාගැනීමේ ඇති වැදගත්කම.

ඔබගේ ආත්මික දීමනා සොයාගැනීම වැදගත් වනුයේ:

### ආත්මික පරමාර්ථ සහ අරමුණු ඉෂ්ඨ කිරීමට:

එපිස 4:12-15 දක්වා සඳහන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවල පරමාර්ථය හා අරමුණු ඔබට මතක ඇත.

**පරමාර්ථ :**

- ශුද්ධවන්තයින් සම්පූර්ණත්වයට ගෙන ඒම.
- සේවය කිරීමේ වැඩය පිණිස
- ක්‍රිස්තුස්වහන්සේ හා සභාව වර්ධනය සඳහා

**අරමුණු :**

- අපි ඇදහිල්ලෙහි එකමුතු වනු ඇත.
- අපි ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ ඇති දැනුමෙන් වර්ධනය වනු ඇත.
- අපි ක්‍රිස්තුස්වහන්සේ අපගේ ආදර්ශ ලෙස ගනිමින්, සම්පූර්ණත්වය කරා වර්ධනය වනු ඇත.
- අපි අසත්‍ය ධර්ම වලින් නොරැවටී, ස්ථායී තත්වයට පත් වනු ඇත.
- අප ක්‍රිස්තුස්වහන්සේ තුළ ආත්මිකව පරිනත වන්නෙමු.

සභාවෙහි මෙම පරමාර්ථ හා අරමුණු ඉෂ්ට වීමට නම්, එහි සිටින සෑම ඇදහිලිවන්තයෙකුම තමා සතු ආත්මික දීමනාව හඳුනාගෙන එය භාවිතා කිරීම අවශ්‍ය වේ.

## ආත්මික සටනේ යෙදෙන පිණිස :

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සභාවට දී ඇති තවත් හේතුවක් නම්, සාතන්ගේ දුෂ්ඨ බලවේගවලට එරෙහිව සටන් වදින පිණිස ආත්මික ආයුධ ලෙස භාවිතා කිරීම සඳහාය.

> **මක්නිසාද අපේ පොර බැදීම වනාහි මාංසයට හා රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

ඔබගේ ආත්මික සතුරා සමග කාර්යක්ෂම අයුරින් සටන් වැදීම සඳහා ඔබ සතු ආත්මික දීමනා හඳුනාගෙන භාවිතා කිරීම වැදගත්ය.

## වැරදි පරිහරණය මගහැරීමට:

ආත්මික දීමනා වැරදි ලෙස පරිහරණය කිරීම තුන් අයුරකින් සිදුවන බව ඔබ මීට පෙර පරිච්ඡේදවලදී ඉගෙන ගන්නට ඇත. ඒවානම් :

1. ඔබට දී ඇති දීමනා භාවිතා නොකිරීම.
2. ඔබට දී නැති දීමනා භාවිතා කිරීමට ප්‍රයත්න දැරීම.
3. දීමනා නිසියාකාරව භාවිතා නොකිරීම.

එබැවින් දීමනා වැරදි ලෙස පරිහරණය වැලැක්වීම සඳහා ඔබ සතු දීමනා හඳුනා ගැනීම ඉතා වැදගත්ය.

## අසහනය වැලැක්වීමට :

බොහෝ නවක කිතු බැතියන් තම ආත්මික දීමනා මොනවාදැයි හරිහැටි හඳුනා ගැනීමකින් තොරව දේව සේවයට ඇතුල්වීම හේතුකොටගෙන අසහනය හා අධෛර්යයට පත්වීමට ලක්වෙති. ඔබ ඔබගේ ආත්මික දීමනාව හඳුනා නොගතහොත් අසහනයට පත් වනු ඇත. ඔබ හට සේවය කිරීම සඳහා දෙවියන්වහන්සේ ඔබට දීමනාවක් දී නොමැති ක්ෂේත්‍රයක ඔබ සේවයෙහි යෙදී සිටීමට උත්සහ දරයි නම් ඔබ අකාර්යක්ෂම වනු ඇත.

ඔබ සේවයෙහි කාර්ය බහුල විය හැකඃ නමුත් දේව රාජ්‍යය සඳහා කිසිවක් ඉටු නොකරනු ඇත. උදාහරණයක් ලෙස එක් මනුෂ්‍යයෙකු ශ්‍රේෂ්ඨ ධර්මදූත ප්‍රචාරක බිලි ග්‍රැහැම්ගේ දීමනාව අනුකරණය කිරීමට උත්සහ කළේය. ඔහු බිලි ග්‍රැහැම් මෙන්ම දේශනා කළ නමුත් කිසිවෙක් ඔහුගේ පණිවුඩයට ප්‍රතිචාර දැක්වූයේ නැත. ඔහු සේවයෙහි ඉතා අසහනයට පත් වූ අතර පසුව තමා හට ධර්මදූත ප්‍රචාරකවරයෙකුගේ දීමනාව නොමැති බව ඔහු වටහාගත්තේය. ඔහුගේ දීමනාව වූයේ ඉගැන්වීමය. ඔහු තමාගේ දීමනාව වන ඉගැන්වීම භාවිතා කිරීමට ආරම්භ කිරීමත් සමගම සේවයෙහි මහත් ප්‍රතිඵලයක් ඔහුට දක්නට ලැබිය.

ඔබගේ ආත්මික දීමනාව කුමක්දැයි සොයා දැනගැනීම ඔබ ඔබ සමග අසහනයට පත්වීමෙන් වලක්වනවා පමණක් නොව ඔබට අනෙක් කිතුනුවන් සමගද අසහනයට පත්වීමෙන්ද වලක්වාලනු ඇත. උදාහරණයක් ලෙස, ඔබගේ සභාපාලකතුමා හොඳ ගුරුවරයෙක් වුවද එතරම් දක්ෂ පරිපාලකවරයෙකු නොවේද කියා ඔබට අවබෝධ විය හැක. ඔහුට ඉගැන්වීමේ දීමනාව තිබෙන නමුත් පරිපාලක දීමනාව නොමැති බව ඔබට වැටහී යාවී. මෙවන් අවස්ථාවකදී ඔහුව විවේචනය කරනු වෙනුවට අවශ්‍ය වනුයේ සභාව කාර්යක්ෂම අයුරින් පවත්වාගෙන යැමට පරිපාලක දීමනාව සහිත කෙනෙකුගේ සහය ඔහුට සපයාදීමය.

## ඔබගේ වගකීම දරාගන්න :

ඔබගේ ආත්මික දීමනාව සොයාගැනීම වැදගත් වනුයේ ඔබට එය "පුබුදුවාලීමට" හා භාවිතා කිරීමට වගකීමක් පවතින බැවිනි. ප්‍රේරිත පාවුල් තිමෝතිට මෙසේ ලිවීය :

**වැඩිමහල්ලන්ගේ අත් තැබීම ඇතුව අනාගතවාක්‍යයෙන් නුඹට දෙනලද නුඹ තුළ තිබෙන දීමනාව ව්‍යවහාර නොකර නොසිටින්න. (1 තිමෝති 4:14)**

**ඒ කාරණය නිසා මාගේ අත් තැබීම කරණකොටගෙන නුඹ තුළ තිබෙන දෙවියන්වහන්සේගේ දීමනාව පුබුදු කරන හැටියට නුඹට සිහිකරවමි. (2 තිමෝති 1:6)**

ඔබගේ වගකීම දැරීම සඳහා ඔබගේ දීමනාව වර්ධනය කර ගැනීම උදෙසා ඔබ සතු දීමනාව සොයා ගත යුතුය. නියම ලෙස ප්‍රමුඛතා යොදාගැනීමෙන් දීමනා කාර්යක්ෂම ලෙස භාවිත කිරීමට තමාගේ ආත්මික දීමනාව දැනගැනීම වැදගත් වේ.

## ඔබගේ ආත්මික දීමනා (ව) සොයා ගැනීම

ඔබගේ ආත්මික දීමනා (ව) සොයා ගැනීම පිණිස පහත සඳහන් උපදෙස් උපකාරී වනු ඇත.

**පළමු පියවර : නැවත - උත්පාදනය ලබාගන්න.**

ඔබ නැවත - උත්පාදනය ලැබිය යුතුය. ස්වාභාවික උපත මගින් ඔබගේ ස්වාභාවික තලෙන්ත බිහිවූවාක් මෙන් ආත්මික උපත තුළින් ආත්මික දීමනා හිමි වේ. ඔබ ස්වාභාවික ලෝකයේ ඉපදුනේ නැත්නම් තලෙන්ත නොලැබෙනු ඇත. එසේම ඔබ ආත්මික ලෝකයට බිහි නොවුවහොත් ආත්මික දීමනා ලැබිය නොහැක.

**පේත්‍රුස් ׃ නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබන්න׃ එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. (ක්‍රියා 2:38)**

**දෙවන පියවර : ශුද්ධාත්ම බව්තීස්මය ලබාගන්න.**

ශුද්ධාත්ම බව්තීස්මය ලබාගත හැකි ක්‍රමය මෙම පාඨමාලාවෙහි හතරවන පරිච්ඡේදයෙහි සඳහන් විය.

**තුන්වන පියවර : ආත්මික දීමනා දැන හඳුනාගන්න.**

පවතින ආත්මික දීමනා මොනවාදැයි ඔබ නොදනී නම්, දෙවියන්වහන්සේ ඔබට දී ඇති දීමනා (ව) කුමක්දැයි ඔබට හඳුනාගත නොහැකි වනු ඇත. ඔබ මෙම පාඨමාලාවෙහිදී ඉගෙන ගත් කරුණු මගින් දෙවියන්වහන්සේ ඇදහිලිවතුනට සපයා ඇති විවිධ දීමනා හඳුනාගැනීමේ හැකියාව ඔබට සපයා ඇත.

**හතරවන පියවර :දීමනා ඇති අයගේ ආදර්ශයන් නිරීක්ෂණය කරන්න.**

ඔබ සතු දීමනාව සොයා යන අතර, විවිධ දීමනාවන් සතු පරිනත ආදර්ශ නිරීක්ෂණය කර බලන්න. “පරිනත ආදර්ශයක්” නම් කිසියම් ඇදහිලිවන්තයෙකු දිගු කාලීනව තමා සතු දීමනා කාර්යක්ෂම ලෙස භාවිතා කරන පුද්ගලයාය.

උදාහරණයක් ලෙස, ඉගැන්වීමේ දීමනාව සතු කෙනෙකු සමග කතාකර බලන්න. ඔවුනට එම දීමනාව තිබෙන බව දැනගත්තේ කෙසේද, එය භාවිතා කිරීමට ආරම්භ කළේ කෙසේද, තමුන්ගේ දීමනාව දියුණු කර ගැනීමට ඔවුන් කළේ කුමක්ද යනාදී කරුණු විමසා දැනගන්න. අනෙකුත් දීමනා සම්බන්ධයෙන්ද එසේම කරන්න. අනෙක් පරිනත ඇදහිලිවතුන් ඔවුන්ගේ දීමනා සොයා ගත් අයුරු දැනගැනීමත්, ඔවුන් එය භාවිතා කරන ක්‍රමය නිරීක්ෂණය කිරීමත් මගින් ඔබට ඔබගේ දීමනාව හඳුනාගැනීමට උපකාරීවේ.

**පස්වන පියවර : ආත්මික දීමනාවක් සොයන්න.**

ඔබ යම් දීමනාවකට ආශා නම් එය ගැන නිරාහාරව සිට යාච්ඤා කරන්න. ආත්මික දීමනාවලට ආශාවන්න කියා බයිබලය අපට පවසයි:

**නුමුත් වඩා උතුම් දීමනා වලට ආශාවෙයල්ලා. තවද ඊටත් වඩා උතුම් මාර්ගයක් මම නුඹලාට පෙන්වමි. (1 කොරින්ති 12:31)**

අප සෑම කෙනෙකු සතුවම අඩු තරමින් එක් දීමනාවක්වත් පවතී. එහෙත් දැනට අප සතුව නොමැති එහෙත් අප ආශාවන දීමනාවක් සෙවිය හැකි බව මෙම පදය සනිටුහන් කරයි.

## හයවන පියවර : අත් තැබීම.

ඔබගේ ආත්මික නායකයා ඔබ මත අත් තබා යාච්ඤා කොට දෙවියන්වහන්සේ ඔබට ඔබගේ ආත්මික දීමනා පෙන්වා දෙන මෙන් ඉල්ලා සිටිය හැකිය.

> **වැඩිමහල්ලන්ගේ අත් තැබීම ඇතුව අනාගතවාක්‍යයෙන් නුඹට දෙනලද නුඹ තුළ තිබෙන දීමනාව ව්‍යවහාර නොකර නොසිටින්න. (1 තිමෝති 4:14)**

සටහන: පියවර එකේ සිට හය දක්වා අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙසට දෙවියන්වහන්සේ ඔබ හට ආත්මික දීමනාව හෙළිකරදී තිබිය හැක. තවමත් මෙය සිදු වූයේ නැත්නම් ඊළඟ පියවර කිහිපය අනුගමනය කරන්න.

## හත්වන පියවර : ඔබගේ ආත්මික ආශාවන් විශ්ලේෂණය කරන්න.

ඔබ සේවය කිරීමේදී වඩාත්ම ප්‍රීතියෙන් යුක්තව නියැලෙන අංශ ඔබට දෙවියන්වහන්සේගේ දීමනා සපයා ඇති අංශ වේ. ස්වාභාවික ලෝකයෙහිදී ඔබ ලබන දීමනාවක් මගින් ඔබ ප්‍රීතියට පත් වෙන්නාක් මෙන් ආත්මික දීමනාද ප්‍රීතිය ගෙන දෙයි. ඔබ කිසියම් සේවා අංශයක් කෙරෙහි දැඩි "ඇල්මක්" හෝ "ලැදියාවක්" (දැඩි ආශාවක්,බරක්) දැක්වීම එම අංශයෙහි සාර්ථකව දෙවියන්වහන්සේට සේවය කිරීමට අවශ්‍යය.

උදාහරණ ලෙස පරිපාලන දීමනාව සහිත පුද්ගලයෙකු හට ඕනෑම කාරණාවක් සංවිධානය කොට මගපෙන්විය හැකිය. ඔහුට සභාවක් පාලනය කළ හැක, ක්‍රිස්තියානි පාසැලක් පාලනය කිරීම, මත් ද්‍රව්‍ය නිවාරණ මධ්‍යස්ථානයක් පරිපාලනය යනාදී සියල්ල කළහැක. ඔහු තම දීමනාව භාවිතා කිරීමට කිසියම් අංශයක් පිළිබඳ ලැදියාවක් හෝ බරක් දැරිය යුතුය. ඔහුට ක්‍රිස්තියානි පාසැලක් පිළිබද ලැදියාවක් නොමැති නම්, ඔහු සතුව පරිපාලන දීමනාව තිබෙන නුමුත් ඔහු එහි වැඩිකල් පවතින්නේ නැත.

ඔබගේ ආත්මික ලැදිකම හෝ උනන්දුව දක්වන බරක් ඇති අංශය සොයා ගැනීමට උපකාරී වන මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයන්න.

1. ඔබ වඩාත්ම ආකර්ෂණය වනුයේ කුමන ආකාර ජන කණ්ඩායමක් වෙතටද?

---

(ඔබව කිසියම් නිශ්චිත ජන කොටසකට කැඳවා ඇත්නම් ඔබගේ ආත්මික දීමනාව ඔවුන්ගේ අවශ්‍යතාවය හා බැඳී පවතී. උදාහරණයක් ලෙස ඔබ දරුවන් වෙතට කැඳවා ඇත්නම් ඔවුන් දෙවියන්වහන්සේ පිළිබඳව අධ්‍යාපනය ලබනු දැකීමට ඔබ සතුටු නම්, ඔබට ඉගැන්වීමේ දීමනාව තිබිය හැක.)

2. ඔබගේ හැඟීම් ඉතාමත්ම දැඩිව ඇවිස්සීමට භාජනය වන්නේ කුමන අවශ්‍යතා සහිත අංශයන් දකිනවිටද?

---

(දෙවියන්වහන්සේ ඔබව කිසියම් අවශ්‍යතාවයක් පිරිමැසීමට කැඳවන විට එම අවශ්‍යතාවය කෙරෙහි ඔබගේ හැඟීම් දැඩි ලෙස කැළඹීමට පත්වේ)

3. ඔබ අසමත් විය නොහැකි නම්, ඔබ ස්වාමින්වහන්සේ උදෙසා ඉටු කිරීමට කැමති දෙය කුමක්ද?

---

(දෙවියන්වහන්සේ පෞද්ගලික ආශාවනට ගරු කරන සේක.)

4. මෙම වාක්‍යය සම්පූර්ණ කරන්න : "මා තුළ වර්ධනය වෙමින් පවතින දැඩි ඒත්තු ගැන්වීම නම් මම සහභාගීවී වැඩ කළ යුත්තේ...".

---

(එවැනි දැඩි ඒත්තුගැන්වීම බොහෝ විට දෙවියන්වහන්සේ ඔබගේ ආත්මයට කතාකොට ඔබ සේවය කළ යුතු ක්ෂේත්‍රය පෙන්වා දීමකි)

5. දෙවියන්වහන්සේ මාව ... සේවා අංගය වෙතට කැඳවා ඇති බව මම දැඩි ලෙස විශ්වාස කරමි.

---

(දෙවියන්වහන්සේ ඔබව කැඳවා ඇති සේවා අංගය ඔබ දනී නම්, ඔබගේ ආත්මික දීමනා හඳුනාගැනීමට පහසු වේ. මන්ද දෙවියන්වහන්සේ ඔබගේ කැඳවීම සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය ආත්මික දීමනා සපයන සේක. මෙම පාඩමෙහි "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසෙහි ඔබට ඔබගේ ආත්මික දීමනාව හඳුනා ගැනීමට සහය වන කරුණු සපයා දෙනු ඇත)

6. ඔබ කුමන දීමනා පිළිබඳ සිතන විට හා භාවිතා කරන විට වඩාත්ම සතුටක් ලැබේවිද?

---

(උදාහරණ ලෙස, ඔබ ඉගැන්වීමේ රස විඳිනවාද? ඔබ ආගන්තුක සත්කාරයට කැමතිද? සෙනඟ ඔබගේ නිවසට එනවාට කැමතිද? ඔබ නිරන්තරයෙන් මුදල් විශාල වශයෙන් දේව සේවයට දීමට පෙළඹෙනවාද?)

**අටවෙනි පියවර : ක්‍රිස්තියානි නායකයෙකු මගින් විශ්ලේෂණය කර බලන්න.**

ඔබගේ ආත්මික හැකියාවන් ක්‍රිස්තියානි නායකයෙකු මගින් විශ්ලේෂණයට භාජනය කර බලන්න. පහත සඳහන් ප්‍රශ්න අසා එයට පිළිතුරු සටහන් කරගන්න.

1. ඔබ දැක ඇති පරිදි මම ක්‍රිස්තියානි සේවයෙහි කුමන අංගවල කාර්යක්ෂමව ක්‍රියා කරනවාද?

---

2. මාගේ කාර්යක්ෂමතාවය නිරීක්ෂණය කිරීමේ පදනම මත, ඔබ සිතන පරිදි මා සතු ආත්මික දීමනා මොනවාද?

---

**නවවෙනි පියවර : ඔබගේ පසුගිය ක්‍රිස්තියානි සේවාවන් විශ්ලේෂණය කර බලන්න.**

ඔබගේ පසුගිය සේවය විශ්ලේෂණය කර බලන්න. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ඔබ මිට පෙර සේවය කර ඇත්තේ ක්‍රිස්තියානි සේවයෙහි කුමන අංග වලද?

---

2. මින් ඔබ සාර්ථක වුයේ කුමන අංග වලදීද?

---

3. ඒ අතරින් සේවයෙහි යෙදිමෙන් වඩාත්ම ප්‍රිතිමත් වුයේ කුමන අංශ වලදිද?

---

4. මේවා අතුරින් ඔබගේ කාර්යක්ෂමතාව ඔබගේ නායකයා/අනෙක් අය දුටුවේ කුමකදිද?

---

**දහවන පියවර : ආත්මික දීමනා ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන්න.**

මෙම පාඩමෙහි අවසාන කොටසෙහි ආත්මික දීමනා පිළිබඳ ප්‍රශ්නාවලි දෙකක් සපයා දී තිබේ. එම ප්‍රශ්නවලට ඔබ සපයන පිළිතුරු මගින් ඔබගේ ආත්මික දීමනා හඳුනාගැනිමට ඔබට උපකාරී වනු ඇත.

**එකොළොස් වන පියවර : ඔබට තිබේයැයි ඔබ සිතන දීමනා හඳුනාගන්න.**

පහත සඳහන් කරුණු මත පදනම් කොට ගෙන ඔබට ඇතැයි ඔබ සිතන දීමනා හඳුනාගන්න.

1. අධ්‍යයනය තුළින් ඔබ ලබා ඇති දීමනා පිළිබඳ දැනුම
2. යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ ඔබට හෙළිකර දී ඇති කරුණු.
3. ඔබම විශ්ලේෂණය කොට සොයා ගත් දෑ.
4. ඔබගේ ජිවිතය පිළිබඳව ප්‍රධාන කිතුණු නායකයෙකු දැක ඇති කරුණු මත.
5. ඔබ මීට පෙර සේවය කර ඇති ක්ෂේත්‍රවල ඔබ ලැබූ කාර්යක්ෂම තත්වය මත.
6. ආත්මික දීමනා ප්‍රශ්නාවලිය සම්පූර්ණ කොට.

දහතුන් වන පියවරෙහිදී දීමනා පිළිබඳ ලැයිස්තුවක් සපයා ඇත. ඔබ සතුව ඇතැයි ඔබ සිතන දීමනා ඉදිරියෙන් සලකුණ යොදන්න.

**දොළොස්වන පියවර : ආත්මික අවශ්‍යතා හඳුනාගන්න.**

ඔබගේ අසල්වැසියන්, ප්‍රජාවෙහි හා සභාවෙහි පවතින ආත්මික අවශ්‍යතා විශ්ලේෂණය කොට බලන්න. මෙම අවශ්‍යතා ලැයිස්තුව පුනරීක්ෂණය කොට බලන්න.

**හමුවීමට යාම :** රෝගින්, සභාවට අළුතින් පැමිණි අය, සභාවේ සාමාජිකයෝ, ආරෝග්‍යශාලා, වැන්දඹුවන්, සිරගෙවල්, මරණයක් විම නිසා දුක්වන්නන්, වැඩිහිටි නිවාස.

**ධර්මදූත ප්‍රචාරක :** ගෙයින් ගෙට, ශුභාරංචි මෙහෙයන්, එළිමහන් රැස්වීම්, ශුභාරංචි රැස්වීම්,

**මුල් උපදෙස් දීමේ සේවා :** අලුතින් පැමිණි අයට.

**උපදේශනය :** පොදු උපදේශනය, විශේෂිත කණ්ඩායම් සඳහා උපදේශනය,, දුරකථනයෙන් උපදෙස් සැපයීම.

**කාර්යාල /පරිපාලන සභය :** පරිඝණක, ලඝු ලේඛණ, චිත්‍ර.. ලිපි ගොනු සැකසීම, නිෂ්පාදනය, ලිපි ලේඛණ, තැපැල් කිරීම, දුරකථන, වාර්තා.

**ආගන්තුක සත්කාර :** සංචාරක : සංචාරක සේවකයන් අනෙකුත් කිතුනුවන්ට හා අවශ්‍ය අයට අවශ්‍ය වූ විට නවාතැන් හා ආහාර පාන සපයා දීම, ඉවුම් පිහුම්.

**දූප්පතුන්ට සේවය :** ආහාර පාන, ඇඳුම්, නිවහන් සපයා දීම.

**සභාවේ ගොඩනැගිලි නඩත්තු කිරීම :** භූමිය සැකසීම, පින්තාරුව, වඩුවැඩ, විදුලිය, ජල නල, පවිත්‍රතාවය.

**සංගීතය :** ගීතිකා කණ්ඩායම, භාණ්ඩ, නමස්කාරය මඟපෙන්වන්නා, විශේෂ සංගීත කණ්ඩායම, තනිව ගායනා කිරීම, සංගීත සැපයීම.

**ආගමික නාට්‍ය නිෂ්පාදනය** ක්‍රිස්තියානි නාට්‍ය ලිවීම හා නිෂ්පාදනය.

**ආර්ථික :** අරමුදල් රැස්කිරීම, ගිණුම්කරණය, සේවාවන් සඳහා මූල්‍යමය සැලසුම්කරණය.

**ලිවීම :** ක්‍රිස්තියානි පොත් පත්, වාරික සඟරා, පත්‍රිකා,ලිපි, කවි, යනාදිය ලිවීම.

**බහු කාර්ය මාධ්‍යයන්** : හඬ පට, රූප පට, රූපවාහිනී, ගුවන් විදුලි, චන්ද්‍රිකා.

**විශේෂ කණ්ඩායම් සඳහා සේවාව** : අන්ධ, ගොළු, බිහිරි, මානසික, රෝගී, මත් පැන්, දුම්වැටි වලට ඇබ්බැහි වූ අය, විදේශික සේවකයන්, කල්ලි, විවාහ නොවූ මව්වරු, සම ලිංගික පුද්ගලයන්, යුදෙව්වන් , සුළු ජාතීන් කණ්ඩායම්. කාන්තා, පුරුෂ, පවුල්, විවාහක යුවල, දූෂණයට ලක් වූ දරුවන්, ඉබාගාතේ ගිය අය, පාසැල් අතරමග හැර ගියවුන්, අධ්‍යාපනයක් නොලද අය, සිරකරුවන්, හමුදාවන්, දරුවන්, යෞවනයන්,වැඩිහිටියන්.

**සභාවේ තනතුරු :** වැඩිමහල්ලා, උපස්ථායකයන්, සබත් පාසැලේ ගුරුවරු, සහකාරක සේවා, පළිගැනීමේ යෙදෙන අය, ගොඩනැගිලි කමිටුව, මූල්‍යමය කමිටුව වැනි කමිටු.

**පරිවර්තනය :** බයිබලය හා ක්‍රිස්තියානි ලිපි ලේඛණ.

**ක්‍රිස්තියානි අධ්‍යාපනය :** සබත් පාසල, නිවාඩු කාලීන බයිබල් පාසැල්, ක්‍රිස්තියානි පෙර පාසැල, ප්‍රාථමික පාසැල්, උසස් අධ්‍යාපනය, විශ්ව විද්‍යාල, ගිහියන් පුහුණු කිරීම,- භාවස්ථයිම් ජාත්‍යන්තර පාඨමාලාව ඇසුරින්, ගෘහ බයිබල් අධ්‍යයනය.

**මිෂනාරී /සභාරෝපන සේවා :** ඔබගේ දේශයෙහි / කලාපයෙහි තවම ශුභාරංචිය ළඟාවී නැති ජන කොටස් වෙත.

**ලිපි-සාහිත්‍යය** : ක්‍රිස්තියානි පුස්තකාල, පොත්හල, බයිබල් හා ලේඛණ බෙදා හැරීම.

**කඳවුරු හා විවේකී කාලයන් සඳහා :**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඔබගේ අසල්වාසි පරිසරයේ ඉටු නොවන අවශ්‍යතා මොනවාද?

______________________________________________________

2. ඔබත් ප්‍රජාවෙහි ඉටු නොවන අවශ්‍යතා මොනවාද?

______________________________________________________

3. ඔබගේ සභාවෙහි ඉටු නොවන අවශ්‍යතා මොනවාද?

______________________________________________________

**දහතුන් වන පියවර : ආත්මික අවශ්‍යතාවයක් සම්පූර්න කරන්න.**

ඔබ මෙතෙක් සම්පූර්ණ කළාවූ අගැයීම් වල නිසි ප්‍රයෝජනය ගත හැක්කේ එම කරුණු ඔබගේ ජීවිතයටත් සේවාවටත් අදාල කර ගැනීමෙන් පමණකි. "අදාළ කරගැනීම" යනු සැබවින්ම යමක් හොඳින් භාවිතා කිරීම හෝ යොදා ගැනීමය.

"දොළොස්වන පියවරෙහිදී" ඔබ සැදූ ආත්මික අවශ්‍යතා ලැයිස්තුව ඔබ හට දෙවියන්වහන්සේ සපයා දී තිබේයැයි ඔබ සිතන දීමනා ලැයිස්තුව හා සංසන්දනය කර බලන්න. ඔබ සතුව ඇති දීමනාවලට ගැලපෙන ආත්මික අවශ්‍යතාවය සපුරාලීමට කැපවීමක් කරන්න. උදාහරණ ලෙස ඔබ සභාවේ ගුරුවරුන්ගේ අවශ්‍යතාවයක් තිබේයැයි ඔබ සිතනවා නම්, ඔබ සතුව ඉගැන්වීමේ දීමනාව තිබේයැයි දනී නම්, ස්වේච්ජාවෙන් ඉදිරිපත්වන්න. ඊළඟ පිටුවෙහි සපයා ඇති පෝරමය භාවිතා කරන්න.

## ආත්මික දීමනා අවශ්‍යතා සමග ගැලපීම.

| පහත සලකුණු කොට ඇති දීමනා මා සතුව ඇතැයි මම විශ්වාස කරමි. | මගේ දීමනාවෙන් සපුරාලිය හැකි අවශ්‍යතාවයන් පවතින ස්ථාන | | |
|---|---|---|---|
| | අසල්වැසි | ප්‍රජාව | සභාව |
| - ප්‍රේරිත | | | |
| - අනාගතවක්තෘ | | | |
| - ධර්මදූත ප්‍රචාරක | | | |
| - සභාපාලක | | | |
| - ගුරුවරයා | | | |
| - අනාගතකීම් | | | |
| - ඉගැන්වීම් | | | |
| - දිරිගැන්වීම් | | | |
| - ප්‍රඥාවේ වචනය | | | |
| - දැනගැන්මේ වචනය | | | |
| - මෙහෙකිරීම | | | |
| - උපකාරකසේවා | | | |
| - නායකත්වය | | | |
| - පරිපාලනය | | | |
| - දීම | | | |
| - දයාව දැක්වීම | | | |
| - ආත්ම විමසීම | | | |

- ඇදහිල්ල ________________________________

- ආගන්තුක සත්කාරය ________________________________

- අන්භාෂා ________________________________

- පරිවර්තනය ________________________________

- භාස්කම් ________________________________

- සුවකිරීම් ________________________________

**දහහතර වන පියවර : ඔබගේ සේවය අගැයීමට ලක්කර බලන්න.**

ඔබගේ දීමනාව සහිත ක්ෂේත්‍රයෙහි ටික කලක් සේවය කර බලා අගැයීමක් කරන්න. ඔබගේ ආත්මික දීමනාවෙහි සැබෑ ගබඩාකරවෙකු වනුයේ පහත සදහන් කාරණා අනුවය.

- ඔබ සේවය කරන ක්ෂේත්‍රයෙහි සඵලවත් වන විට. එහි ප්‍රතිඵලය නම් ඔබ සේවය කරන අංශයෙහි සුභවාදී ප්‍රතිඵල දැකිමය.

- ඔබ තෘප්තිමත් වන විට... ඔබගේ සේවය ඔබට වින්දනයක් ගෙන දේ. ඔබ අසහනයට පත්වනවා නම්, ඔබගේ දීමනාවට ගැලපෙන ක්ෂේත්‍රයෙහි මෙහෙකරනවා නොවිය හැක.

- ඔබට ලැබෙන ප්‍රතිචාර (ඔබගේ ආත්මීත නායකයන්ගෙන් ඔබට ලැබෙන ප්‍රතිචාර) ඔබ හොඳට කාර්යක්ෂමව වැඩ කරන බවට.

ඔබ දැනට යෙදී සිටින සේවාව ඔබගේ ආත්මික හැකියාවනට නොගැලපේ නම් සහ ඔබ සාර්ථක නොවේ නම්, ඔබගේ දීමනා ලැයිස්තුව නැවත බලන්න. ඔබගේ දීමනාවලට ගැලපෙන පරිදි සේවය කිරීමට වෙනයම් ක්ෂේත්‍රයක් ලබාදෙන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

අධෛර්යයට පත් නොවන්න... පළමුවෙන් තමා ධර්මදූත ප්‍රකාශකයෙක් යැයි සිතූ පසුව තමාගේ ඉගැන්වීමේ දීමනාව සොයාගත් මිනිසා මතකනේ ! ඔබට තිබෙන දීමනා දැන සොයා ගැනීම මෙන්ම නැති දීමනා මොනවාදැයි දැන ගැනීමද ඉතා වැදගත්ය. මෙය ඔබ සේවයෙහිදී කාර්යක්ෂම නොවී ඔබගේ කාලය නාස්ති කිරීමෙන් වලකා ලයි. ඔබගේ දීමනා සොයාගෙන, යාච්ඤාවෙන් යුතුව ඉහත ප්‍රායෝගික පියවර උපකාරයෙන් දෙවියන්වහන්සේ ඔබව තබා ඇති සේවයෙහි විශේෂ ස්ථානය ඔබට සොයාගත හැකි වනු ඇත. ඔබ සේවය කිරීමට ආරම්භ කළවිට, ඔබගේ දීමනාවන් ඉක්මනින්ම සොයාගනු ඇත.

## ස්වයං පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. ඔබගේ ආත්මික දීමනාව හඳුනාගැනීම වැදගත්වීමට හේතු පහක් දෙන්න.

3. ඔබගේ ආත්මික දීමනා ඔබට සොයාගැනීමට උපකාරීවන පියවර 14 නම් කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යනය සඳහා.

1. දෙවියන්වහන්සේ සැමවිටම ඔබගේ ආත්මික කැඳවීම සම්පූර්ණ කිරීමට අවශ්‍ය දීමනා සපයන සේක. ඔබට කැඳවීමක් ඇති බව දැනගන්නේ කෙසේද? මෝසෙස්ගේ කැඳවීමෙහි දැකිය හැකි පහත සඳහන් රටාව අධ්‍යයනය කරන්න.

## දෙවියන්වහන්සේ මගපෙන්වීම සපයනසේක:

නික්මයාම 3:1-4 කියවන්න. දෙවියන්වහන්සේගේ කැඳවීම හඳුනා ගැනීමට පළමුවන ප්‍රතිපත්තිය නම් දෙවියන්වහන්සේ මුලින් ක්‍රියා කරන බව වටහාගැනීමය. උන්වහන්සේ ඔබගෙන් අපේක්ෂාකරන දෙය කුමක්ද කියා ඔබට පැවසීමේ වගකීම එතුමා සතුය.

ඔබ දෙවියන්වහන්සේ උදෙසා කුමක් කළ යුතුද කියා සෙවීමට අසහනයෙන් එහා මෙහා දිවීම අවශ්‍ය නොවේ. ඔබ කළ යුතු කුමක්ද කියා දැනගැනීමට ඔබගේ යහළුවන්ගෙන් අදහස් විමසීමට ඡන්දයක් පැවැත්විය යුතු නැත. දෙවියන්වහන්සේගේ වගකීම වනුයේ ඔබගෙන් එතුමා අපේක්ෂා කරන දෙය එනම් කැඳවීම පැහැදිලිව ඔබට ප්‍රකාශ කිරීමය. ඔබගේ වගකීම වනුයේ එතුමා වරක් එය ඔබට පැවසූ පසුව එය ඉටු කිරීමය. දෙවියන්වහන්සේගේ සත්‍ය කැඳවීම නම් ඔබ කිරීමට තිරණය කරන දෙයක් හෝ අනෙක් අය ඔබ කළ යුතුයයි සිතන දෙය නොවේ.

## ඔබට බරක් ඇතිවේවි.

මෝසෙස්ගේ හදවත තුළ තම ජනතාව වන ඉශ්‍රායෙල් පිළිබඳ මහත් බරක් වසර ගණනාවන සිට පැවතිය. ඔහුට මේ පිළිබඳව කෙතරම් දැඩි ලෙස දැනුනාද යත් මිසර ජාතිකයෙකු පවා මැරීය. එනිසා ඔහුට වනාන්තරයට යාමට සිදුවිය (නික්මයාම 2:11-15). දෙවියන්වහන්සේ විසින් ඔබව කිසියම් සේවාවක් සඳහා කැඳවූ කල ඔබ තුළ එම ක්ෂේත්‍රය පිළිබඳ ගැඹුරු, දැඩි, උනන්දුවක්, සැලකිමක්, දයානුකම්පාවක්, බරක් දැනෙනු ඇත.

## ඔබහට දෙවියන්වහන්සේ විසින් දෙන ලද සැලසුමක් ලැබේවි.

දෙවියන්වහන්සේ ඔබහට දී ඇති කැඳවීම සම්පූර්ණ කිරීමට, බරක්, සැලකිමක්, ආශාවක්, දයානුකම්පාවක් තිබූ පමණින් එය ඉටු නොවේ. දෙවියන්වහන්සේ ඔබහට සපයා ඇති බර හා යා යුතු දිශාව මෙන්ම උන්වහන්සේ ඔබට එම කැඳවීම සැපිරීමට සැලසුමක්ද සපයනු ඇත.

බොහෝ මනුෂ්‍යයෝ අසමත් වන ස්ථානය එයයි. ඔව්හු දෙවියන්වහන්සේගෙන් කැඳවීමක් ලබති, සිතෙහි බරක් ඇතිවේ, නුමුත් දෙවියන්වහන්සේ ඔවුනට සැලසුම පවසන තෙක් බලා නොසිට එම සේවය කඩිනමින් ඉටු කිරීමට ඔව්හු දුවති.

දෙවියන්වහන්සේ මෝසෙස්ට සැලසුමක් දුන්සේක. ඔහු ආරොන් සමග පාරාවෝ ඉදිරිපිට පෙනී සිට ඉශ්‍රායෙල්වරු මුදා ගැනීමට තිබුනි. ඉන්පසු ඔව්හු ජනතාව වනාන්තරය ඔස්සේ රැගෙන විත් දෙවියන්වහන්සේ ඔවුනට පොරොන්දු වූ දේශයට මගපෙන්විය යුතු විය. දෙවියන්වහන්සේ ඔබට කැඳවීමක් සහ බරක් දුන් විට ඔබගේ මෙහෙය සම්පූර්ණ කිරීම සඳහා එතුමා සපයන සැලසුම ලැබෙන තුරු ඉවසීමෙන් බලා සිටින්න.

## ඔබට එය කළ නොහැකි බවට හැඟියයි.

නික්මයාම 3:8 හි තමා නුසුදුසු යයි මෝසෙස්ට දැනුනාවූ හැඟීම ඔබට හොඳින් දැක ගත හැකිය. "පාරාවෝ වෙතට යාමටත්, ඉශ්‍රායෙල් පුත්‍රයන්ව මිසරයෙන් පිටතට ගෙන එන්ටත් මම කවුද?" යැයි මෝසෙස් පැවසිය.

ඔබට දෙවියන්වහන්සේගෙන් සත්‍ය වූ කැඳවීමක් ලැබූ කල සැමවිටම ඔබ එයට සුදුසු මදි යැයි හැඟෙනු ඇත. (ඔබට කිසියම් කාර්යයක් කිරීමට පහසුවෙන්ම හැකියයි ස්වයං - විශ්වාසයක් ඇත්නම් ...ප්‍රවේශම්වන්න...එය සැබෑ දේව කැඳවීමක් නොවීමට ඉඩ ඇත!). දෙවියන්වහන්සේ ඔබට කැඳවූ විට, ඔබ දුබල බවත්, සුදුසු මදි බවත්, අවශ්‍යතාවයන් ඇති බවත් දැනේවි. ඔබ එතුමා

කැඳවූ කාරණය කිරීමට තරම් සුදුසුකම් මදියයි හැඟේවී. එසේම ඔබට ලැබී ඇති අභියෝගයෙන් මවිතයට පත්වේවි.

එසේ නම් ඔබ සිටිනුයේ හොඳ සමාගමකය ! ලොව පුරා ශ්‍රේෂ්ඨ පුරුෂයන්ට හා කාන්තාවන්ට, මෙලෙස හැඟීම් වලට ලක් වී ඇත. තමුන්ගේ නුසුදුසු කම් මධ්‍යයේ තමුන්ගේ කැඳවීම ඉටුකළාවූ අය තමුන් සුදුසු නොවූවත් දෙවියන්වහන්සේ සෑහෙන බව විශ්වාස කලෝය. දෙවියන්වහන්සේ මෝසෙස්ට නික්මයාම 3:12 න් පිළිතුරු දුන්සේක. "සැබවින්ම මම ඔබ සමග සිටිමි" දෙවියන්වහන්සේ සොයන්නේ සර්ව සම්පූර්ණ අය නොවේ, වැදගත් වන්නේ ඔබ කවුද යන කරුණ නොව දෙවියන්වහන්සේ කවුද යන කරුණය !

2. බයිබලයෙහි සඳහන් අනෙකුත් පුද්ගලයන් පිළිබඳව අධ්‍යයනය කරන්න. ඒ සැම අය සඳහා දේව කැඳවීමේ රටාව එකම බව ඔබට පෙනී යාවී. උදාහරණ ලෙස විනිශ්චය 6 හි සඳහන් ගිඩියොන්ගේ කැඳවීම හා යෙරමියා 1 හි යෙරමියාගේ කැඳවීම කියවා බලන්න.

3. පහත සඳහන් සෝදිසි කිරීමේ ලැයිස්තුව ඔබහට මෙම පරිච්ඡේදයෙහිදී ඉගෙන ගත් ඔබගේ ආත්මික දීමනා හඳුනාගැනීමට ප්‍රායෝගික පියවර ඉටු කිරීමට සහය වනු ඇත.

පළමු පියවර : ______මම නැවත - උත්පාදනය ලබා ඇත්තෙමි.

දෙවන පියවර : ______මම ශුද්ධාත්ම බව්තිස්මය ලබා ඇත්තෙමි.

තුන්වන පියවර : ______මා හට විවිධ ආත්මික දීමනා හඳුනාගතහැක.

හතරවන පියවර : ______මම ආත්මික දීමනා පරිහරණය කරන පරිනත කිතුනුවන්ගේ ආදර්ශ නිරීක්ෂණය කර ඇත්තෙමි.

පස්වන පියවර : ______මම යාච්ඥාවෙන් හා නිරාහාරයෙන් යුතුව ආත්මික දීමනාවක් සොයා ඇත්තෙමි.

හයවන පියවර : ______මගේ ආත්මික නායකයන් මා පිට අත් තබා මගේ දීමනා(ව) එළිකරදෙන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා ඇත්තෙමි.

හත්වන පියවර : ______මම මගේ ආත්මික ඇල්ම විශ්ලේෂණය කර බලා ඇත්තෙමි.

අටවන පියවර : ______මාව මගේ ආත්මික නායකයා විශ්ලේෂණය කර ඇත.

නව වන පියවර : ______මම මගේ පසුගිය ක්‍රිස්තියානි සේවාව විශ්ලේෂණය කොට බැලුවෙමි.

දහවන පියවර : ______මම ආත්මික දීමනා ප්‍රශ්නමාලාව සම්පූර්ණ කළෙමි.

එකොළොස්වන පියවර : ______මා හට තිබේයයි මම විශ්වාස කරන ආත්මික දීමනා මම හඳුනාගෙන ඇත්තෙමි.

දොළොස්වන පියවර : ______මම මාගේ නිවසෙහි, ප්‍රජාවෙහි හා සභාවෙහි පවතින ආත්මික අවශ්‍යතා හඳුනාගෙන ඇත්තෙමි.

දහතුන්වන පියවර : ______මම මාගේ දීමනාව, අවශ්‍යතාවයක් සමග ගලපා එය ඉටු කිරීමට අරඹා ඇත්තෙමි.

දහ හතර වන පියවර : ______මම එම ක්ෂේත්‍රයෙහි මගේ සේවය අගැයීමට ලක් කොට, එය සාර්ථක බව සොයා ගතිමි.

## ආත්මික දීමනා ප්‍රශ්නාවලිය.

ප්‍රශ්නාවලි වර්ග දෙකක් ඇත. එකක් විශේෂ දීමනා වන ප්‍රේරිත, අනාගතවක්තෘ, ධර්මදූත ප්‍රචාරක, සභාපාලක, ගුරුවරු යන කාණ්ඩ සඳහාය. දෙවන ප්‍රශ්නාවලිය ඉතිරි ආත්මික දීමනා සදහාය, මෙම ප්‍රශ්නාවලි දෙකටම පිළිතුරු සැපයීම එක ආකාරයටම සිදුවේ. එනම් ප්‍රශ්නයට "ඔව්" හෝ "නැත" යන කොටුවල සකුණු යෙදීමෙනි.

### උදාහරණයක් :

ඔව්    නැත

(X)    ( )    1. දෙවියන්වහන්සේ ඔබව නායකත්වයේ ස්ථානයකට කැඳවන බව විශ්වාස කරනවාද?

# විශේෂ දීමනා

## විශේෂ දීමනා ප්‍රශ්නාවලිය.

මෙම "විශේෂ දීමනා" ප්‍රශ්නාවලිය සකසා ඇත්තේ ඔබ තුළ විශේෂ දීමනා (ප්‍රේරිත, අනාගතවක්තෘ, ධර්මදූත, සභාපාලක හා ගුරුවරු) ඇති පුද්ගලයන්ගේ ඇති සුදුසුකම්, චරිත ගුණාංග, ආශාවන් හා ජීවිත රටාවන් පවතිදැයි ඔබට සොයා ගැනීමට උපකාර කිරීමටය. මෙම විභාගය උපකාරයක් මිස නිගමනයකට ඒමට මිනුම් දණ්ඩක් නොවේ. ඔබ ඉතා ප්‍රවේසමෙන් ඔබ තුළ දෙවියන්වහන්සේගේ කැඳවීම අභ්‍යන්තරයෙන් අගැයීමකට ලක් කළ යුතුය. ඔබගේ දීමනාව නොකඩවා සහ කාර්යක්ෂම අයුරින් භාවිතා කිරීම සොයා බලන්න. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට අයත් අනෙක් සාමාජිකයන් මගින් එම දීමනාව සනාථ විය යුතුය.

**ඔව් නැත**

( ) ( ) 1. දෙවියන්වහන්සේ ඔබව නායකත්වයේ තැනකට කැඳවන බව ඔබ විශ්වාස කරනවාද?

( ) ( ) 2. ඔබ කවදාහෝ මිෂනාරී වරයෙකු වීමට ආශා වී තිබෙනවාද?

( ) ( ) 3. දෙවියන්වහන්සේ ඔබහට ප්‍රසිද්ධියේ කතාකිරීමට හැකියාව දී ඇතැයි ඔබ විශ්වාස කරනවාද?

( ) ( ) 4. නොඇදහිලිවතුනට සාක්ෂි දැරීමට ඔබ තුළ මහත් ආශාවක් පවතීද?

( ) ( ) 5. ඔබ බයිබල් අධ්‍යයනයෙහි කාලය ගත කිරීම රස විඳිනවාද?

( ) ( ) 6. ඔබ තුළ සම්පූර්ණ කාලීනව දේව වචනයෙහි මෙහෙ කිරීමට දැඩි ආශාවක් දිගටම පවතීද?

( ) ( ) 7. ඔබ ඉක්මනට තැනින් තැනට මාරු වී යාම ප්‍රියකරනවාද?

( ) ( ) 8. විශාල සෙනගක් ඉදිරියේ කතාකිරීමට ඔබට හැකියාව ඇතැයි හැඟෙනවාද?

( ) ( ) 9. කිතුනුවනට ඉගැන්වීමට හා පුහුණු කිරීමට වඩා නොඇදහිලිවන්තයනට ශුභාරංචිය ප්‍රකාශ කිරීම ඔබ ප්‍රිය කරනවාද?

( ) ( ) 10. ඔබ අළුත් ප්‍රස්තාවන් සහිත තැනකට මාරුවී නොගොස් ඔබගේ ප්‍රාදේශිය සභාවෙහිම වැඩ කරමින් සිටීමට වඩා කැමතිද?

( ) ( ) 11. ඔබගේ විවාහය සහ පවුල් පසුබිම අන් අයට අනුගමනය කිරීමට යහපත් ආදර්ශයක් වේයැයි ඔබ විශ්වාස කරනවාද?

( ) ( ) 12. සභාව උදෙසා නායකයන් බිහි කිරීමට ඔබට දීමනාවක් ඇතැයි ඔබ සිතනවාද?

( ) ( ) 13. ඔබ කිසියම් අකටයුත්තක් හෝ වැරදි තත්වයක් දුටු විට ඒවා නිවැරදි කිරීමට දායක වීමට ඔබට ආශාවක් ඇතිවේද?.

( ) ( ) 14. නොඇදහිලිවතුනට සාක්ෂි දැරීම ඔබට පහසු කාර්යයක්ද?

( ) ( ) 15. ඔබ එතරම් හොඳින් නොදන්නා පුද්ගලයන් සමග පහසුවෙන් මිතුදම් ඇතිකර ගැනීමට සමත්ද?

( ) ( ) 16. ඔබව හොඳින් දන්නා අනෙක් මනුෂ්‍යයෝ ඔබව ඉතා ඉවසිලිවන්ත සහ

කාරුණික පුද්ගලයෙකු ලෙස විස්තර කර දේවිද?

( ) ( ) 17. ඔබ කිසියම් අවස්ථාවක ස්වාමීන්වහන්සේ උදෙසා සේවයක් අරඹා එය වර්ධනය කොට, අනෙක් අයව ඔබ කරන දෙය කිරීමට පුහුණු කොට තිබේද?

( ) ( ) 18. අවශ්‍ය ස්ථාවනවලදී මනුෂ්‍යයන්ට නිර්භීතව දේව වචනය ප්‍රකාශ කිරීමට ඔබ තුළ නිරන්තර ආශාවක් ආත්මයට හැඟෙනවාද?

( ) ( ) 19. ඔබ වගකීම නිසා හෝ රාජකාරිය නිසා නොව, ඔබගේම ආශාවට මිනිසුන්ට ශුභාරංචිය ප්‍රකාශ කරනවාද?

( ) ( ) 20. මනුෂ්‍යයන්ගේ පෞද්ගලික ප්‍රශ්න, ගැටලු, අමාරුකම් දුටු විට තව කෙනෙක් එයට විසඳුම් සෙවීමට ඉඩ නැර ඔබ එම පුද්ගලයන් සමග ක්‍රියා කිරීමට ආශාවක් දක්වනවාද?

( ) ( ) 21. ඔබ ඔබවම හොඳට හික්මවුනු විනය ගරුක කෙනෙකු ලෙස හඳුන්වා දෙනවාද?

( ) ( ) 22. ඔබට වෙනත් රටක වෙනත් සංස්කෘතියක ගොස් ජීවත්වීම පහසු යැයි සිතෙනවාද?

( ) ( ) 23. ඔබ දේව වචනය මනුෂ්‍යයන්ට කතාකරන විට, මනුෂ්‍යයන්ට කාරණා ඒත්තු ගැන්වෙන බව වෙන පුද්ගලයෝ ඔබට පවසා තිබේද?

( ) ( ) 24. කවුරු හරි ඔබ ශුභාරංචි ප්‍රකාශකිරීමට දීමනාවක් ඇති කෙනෙකු බව ඔබට පවසා තිබේද?

( ) ( ) 25. නිතිපතා නොකඩවා සියලු මට්ටම්වල කිතුණුවන්ට ඉගැන්වීමේ සේවාවකට ඔබ දායකවීමට ආසයිද?

( ) ( ) 26. ඔබ ආගන්තුක සත්කාරයට ලැදි කෙනෙකු ලෙස ඔබව හඳුන්වන්න කැමතිද? ඔබගේ නිවසට සෙනග එන යන එක ඔබ රස විඳිනවාද?

( ) ( ) 27. අපහසුකම් මැද, වෙනස්කම් මැද, අමාරුකමින් ජීවත්වීම ඔබට එතරම් අමාරුකාර්යයක් නොවේ යැයි ඔබ සිතනවාද?

( ) ( ) 28. අවශ්‍යතාවයෙන් පෙළෙන මනුෂ්‍යයන් හට දේව වචනය බෙදා ගැනිමට කෙනෙකු ඔබට ආරාධනා කරන තුරු නොසිට බලෙන්ම වාගේ වචනය බෙදා ගැනිමට පෙළඹෙනවාද?

( ) ( ) 29. මනුෂ්‍යයන්ට ඉගැන්වීමට හා පුහුණු කිරීමට වඩා ක්‍රිස්තුස්වහන්සේ වෙතට ඔවුන්ව දිනාගැනීමට ඔබ තුළ මහත් ඇල්මක් පෙන්නුම් වේද?

( ) ( ) 30. ඇදහිලිවතුනට ඔවුන්ගේ ආත්මික දීමනා සොයාගෙන, ඉතා හොඳින් ස්වාමීන්වහන්සේට සේවය කිරීම සඳහා ඔවුන්ව පුහුණු කිරීමට ඔබ සතු බරක් හැඟේද?

( ) ( ) 31. මුදල් අවශ්‍යතා හා සීමිත ආදායමක් තිබියදී පවා වැඩිපුර මුදල් සෙවීමට ලොල් නොවී, චිත්ත පීඩාවෙන් තොරව ජීවත්විය හැකි ආකාරයේ පුද්ගලයෙක්ද?

( ) ( ) 32. වෙන රටකට හෝ සංස්කෘතියකට යාමට හැකි පරිදි ඔබ දැනට පවුල් වගකීමෙන් හා ආර්ථික වගකීමෙන් මිදුනාවූ නිදහස් පුද්ගලයෙක්ද?

( ) ( ) 33. ඔබ පෞද්ගලික කතා බහට වඩා සමූහයකට කතාකිරීමට පෙලඹෙන පුද්ගලයෙක්ද?

( ) ( ) 34. ඔබ නිතරම වෙන කෙනෙකුට ශුභාරංචිය දීමට අවස්ථාව සොයමින් එහි නිරතවන පුද්ගලයෙක්ද?

( ) ( ) 35. ඔබ බයිබලයෙහි කරුණු සෙවීමට දිගු කාලයක් වැය කරන, එවැනි අධ්‍යයනයට රුචි කෙනෙක්ද? ඒ පිළිබඳව ඔබට පහසුවක් දැනේද?

( ) ( ) 36. ඔබ වසර තුනකට වඩා කිතු බැතියෙකුව සිටිනවාද?

( ) ( ) 37. ඔබ මනුෂ්‍යයන්ව ක්‍රිස්තුස්වහන්සේ වෙතට දිනාගෙන ඔවුන්ව සභා පාලකවරුන් බවට පුහුනු කිරීමේ හැකියාව ඇතැයි විශ්වාස කරනවාද?

( ) ( ) 38. ඔබ දේව වචනය කතා කරනු ඇසීමට මනුෂ්‍යයෝ කණ්ඩායම් වශයෙන් සෑදී සිට කතා කිරීමට කියා පැවසූ අත්දැකීම් ලබා තිබේද?

( ) ( ) 39. නොඇදහිලිවන්තයෙකුට අද දින මට ශුභාරංචිය බෙදාගැනීමට අවස්ථාව ලැබේවායි අපේක්ෂාවෙන් ඔබ සෑම දිනකම අවදිවෙනවාද?

( ) ( ) 40. ඔබ හොඳ ගුරුවරයෙකු හෝ පාලකවරයෙකු වේවියැයි කවුරුන් හෝ ඔබට පවසා තිබේද?

( ) ( ) 41. ඔබහට පවුලක් හෝ ව්‍යාපාරයක් කළමණාකරණය කිරීමේ වගකීම පැවරී තිබේද? අනෙක් අය ඔබගේ වැඩකටයුතු සාර්ථක යැයි පවසා තිබේද?

( ) ( ) 42. ඔබට පහසුවෙන් අමුත්තන් සමග මිත්‍රවීමටත් දැනහැඳින ගැනීමටත් හැකියාව තිබේද?

( ) ( ) 43. ඔබ නිරන්තරයෙන්ම සදාචාරාත්මක කාරණා පිළිබඳව සැලකිලිමත් වී වැරැද්දට එරෙහිව කතා කිරීමට පෙළඹෙනවාද?

( ) ( ) 44. ඔබ නිරන්තරයෙන් නොඇදහිලිවන්තයන් සමග යේසුස්වහන්සේ පිළිබඳවත් එතුමාගේ ක්‍රියා පිළිබඳවත් කතා බහ කරනවාද?

( ) ( ) 45. ඔබහට දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් සමගත් ඔවුන්ගේ ගැටලු සම්බන්ධවත් සුබදායි මෙන්ම ප්‍රේමණීය අයුරින් ක්‍රියා කිරීමට හැකියාව ලබා දී ඇතැයි විශ්වාසකරනවාද?

( ) ( ) 46. සභාවේ අනෙක් ඇදහිලිවන්තයෝ ඔබ සභාවට දීමනාවක් වන නායකයෙකු යැයි පවසා තිබේද?

( ) ( ) 47. නායකත්ව හැකියාවන් පෙන්වන අය වෙත වගකීම් පවරා දීම ඔබට පහසුවෙන් කළ හැකිද?

( ) ( ) 48. අන් අය ඔබව සාර්ථක කථිකයෙක් ලෙසට හඳුන්වා දේවිද?

( ) ( ) 49. ගැළවීම නොලද අය ගැලවීම ලැබීම පිණිස ඔබ සතුව පවතින බර කොතරම් දැයි කිවහොත් ඔබ කියන කරන හැම දෙයක්ම ඒ අනුව පාලනය වෙනවායැයි ඔබට පැවසිය හැකිද?

( ) ( ) 50. කිසියම් ජන කොටසක සියලුම ආත්මික අවශ්‍යතා පිළිබඳ රැකබලාගැනීමට ඔබට වගකීම දරන්නට සිදුවුවහොත් ඔබ එය සතුටින් කරාවිද?

## විශේෂ දීමනා ලකුණු පත්‍රය.

ඔබ ප්‍රශ්නාවලියට පිළිතුරු සපයා අවසන් කළ පසුව, ඊළඟ පිටුවද සම්පූර්ණ කරන්න. ඔබ "ඔව්" යැයි පිළිතුරු දුන් සෑම ප්‍රශ්නයකටම අදාල අංකය ඉදිරියෙන් X සලකුණක් යොදන්න. "නැත" පිළිතුර සටහන් නොකරන්න. ඔබ "ඔව්" පිළිතුරු දුන් ප්‍රශ්න අංක පමණක් සලකුණු කරන්න.

**උදාහරණ පහතින් දැක්වේ:** මෙම පුද්ගලයා ප්‍රශ්න 1,6,13 සඳහා "ඔව්" පිළිතුර දුනි. එනිසා ඔහු එම අංක ඉදිරියෙන් සලකුණු යොදයි.

### පොදු සුදුසුකම්

| (විශේෂ දීමනා හතර වර්ගයටම අදාළ වේ) | අනාගතවකතෘ (දේශක) |
|---|---|
| ( X ) #1 | (   ) #3 |
| ( X ) #6 | (   ) #8 |
| (   ) #11 | ( X ) #13 |

ඔහු 11, 3, 8 ප්‍රශ්න වලට "නැත" පිළිතුර සැපයිය. එනිසා එම අංක ඉදිරියේ සලකුණු යොදන්නේ නැත. දැන් ඔබගේ ලකුණු මට්ටම් සටහන් කරන්න.

| පොදු සුදුසුකම් (විශේෂ දීමනා ඇති පුද්ගල කාණ්ඩ 4 ටම අදාළ වේ.) | අනාගතවක්තෘ (දේශක) |
|---|---|
| ( ) #1 | ( ) #3 |
| ( ) #6 | ( ) #8 |
| ( ) #11 | ( ) #13 |
| ( ) #16 | ( ) #18 |
| ( ) #21 | ( ) #23 |
| ( ) #26 | ( ) #28 |
| ( ) #31 | ( ) #33 |
| ( ) #36 | ( ) #38 |
| ( ) #41 | ( ) #43 |
| ( ) #46 | ( ) #48 |

| ප්‍රේරිත (මිෂනාරි) | ශුභාරංචි ප්‍රකාශක | සභාපාලක ගුරුවරයා |
|---|---|---|
| ( ) #2 | ( ) #4 | ( ) #5 |
| ( ) #7 | ( ) #9 | ( ) #10 |
| ( ) #12 | ( ) #14 | ( ) #15 |
| ( ) #17 | ( ) #19 | ( ) #20 |
| ( ) #22 | ( ) #24 | ( ) #25 |
| ( ) #27 | ( ) #29 | ( ) #30 |
| ( ) #32 | ( ) #34 | ( ) #35 |
| ( ) #37 | ( ) #39 | ( ) #40 |
| ( ) #42 | ( ) #44 | ( ) #45 |
| ( ) #47 | ( ) #49 | ( ) #50 |

## විශේෂ දීමනා ආකෘතිය :


පෙර පිටුවේ ලකුණු සටහන් ඇසුරින් විශේෂ දීමනා ආකෘතිය සම්පූර්ණ කරන්න. එක් එක් දීමනාව යටතේ ඔබ සලකුණු කොට ඇති සංඛ්‍යාව ගණන්කරන්න. (ඔබ සලකුණු කොට ඇත්තේ "ඔව්" අංක පමණකි). ආකෘති සටහනෙහි නියමිත සංඛ්‍යාව සලකුණු කරන්න.

**උදාහරණයක් මෙන්න :** යම් පුද්ගලයෙකුගේ ලකුණු පත්‍රය මෙසේය.

| පොදු සුදුසුකම් | අනාගතවක්තෘ (දේශක) |
|---|---|
| ( ) #1 | ( ) #3 |
| (X) #6 | ( ) #8 |
| ( ) #11 | ( ) #13 |
| ( ) #16 | (X) #18 |
| (X) #21 | ( ) #23 |
| (X) #26 | ( ) #28 |
| (X) #31 | (X) #33 |
| ( ) #36 | ( ) #38 |
| ( ) #41 | (X) #43 |
| ( ) #46 | (X) #48 |

| ප්‍රේරිත (මිෂනාරි) | ශුභාරංචි ප්‍රකාශක | සභාපාලක ගුරුවරයා |
|---|---|---|
| ( ) #2 | (X) #4 | (X) #5 |
| (X) #7 | (X) #9 | ( ) #10 |
| (X) #12 | (X) #14 | ( ) #15 |
| ( ) #17 | (X) #19 | (X) #20 |
| (X) #22 | (X) #24 | ( ) #25 |
| ( ) #27 | ( ) #29 | ( ) #30 |
| (X) #32 | (X) #34 | ( ) #35 |
| (X) #37 | (X) #39 | ( ) #40 |
| ( ) #42 | (X) #44 | ( ) #45 |
| ( ) #47 | (X) #49 | ( ) #50 |

**වගුව සම්පූර්ණ කළ ආකාරය.**




දැන් ඔබගේ ලකුණු පත්‍රය ඇසුරින් ඔබගේ විශේෂ දීමනා ආකෘතිය සම්පූර්ණ කරන්න.

**විශේෂ දීමනා ආකෘතිය**

පොදු ______________________________

ප්‍රේරිත ______________________________

අනාගතවක්තෘ ______________________________

ශුභාරංචි ප්‍රකාශක ______________________________

සභාපාලක/ගුරුවරයා ______________________________

1 2 3 4 5 6 7 8 9 10

දිගම රේඛාව ඔබගේ වැඩිම ලකුණු ප්‍රමාණයයි.

කෙටි රේඛාව ඔබගේ අඩුම ලකුණු ප්‍රමාණයයි.

# ආත්මික දීමනා.

## ආත්මික දීමනා ප්‍රශ්නාවලිය.

ඔව් නැත

( ) ( ) 1. ඔබ සාර්ථක මහජන කථිකයෙක් යැයි ඔබ විස්තර කරනවාද?

( ) ( ) 2. බයිබල් අධ්‍යයනය හා සමීක්ෂණය ගැඹුරු ලෙස කිරීමට ඔබ කැමතිද? එසේ කිරීම භුක්ති විඳිනවාද?

( ) ( ) 3. ඔබ මනුෂ්‍යයන්ගේ පෞද්ගලික හා මානසික ගැටලු බෙදා හදා ගැනීම භුක්ති විඳිනවාද?

( ) ( ) 4. දේව වචනයෙහි සරල අවබෝධයට වඩා එහි අදාළ කරගැනීමට ඔබ සැලකිලිමත් වෙනවාද?

( ) ( ) 5. දෙවියන්වහන්සේ ඔබට දේව වචනය ඉගෙනීමටත් දැනුම ලබාගැනීමටත් විශේෂ හැකියාවක් දී ඇතැයි ඔබට දැනෙනවාද?

( ) ( ) 6. අනෙක් අයව විවිධ සේවාවන් වෙතට යොමු කිරීමට පෙලඹවීමට ඔබ ප්‍රිය කරනවාද?

( ) ( ) 7. අනෙක් අය ඔබව ඉතා පහසුවෙන් තීරණ ගත හැකි කෙනෙකු ලෙස හඳුන්වා දේවිද?

( ) ( ) 8. ඔබ කළයුතු අවශ්‍ය ප්‍රායෝගික දෙය ඉටු කිරීම මිස එය කළයුතු මන්දැයි යන කරුණ කෙරෙහි එතරම් සැලකීමක් නොකරයිද?

( ) ( ) 9. කිසියම් අවශ්‍යතාවයකින් පෙළෙන කෙනෙකු පිළිබඳව ඔබට අසන්නට ලැබුන විට, ඔබ ක්ෂණයකින්ම ඔබගේ සහය සපයනවාද?

( ) ( ) 10. ඔබ කිසියම් කය වෙහෙසා මහන්සි වී කරන වැඩකට වඩා උපකාරයක් ලෙස මුදල් දීමට කැමති කෙනෙක්ද?

( ) ( ) 11. රෝගාතුරව හෝ ආබාධිතව සිටින පුද්ගලයන් බැලීමට යාමට ඔබ ප්‍රියකරනවාද?

( ) ( ) 12. ඔබගේ නිවස බොහෝ අයට සුව පහසුව සපයන, ඔබට කලින් නොදන්වා ඔබව බැලීමට සෙනග එන යන තැනක්ද?

( ) ( ) 13. අනෙක් ඇදහිලිවන්තයන්ට පිලිගත නොහැකි වූ කාරනා විශ්වාස කිරීමට විශේෂ හැකියාවක් ඔබ සතු වේයැයි ඔබ සිතනවාද?

( ) ( ) 14. ඔබ සැමවිටම හරි දේත් වැරදි දේත් කුමක් දැයි දැනගත හැකි කෙනෙකු බව ඔබට වෙනකවුරු හෝ පවසා තිබෙනවාද?

( ) ( ) 15. කිසියම් සිද්ධියක් නිවැරදි නොවේ නම්, එය නිවැරදි කිරීමට ඔබ කතා කළ යුතුයයි ඔබට බරක් දැනෙනවාද?

( ) ( ) 16. ඔබ කිසියම් කාරණා හෝ ගැටලු සහගත තත්ව ඔප්පු කිරීමටත් පිළිතුරු සැපයීමටත් කැමතිද?

( ) ( ) 17. මනුෂ්‍යයෝ ඔවුන්ගේ පෞද්ගලික ගැටලුවලට උපදෙස් ලබා ගැනීමට ඔබගෙන් විමසන බව ඔබට පෙනී ගොස් තිබේද?

( ) ( ) 18. කිසියම් අවස්ථාවකදී කළ යුතු කුමක්දැයි අනෙක් අය නොදන්නා විට ඔබ ක්ෂණිකවම ඒ සඳහා කළයුතු දෙය දන්නා බව ඔබට වැටහී තිබේද?

( ) ( ) 19. බොහෝ මනුෂ්‍යයෝ බයිබලය සම්බන්ධ ප්‍රශ්න ගැටලු ඔබ වෙත ගෙනැවිත් ඔබගේ අවබෝධය කුමක් දැයි නිරන්තරයෙන් විමසන බව ඔබට පෙනී ගොස් තිබේද?

( ) ( ) 20. ඔබ ඇදහිලිවන්තයෙකු ලෙසට ඔබගේ ජීවිතය හා සේවය උදෙසා ඉලක්ක හා අරමුණු තබාගන්නවාද?

( ) ( ) 21. අනෙක් අය උදෙසා ඔබට සැහෙන පමණ තීරණ ගැනීමට සිදුවෙනවා යැයි ඔබට හැඟෙනවාද?

( ) ( ) 22. කිරීමට අවශ්‍ය කාරණාව කෙතරම් කුඩා වුවත් එය ඉටුකිරීමෙන් ඔබ මහත් සතුටක් විඳිනවාද?

( ) ( ) 23. අනෙක් අයට ඔවුන්ගේ සේවාවන් වලදී වඩා සාර්ථක වීමට ඔවුනට සහය වීමට ඔබට විශේෂ සේවයක් ඇතැයි ඔබට හැඟෙනවාද?

( ) ( ) 24. කිසියම් කෙනෙකු අවශ්‍යතාවයෙන් පෙළෙන බව ඔබ දැනගත් විට සැනෙකින් ඔවුන් වෙත මුදල් යැවීමට ඔබ පෙලඹෙනවාද?

( ) ( ) 25. කිසිවෙකු රෝහල් ගතවී සිටින බව ඔබට දැනගන්ට ලැබුණ විට, ඔවුනට කිසියම් ආශ්වාදයක්, දිරිගැන්වීමක් දීමට ඔබව පෙලඹෙනවාද?

( ) ( ) 26. ඔබගේ නිවසට අමුත්තන් නොපැමිණෙන කල ජීවිතයේ සැබවින්ම යමක් අඩු බව ඔබට හැඟෙනවාද?

( ) ( ) 27. මනුෂ්‍යයෝ යමක් කළ නොහැකියයි හෝ ඉතා අසීරුයයි පවසන කල ඒ උදෙසා දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට ඔබ පෙළඹෙනවාද?

( ) ( ) 28. ඔබ මනුෂ්‍යයන්ව හොඳින් අඳුනන්නේ නැති වුවත් ඒ අය පිළිබඳ දැනුමක් තිබේයැයි ඔබට හැඟෙනවාද?

( )	( )	29. කිසියම් කණ්ඩායමක සිටින කල යම් කිසි කාරණාවක් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේදී ඔබ නිශ්ශබ්දව බලා නොසිට එම කාරණාව පිළිබඳ කතාකිරීමට ප්‍රවනතාවයක් දක්වනවාද?

( )	( )	30. ඔබට ප්‍රශ්නයක් හෝ ගැටලුවක් පිළිබඳව අසන්නට ලැබූ විට එයට පිළිතුරු සෙවීමටත් පිළිතුරු දීමටත් උත්සුක වෙනවාද?

( )	( )	31. කිසිවෙකු යම් ප්‍රශ්නයක පැටලී සිටී නම්, උපකාර පතා වෙන අයෙකු වෙත යොමු කරනවාට වඩා ඔබම පෞද්ගලිකව එම තැනැත්තා සමග කතාකිරීමට යොමුවේද?

( )	( )	32. මනුෂ්‍යයෝ අපහසු අවස්ථාවන්හිදී ඔබ එවැනි අවස්ථාවක කුමක් කරාවිද කියා නිරතුරු ඔබගෙන් විමසනවාද?

( )	( )	33. ඔබ දේව වචනය අධ්‍යයනය කිරීමේදී අපහසු විෂයයන් පිළිබඳ නැවුම් අදහස්, ගැඹුරු රහස් අවබෝධ වෙනවායැයි ඔබට පෙනී ගොස් තිබේද?

( )	( )	34. කෙනෙක් ඔහුගේ වැඩය හොඳින් නොකරන කල එම පුද්ගලයා හට එය ඉතා හොඳින් කිරීමට සහය දීමට ඔබට හැඟේද?

( )	( )	35. ඔබ කිසියම් මගපෙන්වීමක්, උපදෙසක් දෙන විට සැමවිටම සදාචාරාත්මක වගකීමකින් යුතුව, එම උපදෙස් ඔහුට කෙසේ බලපාවිදැයි විමසිලිමත් වනවාද?

( )	( )	36. ඔබ යම් වැඩක් කළ විට, ඔබ කළ දෙය ගැන අනෙක් අය සිතන දෙයට වඩා ඔබ කළ වැඩය නිසා ඔබට සැහීමට පත්විය හැකිද?

( )	( )	37. ඔබ ඔබව දකින්නේ අන් අය කරන සේවයට උපකාරකයෙක් ලෙසද නැත්නම් නායකත්වයේ තැනක් හොබවන කෙනෙකු ලෙසද?

( )	( )	38. මුදල් අවශ්‍යතාවයන් ගැන කෙනෙකු ආයාචනා කරන තුරු නොසිට මුදල් දීමට ඔබ අවස්ථාවන් සොයමින් සිටිනවාද?

( )	( )	39. ශාරීරිකව දුක් විඳින අය හමුවේ ඔබට පහසුවෙන් ප්‍රීතිය ප්‍රකාශ කළ හැකිද?

( )	( )	40. ඔබ මනුෂ්‍යයන්ව කොතරම් හොඳින් දන්නවාද යන කරුණ ගැන නොසලකා ඔබගේ නිවසෙහි ඔවුන්ව ප්‍රබෝධමත් කිරීමට සංග්‍රහ කිරීමට ඉතා කැමතිද?

( )	( )	41. යම්කිසි දෙයක් කළ නොහැකි බව හෝ ඉටු කළ නොහැකි බව පවසන අයට ඔබ විරෝධතාවය පානවාද?

( )	( )	42. බොහෝ අවස්ථාවලදී පවසන ලද කාරණා දෙවියන්වහන්සේගෙන් නොව යක්ෂයාගෙන් යැයි ඔබට හැඟෙනවාද? ඔබගේ නිගමනය නිවැරදි බව ඔප්පු වී තිබෙනවාද?

( )	( )	43. ඔබ මනුෂ්‍යයන් සමග බයිබලයේ කරුණු බෙදාගන්නා විට ඔවුන්ගේ වැරදි පුරුදු හෝ වැරදි දේව ධර්ම පිළිබඳ ඔවුනට ඒත්තු ගැන්වෙන බව ඔබට දැනී තිබෙනවාද?

( )	( )	44. ඔබ තුළ අපහසු ප්‍රශ්න අන් අයට පැහැදිලි කරදීමේ හැකියාව තිබේයැයි සෙනඟ නිරතුරු ඔබට පවසා තිබේද?

( )	( )	45. පෞද්ගලික ප්‍රශ්න අමාරුකම් තුළින් යන අය දිරිගැන්වීමෙන් ඔබ සතුටක් ලබනවාද?

( )	( )	46. කිසියම් අවස්ථාවකදී කළ යුතු දෙය ඔබ දන්නවා යැයි සිතා මිනිසුන් නිරතුරු ඔබගෙන් ඔවුන් මුහුණ දෙන අවස්ථා ඔබ සමග බෙදා ගන්නවාද?

( ) ( ) 47. ඔබට දේව වචනයෙහි අපහසු ඉගැන්වීම් එතරම් වැඩි අධ්‍යයනයකින් හෝ සමීක්ෂණයකින් තොරව වඩා පහසුවෙන් අවබෝධ කරගැනීමට හැකියාවක් ඇතැයි ඔබට පෙනී ගොස් තිබේද?

( ) ( ) 48. ඔබ කිසියම් කාර්යයක් ඔබම නොකර එය කරන ආකාරය තව කෙනෙකුට පෙන්වා දීමට කැමතිද?

( ) ( ) 49. ඔබ අනෙක් අයට උපදෙස් දීමටත්, ඔවුන් උදෙසා තීරණ ගැනීමටත් ප්‍රිය කරන කෙනෙක්ද?

( ) ( ) 50. ඔබට යම් කාර්යයක් ඉටු කිරීමට පැවසූ විට සාමාන්‍යයෙන් කිසිම පීඩනයකින් හෝ බරකින් තොරව එය පහසුවෙන් කළහැකි බව සත්‍යයද?

( ) ( ) 51. අන්‍යයන්ට පැවරී ඇති කාර්යයන් ඔබ කිරීමට භාරගෙන ඔවුනට වඩා වැදගත් කාර්යයන් සඳහා නිදහස් කිරීමට ඔබ තුළ බරක් ඇතිවේද?

( ) ( ) 52. ආර්ථික අවශ්‍යතාවයන් පැන නැගුන විට, මහා ලොකු සැලසුම් කිරීමකින් තොරව ක්ෂණයකින්ම අවශ්‍යතාවය සඳහා මුදල් දීමට ඔබ පෙළඹෙනවාද?

( ) ( ) 53. ශාරීරිකව දුක් විඳින අය සමග කතාකිරීම ඔබට පහසුද?

( ) ( ) 54. ඔබගේ නිවස අන්‍යයන් උදෙසා සේවා ස්ථානයක් ලෙස ඔබ සලකනවාද?

( ) ( ) 55. ඔබට තීරණ ගැනීම සඳහා පැහැදිලි සාක්ෂි හෝ මගපෙන්වීම් ලැබීමට අවශ්‍ය නොවන බව ඔබට වැටහී තිබේද?

( ) ( ) 56. ඔබ නිරන්තරයෙන්ම මනුෂ්‍යයන් පවසන දෑ, ඔවුන් කරන ක්‍රියා හරිද වැරදිද කියා අගැයීමකට ලක්කරන බව ඔබට පෙනෙනවාද?

( ) ( ) 57. ඔබ දේව වචනය පවසන කල එය අසා සිටින අය එමගින් අභියෝගයට හා අරමුණකට යොමු කළ හැක්කේ කෙසේදැයි සාමාන්‍යයෙන් සිතා බලනවාද?

( ) ( ) 58. ඔබ බයිබලයෙන් කාරණා පහදා දෙන ආකාරය ගැන මිනිසුන් ඔවුන්ගේ ප්‍රසාදය ඔබ වෙත පලකර තිබෙනවාද?

( ) ( ) 59. අධෛර්යයට හා අසහනයට පත් වී සිටින අය සමග පහසුවෙන් ක්‍රියා කිරීමටත්, කරන දෙය තුළ ප්‍රීතියක් ලැබීමටත් ඔබට හැකිද?

( ) ( ) 60. ඔබ අන් ඇදහිලිවතුන් උදෙසා ගත් තීරණ හෝ දුන් අවවාද සැම දෙනාගේම යහපත උදෙසා නිවැරදි මෙන්ම හොඳම ඒවා බව ඔවුන් පිළිගෙන තිබෙනවාද?

( ) ( ) 61. ඔබ හා එකම පසුබිමෙන් එන අන් ඇදහිලිවතුනට තේරුම් ගැනීමට අපහසු දේව වචනයෙහි කාරණා ඔබට වඩා පහසුවෙන් තේරුම් යන බව ඔබට පෙනී යනවාද?

( ) ( ) 62. ඔබහට අනෙක් ඇදහිලිවන්තයන්ව පුහුණු කොට නායකත්වයට ගෝලයන් බවට පත් කිරීමට විශේෂ සැලකීමක් තිබෙනවාද?

( ) ( ) 63. ඔබ නිරන්තරයෙන්ම කිසියම් කණ්ඩායමක් හෝ සංවිධානයක් උදෙසා මගපෙන්වීම සැපයීම සඳහා තීරණ පිළිබඳ සිතමින් සිටින බව දැනෙනවාද?

( ) ( ) 64. කණ්ඩායමක් සමග එකතු වී කිසියම් වැඩක් කිරීමට වඩා ඔබ තනිවම එම වැඩය කිරීමට ප්‍රියකරනවාද?

( ) ( ) 65. ඔබට කළ හැකිව තිබුණා නම්, උපකාර අවශ්‍ය සැම කෙනෙකුටම ඔබ උදව් කරන බව විශ්වාස කරනවාද?

( )    ( )    66. ඔබ වෙනයම් කෙනෙකුට යමක් දීමෙන් එය ලැබූ තැනැත්තාගේ ප්‍රතිචාරය කුමක් වුවත්, ඉමහත් ප්‍රීතියට පත්වෙනවාද?

( )    ( )    67. ඔබ නිරන්තරයෙන්ම ශාරීරිකව දුක් විඳින අයට උපකාරකිරීමට ක්‍රමයක් සොයනවාද?

( )    ( )    68. ඔබ නිතිපතා ඔබගේ නිවසෙහි අමුත්තනට සංග්‍රහ කිරීමේ සේවයක්, ඔවුන් කුමන තරාතිරමේ අය වුවත්, පැවැත්වීමට කැමතිද?

( )    ( )    69. ඔබ අවට සිටින සියලුම දෙනා අවිශ්වාස කරන කල ඔබට යමක් විශ්වාස කළ හැකිද?

( )    ( )    70. අනෙක් ඇදහිලිවන්තයන්ට වැටහෙන්නේ නැති වුවත්, යම්කිසි දෙයක් හරි නැති බව ඔබට හැඟෙන විට ඒ පිළිබඳව ඔබට පවසා තිබේද?

( )    ( )    71. ඔබට ඉතා සාර්ථක ලෙස දේව වචනය බෙදා ගැනීමට හැකියාවක් ඇති බව අනෙක් ඇදහිලිවතුන් ඔබට පවසා තිබේද?

( )    ( )    72. විශේෂිත ප්‍රශ්න, ගැටලුවලට පිළිතුරු ලබා ගැනීමට මිනිසුන් නිරන්තරයෙන් ඔබ සොයා පැමිණෙනවාද?

( )    ( )    73. පෞද්ගලික හා චිත්තයෙහි ගැටලු සහිත මනුෂ්‍යයන් පිළිබඳව ඔබට දැඩි ප්‍රේමයක් හා දයානුකම්පාවක් ඇතිවනවාද?

( )    ( )    74. ඔබ යමෙකුට උපදෙස් දෙනවිට, එය කළ යුතු "ක්‍රමය" ගැන අවධාරණය වැඩියෙන් යොමු කරනු විනා එය කළයුතු "මන්ද" කියා අවධාරණය නොකරයිද?

( )    ( )    75. ඔබට දේව වචනයෙහි කරුණ දැනගැනීමට හා තේරුම් ගැනීමට හැකියාවක් ඇතැයි අනෙක් ඇදහිලිවන්තයෝ ඔබට නිතර පවසා තිබේද?

( )    ( )    76. මිනිසුන් තමන්ගේ අරමුණු හා ඉලක්ක වෙත ළඟාවීම සඳහා උපකාර කිරීමට ඔබට විශේෂ සැලකිල්ලක් තිබේද?

( )    ( )    77. සංවිධානය හෝ කණ්ඩායම වෙනුවෙන් තීරණ ගැනීම සඳහා සෙනඟ ඔබ මත රැඳ සිටින්නේද?

( )    ( )    78. ඉටු කළ යුතු විශේෂ කාර්යයක් පිළිබඳව අසන කල එය ඔබ විසින්ම කරනු ලැබීමට උත්සුක වන්නේද?

( )    ( )    79. ඔබ  යමක් කරනවාට වඩා, ඔබ කළ දෙයකින් යම් පුද්ගලයෙකු උදව් ලැබූ ආකාරය පිළිබඳව ඔබ වඩා තෘප්තිමත් වන්නේද?

( )    ( )    80. ඔබ මුදල් දෙන විට ඔබ කළ දේ පිළිබඳව අනෙක් අය දැනගැනීම නිතර ප්‍රතික්ෂේප කරන්නේද?

( )    ( )    81. ශාරීරිකව පීඩා විඳින්නන්ට නොකඩව කරන සේවයකින් ඔබ සතුටු වන්නේද?

( )    ( )    82. මිනිසුන් ඔබගේ නිවස තුළට ගැනීම අනිවාර්යයෙන් කළ යුතු දෙයකට වඩා මහත් උනන්දුව ඇති කරන දෙයක් හැටියට ඔබ දකින්නේද?

( )    ( )    83. දුෂ්කර තත්වයන් වලදී දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමට ඔබට හැකියාව තිබෙන බව නිතර අනෙක් ඇදහිලිවතුන් ඔබ සමග බෙදාගෙන ඇද්ද?

( )    ( )    84. ඔබ යම් කෙනෙකු හෝ යම් දෙයක් පිළිබඳව හරි හෝ නිවැරදි යැයි සිතා සිටින දේ පිළිබඳව සෙනග නිතර ඔබගේ අදහස් විමසන්නේද?

( ) ( ) 85. අනෙක් අයට සන්නිවේදනය කිරීමේදී ඔබ දිමනා ලත් කෙනෙකු බව ඔබ විශ්වාස කරන්නේද?

( ) ( ) 86. ඔබට පහසුවෙන් උපුටා ගත් පදයකින් යම් වචනයක් කියනවාට වඩා යමෙකුට වචනයක් පැහැදිලි කර දිය හැකිද?

( ) ( ) 87. නිතර ඔබගේ ප්‍රශ්න යමෙකු සමග බෙදාගන්නවාට වඩා අනෙක් අය ඔවුන්ගේ පෞද්ගලික ප්‍රශ්න බෙදාගන්නවා අසා සිටීමට ඔබ ආශාවක් දක්වන්නේද?

( ) ( ) 88. දුෂ්කර තත්වයන් වලදී අනෙක් ඇදහිලිවතුන් ඔබගේ අවවාද අනුගමනය කරනවා දැකිය හැකිද?

( ) ( ) 89. ඔබ දෙවියන්වහන්සේගේ වචනය අධ්‍යයනය කරන අතරම අනෙක් ඇදහිලිවතුන්ට පෙර ජේදයක පැවසෙන දෑ ඔබ සොයා ගන්නේද?

( ) ( ) 90. කිසිවෙකු නැති තැන ඔබ නිතරම කණ්ඩායමක නායකත්වය ගන්නේද?

( ) ( ) 91. ඔබගේ තීරණ වල දිගුකාලීන බලපෑම් වල සදාචාරත්මක වගකීම ඔබට නිතර හැඟෙන්නේද?

( ) ( ) 92. සෙනඟගේ ප්‍රශ්න හා අවශ්‍යතාවයන් පිළිබදව කථාකරමින් කාලය ගත කරනවාට වඩා ඔබ නිශ්චිත කාර්යයක් කරමින් සිටින්නේද?

( ) ( ) 93. යමෙකු ඔබෙන් උපකාරයක් ඉල්ලා සිටින විට ඒ පුද්ගලයාට “බැහැ” කීම ඔබට මහත් දුෂ්කර කාර්යයක්ද?

( ) ( ) 94. ඔබ යමෙකුට මුදල් දෙනවිට එයට ප්‍රතිචාර වශයෙන් යම් අගය කිරීමක් බලාපොරොත්තු නොවන්නේද?

( ) ( ) 95. ශාරීරිකව පිඩා විඳින්නන්ට යම් ක්‍රමයකින් උපකාර කිරීමට අවශ්‍ය වන අයුරින් ඔබට ඔවුන් පිළිබදව අනුකම්පාවක් හැඟෙන්නේද?

( ) ( ) 96. ඔබගේ නිවසේ පෙනුම ගැන නොසලකා සෙනඟ ඔබගේ නිවසට පිළිගත හැකිද?

( ) ( ) 97. සෙනඟ පරාජිතව අධෛර්යයට පත්ව සිටින විට දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන පිණිස ඔවුන් ධෛර්යවත් කිරීමට ඔබට බරක් හැඟෙන්නේද?

( ) ( ) 98. වැරදි හා පාපිෂ්ඨ දේ ප්‍රකාශ කරමින් දෙවියන්වහන්සේගේ වචනයේ සත්‍යය ආරක්ෂා කිරීමට ඔබට විශේෂ වගකීමක් හැඟෙන්නේද?

( ) ( ) 99. සියලු කාරණා විස්තර කිරීමට වේලාව ගන්නවාට වඩා වැඩි විස්තර කිරීමකින් තොරව ඔබ දෙවියන්වහන්සේගේ වචනය අනෙක් අයට කථා කරන්නේද?

( ) ( ) 100. ඔබ නිතරම ඔබගේ සිතිවිලි ක්‍රමානුකූල පිළිවෙලකට සකස් කරන්නේද?

( ) ( ) 101. “පව් කළාවූ” “වැටුණාවූ” යම් ඇදහිලිවන්තයෙකු පිළිබදව ඇසූ විට ඔවුන්ට උපකාර කිරීමට ඔබ උත්සුක වන්නේද?

( ) ( ) 102. දුෂ්කර අවස්ථාවන් වලදී ඔබ විසින් දෙන ලද අවවාද හා තීරණ බොහෝ කාරණා වලදී නිවැරදි බව ඔප්පු වී තිබේද?

( ) ( ) 103. දුෂ්කර බයිබල් ජේදයක තේරුම අනෙක් ඇදහිලිවතුන් සමග බෙදා ගැනීමට ඔබට මහත් ආශාවක් තිබේද?

( ) ( ) 104. නායකත්වය දැරීමේදී කලකිරීමක් හෝ දුෂ්කර භාවයකට වඩා මහත් ප්‍රීතියක් ඔබට දැනෙන්නේද?

( ) ( ) 105. සියලු දෙනාටම බලපාන අයුරින් කණ්ඩායම හෝ සංවිධානය වෙනුවෙන් තිරණ ගැනීමේ අත්දැකීමක් ලබා තිබේද?

( ) ( ) 106. ඉල්ලීමකින් තොරව, කළයුතු දෙය කිරීමෙන් ඔබ සතුටු වන්නේද?

( ) ( ) 107. අනෙක් අයට උපකාර කිරීමට ඔබ අවස්ථාවක් සොයමින් සිටින්නේද?

( ) ( ) 108. මිනිසුන්ට මුදල් දීම දෙවියන්වහන්සේ විසින් ඔබට දෙන ලද මහත් ආත්මික සේවයක් සේ ඔබ දකින්නේද?

( ) ( ) 109. ශාරීරිකව දුක් විඳින්නන් බැහැදැකීමට යාම ඔබට කලකිරීමක් ඇතිකරනවාට වඩා ප්‍රිතිය ගෙන දෙන්නේද?

( ) ( ) 110. සෙනග ඔබේ නිවසට පිළිගැනීම හා දෙවියන්වහන්සේ වෙතට යොමු කිරීම පිළිබඳව අනෙක් අය නිතරම ඔබ ගෙනහැර දක්වන්නේද?

( ) ( ) 111. අනෙක් අය විසින් කළ නොහැකි යැයි කී එහෙත් උන්වහන්සේට කළ හැකියයි ඔබ විශ්වාස කළ මහත් දේ දෙවියන්වහන්සේ ඔබේ ජිවිතයේ කර ඇති බව ඔබ දැක ඇත්තේද?

( ) ( ) 112. යමක් වැරදි යයි දැනගන්නා විට ඔබ සෙනගට උපකාර කරන්නේ යයි හැඟෙන්නේද? ඔවුන් කැමැත්තෙන් ඔබගේ ඇගැයීම පිළිගන්නේද?

( ) ( ) 113. අනෙක් ඇදහිලිවතුන්ට කථා කිරීමට ඔබට අවස්ථාවක් දුනහොත් බයිබල් පාඨ බෙදා ගන්නවාට වඩා ඔබගේ පෞද්ගලික අත් දැකීම් බෙදා ගන්නේද?

( ) ( ) 114. ඔබට ස්ථිර ඉගන්වීමේ සේවයක් පවත්වාගෙන යායුතු බව අනෙක් ඇදහිලිවතුන් ඔබට පවසා ඇති අතර එයම ඔබට හැඟී ගොස් ඇත්තේද?

( ) ( ) 115. කණ්ඩායමකට සේවය කරනවාට වඩා පුද්ගලයාගෙන් පුද්ගලයාට සේවය ප්‍රියකරන්නේද?

( ) ( ) 116. දුෂ්කර ප්‍රශ්න හා අවස්ථාවන් වලදී කළයුතු දේ දැන ගැනීමට විශේෂ හැකියාවක් ඔබට ඇති බව හැඟෙන්නේද?

( ) ( ) 117. අනෙක් ඇදහිලිවතුන් බයිබලයේ ඇතැම් දුෂ්කර ඉගැන්වීම් පිළිබඳව අවබෝධය අඩුව වියවුල්ව සිටින විට එහි අර්ථය කියා දීම ඔබේ වගකීමක් ලෙස ඔබට හැඟෙන්නේද?

( ) ( ) 118. අධික අධ්‍යනයකින් හා සැලසුම් කරණයකින් තොරව මිනිසුන්ගේ අවශ්‍යතාවන්, ඉලක්කයන් හා අභිප්‍රායන් ඉටුකරන්නේ කෙසේදැයි ඔබ දන්නේද?

( ) ( ) 119. කණ්ඩායමක හෝ සංවිධානයක මගපෙන්වීම හා ජයග්‍රහණය පිළිබඳ වගකීම දැරීම පිළිබඳව ඔබ සතුටු වන්නේද?

( ) ( ) 120. ඔබට යම් කාර්යයක් කරන ලෙස ඉල්ලා සිටි විට ඔබට “කාර්ය විස්තරයක්” අනවශ්‍ය බව හැඟෙන්නේද?

( ) ( ) 121. ඔබ යම් කාර්යයක් කරමින් ඔවුන්ට උපකාර කළ බව ද ඒ වගකීම් වලින් ඔවුන් නිදහස් කල නිසා ඔවුන්ට වෙනස් දෙයක් කිරීමට හැකිවූ බව නිතර මිනිසුන් ඔබට පවසන්නේද?

( ) ( ) 122. යම් ප්‍රයෝජනවත් ව්‍යාපෘතියකට මුදල් ලබා දෙන ලෙස යමෙක් ඔබෙන් ඉල්ලා සිටින කල එය මහත් ගෞරවයක් හා වරප්‍රසාදයක්ව පෙනෙන කල සැබවින්ම ඔබ ඒ ගැන උනන්දු වන්නේද?

( ) ( ) 123. ශාරීරිකව වේදනා විඳින්නන්ට උපකාර කිරීම සඳහා ඔබගේ වේලාව, මුදල් හා සම්පත් වැය කිරීමට ඔබ ඉමහත් ආශාවෙන් කැමති වන්නේද?

( ) ( ) 124. මිනිසුන් නිවසට පිළිගැනීමෙන් ඇතිවන බොහෝ වැඩ කටයුතු කිරීමේ වගකීමක් ඇති බවට වඩා එය මහත් ප්‍රීතියක් ලෙස ඔබට හැඟෙන්නේද?

( ) ( ) 125. මිනිස් දැක්මෙන් විය නොහැකි යයි හැඟෙන හෝ දුෂ්කර බොහෝ පුදුමාකාර පිළිතුරු ලැබුණාවූ බලපෑමක් යුතු යාච්ඤා සේවයක් ඔබේ ජීවිතයේ ඇති බව ඔබ අනාවරණය කරගෙන ඇත්තේද?

( ) ( ) 126. අනෙක් අය නොදුටු බව පැවසූ නිවැරදි කළ යුතු බව ඔප්පුවූ යම් දෙයක් හෝ යම් කෙනෙක් ඔබ නිතර ඇඟැයීමට ලක්කර තිබේද?

## ආත්මික දීමනා ලකුණු දීමේ පත්‍රිකාව.

ඔබ ප්‍රශ්න මාලාව අවසන් කළ පසු අනෙක් පිටුව සම්පූර්ණ කරණ විශේෂ දීමනා ලකුණු දීමේ පත්‍රිකාවේ ඔබ මිට පෙර කළ ලෙසම, ප්‍රශ්න මාලාවේ ඔව් යැයි සලකුණු කළ සෑම ප්‍රශ්නයකටම ප්‍රශ්න අංකය ළඟින් සලකුණක් යොදන්න. පිළිතුරක් නැති ඒවාට සලකුණු නොකරන්න.

| අනාගතවාක්‍ය | ප්‍රඥාවේ වචනය | පරිපාලනය | දීම |
|---|---|---|---|
| ( ) # 1 | ( ) # 4 | ( ) # 7 | ( ) # 10 |
| ( ) # 15 | ( ) # 18 | ( ) # 21 | ( ) # 24 |
| ( ) # 29 | ( ) # 32 | ( ) # 35 | ( ) # 38 |
| ( ) # 43 | ( ) # 46 | ( ) # 49 | ( ) # 52 |
| ( ) # 57 | ( ) # 60 | ( ) # 63 | ( ) # 66 |
| ( ) # 71 | ( ) # 74 | ( ) # 77 | ( ) # 80 |
| ( ) # 85 | ( ) # 88 | ( ) # 91 | ( ) # 94 |
| ( ) # 99 | ( ) # 102 | ( ) # 105 | ( ) # 108 |
| ( ) # 113 | ( ) # 116 | ( ) # 119 | ( ) # 122 |

| ඇදහිල්ල | ඉගැන්වීම | දැනගැනීමේ වචනය | සේවය කිරීම. |
|---|---|---|---|
| ( ) # 13 | ( ) # 2 | ( ) # 5 | ( ) # 8 |
| ( ) # 27 | ( ) # 16 | ( ) # 19 | ( ) # 22 |
| ( ) # 41 | ( ) # 30 | ( ) # 33 | ( ) # 36 |
| ( ) # 55 | ( ) # 44 | ( ) # 47 | ( ) # 50 |
| ( ) # 69 | ( ) # 58 | ( ) # 61 | ( ) # 64 |
| ( ) # 83 | ( ) # 72 | ( ) # 75 | ( ) # 78 |
| ( ) # 97 | ( ) # 86 | ( ) # 89 | ( ) # 92 |
| ( ) # 111 | ( ) # 100 | ( ) # 103 | ( ) # 106 |
| ( ) # 125 | ( ) # 114 | ( ) # 117 | ( ) # 120 |

| කරුණාව පෙන්වීම | විමසීම |
|---|---|
| ( ) # 11 | ( ) 14 |
| ( ) # 25 | ( ) 28 |
| ( ) # 39 | ( ) 42 |
| ( ) # 53 | ( ) 56 |
| ( ) # 67 | ( ) 70 |
| ( ) # 81 | ( ) 84 |

| | |
|---|---|
| ( ) # 95 | ( ) 98 |
| ( ) # 109 | ( ) 112 |
| ( ) # 123 | ( ) 126 |

| අනුශාසන කිරීම | නායකත්වය | උපකාර කිරීම | ආගන්තුක සත්කාරය |
|---|---|---|---|
| ( ) #3 | ( ) #6 | ( ) #9 | ( ) #12 |
| ( ) #17 | ( ) #20 | ( ) #23 | ( ) #26 |
| ( ) #31 | ( ) #34 | ( ) #37 | ( ) #40 |
| ( ) #45 | ( ) #48 | ( ) #51 | ( ) #54 |
| ( ) #59 | ( ) #62 | ( ) #65 | ( ) #68 |
| ( ) #73 | ( ) #76 | ( ) #79 | ( ) #82 |
| ( ) #87 | ( ) #90 | ( ) #93 | ( ) #96 |
| ( ) #101 | ( ) #104 | ( ) #107 | ( ) #110 |
| ( ) #115 | ( ) #118 | ( ) #121 | ( ) #124 |

## ආත්මික දීමනා ආකෘතිය

**කලින් පිටුවේ ඇති ලකුණු දීමේ පත්‍රිකාව භාවිතා කොට පසු පිටේ ඇති විශේෂ දීමනා ආකෘතිය සම්පූර්ණ කරන්න.**

එක් එක් දීමනාව යටතේ ඔබ සලකුණු කළ කොටු ගණන ගණන් කරන්න. (ප්‍රශ්න වලට “ඔව්” යනුවෙන් ඔබගේ පිලිතුරු සලකුණු කළ කොටු). ආකෘතියේ සුදුසු අංකය ඉදිරියේ ඉරක් අදින්න.

එකිනෙක මාතෘකා යටතේ සලකුණු කරන ලද හා ආකෘතියේ සලකුණු කරන ලද කොටු ගණන ගණන් කිරීමෙන් පසු ඔබ විශේෂ දීමනා ආකෘතියේ කළාසේ ඉරි පුරවමින් ප්‍රස්ථාරයක් නිර්මාණය කර ආකෘතිය සම්පූර්ණ කරන්න.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනාගතවාක්‍ය | | | | | | | | | | |
| ඉගැන්වීම | | | | | | | | | | |
| අනුශාසනා කිරීම | | | | | | | | | | |
| ප්‍රඥාවේ වචනය | | | | | | | | | | |
| දැනගැනීමේ වචනය | | | | | | | | | | |
| නායකත්වය | | | | | | | | | | |
| පරිපාලනය | | | | | | | | | | |
| සේවය කිරීම | | | | | | | | | | |
| උපකාර කිරීම | | | | | | | | | | |
| දීම | | | | | | | | | | |
| කරුණාව පෙන්වීම | | | | | | | | | | |
| ආගන්තුක සත්කාරය | | | | | | | | | | |
| ඇදහිල්ල | | | | | | | | | | |
| විමසීම | | | | | | | | | | |
| දිග තිරු ඔබගේ ඉහළම ලකුණුය. | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |

කෙටි තීරු ඔබගේ අඩුම ලකුණු වේ.

"ලකුණු දීමනා" ඔබට ඇත්නම් ඒවා ලකුණු වලින් හඳුනාගන්නා නිසා මෙම ප්‍රශ්න මාලාවට ලකුණු දීමනා ඇතුළත් කර නැත.

# එකොළොස්වන පරිච්ඡේදය.

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසානයෙහි ඔබහට :

- ශුද්ධාත්මයාණන්වහන්සේගේ බාහිර ඵල හඳුනාගැනීම.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ අභ්‍යන්තර ඵල හඳුනාගැනීම.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වල වැදගත් කම පැහැදිලි කිරීම.
- අප ඵල දැරීමට තෝරාගෙන ඇති බව හෙළි කරදෙන බයිබල් පදයක් හඳුනාගැනීම.
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ අභ්‍යන්තර විවිධ ඵල අර්ථ දැක්වීම.
- දෙවියන්වහන්සේගේ සමාදානය හා දෙවියන්වහන්සේ සමග සමාදානය අතර වෙනස වටහාගැනීමට හැකිවනු ඇත.

## ප්‍රධාන පද :

**නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම,විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධ ව්‍යවස්ථාවක් නැත. (ගලාති 5:22-23)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල පිළිබඳ සාකච්ඡා කරයි. ඊළඟ පරිච්ඡේදයෙහි එයට ප්‍රතිවිරුද්ධ ගුණාංග එනම් මාංශයේ ක්‍රියා පිළිබඳ ඉගෙන ගනු ඇත. අවසාන පරිච්ඡේදයේ ඔබ ආත්මික දීමනා වර්ධනය කරගන්නා ක්‍රමය ඉගෙන ගනු ඇත.

## ඵලය නම් කුමක්ද?

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය නම් ඇදහිලිවන්තයාගේ ජීවිතයෙන් එළිදරව් වන ආත්මයේ ස්වභාවයයි. එය සියලු කිතුණුවන්ගේ ජීවිත තුළින් එළිදරව් විය යුතු ආත්මික චරිත ගුණාංගයයි.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා බලය සඳහාය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල ඇදහිලිවන්තයාගේ ජීවිතයෙහි චරිතය සඳහාය. පහත සඳහන් වගුව ආත්මික දීමනා හා ආත්මික ඵල අතර වෙනස පැහැදිලි කර දෙයි.

| <u>දීමනා</u> | <u>ඵල</u> |
|---|---|
| - ශරීරයේ සේවය සඳහා | -එක් එක් පුද්ගලයාගේ පරිනත බව උදෙසා |
| - කිසිම ඇදහිලිවන්තයෙකු සතුව සියල්ල නැත. | -සෑම ඇදහිලිවන්තයෙකුම සතුව සියල්ල පැවතිය යුතුය. |
| - බලය උදෙසා | -චරිතය උදෙසා |

ආත්මික ඵල ආත්මික පරිනත භාවයෙහි ඔප්පුවය. ස්වාභාවික ලෝකයෙහි ඵල මෙන්ම එය ජීවිත ක්‍රියා දාමයෙහි ප්‍රතිඵලයක් වන නිෂ්පාදනයකි. ආත්මික ඵලය ඔබගේ පෞද්ගලික හා සාමාජයීය හැසිරීම්වල ස්වභාවය මෙන්ම ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළ ක්‍රියාකිරීමත් එම ක්‍රියාවට ඔබගේ ප්‍රතිචාරයත් මගින් බිහිවන නිෂ්පාදනය වේ. ස්වාභාවික ලොවෙහි ඵලයක් පරිනතවීමට කාලයක් ගත වෙන්නාක් සේ ආත්මික ඵල පරිනතවීමටද කාලය ගතවේ. එය ආත්මයෙහි ජීවිතයෙහි ස්වාභාවික වර්ධනයෙහි නිෂ්පාදනයකි.

# දෙයාකාර ඵල

බයිබලයෙහි ආත්මික ඵල වර්ග දෙකක් පිළිබඳව කතාකරයි.

1. ශුභාරංචි සේවයේ ඵලය
2. දේව භක්තික ආත්මික ගුණාංගයේ ඵල

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන්හට ශුභාරංචියෙහි ප්‍රබල සාක්ෂිකරුවන් විමට සලස්වමින් බාහිර ඵල දැරීමට උපකාරී වේ. එසේම ක්‍රිස්තුස්වහන්සේගේ මෙන් වූ ආත්මික චරිත ගුණාංග අභ්‍යන්තරයෙන් දැරීමට උන්වහන්සේ වර්ධනය ගෙන දෙන සේක.

# බාහිර ඵල : ශුභාරංචිය ප්‍රකාශකිරීම

## ස්වාභාවික බෝවීම.:

දෙවියන්වහන්සේ ආදම් සහ ඒව මැවූ කල ඔවුනට දුන් පළමුවන ආඥාව නම් ස්වාභාවික ලෝකයෙහි “සඵලවත් වී” බෝවීමටය.

> **දෙවියන්වහන්සේ ඔවුන්ට ආශීර්වාදකළසේකඃ දෙවියන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා බෝවී වැඩිවෙමින් පොළොව පූර්ණ කොට ඒක යටත්කරගනිව්ඃ මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයේ පක්ෂින් කෙරෙහිද පොළොව පිට හැසිරෙන සියලු සතුන් කෙරෙහිද අධිපතිකම් කරාවියයි කීසේක. (උත්පත්ති 1:28)**

ස්වාභාවික ලෝකයෙහි දෙවියන්වහන්සේ නැවත ඵල දැරීමේ අඛණ්ඩ චක්‍රයක් පවත්වා තිබේ.

> **පොළොව පවතින තුරු වපුරන කාලය සහ කපන කාලයද ශීතය සහ උෂ්ණයද ග්‍රීෂ්ම කාලය සහ ශීත කාලයද දවාල සහ රාත්‍රියද නොනවතින්නේයයි කීසේක. (උත්පත්ති 8:22)**

## ආත්මික බෝවීම :

ලෝකයේ ආරම්භයේ සිටම දෙවියන්වහන්සේ තම ජනතාවට ස්වාභාවිකව මෙන්ම ආත්මිකවද බෝවීමට කැඳවා තිබේ. ආදම් සහ ඒව ආත්මිකව හා ස්වාභාවික බෝවිය යුතු විය. දෙවියන්වහන්සේගේ මුල් සැලැස්ම වූයේ දෙවියන්වහන්සේගේ ස්වරූපයට මවන ලද දෙවියන්වහන්සේ සමග සහභාගිකමින් හැසිරෙන මනුෂ්‍යයන්ගෙන් පොළොව පූර්ණ කිරීමය.

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය ලෝකය උදෙසා පවතින එතුමාගේ බලය හා සැලැස්ම විදහා දැක්වීමේ සෙනගක් විලසින් එසවූ විට, ඔවුනට ආත්මිකව බෝවීමට එතුමා කැඳවූ සේක.

> **ඔබ මිසරයෙන් මිදිවැලක් ගෙනාසේක. ඔබ ජාතීන් එළවා එය රෝපණයකළසේක. ඔබ ඊට ඉඩමක් එළිකළසේක. එය ගැඹුරට මුල් ඇද්දේය, එයින් දේශය පිරුණේය. ඒකේ සෙවණෙන් කඳු වැසුණේය, ඒකේ අතු දෙවියන්වහන්සේගේ කිහිරි ගස් මෙන් විය. (ගීතාවලිය 80:8-10)**

දෙවියන්වහන්සේ මිසරයෙන් පිටතට ගෙනා “මිදි වැල” නම් ඉශ්‍රායෙල් ජාතිය වේ. ඔවුන් අවට සිටි අන්‍ය ජාතීන් හට ආත්මික ඵල දැරීම තුළින් සත්‍ය දෙවියන්වහන්සේ එළිදරව් කරදීමට එතුමා ඔවුන්ගෙන් අපේක්ෂා කළසේක. ඒ වෙනුවට ඉශ්‍රායෙල් ජාතියද අන්‍යජාතීන් මෙන් වූහ. ඔවුහු රූප නමස්කාර කිරීමට අරඹා (අදෘෂ්‍යමානවූ) නොපෙනෙන්නාවූ රජුන්ගේ රජ වෙනුවට පෙනෙන (දෘෂ්‍යමානවූ) මිනිස් රජෙකු අවශ්‍ය බව ප්‍රකාශ කළෝය. අවසානයේ දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ට පැවසුයේ :

> **ඉශ්‍රායෙල් විහිදියන්නාවූ, ඵල දරන මිදිවැලක්ය. තමාගේ ඵල වැඩිවූ පමණට ඔහු පූජාසන වැඩි කෙළේයඃ ඔහුගේ දේශයේ සාර භාවය හැටියට ඔව්හු අලංකාරවූ රූපස්ථම්භ සෑදුවෝය. (හොෂෙයා 10:1)**

ඉශ්‍රායෙල්වරුන්ගේ ආත්මික ඵල රහිත බව නිසා යේසුස්වහන්සේ පැවසුයේ :

> **එබැවින් නුඹලාට මම කියමි දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලාගෙන් අහක්කොට එහි ඵල උපදවන ජාතියකට දෙනු ලබන්නේය. (මතෙව් 21:43)**

ඉශ්‍රයෙල්වරු ඵල දැරීමට ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන්, රාජ්‍යයෙහි ශුභාරංචිය අන්‍ය ජාතීන් වෙතට ව්‍යාප්ත කරනලදි. අන්‍යජාතීන් තුළින්, දෙවියන්වහන්සේ මුළු ලොව පුරා එතුමාගේ ආත්මික බෝවීමේ සැලැස්ම සපුරා ලීමට සහාවක් එසවූ සේක.

## ඵල දැරීමට තෝරාගන්නා ලදි:

ඇදහිලිවන්තයින් ලෙසට, යේසුස්වහන්සේ අපව ලොව පුරා ශුභාරංචිය ප්‍රචාරය කිරීම තුළින් ඵල දැරීමට තෝරාගෙන ඇත.

> **නුඹලා මා තෝරා ගත්තා නොව මම නුඹලා තෝරාගෙන පත් කළෙමි. එසේ කළේ නුඹලා ගොස් ඵල දරන පිණිසත් නුඹලාගේ ඵල පවතින පිණිසත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේගෙන් නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත් නුඹලාට දෙන පිණිසත්ය. (යොහන් 15:16)**

යේසුස්වහන්සේ එතුමාගේ අනුගාමිකයිනට දුන් අවසාන ආඥාව බෝවීම පිළිබඳවය :

> **උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශකරපල්ලා. (මාර්ක් 16:15)**

මහත් ආත්මික අස්වැන්නක දර්ශනයකින් උන්වහන්සේ තම ගෝලයින්ට අභියෝග කළසේක.

> **තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේයයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි-නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලාපල්ලා. වපුරන්නාත් කපන්නාත් එක්ව සන්තෝෂවන පිණිස, කපන්නා කුලී ලැබ සදාකාල ජීවනයට අස්වැන්න එකතුකරගන්නේය. (යොහන් 4:35-36)**

සාලමොන් පැවසුවේ :

> **ධර්මිෂ්ඨයාගේ ඵලය ජීවන වෘක්ෂයක්ය: ආත්ම දිනාගන්නා ඥානවන්තයෙක්ය. (හිතෝපදේශ 11:30)**

ශුද්ධාත්ම බලය ඇදහිලිවතුන්ට ශුභාරංචිය ප්‍රකාශ කිරීම තුළින් ඵල දැරීමට හැකියාව සපයා දෙයි.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

ආත්මික බෝවීමේ ක්‍රමය 2 තිමෝති 2:2 හි සඳහන් වේ.

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදීපන්න. (2 තිමෝති 2:2)**

ස්වාභාවික ලොවෙහි අස්වැන්න සඳහා දෙවියන්වහන්සේ විසින් ස්ථාපිත චක්‍රයක් පවතින්නාක් සේම ආත්මික ලොවටද ප්‍රචාරණය සඳහා චක්‍රයක් එතුමා පිහිටවූ සේක. සෑම ඇදහිලිවන්තයෙකුම තවත් අයට ඉගැන්වීමෙන් ප්‍රචාරණය කළ හැකි අයට ශුභාරංචිය ඉගැන්විය යුතුවේ. ස්වාභාවික ලොවෙහි බීජ වැපිරීමත් අස්වැන්න නිම නොවෙමින් චක්‍රානුකූලව පැවත එන ලෙසම ආත්මික අස්වැන්න නෙලීමද එසේම සිදුවේ.

(ශුභාරංචි සේවයේ බාහිර ඵල වල ඇති වැදගත්කම හේතුවෙන් එම විෂය පිළිබඳ විශේෂ අධ්‍යයන මාලාවක් හාවස්ටයිම් ජාත්‍යයන්තර ආයතනය ඉදිරිපත්කොට ඇත. *"ආත්මික අස්වැන්න සඳහා උපක්‍රම"* ,*"ගුණනය කිරීමේ ක්‍රමවේද"*, *"මුහුන් වැනි වූ ශුභාරංචි ප්‍රකාශක සේවය"* නම් පාඩම් පිළිබඳ සොයා බලන්න)

# අභ්‍යන්තර - ඵල : ක්‍රිස්තුස්වහන්සේ මෙන්

ශුභාරංචි සේවය නම් බාහිර ඵලයට අමතරව ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් ඇතිකරන සුභවාදී ආත්මික ගුණාංග තිබෙන බව බයිබලය අපට පවසයි. අපි මෙම ඵල ක්‍රිස්තුස්වහන්සේ මෙන් විමේ අභ්‍යන්තර ඵල ලෙස නම් කරමු. මෙම ඵල ගලාති 5:22-23 හි සඳහන් වේ.

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්-ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම,විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධ ව්‍යවස්ථාවක් නැත.** (ගලාති 5:22-23)

ඇදහිලිවන්තයාගේ ජීවිතයෙහි වර්ධනය කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ කැමති අභ්‍යන්තර ගුණාංග මේවාය. එම ගුණාංග යේසුස්වහන්සේගේ ජීවිතයෙහි දක්නට ලැබූ ආත්මික චරිත ගුණාංග මෙන් වේ. අපි එම ගුණාංගවලට ක්‍රිස්තුස්වහන්සේ මෙන්වූ ගුණාංග යයි පවසනුයේ එබැවිනි.

"ඵල" යන පදය ඒක වචනයෙනි. එය "ඵලයන්" නොවේ. ආත්මික දීමනා බොහෝ විවිධය. ශුද්ධාත්මයාණන්වහන්සේට සතුටු අයුරින් උන්වහන්සේ එම දීමනාවන් එක් එක් ඇදහිලිවන්තයා අතර බෙදා දෙන සේක. නමුත් "ඵල" ඒක වචනය. එය මිදි පොකුරක උදාහරණයකින් අපට අවබෝධ කරගත හැකිය. මිදි පොකුරක ගෙඩි රාශියක් තිබේ. එහෙත් එය එක් පොකුරකි. ස්වාභාවික ලොවෙහි මිදි නෙලන අවස්ථාවේදී මුළු පොකුර පිටින්ම නෙලා ගනු ලැබේ. මෙලෙස පොකුරක් ලෙස පවතින මෙම ගෙඩි, මිදි "ඵලය" ලෙස හැඳින්වේ (ඒක වචන).

ආත්මික ලොවෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය මිදි පොකුරකට සමානය. එය විවිධ ආත්මික ගුණාංගයන්ගෙන් හෙබි එක් ඵල පොකුරකි. එම එක ඵලය ආත්මික පරිනතභාවයෙන් ක්‍රිස්තුස්වහන්සේ හා සමාන චරිත ගුණාංග වලින් හෙළිදරව්වේ.

| | | |
|---|---|---|
| එක ඵලයකි | ⇨ | **ආත්මික පරිනතභාවය.** |
| විවිධ ගුණාංග | ⇨ | මෘදුකම,පමණදැන ක්‍රියාකිරීම. ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, කරුණාවන්තබව, යහපත්කම, ඉවසිලිවන්තකම, විශ්වාසවන්තකම. |

දෙවියන්වහන්සේ සියලු ඇදහිලිවතුන් මෙම ශුද්ධාත්ම ඵල සහිතව සිටීමට අපේක්ෂා කරනසේක. දීමනා (බහුවචන) බොහෝවන අතර ඇදහිලිවතුන් අතර බෙදා දෙන නමුත් ඵලය (ඒකවචන) සෑම ඇදහිලිවන්තයෙකු සතුවිය යුතුය.

ඇදහිලිවතුන් කරන්නාවූ සෑම යහපත්කමක්, ධර්මිෂ්ඨකමක්, සත්‍යයක් තුළම ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය නිරූපනය වේ.

> **ආලෝකයේ ඵල නම්, සියලු ආකාර යහපත් කමත් ධර්මිෂ්ඨකමත් සැබෑකමත්ය.** (එපීස 5:9)

පහත සඳහන් වනුයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය වේ.

## ප්‍රේමය

ඉතා ගැඹුරු ආදරයක්, සුරැකීමක් හා තැකීමක් සහිත හැඟීමකි. එය පුද්ගලයාගේ තත්වය හෝ බාහිර පරිසරය ,අවස්ථාව හෝ ගැන නොසලකා කොන්දේසි විරහිතව තමා වෙන කෙනෙකු උදෙසා දීමය. ආත්මික දීමනා පිළිබඳ ඔබගේ අධ්‍යයනයෙහිදී ඔබ ඉගෙන ගත් පරිදි සියලු ආත්මික දීමනා වලට රහස් යතුර නම් ප්‍රේමය වේ. සියලු ආත්මික ඵල වර්ධනය වන්නේද මෙම ගුණාංගයෙනි. ඔබ ආත්මික ඵල සඳහන් වන ගලාති පොතේ බයිබල් කොටස, "ප්‍රේමයේ" පරිච්ඡේදය වන 1 කොරින්ති 13 හා සංසන්දනය කළවිට පෙනී යයි.

| 1 කොරින්ති 13:1-7 | ගලාති 5:22-23 |
|---|---|
| ප්‍රේමය තමාගේම කාරණා සොයන්නේ නැත. | ප්‍රේමය |
| අධර්මිෂ්ඨකමට ප්‍රීති නොවී සැබෑව සමග ප්‍රීතිවන්නේය. | ප්‍රීතිය |
| ප්‍රේමය පාරට්ටු කරගන්නේ නැත. කෝපවන්නේ නැත. සියල්ල දරාගන්නේය. | සමාදානය |
| ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය, සියල්ල ඉවසන්නේය. | ඉවසිලිවන්ත. |
| ප්‍රේමය ඉවසිලිවන්තය, ගුණවන්තය: ඊර්ෂ්‍යා වන්නේ නැත. | කරුණාවන්ත (මෘදු) |
| ප්‍රේමය යහපත්ය, කාරුණිකය, ගුණවන්තය | ගුණවන්ත යහපත්. |
| සියල්ල විශ්වාස කරන්නේය, නපුර ගණන්ගන්නේ නැත. | විශ්වාසවන්ත. |
| ප්‍රේමය උඩගුවන්නේ නැත, තමාගේම කාරණා නොසොයයි. | යහපත්කම. |
| ප්‍රේමය අශෝභන ලෙස හැසිරෙන්නේ නැත. එය පාලනය වූ ජීවිතයක් පෙන්වයි. | පමණ දැන ක්‍රියා කිරීම. |

ශුද්ධාත්ම ඵලයක් මෙන්ම ශුද්ධාත්ම දීමනාවක් වන ඇදහිල්ල ක්‍රියා කරනුයේ ප්‍රේමයෙනි.

> **මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ප්‍රේමය කරණකොටගෙන ක්‍රියා කරන ඇදහිල්ලෙන් මිස, චර්මඡේදනයෙන්වත් අචර්මඡේදනයෙන්වත් ප්‍රයෝජනයක් නැත. (ගලාති 5:6)**

ප්‍රේමය නැමැති ආත්මික ඵලය, ලෝකයෙහි නිරූපණය කරන ආකාරයේ ප්‍රේමයක් නොවේ. එය "නොකිලිටු" ප්‍රේමයකි. එනම් ශුද්ධ වූ පවිත්‍ර පිවිතුරු ප්‍රේමයකි. ඔබ අන්‍යයන්ට දැක්විය යුත්තේ එවැනි ප්‍රේමයකි.

> **සහෝදරයන්ට අවංකකමින් ප්‍රේමකරන පිණිස සත්‍යතාවට කීකරුවීමෙන් නුඹලාගේ ආත්ම පිරිසිදුකරගත් බැවින් සිතින් එකිනෙකාට උනන්දුලෙස ප්‍රේමකරපල්ලා. (1 පේත්‍රුස් 1:22)**

ඔබ දෙවියන්වහන්සේට ප්‍රේම කළ යුතුය :

> **නුඹේ මුළු හෘදයෙන්ද නුඹේ මුළු ආත්මයෙන්ද නුඹේ මුළු බුද්ධියෙන්ද නුඹේ මුළු ශක්තියෙන්ද නුඹේ දෙවි වූ ස්වාමින්වහන්සේට ප්‍රේමකරපන්න යන එකය. (මාර්ක් 12:30)**

(1 යොහන් 2:5,15; 3:11-17; 4:7-20; 5:2; 11 යොහන් 1:5-6; ද්විතිය 6:5; ලූක් 10:27 බලන්න)

ඔබ ඔබගේ සතුරන්ටද ප්‍රේම කළ යුතු වේ.

> **නුමුත් අසන්නාවූ නුඹලාට මම කියමි: නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා. නුඹලාට වෛරකරන්නට යහපත කරපල්ලා. තවද නුඹලාට ප්‍රේම කරන්නන්ට නුඹලාත් ප්‍රේමකරනවා නම් නුඹලාට කවර ස්තුතියක්ද? මක්නිසාද පව්කාරයෝ පවා තමුන්ට ප්‍රේමකරන්නන්ට ප්‍රේම කරති. නුමුත් නුඹලාගේ සතුරන්ට ප්‍රේම කරපල්ලා, යහපතකරපල්ලා, සැක නොසිතා ණයට දීපල්ලා; එවිට නුඹලාගේ විපාකය මහත් වන්නේය; නුඹලා මහෝත්තමයාණන්ගේ පුත්‍රයෝ වන්නහුය. මක්නිසාද කෘතෝපකාර නොසලකන්නන්ටද දුෂ්ටයන්ටද උන්වහන්සේ කරුණාවන්තව සිටින සේක. (ලූක් 6:27,32,35)**

> **තාගේ අසල්වාසියාට ප්‍රේම කරව, තාගේ සතුරාට වෛරකරවයි කී බව නුඹලා අසා තිබේ. නුමුත් මම නුඹලාට කියමි: නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා, නුඹලාට පීඩා කරන්නන් උදෙසා යාච්ඤාකරපල්ලා; (මතෙව් 5:43-44)**

ඔබ ඔබට ප්‍රේම කරන ප්‍රමාණයටම ඔබගේ අසල්වැසියාටද ප්‍රේම කළ යුතු වේ.

**... තමාට මෙන් තමාගේ අසල්වාසියාට ප්‍රේමකරව යන මේවායයි කීසේක. (මතෙව් 19:19)**

යේසුස්වහන්සේ ඔබට ප්‍රේම කර ඇති පමණටම ඔබද අන්‍යයන්ට ප්‍රේම කිරීම එතුමා අපේක්ෂා කරනසේක:

**මා නුඹලාට ප්‍රේමකළාක්මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේමකරන ලෙස, එකිනෙකාට ප්‍රේමකරපල්ලාය කියා අලුත් ආඥාවක් මම නුඹලාට දෙමි. (යොහන් 13:34)**

**පියාණන්වහන්සේ මට ප්‍රේමකළාක්මෙන්ම මමත් නුඹලාට ප්‍රේමකළෙමි. මාගේ ප්‍රේමයෙහි පැවතියල්ලා. (යොහන් 15:9,12)**

**ඔබ මා කෙරෙහි ඇතුව සිටි ප්‍රේමය ඔවුන් තුළෙහිද මාත් ඔවුන් තුළෙහිද වන පිණිස ඔබගේ නාමය ඔවුන්ට දැන්වීමි, තවත් දන්වන්නෙමියි කීසේක. (යොහන් 17:26)**

අපි එකිනෙකාට දක්වන ප්‍රේමය තුළින් අප කිතුණුවන් බව හඳුනාගනු ඇත.

**නුඹලා එකිනෙකාට ප්‍රේමකරනවා නම්, නුඹලා මාගේ ගෝලයෝ බව එයින් සියල්ලන් දැනගන්නවා ඇතැයි කීසේක. (යොහන් 13:35)**

ඔබ අනෙක් ඇදහිලිවතුන්ට ප්‍රේම නොකරයි නම්, දේව ප්‍රේමය ඔබ තුළ නැත:

**ආලෝකයෙහි පවතිමියි කියමින් තමාගේ සහෝදරයාට වෛරවෙන්නා මේතාක් අඳුරෙහි සිටියි. තමාගේ සහෝදරයාට ප්‍රේමවෙන්නා ආලෝකයෙහි පවතියි, පැකිලීමට කාරණයක්ද ඔහු තුළ නැත. (1 යොහන් 2:9-10)**

(මෙය ඉතා වැදගත් සත්‍යයකි: එය තවදුරටත් අධ්‍යයනය කරන්න. යොහන් 13:34; 14:15,21,23,31; 15:9-19; 17:26; 21:15-17)

ඔබගේ ප්‍රේමය වැඩි විය යුතුය (වැඩි වෙමින් පැවතිය යුතුය).

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණ කොටගෙන දෙවියන්වහන්සේට ගෞරවය හා ප්‍රශංසාව සඳහා, නුඹලා ධර්මිෂ්ඨකමේ ඵල වලින් පූර්ණව (පිලිප්පි 1:9)**

**අප නුඹලාට ප්‍රේමකරන්නාක් මෙන්ම ස්වාමීන්වහන්සේ නුඹලාගෙන් එකිනෙකා කෙරෙහිත් අනික් සියල්ලන් කෙරෙහිත් නුඹලාගේ ප්‍රේමය වැඩිකර, එයින් නුඹලා පුරවා, (1 තෙසලෝනික 3:12)**

ඔබ ප්‍රේමයෙහි මුල් ඇද සවි වී සිටිය යුතුය.

**ඇදහිල්ල කරණකොටගෙන ක්‍රිස්තුස්වහන්සේ නුඹලාගේ සිත් තුළ වාසයකරන පිණිසත්, නුඹලා ප්‍රේමයෙහි මුල් ඇද පිහිටා සිට, දෙවියන්වහන්සේගේ මුළු පූර්ණකමට පූර්ණවන පිණිස සියලු ශුද්ධවන්තයන් සමග ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන, එහි පළල, දිග උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම්ගන්ට නුඹලාට පුළුවන්වන පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤාකරමි. (එපීස 3:17-19)**

ඔබ ප්‍රේමයෙන් එකිනෙකාට සම්බන්ධතාවය දැක්විය යුතුය. "ඉවසීමෙන්" ක්‍රියාකළ යුතුය:

**සියලු ආකාර යටහත්කමින්ද මොළොක් ගුණයෙන්ද ඉවසිලිවන්තකමෙන්ද හැසිර, එකිනෙකා ගැන ප්‍රේමයෙන් ඉවසා, (එපීස 4:2)**

ඔබ ප්‍රේමයෙහි පැවතිය යුතුය:

**සදාකාල ජීවනය පිණිස අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දයාව බලාසිටිමින්, දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙහි පැවතියල්ලා. (යුද් 21)**

**නුමුත්, දෙවියන්වහන්සේගේ මනුෂ්‍යය, නුඹ වනාහි මේවායින් පලාගොස්, ධර්මිෂ්ඨකමද භක්තිවන්තකමද ඇදහිල්ලද ප්‍රේමයද ස්ථිරකමද මොළොක්ගුණයද පස්සේ පලයන්න. (1 තිමෝති 6:11)**

ඔබ ස්වාමින්වහන්සේ උදෙසා කරන සේවය ප්‍රේමයේ සේවයක් විය යුතුය:

**අපේ යාච්ඤාවලදී නුඹලා ගැන මතක්කරමින්, නුඹලා සියල්ලන් ගැන සෑමවේලේම දෙවියන්වහන්සේට ස්තුතිකරමුව. (1 තෙසලෝනික 1:3)**

**මක්නිසාද නුඹලාගේ වැඩයද නුඹලාගේ ශුද්ධවන්තයන්ට කළාවූ, කරන්නාවූ උපස්ථානයෙන් දෙවියන්වහන්සේගේ නාමයට පෙන්නූ ප්‍රේමයද මතකනැතිකරන්ට උන්වහන්සේ අධර්මිෂ්ඨ නැත. (හෙබ්‍රෙව් 6:10)**

පොළොවෙහි වෙසෙන අප ලෝකාන්තිමයට සමීප වෙත්ම අපගේ ප්‍රේමය හිනවී යනු ඇත. මනුෂ්‍යයෝ අන් අය පිළිබඳ සැලකිලිමත්වීම ක්‍රමයෙන් හින වී "වියැකී යනු" ඇත.

**අධර්මිෂ්ඨකම බෝවන බැවින් බොහෝ දෙනාගේ ප්‍රේමය හිනවන්නේය. (මතෙව් 24:12)**

දේව ප්‍රේමයෙන් අපව වෙන් කළ හැකි කිසිවක් නොමැති බවට අපට නිසැක කමක් සපයා තිබේ:

**ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්නේ කවුද? විපතවත්, සිත් වේදනාවවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්, නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත්, කඩුවවත් අප වෙන්කරන්නේද? මක්නිසාද මරණයටවත්, ජීවනයටවත්, දූතයන්ටවත්, අධිපතිකම්වලටවත්, දැන් පවතින දේවලටවත්, පරාක්‍රමවලටවත්, උසටවත්,ගැඹුරටවත්, අන් කිසි මැවිල්ලකට වත්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්ට නොහැකිවන්නේයයි ඒකාන්තයෙන්ම දනිමි. (රෝම 8:35,38-39)**

දාවිත් ප්‍රේමය පිළිබඳව බොහෝ කාරණා ලිවීය. ගීතාවලිය 31:23; 18:1; 40:16; 97:10; 116:1; 119:97,113,119,127,132,159,163,105,167; 122:6; 145:20; බලන්න. 1 යොහන් පොත අධ්‍යයනය කරන්න. ප්‍රේමය එම පොතෙහි ප්‍රධාන තේමා වලින් එකකි.

## ප්‍රීතිය

ප්‍රීතිය යනු සතුටුවීමේ, ප්‍රබෝධමත්වීමේ හා අතිශයින් සන්තෝෂවීමේ ගුණාංගයකි.

ආත්මික ඵලයක් වන ප්‍රීතිය සහ සන්තෝෂය නම් චිත්ත හැඟීම එකම දෙයක් නොවේ. එම කාරණා දෙකෙහි මූලාරම්භය ප්‍රභව දෙකකිනි. සන්තෝෂය මෙලොවින් පැමිණෙන අතර එය අවට සිදුවීම් මත රඳා පවතී. ප්‍රීතිය ආරම්භවන්නේ දෙවියන්වහන්සේගේ ආත්මයෙනි; එය අප අවට පවතින සිදුවීම් අනුව රඳා නොපවතී.

යේසුස්වහන්සේ එතුමාගේ උපතින් ප්‍රීතිය ගෙනාසේක:

**දේවදූතයා ඔවුන්ට කථාකොට; භයනොවෙල්ලා; බලව මුළු සෙනඟට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි. මක්නිසාද ස්වාමිවූ ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් නුඹලාට දාවිත්ගේ නුවර අද උපන්සේක. (ලූක් 2:10-11)**

ඔබ ප්‍රීතියෙන් සිටීම දෙවියන්වහන්සේගේ ආශාවය :

**මාගේ ප්‍රීතිය නුඹලා තුළෙහි පවතින පිණිසද නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණවන පිණිසද මේ දේවල් නුඹලාට කීවෙමි. (යොහන් 15:11)**

**නුමුත් දැන් නුඹ ළඟට එමි; මා ලෝකයෙහිදී මේ දේවල් කථාකරන්නේ ඔවුන් මාගේ ප්‍රීතිය තමුන් තුළ සම්පූර්ණ ලෙස ලබන පිණිසය. (යොහන් 17:13)**

ගෝලයෝ ප්‍රීතියෙන් සහ ශුද්ධාත්මයෙන් පිරී සිටියෝය:

**ගෝලයෝ වනාහි ප්‍රීතියෙන්ද, ශුද්ධාත්මයෙන්ද පූර්ණවූහ. (ක්‍රියා 13:52)**

ඇදහිලිවන්තයාට ප්‍රීතිය ගෙන දෙන්නේ ලෞකික භාණ්ඩ නොව දෙවියන්වහන්සේය:

**ඔබ මට ජීවන මාර්ගය දක්වනසේක. ඔබ අභිමුඛයෙහි ප්‍රීතියේ සම්පූර්ණකම ඇත්තේය; ඔබගේ දකුණු පැත්තෙහි සදාකාලේටම සැපත ඇත්තේය. (ගීතාවලිය 16:11)**

ඔබගේ ප්‍රීතිය ආත්මික මෙන්ම බාහිර සිදුවීම් මත රැදී නොපවතින බැවින් පරීක්ෂාවකදී පවා ඔබට ප්‍රීති විය හැක.

**මාගේ සහෝදරයෙනි, නුඹලාගේ ඇදහිල්ල සෝදිසිකිරීමෙන් ක්ෂාන්තිගුණය උපදින බව දැන, (යාකොබ් 1:2)**

පීඩාකාලයේදී ඔබට ප්‍රීතිවිය හැක: (අපහසුතා මැද)

**නුඹලා කෙරෙහි තිබෙන මාගේ විශ්වාසය මහත්ය, නුඹලා ගැන මාගේ පාරට්ටුකිරීම මහත්ය, සැනසිල්ලෙන් පූර්ණව සිටිමි, අපේ සියලු දුක්වලදී ප්‍රීතියෙන් පිනමි. (2 කොරින්ති 7:4)**

ප්‍රීතිය සමග ඔබට බොහෝ දරාගත හැකිය:

**ප්‍රීතිය ඇතුව සියලු ආකාර ස්ථිරකමටත් ඉවසිලිවන්තකමටත් උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලු ආකාර බලයෙන් ශක්තිමත්වෙමින්ද (කොලොස්සි 1:11)**

ප්‍රීතිය දේව රාජ්‍යයෙහි අංගයකි :

**මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය කෑමත් බීමත් නොව, ධර්මිෂ්ඨකමද සමාදානයද ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීතියද වේ. (රෝම 14:17)**

බයිබලය ඇදහිලිවතුන්ට ප්‍රීතිවීමටත් එම ප්‍රීතිය ස්වාමීන්වහන්සේ වෙතට ප්‍රකාශ කිරීමටත් දිරිගන්වා ඇත.

**නුමුත් ඔබ සරණකොට ගන්න සියල්ලෝ සන්තෝෂවෙත්වා, ඔබ ඔවුන් ආරක්ෂාකරන බැවින් සදාකල් ප්‍රීතිනාදකෙරෙත්වා. ඔබගේ නාමයට ප්‍රේමකරන්නෝ ඔබ කෙරෙහි ප්‍රීතිවෙත්වා, (ගීතාවලිය 5:11)**

(ගීතාවලිය 35:9; 63:5; 66:1; 81:1; 95:1-2; 149:5; 98:4,6,8; 100:1 බලන්න.)

## සමාදානය

සමාදානය යනු නිසංසල, තැන්පත්, සැහැල්ලු, වින්දනයකින් යුත් තත්වයකි. එහි ඝට්ටන, තරඟ, කරදරවීම් හා තැකීම් නොමැත. එහෙත් එය අක්‍රියතාවය නොවේ. සමාදානය රැකගෙන සිටින්නාගේ පාර්ශවයෙන් එය ප්‍රබල ක්‍රියාවකි.

සමාදානයෙහි ප්‍රතිවිරුද්ධ බව නම් වියවුලය. දෙවියන්වහන්සේ වියවුල් ඇති නොකරන සේක. එතුමාගේ ආගාව නම් සමාදානය ගෙන ඒමය:

**මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල් කමේ නොව සමාදානයේ දෙවියන්වහන්සේය; ශුද්ධවන්තයන්ගේ සියලු සභාවන්හි එසේමය. (1 කොරින්ති 14:33)**

යේසුස්වහන්සේ මිහිපිට සමාදානය ගෙන ආ සේක:

**ඉතා උසස්තැන්හි දෙවියන්වහන්සේට මහිමයද පොළොවෙහි උන්වහන්සේට ප්‍රියවූ මනුෂ්‍යයන් අතරෙහි සමාදානයද වේවයි කීවෝය. (ලූක් 2:14)**

සියලු සැබෑ සාමය බිහිවන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළිනි:

**උන්වහන්සේ සියල්ලන්ගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන සමාදානයේ යහපත් ආරංචිය ප්‍රකාශකරවමින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට එවනලද වචනය නුඹලා දන්නහුය: (ක්‍රියා 10:36)**

**මක්නිසාද වෙන්කිරීම් මැද භිත්තිය බිඳදමා, ඒ සතුරුකම නමැති නියෝගවල අන්තර්ගතවූ ආඥාව ව්‍යවස්ථාව තමන්ගේ මාංසයෙන් නැතිකොට, දෙගොල්ල එක්කළ උන්වහන්සේම අපේ සමාදානයව සිටිනසේක.... (එපීස 2:14,15)**

**එබැවින් අපි ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨකරනු ලැබ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ හා සමග සමාදානය ඇතුව සිටිමු. (රෝම 5:1)**

යේසුස්වහන්සේ තම ශ්‍රාවකයන්ට විශේෂ සමාදානයක් තබා ගිය සේක:

**නුඹලා වෙත සමාදානය තබා යමි: මාගේ සමාදානය නුඹලාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. නුඹලාගේ සිත් කැලඹෙන්ටවත් භයවෙන්ටවතක් නොදෙල්ලා. (යොහන් 14:27)**

යේසුස්වහන්සේගේ ඉගැන්වීම් සමාදානය ගෙන දුන්නේය:

**මා තුළ නුඹලාට සමාදානය තිබෙන පිණිස මේ දේවල් නුඹලාට කීවෙමි. ලෝකයෙහි නුඹලාට පීඩා තිබේ. නුමුත් ධෛර්‍ය්‍යවත් වෙයල්ලා: මම ලෝකයෙන් ජයගතිමියි කීසේක. (යොහන් 16:33)**

ශුභාරංචිය සමාදානයේ පණිවුඩයකි :

**සමාදානයේ ශුභාරංචියේ සූදානම නැමති වහන් පය ලා සිටපල්ලා. (එපීස 6:15)**

සමාදානයෙහි වර්ග දෙකකි. ඉන් පළමු වැන්න දෙවියන්වහන්සේ සමග සමාදානය වේ.

**එබැවින් අපි ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨකරනු ලැබ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ හා සමග සමාදානය ඇතුව සිටිමු. (රෝම 5:1)**

ඔබ දෙවියන්වහන්සේ සමග සමාදානය ඇති කරගත් පසුව, ඔබගේ ජීවිතයට දෙවියන්වහන්සේගේ සමාදානය ලැබිය හැක:

**එවිට කිසි නුවණකින් දැනගත නොහැකිවූ දෙවියන්වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලාගේ සිත්ද සිතිවිලිද ආරක්ෂාකරනවා ඇත. (පිලිප්පි 4:7)**

සමාදානය ගෙන දෙන කාරණා අනුගමනය කරන ලෙසට අපට පවසා තිබේ.

**එබැවින් අපි සමාදානය උපදවන කාරණාද එකිනෙකා වැඩිදියුණුකරන්ට පුළුවන් කාරණාද අනුව යමු. (රෝම 14:19)**

අපි සමාදානයෙන් ජීවත් විය යුතුය:

**ඉතින් සහෝදරයෙනි, සුවසේ සිටපල්ලා. සම්පූර්ණවෙයල්ලා: සැනසීසිටපල්ලා: එක්සිත්වෙයල්ලා: සමාදානයෙන් සිටපල්ලා. එකල ප්‍රේමයේ හා සමාදානයේ දෙවියන්වහන්සේ නුඹලා සමග වනසේක. (2 කොරින්ති 13:11)**

අප සියලු මනුෂ්‍යයන් සමග සමාදානයෙන් යුතුව ජීවත් විය යුතුය.

**සියල්ලන් සමග සමාදානයෙන් සිටින්ටත්, ශුද්ධකම නැතුව කිසිවෙක් ස්වාමින්වහන්සේ නොදක්නා බැවින් ශුද්ධකම අනුවනයන්ටත් උත්සහ කරපල්ලා. (හෙබ්‍රෙව් 12:14)**

අපි දෙවියන්වහන්සේගේ එකමුතු බව සමාදානයෙන් රැකගත යුතු වේ.

**සමාදානයේ බැම්මෙන් ආත්මයාණන්ගේ එකමුතුකම පවත්වාගන්ට උත්සාහ කරන මෙන්, ස්වාමීන්වහන්සේ නිසා හිරකාරයෙක්ව සිටින මම නුඹලාගෙන් ඉල්ලමි. (එපීස 4:3)**

දෙවියන්වහන්සේගේ සමාදානය අප සිත් තුළ රජකම් කළ යුතුවේ :

**ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය නුඹලාගේ සිත්වල ආණ්ඩුකෙරේවා. ඒ පිණිස නුඹලා එක ශරීරයක්ව සිටීමට කැඳවාගනු ලැබුවහුය: ස්තුතිවන්තවද සිටපල්ලා. (කොලොස්සි 3:15)**

අප සියලු අවස්ථාවලදී සමාදානයෙන් ජිවත්විය යුතුය:

**ඉන්නිසා, ප්‍රේමවන්තයෙනි, නුඹලා මේ දේවල් බලාසිටින බැවින්, උන්වහන්සේ ඉදිරියෙහි කැලැල් රහිතව, නිදොස්ව, සමාදානයෙන් යුක්තව දකිනු ලබන පිණිස උත්සාහකරපල්ලා. (2 පේත්‍රුස් 3:14)**

## ඉවසිලිවන්තබව

ඉවසිලිවන්තකම යනු දරාගෙන සිටීමය. එනම්, ඉවසා දරාගත නොහැකි අවස්ථාවකදී ප්‍රීතිමත්ව එය ඉවසා දරා ගෙන සිටීමට හැකියාවය. ඉවසිලිවන්තබව දෙවියන්වහන්සේගේ ගුණාංගයකි.

**ස්වාමීන්වහන්සේ ඔහු ඉදිරිපිටින් වඩිමින්: ස්වාමීන්වහන්සේය, ස්වාමීන්වහන්සේය, උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණවූ දයාවන්තවූ උදහස්වන්නට ප්‍රමාදවන්නාවූ අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ දෙවිකෙනෙක්ය. (නික්මයාම 34:6)**

**උන්වහන්සේ අයුතුකම හා වරද ක්ෂමාකරනසේක... (ගණන්කථාව 14:18)**

**එහෙත් ස්වාමිනි, ඔබ අනුකම්පාවෙන්ද කරුණාවෙන්ද පූර්ණවූ, කෝපවීමට ප්‍රමාදවන්නාවූ, දයාවෙන් හා සත්‍යයෙන් මහත්වූ දෙවිකෙනෙක්ය. (ගීතාවලිය 86:15)**

**...අපගේ ස්වාමීන්වහන්සේගේ ඉවසිලිවන්තකම ගැළවීමයයි සලකාපල්ලා (2 පේත්‍රුස් 3:15)**

**නොහොත් නුඹ පසුතැවිල්ලට පමුණුවන පිණිස දෙවියන්වහන්සේගේ යහපත්කම් පවතින බව නොදැන, උන්වහන්සේගේ යහපත්කමේද ක්ෂාන්තියේද ඉවසීමේද බහුලත්වය සුළු කොට සිතා, (රෝම 2:4)**

ප්‍රේරිත වූ පාවුල්ගේ සේවා දිවියෙහි ඉවසිලිවන්තකම දක්නට ලැබේ:

**නුමුත් මාගේ ඉගැන්වීමද හැසිරීමද අභිප්‍රායද ඇදහිල්ලද ඉවසිලිවන්තකමද ප්‍රේමයද ක්ෂාන්තියද, (2 තිමෝති 3:10)**

අපට පවසා ඇත්තේ ප්‍රීතියෙන් යුක්තව ඉවසා දරා ගැනීමටය:

**ප්‍රීතිය ඇතුව සියලු ආකාර ස්ථිරකමටත් ඉවසිවන්තකමටත් උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලු ආකාර බලයෙන් ශක්තිමත් වෙමින්ද, (කොලොස්සි 1:11)**

අපහට ඉවසිලිවන්ත වන ලෙස පවසා ඇත:

**සියලු ආකාර යටහත් කමින්ද මොළොක් ගුණයෙන්ද ඉවසිලිවන්තකමෙන්ද හැසිර, එකිනෙකා ගැන ප්‍රේමයෙන් ඉවසා, (එපීස 4:2)**

අප ඉවසිලිවන්තව දේව වචනය දේශනා කළ යුතුවෙමු:

**වචනය දේශනා කරපන්න: කලටත් අකලටත් වැඩේ යෙදී සිටපන්න: සියලු ආකාර ඉවසිලිවන්තකමෙන් සහ ඉගැන්වීමෙන් තරවටුකර, අවවාදකර, අනුශාසනාකරපන්න කියාය. (2 තිමෝති 4:2)**

ඇදහිලිවන්තයෝ ආත්මික ගුණාංගයක් ලෙසට "ඉවසිලිවන්ත බව" පැළඳගත යුතුය:

> **එබැවින් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමවන්තවූ තෝරාගත්තවුන් මෙන් දයාබර හිතක්ද ගුණවන්තකමක්ද යටත්කමද මෘදුකමද ඉවසිලිවන්තකමද පැළඳගෙන,** (කොලොස්සි 3:12)

## කරුණාවන්තකම

මෘදුකම යනු සුමුදු,රළු නොවන,කළහකාරී නොවන, ඝෝසාකාරී නොවන රටාවකි. එය නිශ්චල, ගෞරවණීය කාරුණික බවකි.

බයිබලය ඇදහිලිවතුන්ට අවවාද කරනුයේ සියලු මනුෂ්‍යයන්ට රළු පරුෂ නොවී කාරුණික වන ලෙසටය.

> **ස්වාමීන්වහන්සේගේ දාසයා ඩබරනොකර, සියල්ලන් කෙරෙහි ගුණවන්තවූ, උගන්වන්ට සමර්ථවූ, ඉවසිලිවන්තවූ කෙනෙක්ව සිට,** (2 තිමෝති 2:24)

අපි කළහකාරී ඝෝෂාකාරී අය නොවිය යුතු වෙමු. ඔව්හු සැමවිටම කළහ කරමින් වාද විවාද කරමින් පසුවෙති:

> **කිසිවෙකු ගැන අගුණ නොකියන්ටද, ඩබරකාරයන් නොවී ඉවසිලිවන්තව සිට, සියලු මනුෂ්‍යයන් ගැන සියලූ ආකාර මොළොක්ගුණය පෙන්වන්ටද ඔවුන්ට සිහිකරවාපන්න.** (තීතස් 3:2)

අපගේ කාරුණික බව නිසා අන් අයට පහසුවෙන් අපට කතා කිරීමට, සමීප වීමට හැකියාව තිබිය යුතුය.

> **නුමුත් ඉහළින් පැමිණෙන ප්‍රඥාව පළමුකොට පිරිසිදුව, ඊළඟට සමදානව, ඉවසිලිවන්තව, යටහත්ව, දයාවෙනුත් යහපත් ඵලවලිනුත් පූර්ණව, අපක්ෂවාදීව, අවංකව තිබේ.** (යාකොබ් 3:17)

දාවිත් ලියුවේ:

> **තවද ඔබගේ ගැළවීම නැමැති පළිහ මට දුන්සේක. ඔබගේ දකුණත මා දැරුවේය, ඔබගේ මෘදුකම මා උසස්කළේය.** (ගීතාවලිය 18:35)

## යහපත්කම

යහපත්කම නම් ශුද්ධකමේ හෝ ධර්මිෂ්ඨකමේ ක්‍රියාවන්ය. යහපත්කම දෙවියන්වහන්සේගේ චරිත ගුණාංගයකි.

> **එම්බා බලවන්තය, නුඹ නපුරු ක්‍රියායෙහි කුමට පාරට්ටුකරගන්නෙහිද? දෙවියන්වහන්සේගේ කරුණාව නිතරම පවත්නේය.** (ගීතාවලිය 52:1)

> **ස්වාමීන්වහන්සේගේ යහපත්කම හා මනුෂ්‍ය පුත්‍රයන්ට කරන පුදුම ක්‍රියා ගැන මනුෂ්‍යයෝ උන්වහන්සේට ස්තුති කෙරෙත්වා.** (ගීතාවලිය 107:8,15,21,31)

> **උන්වහන්සේ මට කරුණා නිධානයය, මාගේ බලකොටුවය, මාගේ උස් කොටුව හා මාගේ මිදුම්කරුය. මාගේ පලිහ හා මා විසින් විශ්වාසය තබන තැනැන්වහන්සේය, මාගේ සෙනඟ මට යටත්කරදෙන්නේ උන්වහන්සේය.** (ගීතාවලිය 144:2)

පොළොව දෙවියන්වහන්සේගේ යහපත්කම පෙන්නුම් කරයි.

> **උන්වහන්සේ ධර්මිෂ්ඨකමටත් යුක්තියටත් ප්‍රියවනසේක. පොළොව ස්වාමීන්ගේ කරුණාගුණයෙන් පූර්ණය.** (ගීතාවලිය 33:5)

දෙවියන්වහන්සේගේ යහපත් කමින් වසර සරසනසේක. එහි අර්ථය නම්, සෑම වසරකම ආශිර්වාද එතුමාගෙන් පැමිණෙන බවය.

**ඔබ ස්වකීය යහපත්කම නැමති ඔටුන්නෙන් අවුරුද්ද සරසනසේක: ඔබගේ මාවත්වලින් සාරත්වය වැගිරෙයි. (ගීතාවලිය 65:11)**

පව්කරුවන් පසුතැවිල්ලට යොමු කරන පිණිස දෙවියන්වහන්සේගේ යහපත්කම පෙන්නුම් කරනසේක:

**නොහොත් නුඹ පසුතැවිල්ලට පමුණුවන පිණිස දෙවියන්වහන්සේගේ යහපත්කම පවතින බව නොදැන, උන්වහන්සේගේ යහපත්කමේද ක්ෂාන්තියේද ඉවසීමේද බහුලත්වය සුළු කොට සිතා, (රෝම 2:4)**

දෙවියන්වහන්සේගේ යහපත්කම නොවේ නම්, තමා ක්ලාන්ත වන බව දාවිත් රජු ප්‍රකාශ කළේය:

**ජීවතුන්ගේ දේශයෙහි ස්වාමීන්ගේ යහපත්කම දකින්ට ලැබේයයි නොඇදහුවෙම් නම් කොපමණ අසරණද? (ගීතාවලිය 27:13)**

අප උදෙසා දෙවියන්වහන්සේගේ යහපත්කම රැස්කොට තබා ඇති බව දාවිත් පවසයි :

**ඔබ කෙරෙහි භය ඇත්තන්ට නිදාන කර තැබුවාවූ, ඔබ කෙරෙහි විශ්වාසය තබන්නන්ට මනුෂ්‍ය පුත්‍රයන් ඉදිරියෙහි ඔබ කළාවූ ඔබගේ යහපත්කම කොපමණ මහත්ද!**
**(ගීතාවලිය 31:19)**

දෙවියන්වහන්සේ කුසගිනි ඇත්තන්ව යහපත්කමින් පුරවන සේක:

**මක්නිසාද උන්වහන්සේගේ පිපාසිතයා තෘප්තියට පමුණුවා, ක්ෂුධා ඇත්තා යහපතින් පිනවනසේක. (ගීතාවලිය 107:9)**

ඇදහිලිවන්තයෙකු ලෙසට යහපත් කමත් කරුණාවත් ඔබ වෙතට එන්නේය:

**සැබැවින්ම යහපත්කමත් කරුණාවත් මාගේ ජීවිතයේ සියලු දවස්වල මා අනුව එන්නේය. මම සදාකල්ම ස්වාමීන්ගේ ගෘහයෙහි වාසයකරන්නෙමි. (ගීතාවලිය 23:6)**

## ඇදහිල්ල

ආත්මික දීමනාවක් ලෙසට ඔබ ඇදහිල්ල පිළිබඳ ඉගෙන ගත්තෙහිය. ඇදහිල්ල දීමනාවක් ලෙසට ඉදිරිපත් කළ සියලු සංකල්ප ඵලයක් ලෙසටද එලෙසම බලපායි.

මීට පෙර ඵලය හා දීමනාව යන දෙක අතර පවතින වෙනස්කම විස්තර කළ බැවින් එය මතක් කරගන්න. දීමනාවක් ලෙසට ඇදහිල්ල බලයකි: ක්‍රියාවකි. එය අන් අය දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසයක් නොමැති විටදී පවා ඇදහිලිවන්තයාව ක්‍රියාවකට යොමුකරවන දෙවියන්වහන්සේ කෙරෙහි දැඩි විශ්වාසය වේ. ඵලයක් ලෙසට ඇදහිල්ල චරිත ගුණාංගයකි. එය දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලේ ආකල්පයකි. ඵලයේ වර්ධනය සිදු වන්නේ දෙවියන්වහන්සේගේ ජීවනය අප තුළ ක්‍රියා කිරීම නිසා ඇතිවන අපගේ ආත්මික වර්ධනය මගිනි. සෑම කෙනෙකුම සතුව ඇදහිල්ලේ දීමනාව නොතිබුණද සෑම ඇදහිලිවන්තයෙකුම සතුව ඇදහිල්ලේ ඵලය තිබිය යුතු වේ.

## මෘදුකම

මෘදුකම යනු පාලනය කරන ලද ශක්තියයි. පසුබට වුවකු නැවත ගොඩ නැංවීමට භාවිතා කරන ක්‍රමය නම් මෘදුකමින් ක්‍රියා කිරීමය. පසුබට වූවෙකු නම් යේසුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගෙන සිට නැවතත් පාපිෂ්ඨ ජීවිතයට හැරී ගිය මනුෂ්‍යයෙකි.

**එබැවින් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමවන්තවූ තෝරාගත්තවුන් මෙන් දයාබර හිතක්ද ගුණවන්තකමක්ද යටත්කමද මෘදුකමද ඉවසිවන්තකමද පැළඳගෙන, එකිනෙකා ගැන ඉවසමින්, යමෙකුට විරුද්ධව යමෙකුගේ කාරණයක් ඇත්නම් එකිනෙකාට කමාවෙයල්ලා: ස්වාමීන්වහන්සේ නුඹලාට කමාවුණාක්මෙන් නුඹලාත් කරපල්ලා. (කොලොස්සි 3:12-13)**

**සහෝදරයෙනි, මනුෂ්‍යයෙක් යම් වරදකට අසුවුණත්, ආත්මිකවූ නුඹලා මෘදුකමේ ආත්මයෙන් යුක්තව එබඳු කෙනෙකු හරවාගනිල්ලා. නුඹත් පරීක්ෂාවට නොපැමිණෙන පිණිස බලාගනිල්ලා. (ගලාති 6:1)**

මෘදුකම සභාවේ එකමුතු කම පවත්වා ගනී:

**එබැවින් නුඹලා කැඳවනු ලැබූ කැඳවීමට ඔබිනලෙස, සියලු ආකාර යටහත්කමින්ද, මොළොක් ගුණයෙන්ද, ඉවසිලිවන්තකමෙන්ද, හැසිර, එකිනෙකා ගැන ප්‍රේමයෙන් ඉවසා, සමාදානයේ බැම්මෙන් ආත්මයාණන්ගේ එකමුතුකම පවත්වාගන්ට උත්සහ කරන මෙන්, ස්වාමින්වහන්සේ නිසා හිරකාරයෙක්ව සිටින මම නුඹලාගෙන් ඉල්ලමි. (එපීස 4:1-3)**

සියලු මනුෂ්‍යයන් සමග ක්‍රියාකිරීමේදී මෘදුකමින් හැසිරිය යුතුය:

**ස්වාමින්වහන්සේගේ දාසයා ඩබර නොකර, සියල්ලන් කෙරෙහි ගුණවන්තවූ, උගන්වන්ට සමර්ථවූ, ඉවසිලිවන්තවූ කෙනෙක්ව සිට, විරුද්ධව සිටින්නන් විසින් සැබෑව දැනගන්නා පිනිසද, යක්ෂයා තමාගේ කැමැත්ත කිරීමට අසුකරගත් ඔවුන් මත්කමෙන් පිබිද, (2 තිමෝති 2:24-25)**

**කිසිවකුගැන අගුණ නොකියන්ටද, ඩබරකාරයන් නොවී ඉවසිලිවන්තව සිට, සියලු මනුෂ්‍යයන් ගැන සියලු ආකාර මොළොක්ගුණය පෙන්වන්ටද ඔවුන්ට සිහිකරවාපන්න. (තිතස් 3:2)**

ඔබ මෘදුකමින් යුතුව දේව වචනය පිළිගත යුතුය:

**එබැවින් සියලු කිලුටුකමද, අධික දුෂ්ඨකමද පහකොට, නුඹලාගේ ප්‍රාණ ගළවන්ට පුළුවන්වූ, පිහිටුවන ලද වචනය මෘදුකමින් යුක්තව පිළිගනිල්ලා. (යාකොබ් 1:21)**

ප්‍රඥාවන්ත මිනිසා මෘදු මිනිසෙකි.

**නුඹලා අතරෙහි ප්‍රඥාවත්වූ තේරුම් ඇත්තාවූ කවුද? ඔහු යහපත් හැසිරීමෙන් තමාගේ ක්‍රියා ප්‍රඥාවේ මෘදුකම ඇතුව පෙන්වාවා. (යාකොබ් 3:13)**

ඇදහිලිවන්තයන්හට මෙම මෘදු ගුණාංගය සෙවීමට දිරිගන්වා ඇත.

**එබැවින් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමවන්තවූ තෝරාගත්තවුන් මෙන් දයාබර හිතක්ද ගුණවන්තකමක්ද යටත්කමද මෘදුකමද ඉවසිලිවන්තකමද පැළඳගෙන, (කොලොස්සි 3:12)**

**නුමුත්, දෙවියන්වහන්සේගේ මනුෂ්‍යය, නුඹ වනාහි මේවායින් පලාගොස්, ධර්මිෂ්ඨකමද, භක්තිවන්තකමද, ඇදහිල්ලද ප්‍රේමයද ස්ථිරකමද මොළොක්ගුණයද පස්සේ පලයන්න. (1 තිමෝති 6:11)**

**... උන්වහන්සේ සොයාපල්ලා, ධර්මිෂ්ඨකම සොයාපල්ලා, මොළොක් ගුණය සොයාපල්ලා, සමහරවිට නුඹලා ස්වාමින්වහන්සේගේ උදහස් දවසේදී සඟවනු ලබනවා ඇත. (ශෙපනියා 2:3)**

## පමණ දැන ක්‍රියාකිරීම

පමණ දැන ක්‍රියා කිරීම නම් හැඟීම්වලින්, සිතුවිලි වලින් ක්‍රියාවෙන් විනීත වීමය. එය ස්වයං පාලනයකි. පමණ දැන ක්‍රියා කිරීම සියලු කාරණාවලදී දක්ෂ ලෙස හැසිරීමය.

**නුමුත් මාගේ ශරීරය දමනය කර වාල්කමට පමුණුවමි. එසේ කරන්නේ අනුන්ට දේශනාකළාට පසු කොයි ලෙසකින්වත් මාම එපාකරනු නොලබන පිණිසය. (1 කොරින්ති 9:27)** (1 කොරින්ති 9:19-27 බලන්න)

අපගේ ජිවිතවලට පමණ දැන ක්‍රියාකිරීම එකතුකරගන්න යැයි පවසා ඇත.

**දැනගැන්ම සමග පමණ දැන ක්‍රියා කිරීමද, පමණ දැන ක්‍රියා කිරීම සමග ඉවසිල්ලද, ඉවසිල්ල සමග දේව භක්තියද (2 පේත්‍රුස් 1:6)**

පාවුල්ගේ ශුභාරංචියෙහි පණිවුඩයෙහි කොටසක් වුයේ පමණ දැන ක්‍රියාකිරීමය:

**ඔහු ධර්මිෂ්ඨ කමද පමණ දැන ක්‍රියාකිරීමද පැමිණෙන්නාවූ විනිශ්චය ගැන කථාකරද්දී පිලික්ස් භයපත්ව: දැනට පලයන්න:...**
**(ක්‍රියා 24:25)**

# ඵලයෙහි ඇති වැදගත්කම

යේසුස්වහන්සේ ඵල දැරීම පිළිබදව මහත් අවධාරණයක් යොමුකළ සේක. එක් උපමාවකදී එතුමා පැවසුයේ:

**උන්වහන්සේ මේ උපමාව කියනසේක්: එක් මනුෂ්‍යයෙකුගේ මිදිවත්තෙහි අත්තික්කා ගහක් හිටවා තිබුණේය, ඔහු ඒ ගහේ ගෙඩි සොයමින් ආවේය, නුමුත් කිසිවක් සම්බවුණේ නැත. එවිට ඔහු මිදි වත්ත බන්නාට කථාකොට: බලව, මේ තුන් අවුරුද්දේම මේ අත්තික්කා ගහේ ගෙඩි සොයා ආ නුමුත් කිසිවක් සම්බවුණේ නැත. ඒක කපාදමාපන්න: පොළොවට බරව තිබෙන්නේත් මක්නිසාදැයි කීවේය. ඔහු උත්තරදෙමින්: ස්වාමීනි, ඒක වටකර හාරා, පෝර දමන තුරු, මේ අවුරුද්දේත් තිබුණාවේ. ඉන්පසු ඵල දැරුවොත් යහපත: නැත්නම් ඒක කපාදමන්ට පුළුවනැයි ඔහුට කීවේයයි කීසේක. (ලූක් 13:6-9)**

වරක් ඵල නොමැති අත්තික්කා ගසක් දුටු යේසුස්වහන්සේ :

**අලුයම නුවරට නැවත යන අතරතුර උන්වහන්සේට නැවත බඩගිනිවිය. උන්වහන්සේ පාර අද්දර තිබෙන අත්තික්කා ගහක් දැක ළඟට ගොස්, එහි කොළ මිස වෙන කිසිවක් නොදැක: මෙතැන් පටන් කිසිකලක තාගෙන් ඵල හට නොගනීවයි ඒ ගහට කීසේක. අත්තික්කා ගස වහාම වියැළුණේය. (මතෙව් 21:18-19)**

යේසුස්වහන්සේ ඵල නොමැති අත්තික්කා ගසට සාප කිරීම තමා කුසගින්නේ සිටි නිසා ගසේ ඵල නොතිබු බැවින් කෝපයෙන් කළ දෙයක් නොවේ. එහිදී උන්වහන්සේ වැදගත් සත්‍යයක් ඉගැන්වූ සේක. අත්තික්කා ගස සරුබවක් පෙන්නුම් කළේය. එහි කොළපාටින් අතු පැවති නමුත් ඵල දැරීමක් නොවීය. ඵල දරන වෙසක් දැක්වීය.

සමහර මනුෂ්‍යයෝ පිටතින් ආත්මික බවක් පෙන්නුම් කළද ඇතුලාන්තයෙහි ක්‍රිස්තුස්වහන්සේ මෙන් වූ ආත්මික ඵල නොදරති. යේසුස්වහන්සේගේ කාලයෙහි සිටි ඵරිසිවරුන්ගේ තත්වයත් එවැනිම විය. ඔව්හු ආගමික කණ්ඩායමක් වූහ. යේසුස්වහන්සේ ඔවුනට පැවසුයේ:

**ලියන්නෙනි, ඵරිසිවරුනි, වංචාකාරවූ නුඹලාට දුක්වේ! මක්නිසාද නුඹලා සුදුකළ සොහොන් ගෙවලට සමානය, ඒවා පිටින් ලක්ෂණව පෙනෙන නුමුත් ඇතුළේ මිනීඇටවලින්ද සියලූ අපවිත්‍රකමෙන්ද පිරී තිබේ. (මතෙව් 23:27)**

දෙවියන්වහන්සේ සැකිලිමත් වනුයේ සඵලවත්බව මිස ඵලදරන බවක් පෙන්නුම් කිරීම පිළිබදව නොවේ.

පොදුවේ බලන කල සේවයෙහිදී ශුද්ධාත්මයාණන්ගේ ආත්මික ඵල වලට වඩා ආත්මික දීමනාවලට වැඩි අවධාරණයක් යොමු වී තිබේ. නමුත් බයිබලය වැඩි අවධාරණයක් යොමු කරනුයේ ආත්මික ඵල කෙරෙහිය.

**එබැවින් ඔවුන්ගේ ඵලවලින් නුඹලා ඔවුන් ඇඳිනගන්නහුය. (මතෙව් 7:20)**

කිසියම් පුද්ගලයෙකු අභ්‍යයන්තරයෙන් කුමනාකාරදැයි ඔහු දරන ඵල මගින් එනම් චරිත ගුණාංග මගින් හෙළිකරයි.

**මක්නිසාද නරක ඵල දරන හොඳ ගහක්වත් හොඳ ඵල දරන නරක ගහක්වත් ඇත්තේ නැත. මක්නිසාද එක එක ගහ එහිම ඵලයෙන් දැනගනු ලැබේ. මනුෂ්‍යයෝ කටුගස්වලින් අත්තික්කා ඵල නෙළා නොගනිති. ගොකටු පඳුරකින් මුදික ඵල කඩා නොගනිති. යහපත් සම්පතෙන් යහපත් දේද නපුරු මනුෂ්‍යයා නපුරු සම්පතෙන් නපුරු දේද පිටතට ගෙනෙන්නේය. මක්නිසාද මුඛය කථාකරන්නේ සිතේ පුර්ණකමෙන්ය. (ලූක් 6:43-45)**

සමහර විටක මනුෂ්‍යයෙකු සතුව පුද්ගලික ආකර්ෂණීය බවක් (සිත් ඇදගන්නා සුළු බවක්) පැවතිය හැක: එය ආත්මික බලයක් ලෙස වරදවා වටහාගත හැකිය. ඔහු සමහර විට ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් භාස්කම් පවා කළ හැකිය. එවැනි පුද්ගලයන් පිළිබඳව යේසුස්වහන්සේ පැවසුවේ:

**ස්වර්ගයෙහි සිටින මාගේ ස්වාමින්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට: ස්වාමිනි, ස්වාමිනියි කියන සියල්ලෝම ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නෝය. ඒ දවසේදී බොහෝ දෙනෙක්: ස්වාමිනි, ස්වාමිනි, ඔබගේ නාමයෙන් අනාගත වචන නොකියෙමුද? ඔබගේ නාමයෙන් යක්ෂයන් දුරු නොකෙළෙමුද? ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකෙළෙමුදැයි මට කියනවා ඇත. එවිට මම: කිසිකලෙකත් නුඹලා නොහැඳින්නෙමි, අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන් අහක්ව පයල්ලායයි ඔවුන්ට කියන්නෙමි. (මතෙව් 7:21-23)**

යුද් අවවාද කරමින් අනතුරු ඇඟවූයේ සභාවට "රිංගා" වැරදි ධර්ම උගන්වන අයගෙන් ප්‍රවේසම් වන ලෙසය. එවැනි අය හඳුනාගැනීමට එක් ක්‍රමයක් නම් ඔවුන්ගේ ජීවිතවල ඵල නොමැති බව යුද් පැවසීය.

**මොවුහු නම් නුඹලා සමග මංගල්‍ය කෑම කන විට නුඹලාගේ ප්‍රේම-මංගල්‍යවල නොපෙනී තිබෙන්නාවූ පර්වතයෝය, නිර්භීතව තමුන්ම පෝෂ්‍යකරගන්න එඬේරුය: හුළඟින් ගහගෙනයන වතුර නැති වලාකුල්ය: ඵල නැත්තාවූ, දෙවරක් මළාවූ, මුලින් උදුරනලද්දාවූ ශරත් කාලයේ ගස්ය. (යුද් 12)**

ඕනෑම සේවයක වැදගත් වනුයේ ඵලයයි. "ඔවුන්ගේ ඵල වලින් ඔවුහු ඔබව හඳුනාගනිති" (මතෙව් 7:20). ස්වාභාවික ලෝකයෙහි බෝවීමට අවශ්‍ය බීජ පවතිනුයේ ඵලයෙහිය. ආත්මික ලොවෙහිද ආත්මික බෝවීමට හැකියාව පවතිනුයේ ආත්මික ඵල තුළය.

- ඇදහිලිවන්තයාගේ ජීවිතයෙහි පවතින ක්‍රිස්තුස්වහන්සේ මෙන් වූ ගුණාංග පව්කරුවන්ව දෙවියන්වහන්සේ වෙතට ආකර්ෂණය කර ගනී.
- ශුභාරංචි ප්‍රකාශක ඵලය දේව රාජ්‍යය ව්‍යාප්ත කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස ලොව මුළුල්ලේ ආත්මික අස්වැන්නක් හිමි වේ.

# ස්වයං - පරීක්ෂණය

1. ආත්මයාණන්ගේ ඵල වල බාහිර ඵලය කුමක්ද?

2. ආත්මයාණන්ගේ අභ්‍යන්තර ඵලය කුමක්ද?

3. ශුද්ධාත්මයාණන්ගේ අභ්‍යන්තර ඵලයෙහි ගුණාංග වල ලැයිස්තුවක් සාදන්න.

4. යේසුස්වහන්සේ අපව ඵල දැරීම පිණිස තෝරාගෙන ඇති බව හෙළිකරන බයිබල් පදය කුමක්ද?

5. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

6. ලැයිස්තු අංක 1 හි ඇති ශුද්ධාත්මයාණන්ගේ ඵල කියවා බලන්න. දෙවන ලැයිස්තුවේ ඇති අර්ථ දැක්වීම් කියවන්න. එයට ගැලපෙන අර්ථ දැක්වීමෙහි අංකය ඵලයට ඉදිරියෙන් සදහන් කරන්න.

| **1 වෙනි ලැයිස්තුව** | **දෙවන ලැයිස්තුව** |
|---|---|
| _______පමණ දැන ක්‍රියා කිරීම | 1. ගැඹුරු ස්නේහය, රැකබලාගැනීම. |
| _______ඇදහිල්ල | 2. ප්‍රීතිමත් ,සතුට |
| _______මෘදුකම | 3. නිශ්චල, නිවුන, එකඟතාවය. |
| _______කරුණාවන්තකම | 4. ඉවසිලිවන්තව දරා සිටීම. |
| _______යහපත්කම | 5. සුමුදු, කළහකාරී නොවන |

_______ප්‍රීතිය 6. ධර්මිෂ්ඨ ක්‍රියාවන්

_______ඉවසිලිවන්තබව 7. දෙවියන්වහන්සේ කෙරෙහි දැඩි ස්ථිරභාවය

_______සමාදානය 8. පාලනය කරන ලද ශක්තිය

_______ප්‍රේමය 9. ස්වයං-පාලනය

7. ආත්මික ඵලය වැදගත් වන්නේ ඇයි?

_______________________________________________

_______________________________________________

8. දෙවියන්වහන්සේ සමග සමාදානය හා දෙවියන්වහන්සේගේ සමාදානය අතර ඇති වෙනස කුමක්ද?

_______________________________________________

_______________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මතෙව් 5:1-12 කියවන්න. මෙම ඡේදයෙහි ක්‍රිස්තුස්වහන්සේ මෙන් වූ ගුණාංග වන අභ්‍යයන්තර ඵල කීයක් සඳහන් වේද? උදාහරණ ලෙස ප්‍රීතිය නම් ඵලය 12 පදයෙහි සඳහන් වේ.

2. 1 කොරින්ති 13 පරිච්ඡේදයෙහි සඳහන් ඵලය වන ප්‍රේමය පිළිබඳ කියවන්න. ප්‍රේමයෙහි විකාශනය වී ඇති ඵල කීයක් මෙහි සඳහන් වේද? උදාහරණ ලෙස "සියල්ල විශ්වාස කරයි" යන 7 වෙනි පදය ඇදහිල්ලේ ඵලය සඳහන් කරයි.

3. ශුද්ධාත්ම ඵල දෙවියන්වහන්සේගේ චරිත ගුණාංග විදහා දක්මකි. දෙවියන්වහන්සේ වන්නේ:

| | |
|---|---|
| ප්‍රේමය | 1 යොහන් 4:16; තීතස් 3:4 |
| ප්‍රීතියේ | මතෙව් 25:21 |
| සමාදානයේ | පිලිප්පි 4:7 |
| ඉවසීමේ | 2 පේත්‍රැස් 3:9,15 |
| කරුණාවේ | මතෙව් 11:28-30 |
| යහපත්කමේ | 2 පේත්‍රැස් 1:3 |
| විශ්වාසවන්තකමේ | 2 තිමෝති 2:13 |
| මෘදුකමේ | ශෙපනියා 2:3 |
| පමණ දැන ක්‍රියාකිරීමේ | හෙබ්‍රෙව් 12:11 (දෙවියන්වහන්සේ දඬුවම් කිරීම මධ්‍යස්ථතාව පෙන්නුම් කරයි) |

4. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයෙහි ශුද්ධාත්ම ඵල සියල්ල දක්නට විය.

**පිටස්තර ඵල** : ශුභාරංචි සේවය : යොහන් 10:16; මාර්ක් 1:38.

**අභ්‍යන්තර ඵලය.**

| | |
|---|---|
| ප්‍රේමය | මාර්ක් 10:21; යොහන් 11:5,36 |
| ප්‍රීතිය | යොහන් 15:11 |
| සමාදානය | යොහන් 14:27 |
| ඉවසිලිවන්තකම | 1 පේත්‍රැස් 3:15 |
| කරුණාවන්තකම | 2 කොරින්ති 10:1 |
| යහපත්කම | රෝම 11:22 |
| ඇදහිල්ල | මතෙව් 17:14-21 |
| මෘදුකම | 2 කොරින්ති 10:1 |
| පමණ දැන ක්‍රියාකිරීම | ලූක් 4:1-13 |

මතෙව්, මාක්, ලූක්, යොහන් පොත් කියවන්න. යේසුස්වහන්සේගේ ජීවිතයෙහි ශුද්ධාත්ම ඵල පෙන්නුම් කළ වෙනත් ස්ථාන මෙම ලැයිස්තුවට එකතු කරන්න.

# දොළොස්වන පරිච්ඡේදය.

## මාංශයේ ක්‍රියා

### අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසුව :

- මාංශයේ ක්‍රියා හඳුනාගැනීමට.
- මාංශයේ නොහැසිර ආත්මයෙන් හැසිරෙන ක්‍රමය පැහැදිලි කිරීමට ඔබට හැකි වනු ඇත.

### ප්‍රධාන පදය :

> **ඉඳින් මාංශයේ ක්‍රියා ප්‍රකාශව තිබේ: එනම්, වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම,: රූප වැඳීම, මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදීකම්, භේද, ලබ්ධි භේද,: වෛර, මංගල්‍ය ඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. මෙබඳු දේ කරන්නන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම නුඹලාට ප්‍රථම කී ලෙසම, දැනුත් කලින් නුඹලාට කියමි.**
> (ගලාති 5:19-21)

## හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙහිදී අපි ශුද්ධාත්ම ඵල වලට විරුද්ධ වූ පාපිෂ්ඨ ගුණාංග, එනම් මාංශයේ ක්‍රියා පිළිබඳ සලකා බලමු.

## මාංශයේ ක්‍රියා යනු මොනවාද?

මාංශයේ ක්‍රියා නම් මනුෂ්‍යයාගේ පාපිෂ්ඨ ස්වභාවයෙහි චරිත ගුණාංග වන තෘෂ්ණාව (පාපිෂ්ඨ ආශාවන්) මගින් ඇතිවන ක්‍රියා වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළ වර්ධනය කිරීමට අපේක්ෂා කරන ගුණාංග වලට මාංශයේ ක්‍රියා මුළුමනින්ම ප්‍රතිවිරුද්ධ ගුණාංග වේ.

## ආත්මික සටන

ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි අඛංඩව පවතින සටනක් ඇත. මාංශයේ ක්‍රියා ශුද්ධාත්ම ඵල විනාශ කිරීමට නිරන්තර සටනක යෙදේ.

> **මක්නිසාද, මාංසය ආත්මයාණන්වහන්සේට විරුද්ධවද ආත්මයාණන්වහන්සේ මාංසයට විරුද්ධවද ආශාකරයි. නුඹලා කැමතිවන දේ නොකරන ලෙස මොවුහු එකිනෙකාට විරුද්ධවෙති.** (ගලාති 5:17)

ජම්මික මනුෂ්‍යයාගේ මාංශික ආශාවන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ස්වභාවයට වෙනස්ය.

මාංශයේ ක්‍රියා නම් :

> **ඉඳින් මාංශයේ ක්‍රියා ප්‍රකාශව තිබේ: එනම්, වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම,: රූප වැඳීම, මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදීකම්, භේද, ලබ්ධි භේද,: වෛර, මංගල්‍ය ඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. මෙබඳු දේ කරන්නන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම නුඹලාට ප්‍රථම කී ලෙසම, දැනුත් කලින් නුඹලාට කියමි.**
> (ගලාති 5:19-21)

මෙම පාපවල ප්‍රතිඵල වැරදි ක්‍රියාවලින් පෙන්නුම් වුවත්, එයට හේතුව පෙන්නුම් නොවේ. එයට හේතුව නම් පාපිෂ්ඨ ආශාවන්ය. හදවතෙහි තෘෂ්ණාවය.

**උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලාත් එසේම තේරුම් නැතුව සිටින්නහුද? පිටතින් මනුෂ්‍යයා තුළට පැමිණෙන කිසිම දෙයක්වත් ඔහු අපවිත්‍රකරන්නට නොහැකි බව නුඹලාට තේරෙන්නේ නැද්ද? නැවතද උන්වහන්සේ: නුමුත් මනුෂ්‍යයා අපවිත්‍ර වන්නේ ඔහුගෙන් පිටවන දෙයින්මය. මක්නිසාද ඇතුළතින් එනම් මනුෂ්‍යයන්ගේ සිතින් නපුරු සිතිවිලි, වේශ්‍යාකම්, සොරකම්, මිනීමැරීම්, කාමමිථ්‍යාචාරකම්, තණ්හා, දුෂ්ඨකම්, වංචාව, සල්ලාලකම සහ මෝඩකම නික්මෙයි. මේ සියලු නපුරු දේ ඇතුළතින් නික්ම මනුෂ්‍යයා අපවිත්‍රකෙරේයයි කීසේක. (මාර්ක් 7:18:20-23)**

ගලාති 5:19-21 දක්වා ඇත්තේ බයිබලයෙහි හඳුන්වාදෙන සියලුම පාප නොවේ. එම පාප “මාංශයේ ක්‍රියා” නම්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලයට විරුද්ධ වන පව් කාණ්ඩයක් පමණකි. අපි එම පව් කාණ්ඩය ඉගෙන ගනුයේ එබැවිනි.

## කාමමිථ්‍යාචාරය.

කාමමිථ්‍යාචාරය නම්, විවාහක තැනැත්තෙකු තමාගේ සහකරු/සහකාරිය නොවන තැනැත්තෙකු සමග ලිංගික සම්බන්ධතා පැවැත්වීමය.

දෙවියන්වහන්සේගේ පළමු ආඥා දසයෙන් එකක් වූයේ:

**කාමමිථ්‍යාචාරය නොකරව. (නික්මයාම 20:14)**

පරණ ගිවිසුම් යුගයෙහි කෙනෙකු කාමමිථ්‍යාචාරය කළ විට ඔහුව මරණයට පත්කරන ලදි.

**අන් මනුෂ්‍යයෙකුගේ භාර්යාව සමග කාමමිථ්‍යාචාරය කරන්නෙක් එනම් තමාගේ අසල් වාසියාගේ භාර්යාව සමග කාමමිථ්‍යාචාරය කරන්නෙක් ඇද්ද එසේ කරන්නාද කරන්නීද සැබවින් මරනු ලැබිය යුතුය. (ලෙවී කථාව 20:10)**

යේසුස්වහන්සේ හා පාවුල් යන දෙදෙනාම කාමමිථ්‍යාචාරයට එරෙහිව අලුත් ගිවිසුමෙහි අනතුරු අඟවා ඇත.

**මිනී නොමරව, කාමමිථ්‍යාචාරය නොකරව, සොරකම් නොකරව, බොරුසාක්ෂි නොකියව, වංචාකම් නොකරව, තාගේ පියාටත් මවුටත් ගෞරවකරව යන මේ ආඥා නුඹ දන්නෙහියයි කීසේක. (මාර්ක් 10:19)**

**මක්නිසාද කාමමිථ්‍යාචාරය නොකරව, මිනී නොමරව, සොරකම් නොකරව, ලෝභ නොවව යන ආඥාද, වෙන යම් ආඥාවක් ඇත්නම් ඒ ආඥාවද: නුඹට මෙන් නුඹේ අසල්වාසියාට ප්‍රේමකරව යන මේ කීමෙහි අන්තර්ගතය. (රෝම 13:9)**

යේසුස්වහන්සේ කාමමිථ්‍යාචාරය අර්ථ දක්වමින් එහි පුළුල් විකාශනයක් එනම්, හදවතෙහි දුෂ්ඨ ලිංගික ආශාවන්ද එයට එකතු කළ සේක.

**කාමමිථ්‍යාචාරය නොකරවයි කී බව නුඹලා අසා තිබේ. නුමුත් මම නුඹලාට කියමි: ස්ත්‍රියෙකු දෙස රාගයෙන් බලන කවරෙකු නුමුත් එවේලේම ඈ සමග කාමමිථ්‍යාචාරය කෙළේය.
(මතෙව් 5:27-28)**

විවාහක සහකරු/සහකාරිය, බයිබලීය හේතු කාරණා වලින් තොරව දික්කසාද කොට නැවත විවාහ වීමද කාමමිථ්‍යාචාරයට ඇතුලත් වේ.

**මම නුඹලාට කියමි: වේශ්‍යාකමට මිස වෙන කාරණයකට තමාගේ භාර්යාව අත්හරින කවරෙක් නුමුත් ඇය කාමමිථ්‍යාචාරයට පමුණුවන්නේය. යමෙක් අත්හරිනු ලැබූ ඇය විවාහකරගන්නේ නම් ඔහුත් කාමමිථ්‍යාචාරය කරන්නේය. (මතෙව් 5:32)**

**ඒ ස්ත්‍රී ඇගේ පුරුෂයා අත්හැර වෙන කෙනෙකු සරණපාවාගන්නී නම්, ඈද කාමමිථ්‍යාචාරය කරන්නීයයි කීසේක. (මාර්ක් 10:12)**

යම් කිසිවෙකු කාමමිථ්‍යාචාරය කරන කල ඔහු තමාගේම ප්‍රාණයට එරෙහිව පව් කරයි :

**ස්ත්‍රියෙකු සමග කාමමිථ්‍යාචාරය කරන්නා නුවණ නැති කෙනෙක්ය. එය කරන්නා තමාගේම ප්‍රාණය නාස්තිකරගන්නේය. (හිතෝපදේශ 6:32)**

කාමමිථ්‍යාචාරය කරන්නන්ව දෙවියන්වහන්සේ විනිශ්චය කරන සේක :

**විවාහය සියල්ලන් අතරෙහි ගෞරව ඇතුව, යහන නොකිලුටුව තිබේවා; මක්නිසාද වේශ්‍යාකම්කරන්නන්ද කාමමිථ්‍යාචාරිකයන්ද දෙවියන්වහන්සේ විනිශ්චය කරනසේක. (හෙබ්‍රෙව් 13:4)**

කාමමිථ්‍යාචාරය කරන්නෝ දේව රාජ්‍යය හිමි කර නොගන්නෝය.

**නොහොත් අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්නේ නැති බව නුඹලා දන්නේ නැද්ද? නොරැවටෙල්ලා වේශ්‍යාකම්කරන්නෝවත් රූපවඳින්නෝවත් කාමමිථ්‍යාචාරිකයෝවත් ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝවත් පිරිමින් සමග අනාචාරකරන්නෝවත්, (1 කොරින්ති 6:9)**

බොරු ගුරුවරු හඳුනාගත හැකි එක් චරිත ගුණාංගයක් නම්, කාමමිථ්‍යාචාරයෙහි හැසිරීමය.

**නුමුත් සෙනඟ අතරේ බොරු ප්‍රොපේතවරුද සිටියෝය. එලෙසම විනාශක ධර්මභේද රහසින් උපදවමින්ද තමුන්ම මිලේටගත් ආචාරීන්වහන්සේව එපාකරමින්ද තමුන් පිටට සිඝ්‍ර විනාශය පමුණුවාගන්නාවූ බොරු ගුරුවරු නුඹලා අතරෙත් වන්නෝය. ඔව්හු කාමමිථ්‍යාචාරයෙන් පිරුණාවූ, පාපයෙන් වලකින්ට නුපුළුවන් ඇස් ඇත්තෝය; ඔව්හු අස්ථිර ආත්ම පොලඹවන්නෝය; තණ්හාවට පුරුදු සිතක් ඇත්තෝය; ශාපයේ දරුවෝය. (2 පේත්‍රුස් 2:1,14)**

බයිබලය අනතුරු අඟවනුයේ :

**මක්නිසාද වේශ්‍යා ස්ත්‍රියෙක් නිසා මනුෂ්‍යයෙකුට ඉතිරිවෙන්නේ රොටි කැබැල්ලක් පමණක්ය. මිථ්‍යාචාරී ස්ත්‍රීද අනර්ඝ ප්‍රාණය අල්ලාගන්ට ලුහුබඳින්නිය. (හිතෝපදේශ 6:26)**

## වෛශ්‍යකම

වේශ්‍යාකම නම් විවාහ නොවූ දෙදෙනෙක් ලිංගික ඇසුරුකම් පැවැත්වීමය. වෛශ්‍යාකමට කාමමිථ්‍යාචාරයද ඇතුළු වේ. එනම් විවාහකයෙක් තමාගේ පුරුෂයා හෝ භාර්යාව නොවන කෙනෙකු සමග ලිංගික සංසර්ගයෙහි යෙදීමය. වේශ්‍යාකම, විවාහ වී නොමැති අය අතර ලිංගික සංසර්ගය ඇතුලත් වේ. එමෙන්ම සම ලිංගික සේවනය (එකම ලිංගිකයන් අතර සංසර්ගය) හෝ සතුන් සමග සංවාසය ඇතුලත්වේ.

වේශ්‍යාකම දික්කසාදය සඳහා භාවිතාකළ හැකි වලංගු බයිබලීය සාධකයකි.

**මම නුඹලාට කියමි: වේශ්‍යාකමට මිස වෙන කාරණයකට තමාගේ භාර්යාව අත්හරින කවරෙක් නුමුත් ඇය කාමමිථ්‍යාචාරයට පමුණුවන්නේය. යමෙක් අත්හරිනු ලැබූ ඇය විවාහකරගන්නේ නම් ඔහුත් කාමමිථ්‍යාචාරය කරන්නේය. (මතෙව් 5:32)**

වේශ්‍යාකම කරන්නෝ දේව රාජ්‍යය උරුම කර නොගනු ඇත.

**නොහොත් අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්නේ නැති බව නුඹලා දන්නේ නැද්ද? නොරැවටෙල්ලා වේශ්‍යාකම්කරන්නෝවත් රූපවඳින්නෝවත් කාමමිථ්‍යාචාරිකයෝවත් ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝවත් පිරිමින් සමග අනාචාරකරන්නෝවත්, සොරුවත් ලෝභයෝවත් බේබද්දෝවත් නින්දාකරන්නෝවත් කොල්ලකන්නෝවත් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකර නොගන්නෝය. (1 කොරින්ති 6:9-10)**

වේශ්‍යාකමින් වැලකී සිටින ලෙස බයිබලය අපට පවසයි.

**දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, නුඹලා ශුද්ධව සිටීමය, නුඹලා වේශ්‍යාකමින් වැලකී, (1 තෙසලෝනික 4:3)**

**නුමුත් වේශ්‍යාකම් නිසා එක එක පුරුෂයා තම තමාගේම භාර්යාවද එක එක ස්ත්‍රී තම තමාගේ පුරුෂයාද ඇතුව සිටීවා. (1 කොරින්ති 7:2)**

**ඔවුන්ගෙන් සමහරෙක් වේශ්‍යාකම් කළාක්මෙන්, අපි වේශ්‍යාකම් නොකරමු, එයින් එක දවසෙහි විසිතුන්දහස් දෙනෙක් විනාශවුණෝය. (1 කොරින්ති 10:8)**

ශරීරය ස්වාමින්වහන්සේට අයත් බැවින් එය වේශ්‍යාකමට භාරකළ නොහැක. එබැවින් ඔබ වේශ්‍යාකමෙන් ඉවත්විය යුතුය.

**කෑම බඩ උදෙසාය, බඩ කෑම උදෙසාය. නුමුත් දෙවියන්වහන්සේ ඒකත් ඒවාත් නැතිකරනසේක. එහෙත් ශරීරය තිබෙන්නේ වේශ්‍යාකම පිණිස නොව ස්වාමීන්වහන්සේ උදෙසාය; ස්වාමීන්වහන්සේද ශරීරය උදෙසාය. වේශ්‍යාකම් කෙරෙන් පලා දුවපල්ලා. මනුෂ්‍යයා කරන්නාවූ සියලු පව් ශරීරයෙන් පිටතය; නුමුත් වේශ්‍යාකම්කරන්නා තමාගේම ශරීරයට විරුද්ධව පව්කරන්නේය. නොහොත් නුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබූ, නුඹලා තුළ ඇත්තාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව බව නොදනිවුද? නුඹලා නුඹලාටම අයිති නැත; මක්නිසාද නුඹලා මිලේටගනු ලැබුවහුය. එබැවින් නුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට ගෞරවකරපල්ලා. (1 කොරින්ති 6:13;18-20)**

වේශ්‍යාකම පහකර දැමීම ඔබගේ වගකීමය.

**එබැවින් පොළොවේ තිබෙන නුඹලාගේ අවයවයන්, එනම් වේශ්‍යාකමත් අපිරිසිදුකමත් කාමරාගයත් නපුරු තෘෂ්ණාවත් රූපවැඳීමවූ තණ්හාවත් නසාපල්ලා. (කොලොස්සි 3:5)**

වේශ්‍යාකම ඇදහිලිවතුන් අතර සඳහන් කිරීමට වත් නුසුදුසුය.

**නුමුත් වේශ්‍යාකමද සියලු ආකාර අපවිත්‍රකම හෝ තණ්හාවද නුඹලා අතරේ සඳහන් කරන්ට පමණවත් එපා; එය ශුද්ධවන්තයන්ට නුසුදුසුය. (එපීස 5:3)**

යම් කිසිවෙකු වේශ්‍යාකමට පුරුදු වුවහොත් අවසානයේ සම්පූර්ණයෙන්ම එයට ඇබ්බැහි වනු ඇත. රෝම 1 ට අනුව එය සමලිංගික සේවනයට පවා යොමු කළ හැක. අවසානයේදී ඔහුගේ හෘදසාක්ෂිය ඔහුට දොස් නොදෙන තත්වයට පත් වනු ඇත.

**ඒ නිසා දෙවියන්වහන්සේ ඔවුන් නීච තෘෂ්ණාවලට භාරදුන්සේක. ඔවුන්ගේ ස්ත්‍රීහු ස්වාභාවික ව්‍යවහාරයට වෙනස්කළෝය. ඔවුන් වනාහි සියලු අධර්මිෂ්ඨකමින්ද දුෂ්ටකමින්ද ලෝභකමින්ද නපුරුකමින්ද පූර්ණව, ඊර්ෂ්‍යාවෙන්ද මිනීමැරීමෙන්ද ඩබරයෙන්ද වංචාවෙන්ද ක්‍රෝධයෙන්ද පිරී සිටියෝය. (රෝම 1:26,29)**

## අපවිත්‍රකම

අපවිත්‍රකම යනු පවිත්‍රතාවයේ ප්‍රතිවිරුද්ධ ලක්ෂණය වේ. මාංශයේ ක්‍රියා සම්බන්ධව සඳහන් වන මෙම ජේදයෙහි "අපවිත්‍රකම" ලෙස දක්වනුයේ ආත්මික හෝ සදාචාරාත්මක අපවිත්‍රකමකි.

දෙවියන්වහන්සේ තම ජනතාව අපවිත්‍රවීමට ප්‍රිය නොකරන සේක :

**නුමුත් වේශ්‍යාකමද සියලු ආකාර අපවිත්‍රකම හෝ තණ්හාවද නුඹලා අතරේ සඳහන් කරන්ට පමණවත් එපා, එය ශුද්ධවන්තයන්ට නුසුදුසුය. (එපීස 5:3)**

**දෙවියන්වහන්සේ අප කැඳවූයේ අපවිත්‍රකමට නොව ශුද්ධකමටය. (1 තෙසලෝනික 4:7)**

අපවිත්‍රකම තුරන් කොට, ශුද්ධ වූ ජීවිතයක් ගතකිරීමට හික්මවනු ලැබීම ඔබගේ වගකීමය.

**එබැවින් පොළොවේ තිබෙන නුඹලාගේ අවයවයන්, එනම් වේශ්‍යාකමත් අපිරිසිදුකමත් කාමරාගයත් නපුරු තෘෂ්ණාවත් රූපවැඳීමවූ තණ්හාවත් නසාපල්ලා. (කොලොස්සි 3:5)**

**එබැවින්, ප්‍රේමවන්තයෙනි, මේ පොරොන්දු අපට තිබෙන නිසා, මාංසයේද ආත්මයේද සියලු කිලුටුකම්වලින් අපම පවිත්‍රකරගනිමින්, දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව, ශුද්ධකම සම්පූර්ණකරගනිමු. (2 කොරින්ති 7:1)**

**නුඹලාගෙන් එකිනෙකා තම තමාගේ භාජනය, දෙවියන්වහන්සේ නාඳුන්නාවූ ජාතීන් මෙන් කාමරාගයෙහි නොව, (1 තෙසලෝනික 4:4)**

ඔබ අපවිත්‍රකම පහකර නොදැමුවහොත් එයට යටත් වනු ඇත.

**නුඹලාගේ මාංසයේ දුර්වලකම නිසා මනුෂ්‍ය ව්‍යවහාරයෙන් කථාකරමි. නුඹලා නුඹලාගේ අවයවයන් අපවිත්‍රකමටත් අයුතුකම පිණිස අයුතුකමටත් දාසයන් කොට භාරදුන් සේම, දැන් නුඹලාගේ අවයවයන් ශුද්ධකම පිණිස ධර්මිෂ්ඨකමට දාසයන් කොට භාරදීපල්ලා. (රෝම 6:19)**

ඔබ අපවිත්‍රකමේ දිගටම පැවතුනහොත් අවසානයේදී එයට වහල්වනු ඇත.

**ඔව්හු හැඟීමක් නැතුව සියලු අපවිත්‍රකම් ගිජුලෙස කරන පිණිස සල්ලාලකමට භාරවුණෝය. නුමුත් නුඹලා ක්‍රිස්තුස්වහන්සේව එසේ ඉගෙනගත්තේ නැත: (එපීස 4:19-20)**

ඔබ ආත්මික අපවිත්‍රතාවයෙහි (පාපයෙහි) දිගටම ජීවත් වුවහොත් දෙවියන්වහන්සේ ඔබව එයට භාර දෙනු ඇත.

**එබැවින් ඔවුන් තම තමුන්ගේ සිත්වල තෘෂ්ණා කරණකොටගෙන තමුන්ගේ ශරීරවලට අවමාන්නකරගන්න හැටියට දෙවියන්වහන්සේ ඔවුන් අපවිත්‍රකමට පවාදුන්සේක. (රෝම 1:24)**

මනුෂ්‍යයෙකුව දෙවියන්වහන්සේ කිසියම් දෙයකට භාරකළවිට, ඔහුගේ හෘදසාක්ෂිය ක්‍රියාත්මකවීම නවතී. ඔහුව එම කාරණාවෙන් සම්පූර්ණයෙන්ම පාලනය වනු ඇත. ඔහු තම පාපයෙන් පසුතැවිලි නොවුවහොත් එම පාපයෙහි විනාශ වනු ඇත.

**දඬුවම යටතේ විනිශ්චය දවස දක්වා තබන්ටත් ස්වාමීන්වහන්සේ දන්නාසේක. භය නැත්තාවූ හිතුවක්කාරවූ මොව්හු උත්තමයන්ට නින්දාකරන්ට තැති නොගනිති. නුමුත්, අල්ලා විනාශකරනු ලබන්ට උපන්, ජම්මයෙන් නුවණ නැත්තාවූ තිරිසනුන් මෙන්, මොව්හු, නොදන්නා දේට අපහාසකරමින්, අධර්මිෂ්ඨකමේ කුලිය ලබමින්, තමුන්ගේම කිලුටුකමෙන් සැබවින් විනාශවන්නෝය. (2 පේත්‍රුස් 2:10,12)**

පහත සඳහන් වගුව බලන්න. අපවිත්‍රකම පිළිබඳ පද එකට ගොනුකළවිට රටාවක් මැවෙන බව ඔබට පෙනී යාවී. ඔබට පාපය දමනය කිරීමට හෝ එයට යටත්වීමට බලය තිබේ. ඔබ අපවිත්‍රකම දමනය කළහොත් එමගින් පවිත්‍ර ජිවිතයකට මගපෙන්වයි. ඔබ එයට යටත් වුවහොත් ක්‍රමයෙන් එයට අබ්බැහිවනු ඇත. අවසානයේදී දෙවියන්වහන්සේ ඔබව එයට භාරදෙනු ඇත. ඔබ ඔබගේ පාපයෙහි විනාශ වනු ඇත.

## අපවිත්‍රකම : තෝරාගැනීමේ රටාවක්

ඔබ

↓

අපවිත්‍රකම දමනය කළහොත්
කොලොස්සි 3:5

↓

එය ඔබව

↓

ශුද්ධ කමට යොමු කරවයි.
1 තෙසලෝනික 4:7

ඔබ

↓

අපවිත්‍රකමට යටත් වුවහොත්
රෝම 6:19

↓

එය ඔබව

↓

↓

එයට භාර වෙන තැනට ගෙන යයි.
එපිස 4:19 සලස්වයි.

එහි ප්‍රතිඵලයක් ලෙස

↓

දෙවියන්වහන්සේ ඔබට එයට භාරදෙයි.
රෝම 1:24

↓

එහි අවසානය

↓

ඔබගේම පාපයෙහි ඔබ
සහමුලින්ම විනාශ වීමය.
2 පේත්‍රුස් 2:10,12

# සල්ලාලකම

සල්ලාලකම යනු කාමයෙහි ආශාවන් හා පාපිෂ්ඨ හැඟීම්ය. එය අශීලාචාර, නිර්ලජ්ජිත හැසිරීමය. බොරු ගුරුවරු හඳුනාගත හැකි එක් චරිත ගුණාංගයක් නම් සල්ලාලකමය.

> **මක්නිසාද පුරාණකාලයේදී මේ දඬුවමට නියම කොට තැබුවාවූද, අභක්තිකවූද, අපගේ දෙවියන්වහන්සේගේ කරුණාව සල්ලාලකමට හරවාගන්නාවූන්ද, අපගේ එකම අධිපතිවූ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව එපාකරන්නාවූද මනුෂ්‍යයන් වගයක් රහසින් ඇතුල්වී සිටිති.**
> (යුද් 4)

පෙර කාලයේ ඔබ සල්ලාකමට පුරුදුව සිටි කෙනෙකු විය හැක. එනමුත් ඇදහිලිවන්තයෙකු ලෙසට ඔබ තව දුරටත් එලෙස හැසිරිය යුතු නොවේ.

> **දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ජීවත්වෙන පිණිස එම සිත ආයුධයක් කොට පැළඳගනිල්ලා. මක්නිසාද මාංසයෙන් වධවින්ද තැනැත්තේ පාපයෙන් නිදහස්වී සිටියි. සල්ලාලකම්වලද තෘෂ්ණාවලද බීමත්කම්වලද නපුරු මංගල්‍යවලද මත්පැන්බීම්වලද පිළිකුල්වූ රූපඇදීම්වලද හැසිර, අන්‍යජාතීන්ගේ කැමැත්ත කරමින් නුඹලා ගතකළාවූ කාලය ඉතා ඇත. (1 පේත්‍රුස් 4:2-3)**

බයිබලය පවසන්නේ ඔබ සල්ලාලකමෙහි රැඳී සිටියහොත් අවසානයෙහි ඔබ හෘද සාක්ෂියෙන් තොරව එයට අවනතවනු ඇත.

**ඔව්හු හැඟීමක් නැතිව සියලු අපවිත්‍රකම් ගිජුලෙස කරන පිණිස සල්ලාලකමට භාරවුණෝය. (එපීස 4:19)**

## රූප නමස්කාරය

රූප නමස්කාරය නම් රූප වලට වන්දනා කිරීමය. රූප නමස්කාරය යනු මැටි, ගල්, ලී, අගනා රන් රිදියෙන් සැදූ පිළිම වලට නමස්කාර කිරීම පමණක් නොවේ. ඔබහට දෙවියන්වහන්සේට වඩා කිසියම් දෙයක්, කෙනෙක් හෝ භාණ්ඩයක් වටී නම්, එය රූපයකි. සත්‍ය දෙවියන්වහන්සේට හැර වෙන ඕනෑම දෙයකට නමස්කාර කරන්නවුන් රූප නමස්කාරකරන්නෝ වෙති. රූප නමස්කාරය යනු ඔබගේ ජීවිතයෙහි දෙවියන්වහන්සේට හිමිවිය යුතු නියමාකාර ස්ථානය පිළිනොගැනීමය.

දෙවියන්වහන්සේ මුලින්ම දුන් පළමු ආඥාවක් රූප නමස්කාරය සම්බන්ධයෙන් වේ.

**රූප වෙතට නොහැරෙල්ලා, වාත්තු දේවතාවුන් සාදානොගනිල්ලා. මම නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේය. (ලෙවී කථාව 19:4)**

**රූප සාදා නොගනිල්ලා, කැපූ පිළිමයක්වත් රූපස්ථම්භයක්වත් සිටුවා නොගනිල්ලා, නමස්කාර කරන පිණිස නුඹලාගේ දේශයෙහි කැටයම්කළ කිසි ගලක් නොතබල්ලා. මක්නිසාද මම නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේය. (ලෙවී කථාව 26:1)**

අන්‍යජාතීන්ගේ දෙවිවරු රූප ලෙස නම් කොට ඇත.

**මනුෂ්‍ය වර්ගයන්ගේ සියලු දෙවිවරු පිළිම පමණක්ය. නුමුත් ස්වාමීන්වහන්සේ ආකාශ මණ්ඩලය සෑදුසේක. (ගීතාවලිය 96:5)**

ඔබ රූප නමස්කාරය කිරීමෙන් ඔබම වියවුලට පත්වේ.

**රූපවලට මෙහෙකරන්නාවූ, පිළිම ගැන පාරට්ටුකරගන්නාවූ සියල්ලෝ ලජ්ජාවෙත්වා. දෙවිවරු සියල්ලෙනි, උන්වහන්සේට නමස්කාරකරව්. (ගීතාවලිය 97:7)**

අන්‍යජාතීන්ගේ දෙවිවරු මිනිස් හස්ත කර්මාන්තය වේ. ඔව්හු සතුව බලයක් හෝ ආත්මික සුවිශේෂී බවක් නොමැත.

**ජාතීන් සැප රන් රිදීය, මනුෂ්‍යයන්ගේ අත් වැඩය. ඒවාට කටවල් ඇත, එහෙත් කථා නොකරති: ඇස් ඇත, එහෙත් නොදකිති: කන් ඇත, එහෙත් නොඅසති: ඒවායේ කටවල හුස්මත් නැත. ඒවා සාදන්නොත්, එසේය, ඒවා කෙරෙහි විශ්වාසකරන සියල්ලොත් ඒවාට සමාන වන්නෝය. (ගීතාවලිය 135: 15-18) (ගීතාවලිය 115:4-8 බලන්න)**

කිතුනුවෙකු හට රූප නමස්කාරය කළ නොහැක.

**දේවතා රූප සමග දෙවියන්වහන්සේගේ මාළිගාවට ඇති එකඟකම මොකද? (2 කොරින්ති 6:16)**

ඔබ රූප නමස්කාරය කරන්නන් සමග සහභාගිකම් පවත්විය යුතු නොවේ.

**නුමුත් සහෝදරයෙකැයි කියනලද කෙනෙක් වෙශ්‍යාකම්කරන්නෙක්වත් ලෝභයෙක්වත් රූපවඳින්නෙක්වත් නින්දාකරන්නෙක්වත් බේබද්දෙක්වත් කොල්ලකාරයෙක්වත් වේ නම්, එබන්දෙකු සමග සමාගම් නොපවත්වන්ටද කෑමවත් නොකන්ටද දැන් නුඹලාට ලියමි:
(1 කොරින්ති 5:11)**

රූප වලින් ඈත්ව සිටීමට අපහට අනතුරු දක්වා ඇත.

**මාගේ ප්‍රිය දරුවෙනි, දේවතා රූප වලින් දුරුව සිටපල්ලා. (1 යොහන් 5:21)**

රූප නමස්කාරය කරන්නවුන්ට දේව රාජ්‍යයෙහි පංගුකාරකමක් නොමැත :

**නොහොත් අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්නේ නැති බව නුඹලා දන්නේ නැද්ද? නොරැවටෙල්ලා වේශ්‍යාකම්කරන්නෝවත් රූපවඳින්නෝවත් කාමමිථ්‍යාචාරිකයෝවත් ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝවත් පිරිමින් සමග අනාචාරකරන්නෝවත්, සොරුවත් ලෝභයෝවත් බේබද්දෝවත් නින්දාකරන්නෝවත් කොල්ලකන්නෝවත් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකර නොගන්නෝය. (1 කොරින්ති 6:9-10)**

රූප නමස්කාර කරන්නවුන්ගේ ඉරණම බයිබලය හෙළිකරදෙයි :

**නුමුත් භය ඇත්තන්ටත් අවිශ්වාස කරන්නන්ටත් පිළිකුල්ව සිටින්නන්ටත් මිනීමරන්නන්ටත් වේශ්‍යාකම්කරන්නන්ටත් මායාකාරයන්ටත් රූපවඳින්නන්ටත් සියලු බොරුකාරයන්ටත් ගින්නෙුත් ගෙන්දගම්නුත් දැවෙන විලෙහි තමුන්ගේ කොටස වන්නේය: එය දෙවෙනි මරණයයි මට කීසේක. (එළිදරව්ව 21:8)**

**පිටත සිටින්නෝ නම් බල්ලෝද මායම්කාරයෝද වේශ්‍යාකම්කරන්නෝද මිනීමරන්නෝද රූප වඳින්නෝද බොරුවකට ප්‍රියවන්නාවූ, එය කරන්නාවූ සියල්ලෝද වෙති. (එළිදරව්ව 22:15)**

තණ්හාව ද රූප නමස්කාරයෙහි එක් ක්‍රමයක් බව බයිබලය පවසයි. තණ්හාව යනු වැරදි ආශාවකින් ඉතා දැඩි ලෙස යමක් ඕනෑ කිරීමයි. ඔබ තණ්හාව දුරු කොට විනාශකර දැමිය යුතු වේ :

**එබැවින් පොළොවේ තිබෙන නුඹලාගේ අවයවයන්, එනම් වේශ්‍යාකමත් අපිරිසිදුකමත් කාමරාගයත් නපුරු තෘෂ්ණාවත් රූපවැඳීමවූ තණ්හාවත් නසාපල්ලා. (කොලොස්සි 3:5)**

ඔබ පෙර කල රූප නමස්කාර කරන්නෙකුව සිටින්නට ඇත. එහෙත් දැන් ඔබ ඇදහිලිවන්තයෙකු ලෙස එම පුරුදුවල නියැලිය යුතු නොවේ.

**දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ජීවත්වෙන පිණිස එම සිත ආයුධයක් කොට පැළඳගනිල්ලා. මක්නිසාද මාංසයෙන් වධවින්ද තැනැත්තේ පාපයෙන් නිදහස්ව සිටියි. සල්ලාලකම්වලද තෘෂ්ණාවලද, බීමත්කම්වලද නපුරු මංගල්‍යවලද මත්පැන්බීම්වලද පිළිකුල්වූ රූපඇදහීම්වලද හැසිර, අන්‍යජාතීන්ගේ කැමැත්ත කරමින් නුඹලා ගතකළාවූ කාලය ඉතා ඇත. (1 පේත්‍රුස් 4:2-3)**

**එසේ නුඹලා වෙතට අපේ පැමිණීම කොයි ආකාරව තිබුණේද කියාත් නුඹලා ජීවමානවූ සැබෑවූ දෙවියන්වහන්සේට මෙහෙකරන පිණිසද, උන්වහන්සේ විසින් මළවුන්ගෙන් නැගිටවනුලද්දාවූ, (1 තෙසලෝනික 1:9)**

## මායාව

මායාව යනු ඕනෑම ආකාරයක යන්ත්‍ර, මන්ත්‍ර, විජ්ජා, නක්ෂත්‍ර, වූඩු, අණ විණ, කොඩිවින, මැතිරීම්, සහ මත්ද්‍රව්‍යය. ඕනෑම ආකාරයක යක්ෂයාගේ සිරිත් විරිත්, පුරුදු, නමැදීම් එයට ඇතුලත් වේ.

අනෙක් අය පාලනය කිරීම උදෙසා, මෙහෙයවීම උදෙසා භාවිතා කරන ඕනෑම දෙයක් මායාවක් ලෙස විවිරණය කළ හැක. ඔබ යක්ෂයාගේ මායම් වලට සම්බන්ධ නොවුවත්, අනෙක් අයව ඔබට ඕනෑ විධියට පාලනය කිරීමට, මෙහෙයවීමට, ඔවුන්ට විරුද්ධව යාඥා කිරීමට උත්සහ දැරීමෙන් "මායාවේ" පාපයට වරදකරුවෙකු විය හැක.

මායාකාරකම දෙවියන්වහන්සේට එරෙහිව ආත්මික කැරලිකාරකමකි. කැරලිකාරකම, මායාව තරමට දුෂ්ඨ බව දෙවියන්වහන්සේ පවසනසේක:

**මක්නිසාද කැරළිකාරකම ජේනකීමේ පාපයටත් මුරණ්ඩුකම දේවතාවන් හා රූප ඇදහීමටත් සමානය. නුඹ ස්වාමින්වහන්සේගේ වචනය පහකළ නිසා උන්වහන්සේත් නුඹ රජකමෙන් පහකළසේකැයි කීවේය. (1 සාමුවෙල් 15:23)**

## වෛරය

වෛරය යනු ප්‍රේමයෙහි ප්‍රතිවිරුද්ධ ගුණාංගයයි. එය දැඩි ලෙස අප්‍රිය කිරීමේ හැඟීමකි. එය අන්‍යයන් කෙරෙහි දුෂ්ඨ හැඟීම් දරා සිටීමකි. වෛරය කළහ අවුස්සන බව බයිබලය පවසයි.

**වෛරය ඩබර උපදවයි: එහෙත් ප්‍රේමය සියලු වැරදි වසයි. (හිතෝපදේශ 10:12)**

වෛරයෙන් පිරුණ අය සමග සිටීමට වඩා ප්‍රේමය ඇති තැන සිටීම යහපත්ය.

**වෛරය ඇතුව තර ගොනෙකුගේ මසට වඩා ප්‍රේමය ඇතුව පලා කෑම හොඳය. (හිතෝපදේශ 15:17)**

වංචාවෙන් වසාගත් වෛරය දෙවියන්වහන්සේ විසින් නිරාවරණය කරනසේක :

**ඔහුගේ වෛරය ප්‍රයෝගයෙන් වසා තිබන නුමුත් ඔහුගේ දුෂ්ටකම සභාව ඉදිරියෙහි එළිදරව්වන්නේය. (හිතෝපදේශය 26:26)**

වංචාව ලෙස මෙතැන සඳහන් වන්නේ ඔබ සැබවින්ම කෙනෙකුට වෛර කරන නමුත් ඒ තැනැත්තාව ප්‍රිය කරන බව මවා පෙන්වීමය.

## මතභේද

මතභේද යනු එකඟ නොවීම, සාමුහිකව එක අදහස නොදැරීම, විරුද්ධතා සහිත වීමය. එය අරගලයකට සමානය. මෙම වචනය බයිබලයෙහි භාවිතා කොට ඇත්තේ තව එක ස්ථානයක පමණි. එය යේසුස්වහන්සේ අවසාන කාලයේ සලකුණක් ලෙස පවුල් වල ඇතිවන "භේදය" පිළිබඳ කළ ප්‍රකාශනයෙහි සඳහන් වේ. (මතෙව් 10:35)

## තරඟකාරීත්වය

තරඟකාරීත්වය ලෙස මෙහි සඳහන් වන්නේ අන් අය අනුකරණය කොට ඔවුන්ට සමාන වීමට හෝ ඔවුන් පරදා ඉහළට යාමට පවතින ආශාවය. එය විරුද්ධවාදීවීම සහ ඊර්ෂ්‍යාවේ එක් හැඩයකි. මෙම වචනය මෙයාකාරයෙන් බයිබලයෙහි භාවිතාකර ඇති එකම ස්ථානය ගලාති 5:19-21 පමණකි.

## ක්‍රෝධය

ක්‍රෝධය යනු දරුණු කෝපය, කෝපාවිෂ්ඨවූ ක්‍රියා හා කුපිත වීමය.ක්‍රෝධය ක්‍රෑර බව බයිබලය පවසයි :

**උදහස ක්‍රෑරය, කෝපයද රෞද්‍රය: එහෙත් කාම ක්‍රෝධය ඉදිරිපිට සිටින්ට පුළුවන් කාටද? (හිතෝපදේශ 27:4)**

දරුණු ලෙස ක්‍රෝධය සහිත මිනිසා එයින් දුක් විඳිනු ඇත :

**අධික තරහකාරයා දඬුවම විඳින්නේය: මක්නිසාද ඔබ ඔහු මිදුවත් නැවත නැවතත් එසේ කරන්නට ඕනෑවෙයි. (හිතෝපදේශ 19:19)**

ප්‍රඥාවන්ත මනුෂ්‍යයෝ ක්‍රෝධයෙන් ඉවත් වෙති :

**නින්දා කරන මනුෂ්‍යයෝ නගරයෙහි ගිනි අවුළුවති: එහෙත් ප්‍රඥාවන්තයෝ උදහස පහකරති. (හිතෝපදේශ 29:8)**

ඔබ නොඇදහිලිවන්තයෙකුව සිටි කල ක්‍රෝධයේ දරුවෙකුව පසුවිය :

**ඔවුන් අතරේ අප සියල්ලෝද වරක් අපේ මාංසයේ තෘෂ්ණාවල හැසිරෙමින්, මාංසයටත් සිතටත් කැමතිදේ කරමින්, ස්වාභාවෙන් අනික් අය මෙන් උදහසේ දරුවෝව සිටියෙමුව. (එපීස 2:3)**

වර්තමානයේ ඔබගේ ජීවිතයෙහි ක්‍රෝධය නොපැවතිය යුතුය.

**සියලු තික්තකමත් කෝපයත් උදහසත් කෝලාහලත් අපහාසත් සියලු ක්‍රෝධත් නුඹලා කෙරෙන් පහ කරනු ලැබේවා. (එපීස 4:31)**

ඔබ ක්‍රෝධය ඉවත් කළ යුතුය :

**නුමුත් දැන් නුඹලා ඒ සියල්ල-කෝපය, උදහස, ක්‍රෝධය, අපහාසය, නින්දාකිරීම, නුඹලාගේ මුඛයෙන් නික්මෙන කැත කථාව-පහකරපල්ලා. (කොලොස්සි 3:8)**

ඔබ ක්‍රෝධය ප්‍රතික්ෂේප කළ යුතුය :

**තරහෙන් වැලකී උදහස අත්හැරව. කල නොකිරෙව, එයින් හටගන්නේ නපුරු ක්‍රියා පමණක්ය. (ගීතාවලිය 37:8)**

ඔබ කෝපවීමට ඉක්මන් නොවිය යුතුය :

**මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, නුඹලා මේක දන්නහුය. නුමුත් එක එක මනුෂ්‍යයා ඇසීමට ඉක්මන්වේවා, කථාකිරීමටත් උදහස්වීමටත් ප්‍රමාද වේවා. මක්නිසාද මනුෂ්‍යයාගේ උදහසින් දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඉෂ්ට නොවන්නේය. (යාකොබ් 1:19,20)**

**කෝපයට ප්‍රමාදවන්නා බොහෝ නුවණැත්තෙක්ය; එහෙත් ඉක්මනින් කිපෙන්නා මෝඩකම මතුකරන්නේය. (හිතෝපදේශ 14:29)**

කෝපය සහ මාංශයේ ඊළඟ ක්‍රියාව වන පක්ෂවාදී අරගලය අතර සම්බන්ධතාවයක් පවතී. බයිබලය මෙම සම්බන්ධතාවය විස්තර කර දෙන්නේ :

**තරහකාර මනුෂ්‍යයෙක් තරහ උපදවයි; එහෙත් ඉවසිලි ඇත්තා ඩබරය සන්සිඳුවයි. (හිතෝපදේශ 15:18)**

**මක්නිසාද කිරි ඇල්ලීමෙන්ද වෙඬරු හැදෙන්නේය, නාසය මිරිකීමෙන් ලේ එන්නේය. එසේම උදහස ඇවිස්සීමෙන් තරහය හටගන්නේය. (හිතෝපදේශ 30:33)**

## පක්ෂවාදී අරගලය

පක්ෂවාදී අරගලය නම් රණ්ඩුකිරීම, සටන්කිරීම හෝ ප්‍රතිවිරුද්ධ ගැටුම වේ. එනම් මතභේදයක් හෝ එකඟතාවයක් නොමැතිවීමයි. කෝපය මගින් අරගල ඇති කරන්නාක් මෙන්ම ඊර්ෂ්‍යාව ද අරගල බිහිකරයි.

**වෛරය ඩබරය උපදවයි; එහෙත් ප්‍රේමය සියලු වැරදි වසයි. (හිතෝපදේශය 10:12)**

ප්‍රයෝගකාර මිනිසුන්ද පක්ෂවාදීකම පතුරුවති:

**ප්‍රයෝගකාර මනුෂ්‍යයා තරහ පතුරවන්නේය; කේලාම් කියන්නාද හිතමිත්‍රයන් වෙන්කරන්නේය. (හිතෝපදේශ 16:28)**

උඩගුකම තරහය උපදවයි :

**ගිජු සිත් ඇත්තා තරහය උපදවයි; එහෙත් ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන්නා පුෂ්ටිමත් වෙයි. (හිතෝපදේශ 28:25)**

කෝප වූ මිනිසුන් තරඟ උපදවයි :

**තරඟකාර මනුෂ්‍යයෙක් තරඟ උපදවයි: කෝපවෙන මනුෂ්‍යයෙක්ද බොහෝ වරද කරන්නේය. (හිතෝපදේශ 29:22)**

කවටකම් කරන්නෝ තරඟ උපදවයි :

**නින්දාකරන්නා පන්නාදමාපන්න, එවිට තරඟය පහවේ: එසේය, විවාදයත් ලජ්ජාවත් නවතියි. (හිතෝපදේශ 22:10)**

කවටකම් කිරීම යනු යම් දෙයකට හෝ තැනැත්තෙකු හට සමච්චල් කිරීමය.

අනෙක් අයගේ කාරණාවලට ඇගිලි ගසන මනුෂ්‍යයන් සිටින කල, වාද විවාද පවතින කල, අන් අය පිළිබඳ ඕපාදූප කතාකරන කල පක්ෂවාදීකම ඇවිස්සේ.

**පාරේ යමින් තමාට වැදගැන්මක් නැති ඩබරයකට මැදිවෙන්නා උගේ කන්වලින් බල්ලෙකු අල්ලා ගන්න කෙනෙක් මෙන්ය. දරනැති තැන ගින්න නිවීයයි: එසේම කේළාම් කියන්නෙක් නැති කල තරඟය නවතින්නේය. ගිනිඅඟුරුවලට අඟුරුත් ගින්නට දරත් යම්සේද, ඩබර අවුස්සන්ට තරඟකාර මනුෂ්‍යයා එසේමය. (හිතෝපදේශ 26:17,20-21)**

මෝඩ ප්‍රශ්නවලින්ද තරඟය ඇවිස්සේ :

**නුමුත් මෝඩවූ අඥානවූ විවාදවලින් ඩබර උපදින බව දැන, ඒවා එපාකරපන්න. (2 තිමෝති 2:23)**

පක්ෂභේද, තරඟය මාංශයේ ලෞකික ක්‍රියාවකි :

**එසේය, දැනුත් බැරිය: මක්නිසාද නුඹලා තවම මාංසිකය. නුඹලා අතරෙහි ඊර්ෂ්‍යාවද විවාදයද ඇති බැවින්, නුඹලා මාංසිකව මනුෂ්‍ය ප්‍රකාරයෙන් හැසිරෙනවා නොවේද? (1 කොරින්ති 3:3)**

ඊර්ෂ්‍යාව, තරඟය ඇති තැන වියවුල හටගනී :

**මෘදුකම ඇතුව පෙන්වාවා. නුමුත් නුඹලාගේ සිත්වල තික්ත ඊර්ෂ්‍යාවද පක්ෂවාදීකමද තිබේනම්, පාරට්ටුකරමින් සත්‍යයට බොරු නොකියල්ලා. මක්නිසාද ඊර්ෂ්‍යාවත් පක්ෂවාදීකමත් ඇති තැන, අවුල්කමත් සියලු නපුරු ක්‍රියාවලුත් ඇත්තේය. (යාකොබ් 3:14,16)**

තරඟයෙන් යුතුව කිසිවක් නොකළ යුතු බව බයිබලය පවසයි :

**පක්ෂවාදීකමෙන්වත් නිෂ්ඵල පාරට්ටුකාරකමෙන්වත් කිසි දෙයක් නොකොට, එකිනෙකා තම තමාට වඩා වෙන කෙනෙක් උතුමැයි යටහත්කමින් සිතාවා. (පිලිප්පි 2:3)**

තරඟකාරී බව බොරු ගුරුවරුන්ගේ එක් ලක්ෂණයකි :

**වචන ගැන ප්‍රශ්නකිරීමෙන්ද වාදකිරීමෙන්ද උමතුව අහංකාරව සිටියි: එයින් ඊර්ෂ්‍යාවද විවාදයද අපහාසයද නපුරුයයි සිතිමද දූෂ්‍යවූණ සිත් ඇත්තාවූ, සැබෑවෙන් වෙන්ව සිටින්නාවූ භක්තිවන්තකම ලාභයට මාර්ගයකැයි සිතන්නාවූ මනුෂ්‍යයන්ගේ නිරන්තර තරඟද උපදින්නේය. (1 තිමෝති 6:4-5)**

## කැරලිකාර ස්වභාවය

කැරලිකාරකම යනු සමූහයක නොසන්සුන් කමක් හෝ වියවුලක් අවුස්සා තැබීමය. බයිබලයෙහි මෙම වචනය භාවිතා කර ඇති පද ස්වල්පයෙන් මෙය එක් ස්ථානයකි.

## මිථ්‍යා ලබ්ධිය

මිථ්‍යාව නම් දේව වචනයට එරෙහිවූ විශ්වාසයන්ය. මිථ්‍යා මත මිනිස් මත වන අතර ඒවා වැරදි සහගත වේ. එමගින් සභාවල බෙදීම් හටගනී. මිථ්‍යා මත බොරු අනාගතවාකතෘන්ගේ එක් චරිත ලක්ෂණයකි.

> **නුමුත් සෙනඟ අතරේ බොරු ප්‍රොපේතවරුද සිටියෝය. එලෙසම විනාශක ධර්මභේද රහසින් උපදවමින්ද තමුන්ම මිලේටගත් ආචාරීන්වහන්සේව එපාකරමින්ද තමුන් පිටට සීඝ්‍ර විනාශය පමුණුවාගන්නාවූ බොරු ගුරුවරු නුඹලා අතරෙත් වන්නෝය. (2 පේත්‍රුස් 2:1)**

## ඊර්ෂ්‍යාව

අන් අයගේ සාර්ථකත්වය නිසා පැන නගින ඊෂර්‍යවකි. එය වෙනකෙනෙකු ආත්මිකව, ආර්ථිකව හෝ භාණ්ඩමය අතින් ලබන ආශිර්වාද කෙරෙහි මිනිසා දක්වන නොරිස්සීමය. එය වැරදි ආශාවක් සහ පැතිමකි.

බොරු ගුරුවරුන්ගේ එක් චරිත ලක්ෂණයක් නම් ඊර්ෂ්‍යාව

> **වචන ගැන ප්‍රශ්නකිරීමෙන්ද වාදකිරීමෙන්ද උමතුව අහංකාරව සිටියි; එයින් ඊර්ෂ්‍යාවද විවාදයද අපහාසයද නපුරුයයි සිතීමද දූෂ්‍යවූණ සිත් ඇත්තාවූ, (1 තිමෝති 6:4)**

ඊර්ෂ්‍යාව පැමිණෙන්නේ මිනිස් ආත්මයෙනි :

> **නොහොත් දෙවියන්වහන්සේ අප තුළ වාසයකෙරෙවුවාවූ ආත්මය අප කෙරේ අතිශයින් ආශාවන්නේය කියා ලියවිල්ල නිෂ්කාරණයේ කථාකරන්නේයයි නුඹලා සිතන්නහුද? (යාකොබ් 4:5)**

ඊර්ෂ්‍යා කිරීමෙන් කිතුනුවෙකු තමා ලෞකික කෙනෙකු බවට පත්වී ඇති බව පෙන්විය :

> **එසේය, දැනුත් බැරිය; මක්නිසාද නුඹලා තවම මාංසිකය. නුඹලා අතරෙහි ඊර්ෂ්‍යාවද විවාදයද ඇති බැවින්, නුඹලා මාංසිකව මනුෂ්‍ය ප්‍රකාරයෙන් හැසිරෙනවා නොවේද? (1 කොරින්ති 3:3)**

පාපයෙහි ජීවත්වන අය ඊර්ෂ්‍යාවෙන් පිරී පවති :

> **ඔව්හු වනාහි සියලු අධර්මිෂ්ඨකමින්ද දුෂ්ටකමින්ද ලෝභකමින්ද නපුරුකමින්ද පූර්ණව, ඊර්ෂ්‍යාවෙන්ද මිනීමැරීමෙන්ද ඩබරයෙන්ද වංචාවෙන්ද ක්‍රෝධයෙන්ද පිරී සිටියෝය.**
> **(රෝම 1:29)**

> **මක්නිසාද අපිත් වරක් අඥානව, අකීකරුව, මුළාව, අනේකාකාර තෘෂ්ණාවලටත් සැප සෙල්ලම්වලටත් වාල්ව, ක්‍රෝධයෙන් හා ඊර්ෂ්‍යාවෙන් හැසිරෙමින්, නුරුස්සනු ලබන්ට නිස්සෝව, එකිනෙකාට වෛරකරමින් සිටියෙමුව. (තීතස් 3:3)**

ඊර්ෂ්‍යාව ඇති තැන අනෙක් ගැටලු හටගනී :

> **මෘදුකම ඇතුව පෙන්වාවා. නුමුත් නුඹලාගේ සිත්වල තිත්ත ඊර්ෂ්‍යාවද පක්ෂවාදීකමද තිබේනම්, පාරට්ටුකරමින් සත්‍යයට බොරු නොකියල්ලා. මක්නිසාද ඊර්ෂ්‍යාවත් පක්ෂවාදීකමත් ඇති තැන, අවුල්කමත් සියලු නපුරු ක්‍රියාවලුත් ඇත්තේය. (යාකොබ් 3:14,16)**

පව්කරුවනට ඊර්ෂ්‍යා නොකරන ලෙසට අපට අවවාද කර තිබේ :

> **නුඹේ සිත පව්කාරයන්ට ඊර්ෂ්‍යා නොකොට, හැම කල්හිම ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇතුව තිබේවා. (හිතෝපදේශ 23:17)**

# මිනිමරුවෝ

මිනී මැරීම නම් කලින් සැලසුම් කරගෙන ඕනෑකමින්ම ද්වේශ සහගත ලෙස වෙනයම් කෙනෙකු ජීවිතක්ෂයට පත් කිරීමය. මිනී මැරීම ස්වයං-ආරක්ෂාව හෝ හදිස්සියේ අතපසුවීමකින් සිදුවන මරණයක් හා සමාන නොවේ. වෙනකෙනෙකු මැරීම හේතුවෙන් මරණීය දණ්ඩණයට යටත් වූ කෙනෙකු හා සමාන නොවේ. මෙය ගණන් කථාව පොතේ 35 හි දෙවියන්වහන්සේ විසින් ස්ථාපිත විනිශ්චයකි. දෙවියන්වහන්සේ දුන්නාවූ ආඥාවලින් මූලික එකක් වනුයේ "මිනී නොමරනු" යන්නය.

යේසුස්වහන්සේ පැවසුවේ :

**... යේසුස්වහන්සේ කියනසේක්: මිනී නොමරව... (මතෙව් 19:18)**

ඔබ මිනී මැරීමේ වරදට චෝදනා නොලද කෙනෙකු විය යුතුය :

**නුඹලාගෙන් කිසිවෙක් මිනීමරන්නෙක්වත් සොරෙක්වත් නපුර කරන්නෙක්වත් අනුන්ගේ කාරණාවලට ම දිවන්නෙක්වත් මෙන් දුක් නොවිඳීවා. (1 පේත්‍රුස් 4:15)**

අළුත් ගිවිසුමෙහි මිනී මැරීම අර්ථය පුළුල් කර දක්වමින් කෝපයද මිනී මැරීමට ඇතුලත් කොට ඇත. ඔබ අන් ඇදහිලිවන්තයන්ට ද්වේශ කරයි නම් එයද මිනීමැරීමට සමාන කොට දක්වා ඇත.

**තමාගේ සහෝදරයාට වෛරකරන කවරෙක් නුමුත් මිනීමරන්නෙක්ය. කිසි මිනී මරන්නෙක් තුළ සදාකාල ජීවනය නොපවතින බව නුඹලා දනිහුය. (1 යොහන් 3:15)**

# බීමත්කම

බීමත්කම යනු අධික ප්‍රමාණයක් මත් පැන් භාවිතය හේතු කොටගෙන මානසික සහ ශාරීරිකව බලපෑමක් ඇතිවූ තත්වයකි. එය සැර රසායනික බීම පානය කිරීම මගින් මත් වූ තත්වයකට පත්වීමකි. බීමත්කමට ඇබ්බැහිවූ බේබද්දෝ දුප්පත් වන බවට බයිබලය අනතුරු අඟවයි.

**මක්නිසාද බේබද්දාත් කෑදරයාත් දිළිඳුවන්නේය: නිදිමත වැරහැලි ඇඳීමට පමුණුවන්නේය. (හිතෝපදේශ 23:21)**

ඔබ බේබදු ජීවිත රටාවක් ගෙවිය යුතු නොවේ :

**ක්‍රීඩා ඝෝෂාව සහ බීමත්කමෙන් හෝ සල්ලාලකම සහ අනාචාරයෙන් හෝ ඩබර සහ ඊර්ෂ්‍යාවෙන් හෝ නොහැසිර, දවාලෙහි මෙන් ඔබින ලෙස හැසිරෙමු. (රෝම 13:13)**

බේබද්දන් සමග ඔබ සහභාගිකම් නොපැවැත්විය යුතුය :

**නුමුත් සහෝදරයෙකැයි කියනලද කෙනෙක් වෙශ්‍යාකම්කරන්නෙක්වත් ලෝභයෙක්වත් රූපවඳින්නෙක්වත් නින්දාකරන්නෙක්වත් බේබද්දෙක්වත් කොල්ලකාරයෙක්වත් වේ නම්, එබන්දෙකු සමග සමාගම් නොපවත්වන්ටද කෑමවත් නොකන්ටද දැන් නුඹලාට ලියමි:**
**(1 කොරින්ති 5:11)**

බේබද්දෝ දේව රාජ්‍යය හිමිකර නොගන්නා බව බයිබලය අවවාද කරයි :

**නොහොත් අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්නේ නැති බව නුඹලා දන්නේ නැද්ද? නොරැවටෙල්ලා. ...බේබද්දෝවත් ...දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකර නොගන්නෝය. (1 කොරින්ති 6:9-10)**

ඔබ අතීතයේ බේබද්දෙක්ව සිටින්නට ඇති. නමුත් ඇදහිලිවන්තයෙකු ලෙස තවදුරටත් ඔබ එය නොකළ යුතුය :

**දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ජීවත්වෙන පිණිස එම සිත ආයුධයක් කොට පැළඳගනිල්ලා. මක්නිසාද මාංසයෙන් වධවින්ද තැනැත්තේ පාපයෙන් නිදහස්වී සිටියි. සල්ලාලකම්වලද**

**තෘෂ්ණාවලද, බීමත්කම්වලද, නපුරු මංගල්‍යවලද, මත්පැන්බීම්වලද, පිළිකුල්වූ රූපඅැඳීම්වලද හැසිර, අන්‍යජාතීන්ගේ කැමැත්ත කරමින් නුඹලා ගතකළාවූ කාලය ඉතා ඇත. (1 පේතෘස් 4:2-3)**

බයිබලය මුද්‍රික පානයෙන් මත්වීම ශුද්ධාත්මයෙන් පූර්ණවීමට ප්‍රතිවිරුද්ධ ලෙස සංසන්දය කරයි.

**මුද්‍රිකපානයෙන් මත් නොවෙල්ලා, එයින් අනාචාරකම් හටගන්නේය: නුමුත් ආත්මයාණන්ගෙන් පූර්ණවී, (එපීස 5:18)**

ස්වාභාවික ලෝකයෙහි, බේබද්දෙක්...

1. මත් පැන් සඳහා පවතින ආශාවට ලොල් වී සිටී.

2. මත් පැනට තම ශරීරයේ අවයව හා චිත්තය භාර දෙයි.

3. මත් පැන් මගින් කතාබහට බලපෑම් ඇතිවේ.

4. තමා පිළිබඳ තහනමක් නොමැතිව ක්‍රියා කරයි. බය නැතිවී ගොස් බොහෝ විට අමුතු ශක්තියක් පෙන්වයි.

5. මත් පැනින් මත් වී සිටින තුරු ප්‍රීතියෙන් සිටී.

## මංගල්‍ය ඝෝෂා

මංගල්‍ය ඝෝෂා නම් ලෝකාකාරවූ, ශබ්ද පවත්වන සතුටුවීමට කරන්නාවූ උත්සව, සීමාව ඉක්මවා විනෝදවීමට සංවිධානය කරන ප්‍රිති සාද, යනාදිය පවැත්වීම හා සහභාගිවීමය. එය ප්‍රචණ්ඩ වූත්, කළහකාරීවූත් ජීවිතයකි.

ඔබ අතිතයේදී එවැනි මංගල්‍ය ඝෝෂාවලට ඇබ්බැහි වී සිටින්නට ඇත. එහෙත් දැන් කිතු බැතියෙකු ලෙසට ඔබ එම පුරුදු අත්හල යුතුය.

**දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ජීවත්වෙන පිණිස එම සිත ආයුධයක් කොට පැළඳගනිල්ලා. මක්නිසාද මාංසයෙන් වධවින්ද තැනැත්තේ පාපයෙන් නිදහස්වී සිටියි. සල්ලාලකම්වලද තෘෂ්ණාවලද බීමත්කම්වලද නපුරු මංගල්‍යවලද මත්පැන්බීම්වලද පිළිකුල්වූ රූපඅැඳීම්වලද හැසිර, අන්‍යජාතීන්ගේ කැමැත්ත කරමින් නුඹලා ගතකළාවූ කාලය ඉතා ඇත. (1 පේතෘස් 4:2-3)**

## මාංශයේ ක්‍රියා : එහි ප්‍රතිඵල

මාංශයේ ක්‍රියා කිරීමේ ප්‍රතිඵල පාවුල් තුමා පැහැදිලි කරයි.

**වෛර, මංගල්‍ය ඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. මෙබඳු දේ කරන්නන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම නුඹලාට ප්‍රථම කී ලෙසම, දැනුත් කලින් නුඹලාට කියමි. (ගලාති 5:21)**

මෙම දඬුවමෙන් මිදීමට දෙවියන්වහන්සේ මාර්ගයක් සපයා ඇත.

**අපේ පාපවල් කියාදෙමු නම්:, අපේ පව් අපට කමා කරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක. (1 යොහන් 1:9)**

## ආත්මයෙන් හැසිරෙන්න

කෙනෙකු මාංශයෙහි පාපිෂ්ඨ ක්‍රියා කිරීම නවත්වන්නේ කෙසේද?

**පළමුව :** ඔබගේ පාපය පිළිබඳ පසුතැවිලි වී දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ඔබගේ පෞද්ගලික ගැළවුම්කරු ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිගැනීම තුළිනි.

**එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටිනම්, ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය; මෙන්න සියල්ලම අලුත් වී තිබේ. (2 කොරින්ති 5:17)**

දෙවියන්වහන්සේ පාපිෂ්ඨ මිනිසා රැගෙන ඔහුට ස්වයං-දියුණුවේ පාඨමාලාවක් සපයන්නේ නැත. උන්වහන්සේ නවතම මිනිසෙකු ඔහු තුළින් සාදයි. පැරණි දෙය පහව යන්නේය. මාංශයේ ක්‍රියා වෙනුවට ශුද්ධාත්මයාණන්ගේ ඵල එම තැනට ඇතුළුකළ යුතුය.

**දෙවනුව :** ශුද්ධාත්මයෙන් පූර්ණ වන්න. ඔබට ශුද්ධ ආත්මය පව්කාර මාංශයේ ක්‍රියාවල නොහැසිර ආත්මයේ ක්‍රමයට හැසිරීමට හැකියාව සපයන සේක.

**මක්නිසාද, මාංසය ආත්මයාණන්වහන්සේට විරුද්ධවද, ආත්මයාණන්වහන්සේ මාංසයට විරුද්ධවද ආශාකරයි. නුඹලා කැමතිවන දේ නොකරන ලෙස මොවුහු එකිනෙකාට විරුද්ධවෙති. (ගලාති 5:17)**

**තුන්වෙනුව :** ඔබගේම ශක්තියෙන් මාංශයේ ක්‍රියා වලින් නිදහස් වී ආත්මයාණන් තුළ හැසිරිය නොහැකි බව අවබෝධකරගන්න.

ප්‍රේරිත වූ පාවුල් තම ශක්තියෙන් දේව භක්තික ජීවිතයක් ගත කිරීමට උත්සහ දැරීමේ පොර බැදීම පිළිබඳව විස්තර කරයි :

**මක්නිසාද, මම කරන දේ මම නොදනිමි. මා කරන්නේ මා කැමති දේ නොව මා ද්වේශකරන දේය. ඉඳින් මම අකමැති එක කරම් නම්, ව්‍යවස්ථාව යහපත්කම ඒත්තුගනිමි. එහෙයින් එය කරන්නේ මා නොව මා තුළ වාසය කරන පාපයය. මක්නිසාද, මා තුළ එනම් මාගේ මාංසය තුළ කිසි යහපතක් වාසය නොකරන බව දනිමි. මක්නිසාද, කැමැත්ත මට ඇත්තේය. නුමුත් යහපත් දෙය කිරීම මට නැත්තේය. මක්නිසාද, මම කැමති යහපත නොකර අකමැති නපුර කරමි. (රෝම 7:15-19)**

පාවුල් තුමා ශුද්ධ ජීවිතයක් ගත කිරීමට අපහසු බව අත් දුටුවේය. එහෙත් ඔහුගේ අසමත්කම මධ්‍යයේ පවා එම ඉලක්කය ඉටු කර ගැනීමට උත්සහ දැරීය.

ඔබගේ හද තුළට ශුද්ධ ජීවිතයක් ගත කිරීමේ ආශාව ඇතුළු කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඔබ අසමත්වූ විට, පව් කළ විට එය ක්ෂණයකින්ම පාපොච්චාරණය කොට, ඉන් ජය ගැනීමට ශුද්ධාත්ම උපකාරය ඉල්ලා සිටින්න. ඔබ ශුද්ධාත්මයාණන් තුළ හැසිරීමට ඉගෙන ගනුයේ එලෙසය.

**එහෙයින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින්නන්ට දැන් දඬුවමට පත්කිරීමක් නැත. මක්නිසාද, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ වූ ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද, මරණයේද, ව්‍යවස්ථාවෙන් මා නිදහස්කළාය. මක්නිසාද, දෙවියන්වහන්සේ තමන්වහන්සේගේම පුත්‍රයාණන් පාප-මාංසයේ සමානකමෙන්ද, පාපය නිසාද, එවා, මාංසයේ පාපය දඬුවමට පත්කරමින්, මාංසය කරණකොටගෙන දුර්වල වූ ව්‍යවස්ථාවට බැරිවූ දේ ඉෂ්ඨකළසේක. එසේ කළේ මාංසික ලෙස නොව ආත්මිකලෙස හැසිරෙන්නාවූ අප තුළ ව්‍යවස්ථාවේ නියෝගය සම්පූර්ණවෙන පිණිසය. මක්නිසාද, මාංසික ලෙස සිටින්නෝ මාංසික දේවලටද, ආත්මික ලෙස සිටින්නෝ ආත්මික දේවටද ඇලුම්වෙති. මාංසයේ ඇල්ම මරණයය; නුමුත් ආත්මයේ ඇල්ම ජීවනය හා සමාදානයය. කුමක්හෙයින්ද, මාංසයේ ඇල්ම දෙවියන්වහන්සේට සතුරුකමය; ඒක දෙවියන්වහන්සේගේ ව්‍යවස්තාවට යටත් නැත. යටත් වෙන්ටත් බැරිය. මෙසේ, මාංසයෙහි සිටින්නන්ට දෙවියන්වහන්සේ සතුටු කරන්ට නොහැකිය. නුමුත් නුඹලා තුළ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ වාසයකරණසේක් නම්, නුඹලා මාංසයෙහි නොව ආත්මයෙහි සිටින්නෝය. ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මයාණන්වහන්සේ යම් කෙනෙකුට නැත්නම් ඔහු උන්වහන්සේට අයිති නැත. (රෝම 8:1-9)**

යේසුස්වහන්සේ මෙන්වූ ගුණාංග ඔබ තුළ වර්ධනය වනුයේ ඔබ ශුද්ධාත්ම බලය තුළ හැසිරීමට ඉගෙන ගත් විට පමණකි. ඇදහිලිවන්තයෝ ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය තේ/මි ගැනීම ඉතා වැදගත් වනුයේ එබැවිනි.

# ස්වයං- පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

2. ශුද්ධාත්ම ඵල වලට ප්‍රතිවිරුද්ධ ගුණාංග හඳුන්වනුයේ :

______________________________________________

______________________________________________

______________________________________________

3. මාංශයේ ක්‍රියා වලින් ජය ගැනීමට රහස සපයා දෙන්නේ කුමන බයිබල් කොටස් වලින්ද?

______________________________________________

______________________________________________

______________________________________________

4. අංක 1 යටතේ මාංශයේ ක්‍රියා සඳහන් වේ. අංක 2 හි අර්ථ දැක්වීම් දී ඇත. සපයා ඇති හිස්තැනෙහි ගැලපෙන අර්ථ දැක්වීමෙහි අංකය සඳහන් කරන්න.

| අංක 1 | අංක 2 |
|---|---|
| __________මංගල්‍ය ඝෝෂා | 1. විවාහකයෙක් තම සහකරු/සහකාරිය නොවන අයෙකු සමග සංවාසය. |
| __________ඊෂ්‍යාව | 2. විවාහ නොවූ යුවලක් ලිංගික සංසර්ගයේ යෙදීම. |
| __________මිනීමරුවෝ | 3. ආත්මිකව හා සදාචාරාත්මක අපවිත්‍රකම. |
| __________බේබද්දෝ | 4. කාමය,දුෂ්ඨ හැඟීම්, |
| __________සල්ලාලකම | 5. පිළිම නමස්කාරකිරීම. |
| __________කාමමිථ්‍යාචාරය. | 6. යන්ත්‍ර මන්ත්‍ර ආදිය. |
| __________වේශ්‍යාකම | 7. ප්‍රේමයේ ප්‍රතිවිරුද්ධ බව |
| __________අපවිත්‍රකම | 8. එකඟනොවීම, ප්‍රතිවිරුද්ධ අදහස් |

| | |
|---|---|
| __________මායාව | 9. තරඟය, අන් අය අනුකරණය කොට සමානවීමට හෝ පරදා යාමට දැඩි ආශාව. |
| __________රූපනමස්කාරය | 10. ප්‍රචණ්ඩ තරහාව, දැඩි කෝපය. |
| __________වෛරය | 11. රණ්ඩු දබර කරගැනිම. |
| __________මතභේද | 12. අසමගිය පැතිරවීම, ඇවිස්සීම. |
| __________ලබ්දිභේද | 13. දේව වචනයට එරෙහි විශ්වාසයක්. |
| __________තරඟකාරිත්වය | 14. අන්‍යයන්ගේ සාර්ථකත්වය දැක ඊර්ෂ්‍යාකිරීම. |
| __________පක්ෂවාදී අරගල | 15. අන් කෙනෙකු ජීවිතක්ෂයට පත්කිරීම. |
| __________ක්‍රෝධය | 16. වැඩිමහත් බීම. |
| __________කැරලි ස්වභාවය | 17. ලෝකාකාරවූ, ඝෝෂාකාරී,උත්සව, ප්‍රිය සම්භාෂණ පැවැත්වීම. |

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

ගලාති 5:22-24 හි සඳහන් ආත්මයාණන්ගේ ඵල සහ ගලාති 5:19-21 හි සඳහන් මාංශයේ ක්‍රියා අතර ප්‍රතිවිරුද්ධතාවය සඳහන් කරන්න. පළමුවැන්න උදාහරණයක් ලෙස කර ඇත.

## ප්‍රතිවිරුද්ධතාවයන්

| ආත්මයාණන්ගේ ඵල | මාංශයේ ක්‍රියා |
|---|---|
| (ගලාති 5:22-24) | (ගලාති 5:19-21) |
| ප්‍රේමය | ක්‍රෝධය, මිනීමැරීම, ඊර්ෂ්‍යාව. |
| ප්‍රීතිය | |
| සමාදානය. | |
| ඉවසිලිවන්තකම | |
| කරුණාවන්තකම | |
| යහපත්කම | |
| ඇදහිල්ල | |
| මෘදුකම | |
| පමණ දැන ක්‍රියාකිරීම. | |

# දහතුන්වන පරිච්ඡේදය

# ආත්මික ඵල වර්ධනය කිරීම

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබට :

- ආත්මික ඵල නිෂ්පාදනයෙහි විවිධ මට්ටම් පැහැදිලි කිරීමට
- ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි ආත්මික ඵල වර්ධනය වීම ස්වාභාවික ඵල නිපදවන ක්‍රමය ඇසුරින් පැහැදිලි කර දීම කළ හැකි වනු ඇත.

## ප්‍රධාන පදය :

**මා තුළෙහි තිබී ඵල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරන සේක. ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස උන්වහන්සේ පවිත්‍රකරනසේක. (යොහන් 15:2)**

## හැඳින්වීම

ඔබගේ ජීවිතයෙහි ආත්මික ඵල දක්නට ලැබීම දෙවියන්වහන්සේගේ ආශාව බව මෙහි ප්‍රධාන පදයෙන් සනාථ වේ. මෙම පරිච්ඡේදය ඔබහට ආත්මික ඵල වර්ධනය කරගැනීමට උපදෙස් සපයයි.

## ඵලවල නිෂ්පාදන මට්ටම්

ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි ඵල දැරීමේ විවිධ මට්ටම් දැකිය හැක. යොහන් 15 පරිච්ඡේදයෙහි විවිධ ඵලදැරීම් මට්ටම් සඳහන් වේ.

| | |
|---|---|
| - ඵල | යොහන් 15:2 |
| - වඩා ඵල | යොහන් 15:2 |
| - බොහෝ ඵල | යොහන් 15:5,8 |
| - සදාකාල ඵල | යොහන් 15:16 |

දෙවියන්වහන්සේගේ ආශාව ඔබ බොහෝ ඵල දැරීමත් එය සදාකාලයට පවතින ඵල වීමත්ය. ඔබ බාහිර ඵල වන ශුභාරංචි සේවයෙහිද, අභ්‍යයන්තර ඵල වන ක්‍රිස්තුස්වහන්සේ මෙන් වූ චරිත ගුණාංග වලින්ද ඵල දැරීම එතුමාගේ අපේක්ෂාවය.

## ස්වාභාවික හා ආත්මික සත්‍යයන්

දෙවියන්වහන්සේ ඔබහට පවසන දෑ වටහා ගැනීම සඳහා බයිබලයෙහි වැදගත් මූලධර්ම ඇති බව ඔබ හඳුනාගත යුතුය. ඉන් එක් මූලධර්මයක් නම් ආත්මික හා ස්වාභාවික සත්‍යවල සමාන්තර භාවය වේ. "සමාන්තර" යනු එක හා සමාන වූ හෝ එකට එක පැත්තෙන් ඒකාකාරීව පවතින යන්නය. "ආත්මික සත්‍යය, ස්වාභාවික සමාන්තරයෙහිදී" දෙවියන්වහන්සේ ආත්මික සත්‍යයක් පැහැදිලි කිරීමට හෝ නියෝජනය කිරීමට ස්වාභාවික උදාහරණයක් භාවිතා කරනසේක.

යේසුස්වහන්සේගේ උපමා කතා ආත්මික සත්‍යයන් පිළිබඳ ස්වාභාවික උදාහරණ වේ. උදාහරණයක් ලෙස එක් උපමාවකදී යේසුස්වහන්සේ කාසියක් නැතිවී එය ඉතා ඕනෑකමින් සෙවූ කාන්තාවක් භාවිතා කළසේක. උන්වහන්සේ මෙම උපමාව තුළින් නැතිවී සිටින ස්ත්‍රී/පුරුෂයන් සෙවීමට අප කොපමණ උනන්දුවෙන් සෙවිය යුතුද කියා පෙන්වීමට භාවිතා කළසේක. යේසුස්වහන්සේ ආත්මික සත්‍යයන් පැහැදිලි කිරීම පිණිස ස්වාභාවික උදාහරණ භාවිතා කළ බොහෝ අවස්ථාවන් ඇසුරින් මෙම උපමාව එකක් පමණි.

ආත්මික සහ ස්වාභාවික සත්‍යයන්හි සමාන්තර බව නම් වූ මූලධර්ම 1 කොරින්ති හි පැහැදිලි කොට ඇත.

> **ස්වාභාවික ශරීරයක්ව වපුරනු ලැබේ; ආත්මික ශරීරයක්ව නැගිටවනු ලැබේ. ස්වාභාවික ශරීරයක් තිබේ නම් ආත්මික ශරීරයක්ද තිබේ. එසේම; පළමුවෙනි මනුෂ්‍යයාවූ ආදම් ජීවමාන ප්‍රාණයක් වුණේයයි ලියා තිබේ. අන්තිම ආදම් ජීවනදායක ආත්මයක් විය. එසේවී නුමුත් ප්‍රථම වන්නේ ආත්මික එක නොව ස්වාභාවික එකය; පසුව ආත්මික එක විය.**
> (1 කොරින්ති 15:44-46)

මෙම පදවලදී පාවුල් තුමා ආත්මික සත්‍යයක ශ්‍රේෂ්ඨ ස්වාභාවික උදාහරණයක් පැහැදිලි කරයි. දෙවියන්වහන්සේ විසින් මවනලද පළමු මිනිසා ස්වාභාවික වූ ආදම්ය. අවසාන ආදම් නම් වූ යේසුස්වහන්සේ ආත්මයකි. දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් එළිදරව් කළාවූ ආත්මික සත්‍යයෙහි ස්වාභාවික සමාන්තරය වුයේ ආදම්ය. ස්වාභාවික මිනිසා හේතුකොටගෙන පාපය හා මරණය ඇතුළුවිය. ආත්මික මිනිසා හේතුකොට ගෙන ගැලවීම හා ජීවනය ලැබිණ.

ස්වාභාවික වූ දෙය ඔබගේ ඉන්ද්‍රියනට හසුවේ. ඔබට දකින්නට ,අසන්නට හෝ ස්පර්ශ කරන්ට හැකිය. ආත්මික දේ දැකිය හැක්කේ ආත්මික සංවේදිතාවය මගිනි. ස්වාභාවික ආදර්ශ භෞතික සංවේදි ඉන්ද්‍රියයන්ගෙන් හඳුනාගත හැකිය. එහි ආත්මික සමාන්තර දෙය හඳුනාගත හැක්කේ ශුද්ධාත්ම හෙළිදරව්ව තුළින් පමණකි. ආත්මික සත්‍යවල ස්වාභාවික සමාන්තරය නම් මූලධර්මය ඉගෙනීම තුළින් දේව වචනය අධ්‍යයනයෙහිදී නැවුම් කාරණා ඔබට ඉගෙනගත හැකිය.

## ශුද්ධාත්ම ඵල වර්ධනය කිරීම

යේසුස්වහන්සේ ශුද්ධාත්මයාණන්ගේ “ඵල” ලෙසට ආත්මික සත්‍යයක ස්වාභාවික සමාන්තරය “ඵල” යන වචනයෙන් පෙන්වීමට යොදාගත් සේක. ස්වාභාවික ලෝකයේ ඵලයක් හට ගැනීමට කිසියම් තත්වයන් පැවතිය යුතුය. එසේම ආත්මික ඵල නිපදවීමට ද එම තත්වයන් පැවතිය යුතුය. එය ආත්මික සමාන්තරයවේ. ආත්මික ලොවෙහිත්, ස්වාභාවික ලොවෙහිත් ඵලවල වර්ධනය ස්ථිර කිරීමට අවශ්‍යවන සුවිශේෂි තත්වයන් පවති. ඉන් සමහර අවශ්‍යතාවයන් වනුයේ :

### ජීවනය :

ආත්මික ඵල වර්ධනය වීමට අවශ්‍ය කරන පළමුවන සාධකය නම් ජීවනයයි. ස්වාභාවික ලොවෙහි ජීවනය ඇතිවන්නේ බීජ වලින් මෙන්ම ආත්මික ලොවෙහි ජීවනයද යේසුස් ක්‍රිස්තුස් නම් බීජය තුළින් ඇතිවේ.

ලෝකය උදෙසා ගැළවුම්කාරයෙක් පිළිබද පළමුවන පොරොන්දුවෙහි යේසුස්වහන්සේ බීජයක් ලෙසට හඳුන්වා තිබේ :

> **මම තා සහ ස්ත්‍රිය අතරෙහිද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි; ඒ වංශය තාගේ හිස පොඩි කරන්නේය, තෝ ඔහුගේ විලුඹ පොඩිකරන්නෙහියයි කීසේක. (උත්පත්ති 3:15)**

> **උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය; ඒ ජීවනය මනුෂ්‍යයන්ගේ ආලෝකය වූයේය.**
> (යොහන් 1:4)

> **මක්නිසාද පියාණන්වහන්සේ තමන් තුළම ජීවනය ඇතුව සිටින්නාක්මෙන් පුත්‍රයාටත් තමන් තුළම ජීවනය ඇතුව සිටින්ට උන්වහන්සේ වරය දුන්සේක. (යොහන් 5:26)**

> **සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

ජීවනයේ එම බීජය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබ තුළ ජීවත්විය යුතුය. ඔබ උන්වහන්සේ සමග පෞද්ගලික සම්බන්ධතාවයක් නොදරයි නම් ඔබට ආත්මික ඵල නිපදවිය නොහැක. එයට හේතුව නම් :

> **මා කෙරෙහි අදහාගන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක. උන්වහන්සේ මෙසේ කීවේ තමන් අදහාගත්තවුන් විසින් ලබන්ට සිටිය ආත්මයාණන් ගැනය. මක්නිසාද යේසුස්වහන්සේ ඒතාක්ම මහිමයට නොපැමිණි බැවින් ඒතාක්ම ආත්මයාණන් නොදෙනලද්දේය. (යොහන් 7:38-39)**
>
> **මක්නිසාද පිපාස ඇත්තා කෙරෙහි වතුරද වියලි භූමිය කෙරෙහි ජලධාරාද වගුරවන්නෙමි. නුඹේ වංශය කෙරෙහි මාගේ ආත්මයද නුඹේ දරුවන් කෙරෙහි ආශිර්වාදයද වගුරවන්නෙමි. (යෙසායා 44:3)**

## ආලෝකය :

ස්වාභාවික ඵල දැරීමේ ක්‍රියාවලියෙහි වර්ධනය උත්තේජනය වනුයේ ආලෝකයට ප්‍රතිචාර දැක්වීමක් විලසිනි. ඔබ දේව වචනයෙහි ආලෝකයට දක්වන ප්‍රතිචාරය අනුව ශුද්ධාත්ම ඵල නිපදවීමේ ක්‍රියාවලිය සිදුවේ.

> **අප විසින් උන්වහන්සේගෙන් අසා තිබෙන්නාවූ, නුඹලාට දන්වන්නාවූ පණිවිඩය නම්, දෙවියන්වහන්සේ ආලෝකය බවත් උන්වහන්සේ තුළ කිසිම අන්ධකාරයක් නැති බවත්ය. අපි උන්වහන්සේ සමග පංගුකාරකම ඇතැයි කියමින් අන්ධකාරයෙහි හැසිරෙමු නම් අපි බොරු කියනවා මිස සැබෑව නොකරමුව. නුමුත් උන්වහන්සේ ආලෝකයෙහි සිටින්නා සේම අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම්, අපට එකිනෙකා සමග පංගුකාරකම ඇත්තේය. උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්සේගේ ලේද සියලු පාපවලින් අප පවිත්‍ර කරන්නේය. (1 යොහන් 1:5-7)**

## වාතය :

ස්වාභාවික පලෑටිය එය වටා ඇති වාතයෙන් කාබන්ඩයොක්සයිඩ් උරාගනී. පැලෑටියේ වර්ධනයටත් ඵල නිපදවීමටත් එය අවශ්‍ය වේ. දේව වචනයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ වාතයට හෝ සුළඟට සමාන කොට දක්වා තිබේ.

> **හුළඟ කැමති කැමති තැනට ගසයි, එහි ශබ්දය නුඹට ඇසෙයි, නුමුත් කොතැනින් එන්නේද කියාවත් කොතැනට යන්නේද කියාවත් නුඹ දන්නේ නැත. ආත්මයාණන්ගෙන් ඉපිද සිටින සියල්ලෝම එසේමයයි කීසේක. (යොහන් 3:8)**

ඔබගේ බීජය හරහා හමා යන ශුද්ධාත්යාණන්ගේ “සුළඟ” ස්වාභාවික ලෝකයෙහි සුළඟට බොහෝ සමානය. එය දේව වචනය නමැති බීජ ව්‍යාප්ත කරයි. ඔබගේ ආත්මික ජීවිතයෙහි ඇති බොල් වූ බීජ වලින් හොඳ තිරිඟු බීජ වෙන්කරයි, ආත්මික ජවලිතකම නැමැති අඟුරු නැවත ගිනි අවුලුවා දෙවියන්වහන්සේ කෙරෙහි අළුතින් ජවලිත කරවයි.

## අවකාශය :

මතෙව් 13 හි වපුරන්නාගේ උපමාවෙහි සඳහන් පරිදි ඉඩකඩ සඳහා වූ තරඟකාරීත්වය සමහර පැලෑටි යටකරගෙන වැඩී සිටි බව පෙන්වයි. ආත්මික ඵල වර්ධනය කරගත් ඇදහිලිවන්තයා ලෝකයෙහි තරඟකාරීත්වයෙන් ඉවත් වී සිටිය යුතු බව හඳුනාගනීවි.

> **කටු අතරෙහි වපුරන ලද්දේ නම්, වචනය අසා, ලෝකය ගැන වෙහෙසීමෙන්ද වස්තුවේ රැවටිලිකාරකමෙන්ද වචනය යටවීමෙන් ඵල නොදරන තැනැත්තාය. (මතෙව් 13:22)**

ඔබ ලෝකයේ ආකාරයට සමාන නොවිය යුතුය. ඔබ දෙවියන්වහන්සේගේ ක්‍රමයට වෙනස් විය යුතුය.

> **නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:2)**

ඔබට ආත්මිකව වර්ධනය වීමට හැකිවන පරිදි දෙවියන්වහන්සේ ඔබ අවට අවකාශය සපයමින් ඉඩකඩ ලබා දෙන සේක. (ලෝකයෙන් වෙන් කොට තබන සේක)

**මම ඉශ්‍රායෙල්ට පිනි මෙන් වන්නෙමි. ඔහු මානෙල් මෙන් මල් දරන්නේය, ලෙබනොන් මෙන් මුල් අදින්නේය. ඔහුගේ අතු පැතිරී ගොස්, ඔහුගේ අලංකාරය ඔලීව ගස මෙන්ද ඔහුගේ සුවඳ ලෙබනොන් මෙන්ද වන්නේය. ඔහුගේ සෙවණෙහි වසන්නෝ හැරීඑන්නෝය; ඔව්හු ගොයම මෙන් නැවත ප්‍රාණවත්වී, මුද්‍රිකවැල මෙන් දළුදමන්නෝය. එහි සුවඳ ලෙබනොන්හි මුද්‍රිකපානය මෙන් වන්නේය. එප්‍රායිම්ද: දේවරූපවලින් මට තවත් කම මොකදැයි කියනවා ඇත. මමම ඔහුට උත්තරදුනිමි, ඔහු සලකන්නෙමි. මම වනාහි කොළ නොවේලෙන දේවදාර ගසක් මෙන්ය; නුඹේ ඵල ලැබී තිබෙන්නේ මාගෙන්ය. (හොෂෙයා 14:5-8)**

## මූල පද්ධතිය :

පැලෑටියක් සෘජුව පවත්වා ගැනීමටත් පෝෂ්‍ය පදාර්ථ සැපයීමටත් හොඳ මූල පද්ධතියක් පැවතිය යුතුය. ඔබගේ ජීවිතයෙහි මූල පද්ධතිය වර්ධනය කරගත හැකි ක්‍රමය ගීතාවලිය 1 වෙනි පරිච්ඡේදයෙහි සඳහන් වේ.

**දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ, පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ, නින්දාකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ, ස්වාමීන්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ, උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දාවල් මෙනෙහිකරන්නාවූ, මනුෂ්‍යයා ආශිර්වාදලද්දේය. ඔහු දිය ඇළවල් ළඟ හිඳුවූ, නියම කලට ඵල දෙන, නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේය; ඔහු කරන සියල්ල සඵලවෙයි. (ගීතාවලිය 1:1-3)**

## විවේකය :

අක්‍රියව (විවේකව) සිටීමේ කාලයක් පැලෑටි ජිවන චක්‍රයෙහි ස්වාභාවික පවතින විශේෂ වකවානුවකි. එම කාලය තුළ පැලෑටිය සමහර විට මියගොස් මෙන් වර්ධනයක් පෙනෙන්නට නොමැතිව තිබේ. එය පැලෑටිය විවේකය ගන්නා කාලවකවානුවයි. සාමාන්‍යයෙන් ඉතා සීඝ්‍ර වර්ධනයකට පෙර කාල සීමාව පැලෑටියකට අක්‍රිය කාලය ලෙස පවතී. ස්වාභාවික ලොවෙහි දෙවියන්වහන්සේ භූමියට විවේක දෙන වකවානුවක් පිළිබඳව පැවතේ. (ලෙවී කථාව 25:5)

ශුද්ධාත්ම බව්තීස්මයෙහි එක් පරමාර්ථයක් නම් ආත්මික විවේකය හා නැවුම් බව ගෙන දීමය. එම නැවුම් කිරීමේ ප්‍රතිඵලයක් විලසින් ශුද්ධාත්ම ඵල සීඝ්‍රයෙන් වර්ධනය වේ.

**එබැවින් උන්වහන්සේගේ විශ්‍රාමස්ථානයට ඇතුල්වීමේ පොරොන්දුවක් ඉතුරුව තිබෙද්දීත් නුඹලාගෙන් යමෙකුට ඊට පැමිණෙන්ට බැරිවූ බැව් පෙනේදෝ කියා භයවෙමු. එබැවින් දෙවියන්වහන්සේගේ සෙනඟට සබත් නිවාඩුවක් ඉතුරුව තිබේ. (හෙබ්‍රෙව් 4:1,9)**

**එසේය, උන්වහන්සේ වියවුල් තොල්වලින්ද වෙන භාෂාවකින්ද මේ සෙනඟට කථාකරනවා ඇත. උන්වහන්සේ ඔවුන්ට කථාකොට: නිවාඩුව මේය, වෙහෙසවූ අයට නිවාඩු දීපල්ලා; නිස්කලංකයත් මේයයි කීසේක. එහෙත් ඔව්හු අසන්ට අකමැතිවූහ. (යෙසායා 28:11-12)**

## පස :

ආත්මික ලොවෙහි හා ස්වාභාවික ලොවෙහි යන දෙකෙහිම ඵල නිපදවීමට පස හොඳින් සූදානම් කළ යුතුවේ. මතෙව් 13 හි වපුරන්නාගේ උපමාවෙහි බීජ වැඩීමෙහිදී බලපාන ලද සාධකය වූයේ පසෙහි තත්වය වේ. ඔබගේ හදවත ස්වාභාවික ලොවෙහි පස් වැනිය. ඔබගේ හදවත දැඩිව, ලෝකයෙහි කාරණා වලින් පිරී පවතී නම්, එමගින් දේව වචනයෙන් සිරකර දමන අතර, එවිට ඔබ ඵල නොදරනු ඇත.

එබැවින් දේව වචනයට නිසියාකාරව ප්‍රතිචාර දක්වන පිණිස ඔබගේ හදවත නමැති පස සූදානම් කිරීම ඔබගේ වගකීම වේ :

**ධර්මිෂ්ඨකම පිණිස වපුරාගන, කරුණාවේ හැටියට කපාගනිල්ලා; පුරන් බිම කොටාගනිල්ලා. ස්වාමින්වහන්සේ ඇවිත් නුඹලාට ධර්මිෂ්ඨකම වස්වන තුරු, දැන් උන්වහන්සේ සොයන්ට කාලයය. (හොෂෙයා 10:12)**

**මරණය :**

ඔබ බීජයක් පැල කරන සෑම අවස්ථාවකම එම බීජය මිය නොගියොත් අලුත් පැලයක් හට නොගනී.

> **සැබෑවක් සැබෑවක් නුඹලාට කියමි-ගෝධුම බීජය පොළොවෙහි වැටී නොමළොත් තනිව තිබෙයි; නුමුත් මොළොත් බොහෝ ඵල දෙයි. (යොහන් 12:24)**

> **අඥානය, නුඹම වපුරන දේ මළොත් මිස නැත්නම් පැළවෙන්නේ නැත. (1 කොරින්ති 15:36)**

ආත්මික ජීවිතය රදා පවතිනුයේ ලෞකික ආශාවලට මිය යාම හා ලෞකික සැපතට මිය යාමය. ලෝකයට මිය යාම තුළින් ඔබ තුළ ක්‍රිස්තුස්වහන්සේ මෙන් වූ ගුණාංග වර්ධනය වීම සිදුවේ.

## මිදිවැලට සම්බන්ධව සිටීම :

ස්වාභාවික ලොවෙහි අත්තක ඵල හටගැනීමට නම් අත්ත ප්‍රධාන පැලයට සම්බන්ධව පැවතිය යුතුය. ජීවය සපයන ප්‍රධාන කඳෙන් ඉවත් වූ අත්තකට ඵල දැරිය නොහැක. යේසුස්වහන්සේ අපේ ප්‍රධාන පැලය (මිදිවැල) වන අතර අපි එහි අතු වෙමු. අපි ආත්මික ඵල දරණ පිණිස එතුමා සමග සම්බන්ධතාවයක් දරා සිටිය යුතු වෙමු.

> **මම සැබෑවූ මිදිවැලය, මාගේ පියාණන්වහන්සේ ගොවියාය. මා තුළෙහි තිබී ඵල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරනසේක. ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස උන්වහන්සේ පවිත්‍රකරනසේක. මා විසින් නුඹලාට කී වචනය කරණකොටගෙන නුඹලා දැන් පවිත්‍රය. මා තුළ පැවතියල්ලා. මමත් නුඹලා තුළ පවතින්නෙමි. අත්ත මිදි වැලෙහි නොපවතී නම් තනියම ඵල දරන්ට බැරුවාක්මෙන්, නුඹලා මා තුළෙහි නොපවතිවූ නම් ඵල දරන්ට නුඹලාට බැරිය. මිදිවැල මමය, නුඹලා අතුය. යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිම්ද, ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි. මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය. (යොහන් 15:1-5)**

## කප්පාදුකිරීම :

ස්වාභාවික ලොවෙහි පැලෑටියක් ඵල දරමින්, සඵලවත් ලෙස දිගටම පැවතීමට නම්, කප්පාදු කිරීම අවශ්‍යවේ. ගොවියෙක් පැලයක් කප්පාදු කරන විට ඵල නොදරන අතු කපා දමන්නේ වඩා දියුණු අස්වැන්නක් නෙලා ගැනීම සඳහාය. පැලෑටියේ වර්ධනයට බාධා කරන සියලුම දෑ ඔහු ඉවත් කරයි.

ආත්මික ලොවෙහිද කප්පාදුව අවශ්‍ය වේ. ආත්මික කප්පාදුව නම් දෙවියන්වහන්සේ විසින් නිවැරදි කිරීමය. බයිබලය එය හික්මවීම සඳහා දඬුවම් පැමිණවීම ලෙස නම් කරයි. දෙවියන්වහන්සේ "කප්පාදු" කරන කල ඔබගේ ආත්මික වර්ධනයට බාධා විය හැකි සියල්ල එතුමා ඉවත් කරනසේක. ඔබ ආත්මිකව ඵල දැරීමට නම් එසේ කිරීම අවශ්‍ය වේ.

> **මා තුළෙහි තිබී ඵල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරනසේක. ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස උන්වහන්සේ පවිත්‍රකරනසේක. (යොහන් 15:2)**

සමහර අවස්ථාවලදී ඔබව "කප්පාදු කිරීමට" ඔබගේ ජීවිතයට දෙවියන්වහන්සේ කිසියම් අවස්ථාවන් ගෙන දෙමින් ඔබව හරිගස්සන කල, ඔබ එයට සාතන්ට වරද තබමින් සිටීම නිසා එම කප්පාදුවේ වාසි අත් කර නොගනී. දෙවියන්වහන්සේගේ හරිගැස්සවීම් වල පරමාර්ථය හොෂෙයා පොතෙහි සඳහන් කොට තිබේ.

> **වරෙල්ලා. අපි ස්වාමීන්වහන්සේ වෙතට හැරීයමු. මක්නිසාද ඉරාදැමුවේ උන්වහන්සේය, උන්වහන්සේ අප සුවකරනවා ඇත; පහරදෙන උන්වහන්සේ අපේ තුවාල බඳිනවා ඇත. (හොෂෙයා 6:1)**

කප්පාදු කිරීමේ හික්මවීම ඔබව නැවත දෙවියන්වහන්සේ වෙතට හැරී ඒමට යොමු කරවයි. ඔබ එතුමා වෙතට හැරී ඒමෙන් පමණක් ශුද්ධාත්ම ඵල ඔබ තුළ හට ගෙන ඵල දරනු ඇත.

**දේශගුණය :**

ඵල වර්ධනය කෙරෙහි දේශගුණයද වැදගත් වේ. ස්වාභාවික ලොවෙහි, පාලනය කරන ලද පරිසර සාධක සහිතව වවන්නාවූ ඵල වර්ග රාශියක් ඇත. "හරිතාගාර" හෝ "උණුසුම් කුටී" තුළ විශේෂිත උෂ්ණත්වයක එම පැලෑටි වවනු ලැබේ. එම පැලෑටි ස්වාභාවික ලොවෙහි සුපුරුදු පරිසරයෙන් වෙන්කොට වවනු ඇත. "උණුසුම් කුටීර" තුළ වවන ලද පැලෑටියක් ගෙන ස්වාභාවික දේශගුණයට නිරාවරණය කළහොත් එය ඉතා ඉක්මනින් මිය යනු ඇත. එයට හේතුව නම් මෙතෙක් කල් එම පැලෑටිය පාලනය කරන ලද පරිසරයක වැවීමට හුරුවී තිබීමය. එය ස්වාභාවික ලොවෙහි පරිසරයට ඔරොත්තු නොදේ.

ආත්මික වශයෙන් බලන කල, "උණුසුම් කුටීර" වල පාලනය කරන ලද තත්ව යටතේ මනාව වැඩෙන එහෙත් සැබෑ ලොවෙහිදී ඉක්මනින් වියැකී යන කිතුණුවන් අපට අවශ්‍ය නොවේ. පාලනය කරන ලද තත්වයන් වන ක්‍රිස්තියානි මිතුරන් සමග හෝ සභාව තුළ ගතකරන ආකාරයටම ලෝකයෙහිදී ද ආත්මික ඵල එක සේ ක්‍රියාත්මක විය හැකි කිතුනුවන් අවශ්‍ය වේ.

# ස්වයං-පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

2. යොහන් 15 පරිච්ඡේදයෙහි සඳහන් ඵල නිෂ්පාදන මට්ටම් හතර මොනවාද?

3. ස්වාභාවික ලෝකයෙහි ඵල හටගැනීම අවශ්‍ය කරන සාධක දොළොස නම් කරන්න. මේවා ආත්මික සත්‍යයක ස්වාභාවික සමාන්තරයෙන් බව මතක තබාගන්න. ආත්මික ඵල හටගැනීම සඳහාද මෙම සාධක අවශ්‍ය වේ.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා.

1. සාලමොන්ගේ ගීතිකාව 4:12-16 දක්වා කියවන්න. මෙම කොටස තුළින් අපට දෙවියන්වහන්සේගේ උයන පිළිබඳ දර්ශනයක් ලබා දේ. උන්වහන්සේ තම සෙනඟ, සභාව (ඇදහිලිවන්තයන්) තම උයන ලෙස හඳුන්වයි. ඔබගේ ජීවිතය ආත්මික ඵල දරන, ආත්මික "වල් පැළෑටි" වැඩෙන හෝ නිසරු හා හිස්ව ඇති ආත්මික "භූමියයි". ඔබේ ජීවිතය නමැති ආත්මික භූමියේ වැඩෙන්නේ මොනවාද? ඒවා :

   - ලෝකයේ දේවල් පිළිබඳ කනගාටු වීමේ, උනන්දු වීමේ, කනස්සලු වීමේ හා ආශා කිරීමේ වල් පැළෑටි හා කටු පඳුරුද?
   - වස්තුව පිළිබඳ වූ ප්‍රයෝගකාරකමේ වල් පැලෑටි හා කටු පඳුරුද?
   - ලෞකික දේවල් පිළිබඳ වූ ආශාවේ වල් පැළෑටි හා කටු පඳුරුද?

   ඔබේ ජීවිතයෙන් වැඩි ඉඩකඩක් ලබා ගන්නේ මොනවාද? ඔබේ කාලය හා අවධානය වැඩි වශයෙන් යොමුවන්නේ මොනවාටද? ඔබ ප්‍රමුඛත්වය ලබා දෙන දේවල් තුළ වඩා වැදගත් වන්නේ මොනවාද? ඔබගේ "හදවත නැමති උයන" ගල් සහිත පසින් යුක්ත වේද? ඔබට දැඩි හදවතක් තිබේද? ක්‍රිස්තුස්වහන්සේගේ ආඥාවන්ට යටත්වීම හිතුවක්කාරී ලෙස ප්‍රතික්ෂේප කරන ඔබගේ හදවතේ ක්ෂේත්‍ර නිසරු, ගල් සහිත ආත්මික පසයි.

2. මෙම පාඩම "ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය" පිළිබඳ ඔබගේ අධ්‍යයනය සම්පූර්ණ කරයි. වැඩිදුර අධ්‍යයනය සඳහා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "ආත්මික උපක්‍රම : ආත්මික සටන පිළිබඳ අත්පොතක්" ලෙස නම් කර ඇති පාඨමාලාවට සහභාගී වන ලෙස අපි යෝජනා කරමු. එමඟින් ආත්මික සටන තුළ ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සළකා බලන අතර ත්‍රිත්වයේ සෙසු සාමාජිකයන් වන පියවූ දෙවියන්වහන්සේගේ හා පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙයන් පැහැදිලි කරයි.

3. පහතින් දක්වා ඇති "ආත්මික ඵල විශ්ලේෂණය" සම්පූර්ණ කරන්න. ඔබේ ජීවිතය තුළ ආත්මික ඵල වර්ධනය වීමේ වත්මන් අවධිය හඳුනාගැනීමට ඔබේ අවංක පිළිතුරු ඔබට උපකාරී වනු ඇත.

## ආත්මික ඵල විශ්ලේෂණය.

පහත සඳහන් ප්‍රකාශ කියවා වර්තමානයේදී ඔබව හොඳින්ම විස්තර කරන ප්‍රතිචාරයේ අංකය තේරීම මඟින් ප්‍රතිචාර දක්වන්න. 3,2,1, හෝ 0 ලිවීම මඟින් සෑම ප්‍රශ්නයකටම ප්‍රතිචාර දක්වන්න.

3 යනු "මෙය මගේ ජීවිතයේ අනිවාර්යයෙන්ම සත්‍යයකි"
2 යනු "මෙය මගේ ජීවිතයේ සාමාන්‍යයෙන් සත්‍යයකි"
1 යනු "මෙය යම් අවස්ථා වලදී සත්‍යයකි"
0 යනු "මෙය මගේ ජීවිතයේ කිසිදාක සත්‍ය නොවේ"

**උදාහරණය** : - 2 - 1. අනාගතය පිළිබඳව දෙවියන්වහන්සේගේ පාලනය ගැන ස්ථිරත්වය තුළ මා ආරක්ෂා වී සිටී.

(මෙම විශ්ලේෂණය සිදුකරන පුද්ගලයා, මෙම ප්‍රකාශය ඔහුගේ ජීවිතය තුළ සාමාන්‍යයෙන් සත්‍යයක් වන බැවින් හිස්තැන් තුළ අංක "2" ලිවේය.)

_______ 1. අනාගතය පිළිබඳව දෙවියන්වහන්සේගේ පාලනය ගැන ස්ථිරත්වය තුළ මා ආරක්ෂා වී සිටී.

_______ 2. යේසුස්වහන්සේ ස්වකැමැත්තෙන්ම දෙවියන්වහන්සේගේ කැමැත්ත කළ බව මම තේරුම් ගෙන සිටිමි.

_______ 3. මගේ ඇදහිල්ලට බලය ඇත්තේ දෙවියන්වහන්සේ විශ්වාසවන්ත වන්නේ නම් පමණක්ය යන්න සමඟ මම එකඟ වෙමි.

_______ 4. දෙවියන්වහන්සේගේ පොරොන්දු ඉටුවන තුරු මම බලා සිටිමි.

_______ 5. මම ඇතැම් විට දෙවියන්වහන්සේ මා ගැන කෝපයෙන් සිටියයි සිතමි.

_______ 6. යේසුස්වහන්සේව එවා මා ලැබිය යුතු දඬුවමින් මා නිදහස් කිරීම තුළින් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය එළිදරව් වූ බව මම දනිමි.

_______ 7. දෙවියන්වහන්සේ තම පුත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේව දෙන තරම් ලෝකයට ප්‍රේම කිරීම පිළිබඳව මම කෘතඥ වෙමි.

_______ 8. දෙවියන්වහන්සේගේ අභිමුඛය මාගේ ප්‍රීතිය වන බව මම දනිමි.

_______ 9. දෙවියන්වහන්සේ තහනම් කර ඇති දේවල් වලට මා “නැත” කියන අතර උන්වහන්සේගේ ආඥාවන්ට “ඔව්” යැයි කියමි.

_______ 10. යේසුස්වහන්සේගේ සමාදානයේ පොරොන්දුව මම පිලිගනිමි.

_______ 11. මගේ ජීවිතයේ ආධිපත්‍යයන්ට මම ස්වකැමැත්තෙන්ම යටත් වෙමි.

_______ 12. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත් ,අදත්, සැමදාමත් එකම ආකාර බව මම විශ්වාස කරමි.

_______ 13. දෙවියන්වහන්සේ තවමත් ඔවුන්ගේ ජීවිත තුළ ක්‍රියා කරන බව දැන සිටීමෙන් මම අන් අයගේ අඩුපාඩුකම් ඉවසා සිටිමි.

_______ 14. මම දැඩි මෙන්ම යහපත් වූ දෙවියන්වහන්සේගේ කරුණාකොටගෙන ඒත්තු ගැන්විමකට යටත්ව සිටිමි.

_______ 15. ක්‍රිස්තුස්වහන්සේ මට සමාව දුන් ලෙස මම අන් අයට සමාව දෙමි.

_______ 16. මම අන් අයට ප්‍රේම නොකරන විට පවා දෙවියන්වහන්සේ මට ප්‍රේම කරන බව මම දනිමි.

_______ 17. යේසුස්වහන්සේ ස්වාමීන් ලෙස පිළිගැනීම තුළින් මට ගැළවීමේ ආරක්ෂාව තිබේ.

_______ 18. දෙවියන්වහන්සේගෙන් වන විශාල දේවල් අත්දැකීම උදෙසා කුඩා දේවල් වලට “නැත” යැයි කීමට මම ඉගෙන ගනිමි.

_______ 19. පාපයට කමාව ලැබීම පිළිබඳ ආරක්ෂාවක් මට පවතී.

_______ 20. දේව වචනයට හා ශුද්ධාත්මයාණන්ට මම කැමැත්තෙන්ම යටත් වෙමි.

_______ 21. මම පොරොන්දු ඉටු කිරීම පිළිබඳව විශ්වාසවන්තව සිටිමි.

_______ 22. අපේක්ෂා භංගත්වය, පීඩාව, අසීරු ඉල්ලීම් හා පීඩනයන්ට මුහුණ දීමේදී මට දැඩි වීර්ය තිබේ.

_______ 23. මගේ දෛනික ක්‍රියාකාරකම් මම බයිබලීය ජීවන රටාවකට අනුව කරගෙන යමි.

_______ 24. මම අන් අයව සැනසීම, ධෛර්යමත්කිරීම හා උපදෙස් දීම සිදු කරමි.

_______ 25. මම කොන්දේසි විරහිතව ඥාතීන්ගේ හා මිතුරන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරමි.

_______ 26. මම දෙවියන්වහන්සේට අවශ්‍ය පරිදි වර්ධනය වෙමින් පරිණත වෙමි.

_______ 27. මට නිරන්තර නිහඬ කාලයක් අන්තර්ගත ජීවිතයක් ගත කරයි.

_______ 28. දෙවියන්වහන්සේ ඉදිරියේ නිවැරදි වීම පිළිබඳව මට අභ්‍යන්තර නිසැකකමක් හා විශ්වාසයක් තිබේ.

_______ 29. මම සහයෝගිතාව, ඉගැන්වීමේ හැකියාව හා යටහත් බව පෙන්නුම් කරමි.

_______ 30. මම වගකීමක් ගත් කළ වෙන පුද්ගලයෙකුට මා මත රඳා පැවතිය හැක.

_______ 31. දෙවියන්වහන්සේට මා ගොඩනැඟිය යුතු තත්වයකට පත්වීම උදෙසා උන්වහන්සේ මට උපකාර කරන තුරු මම බලා සිටිමි.

_______ 32. සත්‍ය පැවසීම, අවංක වීම හා පොරොන්දු ඉටු කිරීම පිළිබඳව මම විශ්වාසවන්තව සිටිමි.

_______ 33. මම අන් අයව ගොඩනැඟිමට උපකාර වන ධනාත්මක වචන කතා කරමි.

_______ 34. මට මහත් සේ හිරිහැර කරන මිනිසුන්ගේ යහපත් ගුණාංග මම තරයේ කියා සිටිමි.

_______ 35. දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම තුළින් මම ස්ථිර තෘප්තියක් ලබමි.

_______ 36. මගේ ජිවිතයේ ගැටලු සහිත කාරණා පාලනය කිරීම පිළිබඳව මට ගණන් දීම උදෙසා මම පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් සමඟ සබඳතා පවත්වමි.

_______ 37. මගේ අභ්‍යන්තර ජිවිතය පාලනය කිරීමට ශුද්ධාත්මයාණන්ට ඉඩහැරීම පිළිබඳව මා තුළ සමාදානය පවතී.

_______ 38. මම වර්ධනය විය යුතු ස්ථාන පිළිබඳව අන්‍යයන්ගෙන් ලැබෙන යෝජනා වලට මම විවෘත වෙමි.

_______ 39. මම තේරුම් ගෙන ඇති මගේ හැකියාවන් මම නිසි ලෙස යොදා ගනිමි.

_______ 40. අනාගත ආත්මික වර්ධනයක් ලබාගැනීමේ අරමුණු උදෙසා ක්ෂණික සතුටක් ලබාදෙන ක්‍රියාකාරකම් මා විසින් කල්දමා තිබේ.

_______ 41. වෙනත් කිතුනුවන්ගේ හැසිරීම් දෙවියන්වහන්සේගේ ප්‍රමිතීන් අනුව නිවැරදි නොවන විට මම ප්‍රවේසම් සහගත ලෙස ඔවුන්ට පවසා ඇත.

_______ 42. මම සැබවින්ම තවත් පුද්ගලයෙකුව තේරුම් ගැනීමේ අරමුණින් සවන් දෙමි.

_______ 43. මට සේවය කිරීමට නොහැකි හෝ මට සේවය නොකරන පුද්ගලයන්ට මම සේවය කරමි.

_______ 44. ආත්මික ජයග්‍රහණයකදී මට විශිෂ්ට ප්‍රීතියක් ඇති වේ.

_______ 45. මගේ ජිවිතයේ මුදල්, ලිංගිකත්වය, ප්‍රමාණයට වඩා ආහාර ගැනීම, හෝ ඕපාදූප කීම වැනි ගැටලු පාලනය කිරීමේදී මම මගේ දැනුම අනුව අවබෝධයෙන් කටයුතු කරමි.

_______ 46. අන් අයගේ වෙනස් කම් නිසා ඇතිවන පරස්පර විරෝධී තත්වයන්ට මුහුණ දෙන විට මගේ අභ්‍යන්තරයේ සන්සුන්භාවයක් ඇත.

_______ 47. මගේ කතාබහේදී මම විනීත වෙමි.

_______ 48. මගේ කාලය, මුදල් හා මගේ හිමිකාරීත්වය දෙවියන්වහන්සේ සතු බැවින් මම ඒවා කළමනාකරණය කරමි.

_______ 49. මම දුක්විඳින විට පවා දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුවෙමි.

_______ 50. “මිනිසුන් මාගේ යහපත් ක්‍රියා දකින පිණිස මාගේ ආලෝකය අන් අය ඉදිරියේ බැබලීමට” සලස්වමි.

_______ 51. මම අනුකම්පා සහගත ලෙස අවශ්‍යතාවයන් දකින අතර ප්‍රයෝජනවත් ලෙස ඊට ප්‍රතිචාර දක්වමි.

_______ 52. ගැඹුරු ලෙස මට රිදවූ අයට මම සමාව දී තිබේ.

_______ 53. දෙවියන්වහන්සේ අනෙකුත් ඇදහිලිවන්තයන්ගේ ජීවිතවල කරන දේවල් මට ප්‍රීතිය ගෙන දේ.

_______ 54. මෙම ලෝකයේ පීඩාවන් මධ්‍යයේ මට නොකැළඹුනු හදවතක් ඇත.

_______ 55. අන් අය මට වරදක් කළ විට මමත් ඒ හා සමාන වීම අතහැර තිබේ.

_______ 56. විපත්ති කාලයන්හිදී පවා මට බලාපොරොත්තුවෙන් බලා සිටිය හැකිය.

_______ 57. වෙනස් තත්වයන් තුළ හෝ වෙනත් මාර්ග වල වර්ධනය වන පුද්ගලයන් මම පිළිගනිමි.

_______ 58. මම අයුක්ති සහගත ක්‍රියාවන්ට එරෙහිව පෙත්සම් අත්සන් කරමි.

_______ 59. අන් අය විසින් “බරපතල”පාපයක් කරන බවට සලකනු ලැබූ පුද්ගලයන් මම පිළිගනිමි.

_______ 60. මම මගේ සතුරන් හා ප්‍රේමනීය නොවන අය උදෙසා යාච්ඤා කරමි.

_______ 61. සේවය උදෙසා මාගේ කැපකිරීම් සම්පූර්ණ කිරීම තුළින් මම ප්‍රීති වෙමි.

_______ 62. මම පහසුවෙන් පරීක්ෂාවට හසුවන හෝ ඇබ්බැහි වන අවස්ථාවන් මම මඟහරිමි.

## විශ්ලේෂණයේ ලකුණු ගණනය කිරීම.

1. ඔබේ පිළිතුරු "විශ්ලේෂණයේ" සිට මීළඟ පිටුවේ ඇති හිස්තැන් වෙත මාරු කරන්න. උදාහරණයක් ලෙස, ප්‍රශ්න අංක 1 සඳහා ඔබේ පිළිතුර "3" නම්, කොටු අංක 1 හි "3" ලියන්න.

2. ඔබ සියලුම කොටු පිරවූ පසු, තීරු අනුව හරහට එකතු කිරීමෙන් එකතුව ගණන් බලන්න.

| ⇨ | ⇨ | ⇨ | ⇨ | ⇨ | ⇨ | ⇨ | තීරුවේ එකතුව | ඵලය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 10 | 19 | 28 | 37 | 46 | 55 | | සමාදානය |
| 2 | 11 | 20 | 29 | 38 | 47 | 56 | | කරුණාවන්තකම |
| 3 | 12 | 21 | 30 | 39 | 48 | 57 | | ඇදහිල්ල |
| 4 | 13 | 22 | 31 | 0 | 49 | 58 | | ඉවසිලිවන්තකම |
| 5 | 14 | 24 | 33 | 2 | 51 | 60 | | යහපත්කම |
| 6 | 15 | 24 | 33 | 42 | 51 | 60 | | මාදුකම |
| 7 | 16 | 25 | 34 | 43 | 52 | 61 | | ප්‍රේමය |
| 8 | 17 | 26 | 35 | 44 | 53 | 62 | | ප්‍රීතිය |
| 9 | 18 | 27 | 36 | 5 | 54 | 63 | | පමණ දැන ක්‍රියා කිරීම. |
| | | | | | | | | |

## අදාළ කරගැනීම

ආත්මික ඵල විශ්ලේෂණය උදෙසා ඔබ ලැබූ ප්‍රතිඵල මත පදනම්ව, පහත ප්‍රකාශයන් සම්පූර්ණ කරන්න.

1. ඔබ අඩුවෙන් ලබා ඇති ලකුණු දෙස බලා, පහත ප්‍රකාශය සම්පූර්ණ කරන්න.

   විශ්ලේෂණයෙන් දැක්වෙන පරිදි මා තවදුරටත් වර්ධනය කරගත යුතු ආත්මික ඵලය වන්නේ :

   ________________________________________

2. ඉදිරි මාසය තුළදී මාගේ යාච්ඤාවන් හා අවධානය කේන්ද්‍රගත කිරීමට මම එක් ඵලයක් තෝරා ගනිමි. එම ඵලය වන්නේ,

   __________________________

3. යාච්ඤාවන්ට අමතරව, මෙම ඵලයේ වර්ධනයට උපකාරී වීම උදෙසා මම පහත සඳහන් ක්‍රියාමාර්ග ගනිමි : එකක් පරීක්ෂා කර ඉන් අනතුරුව ප්‍රකාශය සම්පූර්ණ කරන්න:

________ මම අලුත් යමක් කිරීමට පටන් ගනිමි.

ඔබ කිරීමට පටන් ගන්නේ කුමක්ද? ________________________________

________ මම දැන් කරමින් සිටින යමක් කිරීම නවත්වමි.

ඔබ නතර කරන්නේ කුමක්ද? __________________________________

________ මම මගේ ජීවිතයේ යමක් වෙනස් කරමි.

ඔබ නිශ්චිතවම වෙනස් කරන්නේ කුමක්ද? ____________________________

# උපග්‍රන්ථය

උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. එසේ දුන්නේ ඇදහිමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක්, ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණවීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය. තවද අපි තවත් මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද ප්‍රයෝගයෙන්ද රැවටිලි සහිත උපාමාරුවෙන්ද හටගන්න සියලු ආකාර ඉගැන්වීම් නමැති සුළඟින් ඈත මෑත විසිවෙමින් ගෙනයනු ලබන්නාවූ බාලයන් නොවන පිණිසත්, ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය. උන්වහන්සේගෙන් මුළු ශරීරය එකට සන්ධිකරනු ලැබ සවිවී, එක එක කොට්ඨාසයේ ප්‍රමාණයේ ක්‍රියාකිරීමේ හැටියට සහකාරවූ එක එක සන්ධිය කරණකොටගෙන ප්‍රේමයෙන් වර්ධනය වන ලෙස ශරීරය වැඩෙන්නේය. එබැවින් අන්‍යජාතීන් තමුන්ගේ සිත්වල නිෂ්ඵලකමින් හැසිරෙන්නාක්මෙන්, නුඹලා තවත් නොහැසිරියල්ලායයි ස්වාමීන්වහන්සේ තුළ සාක්ෂිදෙමින් කියමි. (එපීස 4:11-17)

කොඳුරන්නේ නැතුව එකිනෙකාට ආගන්තුක සත්කාරකරපල්ලා. දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට ලැබුණු දීමනාවේ හැටියට එයින් එකිනෙකාට සේවයකරපල්ලා. යමෙක් කථාකෙරේ නම්, දෙවියන්වහන්සේගේ වාක්‍ය වශයෙන් කථාකාරාවා; යමෙක් සේවය කෙරේ නම්, දෙවියන්වහන්සේ සපයාදෙන ශක්තියේ ප්‍රකාර සේවය කරාවා. දෙවියන්වහන්සේට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන සියලු කාරණාවලදී ගෞරව පැමිණෙන පිණිස එසේකරන්ට ඕනෑය. මහිමයත් පරාක්‍රමයත් සදාකාලේටම උන්වහන්සේගේය. ආමේන්. (1 පේත්‍රුස් 4:9-11)

මක්නිසාද යම්සේ අයට එකම ශරීරයෙහි බොහෝ අවයව තිබෙන නුමුත් ඒ සියලු අවයවයන්ට එකම ක්‍රියාවක් නැතුවාක්මෙන්, බොහෝ දෙනෙක්වූ අපිත් ක්‍රිස්තුස්වහන්සේ තුළ එසේම එක ශරීරයක්ව, වෙන් වෙන් වශයෙන් ඔවුනොවුන්ගේ අවයවයෝ වෙමුව. එහෙයින් අපට දෙන ලද අනුග්‍රහයෙ ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගත කීම නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු. සේවය නම් අපගේ සේවයෙහි යෙදී සිටිමු. උගන්වන්නා තමාගේ ඉගැන්වීමටත්, උපදේශ දෙන්නා තමාගේ උපදේශ දීමටත් භාරවේවා. දෙන තැනැත්තේ ත්‍යාගවන්තකමෙන්ද ආණ්ඩුකරන තැනැත්තේ උනන්දුකමෙන්ද කරුණාව පෙන්වන තැනැත්තේ ප්‍රසන්න ලීලාවෙන්ද එසේ කෙරේවා. (රෝම 12:4-8)

සහෝදරයෙනි, ආත්මික දීමනා ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි. ඉතින් නානාප්‍රකාර දීමනා ඇත්තේය, නුමුත් එක ආත්මයාණන්වහන්සේය. නානාප්‍රකාර සේවය කිරීම් ඇත්තේය, නුමුත් එක ස්වාමීන්වහන්සේය. නානාප්‍රකාර ක්‍රියාකිරීම් ඇත්තේය, නුමුත් සියල්ලන් තුළෙහි සියල්ල කරවන්නේ එක දෙවියන්වහන්සේය. නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. කෙසේදයත්: ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට ප්‍රඥාවේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන තවත් කෙනෙකුට දැනගැනීමේ වචනයද කෙසේදයත්: ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට ප්‍රඥාවේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන තවත් කෙනෙකුට දැනගැනීමේ වචනයද කෙනෙකුට සුව කිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආශ්චර්ය කිරීමද, තවත් කෙනෙකුට ධර්මවාක්‍ය කීමද, වෙන කෙනෙකුට ආත්මවල් විමසීමද, තවත් කෙනෙකුට නානා වර්ග භාෂාද, තවත් කෙනෙකුට භාෂා තේරුම්කර දීමද දෙනලද්දේය. නුමුත් එකම වූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදා දෙමින්, මේ සියල්ල කරවන සේක. මක්නිසාද ශරීරය එකක්ව බොහෝ අවයව ඇතුවාක් මෙන්ද, ශරීරයේ අවයව සියල්ල බොහෝ වුවත් එක ශරීරයක්ව තිබෙන්නාක්මෙන්ද, ක්‍රිස්තුස්වහන්සේත් එසේව සිටිනසේක. මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්චර්ය කරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුද නානා වර්ග භාෂාද සභාවෙහි පිහිටෙවුසේක.
(1 කොරින්ති 12:1,4,5,6,7,8,9,10,11,12,28)

# ස්වයං - පරීක්ෂණය සඳහා පිළිතුරු

## පළමු පරිච්ඡේදය :

1. යේසුස්වහන්සේ බව්තීස්ම ලැබ එකෙණෙහිම දියෙන් ගොඩනැගුණුසේක. බලව, අහස උන්වහන්සේට විවර විය, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරවියෙකු මෙන් බසිනවාද තමන් පිටට පැමිණෙනවාද උන්වහන්සේ දුටු සේකː තවදː මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක් විය. (මතෙව් 3:16-17)

2. පියාණන්වහන්සේ, පුත්‍රයාණන්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේ,

3. ශුද්ධාත්මයාණන්වහන්සේට :
   - මනසක් තිබේ.
   - මිනිස් මනස පරීක්ෂා කරයි.
   - කැමැත්තක් තිබේ.
   - කතාකරයි.
   - ප්‍රේම කරයි.
   - මැදිහත්කාරකම් කරයි.

4. මෙහි අදහස උන්වහන්සේට මිනිසුන්ගේ ක්‍රියාවන් මඟින් බලපෑමක් ඇතිකළ හැකි හැඟීම් පවතින බවයි.

5 .- ශුද්ධාත්මයාණන්ට බොරු නොකියන්න.
   - ශුද්ධාත්මයාණන්ව නොවලක්වන්න.
   - ශුද්ධාත්මයාණන්ව නිවා නොදමන්න.
   - ශුද්ධාත්මයාණන්ට දුක් නොදෙන්න.
   - ශුද්ධාත්මයාණන්ට නිගරු නොකරන්න.
   - ශුද්ධාත්මයාණන්ට දේව අපහාස නොකරනන.
   - ශුද්ධාත්මයාණන්ට අමනාප නොකරන්න කරයි.

6. 5,3,2,1,4

## දෙවන පරිච්ඡේදය :

1. නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද? (1 කොරින්ති 3:16)

2. සංඥාවක් මඟින් යමක් නිරූපනය කරයි. එය විශේෂ තේරුමක් ඇති සංකේතයකි.

3. 5,4,3,1,2.

4 - ස්වාමින්වහන්සේගේ අභිමුඛය.
   - අනුමැතිය.
   - ආරක්ෂාව/මඟපෙන්වීම.
   - පවිත්‍රකිරීම.
   - ශුද්ධාත්මයාණන්ගේ දීමනාව.
   - විනිශ්චය.

5. - දෙවියන්වහන්සේගේ ආත්මය.
   - ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මය.
   - සදාකාලික ආත්මය.
   - සත්‍යයේ ආත්මය.
   - අනුග්‍රහයේ ආත්මය.
   - ජීවනයේ ආත්මය.
   - මහිමයේ ආත්මය.

- ප්‍රඥාවේ හා එළිදරව්කිරීමේ ආත්මය.
- සැනසිලිදායකයාණෝ
- පොරොන්දුවේ ආත්මය.
- ශුද්ධකමේ ආත්මය.
- ඇදහිල්ලේ ආත්මය.
- පුතුකම ලබාදීමේ ආත්මය.

## තුන්වන පරිච්ඡේදය :

1. නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහිකරවනසේක. (යොහාන් 14:26)

2 - උන්වහන්සේ ඉශ්‍රායෙල් නායකයන් පිට වැඩිය සේක.
- උන්වහන්සේ ඔවුන් නමස්කාර කළ ස්ථාන වලට වැඩිය සේක.
- උන්වහන්සේ ඔවුන්ට පොරොන්දු දේශයට මඟපෙන්වූ සේක.
- උන්වහන්සේ පීඩා කාලයේදී ඉශ්‍රායෙල් මතට වඩිනු ඇත.
- උන්වහන්සේ දහස් අවුරුදු රජකම් කාලයේ ඉශ්‍රායෙල් මතට වඩිනු ඇත.

3. සත්‍ය.

4. 2,1,3.

5. යොහන් 16:7-11

6. ශුද්ධාත්මයාණන් යනු සාතන්ගේ බලය සීමා කරන මැඩපැවැත්වීමේ ආත්මික බලයයි.

7. යේසුස්වහන්සේ :
- ආත්මයාණන් මඟින් ගැබ්ගනු ලැබීය.
- ආත්මයාණන් මඟින් ආලේපකරනු ලැබීය.
- ආත්මයාණන් මඟින් මුද්‍රාකරනු ලැබීය.
- ආත්මයාණන් මඟින් මඟපෙන්වනු ලැබීය.
- ආත්මයාණන් මඟින් බලගන්වනු ලැබීය.
- ආත්මයාණන් මඟින් පූර්න කරනු ලැබීය.
- ආත්මයාණන් කැලඹුනු ලැබීය.
- ආත්මයාණන් ප්‍රීතිවනු ලැබීය.
- ආත්මයාණන් තුළින් පූජාකරනු ලැබීය.
- ආත්මයාණන් තුළින් මරණීන් නැඟිටුවනු ලැබීය.
- ආත්මයාණන් තුළින් තම ගෝලයන්ට අණ දුන් සේක.

8. ශුද්ධාත්මයාණන් :
- එය නිර්මාණය කළ සේක.
- එහි නමස්කාරයට පොලඹවන සේක.
- එහි ධර්ම දූත මෙහෙයට මඟපෙන් වූ සේක.
- එහි සේවකයන් තෝරාගත් සේක.
- එහි දේශකයන් ආලේප කළ සේක.
- එහි තීරණ වලට මඟපෙන්වූ සේක.
- එය බලයෙන් බව්තිස්ම කළ සේක.

9. ශුද්ධාත්මයාණන් :
- වරද ඒත්තු ගන්වා දෙන සේක.
- පවිත්‍ර කරන සේක.
- සමඟ වැඩ වසන සේක.
- එකමුතු කරන සේක.
- මඟපෙන්වන සේක.
- ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට සමාන කරනසේක.
- බව්තිස්ම කරන සේක.
- ශක්තිමත් කරන සේක.
- ප්‍රේමය විදහා දක්වන සේක.
- සත්‍ය එළිදරව් කරන සේක.
- උගන්වන සේක.

- ගැළවීම පිළිබඳ නිසැකකම ලබා දෙන සේක.
- සාක්ෂි දැරීම උදෙසා බලගන්වන සේක.
- දෙවියන්වහන්සේගේ බලය විදහාපාන සේක.
- අලුත් කරනු ලබයි.
- නිදහස ලබා දේ.
- කතා කරන සේක.
- සනසන සේක.
- ප්‍රාණවත්කරන සේක.
- මැදිහත්කාරකම් කරයි.

10. ඔවුන් ශුභාරංචියේ බලවත් සාක්ෂිකාරයන් වූහ. ක්‍රියා 1:8.

## හතරවන පරිච්ඡේදය :

1. නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදඩයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)

2 - පසුතැවිලි වී බව්තීස්මය ලබන්න.
- එය ඔබ උදෙසා බව විශ්වාස කරන්න.
- එයට ආශා වන්න.
- එය ත්‍යාගයක් ලෙස පිළිගන්න.
- දෙවියන්වහන්සේට යටත් වන්න.
- අන් ඇදහිලිවන්තයන්ගේ යාච්ඤාවන් ඉල්ලා සිටින්න.

3. කථිකයා නොදන්නා භාෂාවකින් කතා කිරීමය.

4. කිතුනුවෙකු ශුභාරංචියේ බලවත් සාක්ෂිකාරයෙකු බවට පත් කිරීමටය. ක්‍රියා 1:8.

5. - සෑම කිතුණුවෙකුම, ඔහු දෙවියන්වහන්සේ වෙතට හැරෙන විට ශුද්ධාත්මයාණන් ලබා ගනී.
- සියලු දෙනා අන්‍යභාෂා කතා නොකරන බව බයිබලය පවසයි.
- බිය.
- එය හැඟීම් සහිත අත්දැකීමකි.

6. නැත.

7. යමක ඇලී ගැලී සිටීම හෝ එහි ගැඹුරුට යාම.

8. - ක්‍රියා 2:2-4.
- ක්‍රියා 10:44-46
- ක්‍රියා 19:6.

## පස්වන පරිච්ඡේදය :

1. සහෝදරයෙනි ආත්මික දීමනා ගැව නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි. (1 කොරින්ති 12:1)

2. තලෙන්තයක් යනු උපතින්ම හිමිවන හෝ පුහුණුව තුළින් වර්ධනය කර ගන්නා ස්වාභාවික හැකියාවකි. ආත්මික දීමනාවක් යනු උපතින්ම හෝ පුහුණුව තුළින් නොලැබෙන අධිස්වාභාවික හැකියාවකි. එය නිශ්චිත ආත්මික අරමුණු උදෙසා ශුද්ධාත්මයාණන් විසින් දෙනු ලබන අධි-ස්වාභාවික හැකියාවකි.

3. - ශුද්ධවන්තයන්ව සම්පූර්ණ කරයි.
- සේවයේ ක්‍රියාවන්ට අනුබල දෙයි.
- ක්‍රිස්තුස්වහන්සේ හා සභාව ගුණයෙන් වර්ධනය කරයි.

4. අපි :
- ඇදහිල්ලෙන් එක්සත් කරනු ඇත.
- ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අපේ දැනුම වර්ධනය කරනු ඇත.
- අපගේ ආදර්ශ ලෙස ක්‍රිස්තුස්වහන්සේ සමඟ සම්පූර්ණත්වය තුළ වර්ධනය වනු ඇත.
- වැරදි ඉගැන්වීම් වලින් රැවටිය නොහැකි වන පරිදි ස්ථිර වනු ඇත.

- ක්‍රිස්තුස්වහන්සේ තුළ ආත්මිකව පරිණත වනු ඇත.

5. ඔව්. 1 පේත්‍රැස් 4:10 හා 1 කොරින්ති 12:7 හා 11.

6. - ඔබට දී ඇති දීමනා පාවිච්චි නොකිරීම.
   - ඔබට ලබා දී නැති දීමනා පාවිච්චි කිරීමට උත්සහ කිරීම.
   - දීමනා නිසි ලෙස පාවිච්චි නොකිරීම.
   - ඔබේ දීමනාව මහිමයට පත් කිරීම.

7. ශුද්ධාත්මයාණන්වහන්සේ.

8. ප්‍රේමය. 1 කොරින්ති 13.

9. ව්‍යාජ දීමනා එපිස 4:12-15 හි සඳහන් ආත්මික දීමනාවන්ගේ අරමුණු සම්පූර්ණ නොකරයි. බයිබලය යේසුස්වහන්සේ පිළිබඳව පවසන දේවල් සමඟ ඒවා එකඟ නොවේ. ව්‍යාජ පුද්ගලයන් 2 පේත්‍රැස් 2 හා යුද් පොතෙහි සඳහන් ආකාරයේ චරිත ලක්ෂණ පෙන්නුම් කරනු ඇත.

10. ආත්මික දීමනා යනු බලවත් ලෙස සේවය කිරීමේ හැකියාව ලැබෙන පරිදි ශුද්ධාත්මයාණන් විසින් ලබා දෙනු ලබන අධි ස්වාභාවික හැකියාවන්ය.

11. ආත්මික දීමනා ලබා දීමේ අරමුණු තවමත් සම්පූර්ණ වී නොමැති බැවින් සියලුම ආත්මික දීමනා අද දවසටත් අදාළ වේ. "සම්පූර්ණ වූ දෙය" පැමිණෙන තුරු ආත්මික දීමනාවන් ක්‍රියාත්මක වනු ඇත. මෙහි අදහස පෘථිවිය මත ක්‍රිස්තුස්වහන්සේගේ රාජ්‍ය පිහිටුවීමයි.

12. ශුද්ධාත්මයාණන්ගේ දීමනාව පෙන්තකොස්ත දවසේදී ලබා දෙන ලදී. ශුද්ධාත්ම දීමනා යනු ඇදහිලිවන්තයන් උදෙසා වන අධිස්වාභාවික ආත්මික හැකියාවන්ය.

13. a . ස
    b . අ
    c . අ
    d . අ
    e . අ
    f . ස
    g . ස
    h . ස
    i . ස

## හයවන පරිච්ඡේදය :

1. උන්වහන්සේ සමහන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන්සේක. (එපිස 4:11)

2. - ප්‍රේරිතයන්
   - අනාගතවක්තෘවරු.
   - ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්.
   - සභාපාලකයන්.
   - ගුරුවරු

3. සෑම එකක්ම සභාවේ විශේෂ නායකත්ව තත්වයක් වන බැවිනි.

4. a සත්‍ය b. සත්‍ය. c. සත්‍ය

5. 2,1,4,3,5.

6. - විශේෂ දිමනා
   - කතා කිරීමේ දිමනා.
   - සේවය කිරීමේ දිමනා
   - ලකුණු සහිත දිමනා

## හත්වන පරිච්ඡේදය :

1. නමුත් දෙවියන්වහන්සේ තමන්ගේ කැමැත්ත ලෙස ඒ සියලු අවයවයන් වෙන වෙනම ශරීරයේ තැබූ සේක. (1 කොරින්ති 12:18)

2. - අනාගතවාක්‍ය පැවසීම
   - ඉගැන්වීම
   - උපදේශනය
   - ප්‍රඥාවේ වචනය
   - දැනගැන්මේ වචනය

3. 2,1,4,3,5

4. C

5. අසත්‍ය.

## අටවන පරිච්ඡේදය :

1. නුඹලා අතරේ ප්‍රධානියා වෙන්ට කැමති කවරෙක් නුමුත් සියල්ලන්ගේ දාසයා වන්නේය. (මාර්ක් 10:44)

2. - ආත්මවල් විමසීම.
   - නායකත්වය
   - පරිපාලනය
   - ඇදහිල්ල
   - දීම
   - උපකාරකිරීම
   - සේවය කිරීම
   - කරුණාව
   - ආගන්තුක සත්කාරය

3. ඒවා ආත්මික මෙන්ම ප්‍රායෝගික ක්ෂේත්‍ර වලද ආකෘතිය, සංවිධානාත්මකභාවය හා සහයෝගය ලබා දීමට සේවය කරන බැවිනි.

4. පරිපාලනයේ දීමනාව සහිත පුද්ගලයෙකු මඟපෙන්වීමේ, සංවිධානය කිරීමේ හා අන් අය උදෙසා තීරණ ගැනීමේ හැකියාව ඇති අයෙකි. නායකත්වයේ දීමනාව දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා නිශ්චිත අරමුණු ළඟා කර ගැනීමට අන් අයව උද්යෝගිමත් කරවීම හා නායකත්වය දී සිදු කරයි.

5. සේවය කිරීම දිමනාව ඇති පුද්ගලයා වෙනත් කෙනෙකු යම් රාජකාරියකින් නිදහස් කරන බැවින් එය උපකාර කිරීමේ දිමනාවෙන් වෙනස් වේ. සේවය කරන කෙනෙකු තවත් අයෙකුට තම ආත්මික දීමනා පාවිච්චි කිරීමට නිදහස් කිරීම උදෙසා යම් කාර්යයන්ගේ වගකීම භාරගනී. උපකාර කිරීමේ දීමනාව ඇති අයකු තවත් කෙනෙකුට ඔවුන්ගේ සේවයේදී සහය වෙන නමුත් ඔවුන්ව වගකීම් වලින් නිදහස් කිරීමක් සිදු නොකරයි.

6. 9,6,2,3,5,7,11,4,8.

7. අසත්‍ය.

8. ඇදහිල්ල පිළිබඳ නිර්වචනය හෙබ්‍රෙව් 11:1 හි සඳහන් වේ.

9. දීමනාව බලය උදෙසාය. ඵලය චරිතය උදෙසාය.

10. දේව වචනයට සවන් දීම තුළින්ය. රෝම 10:17.

## නව වන පරිච්ඡේදය :

1. විපාකයක් ලැබුණේ වී නම්, පළමුවෙන් ස්වාමීන්වහන්සේ කරණකොට ගෙන කියනලද වචනය ස්ථිරවී, සියලු වැරදි ක්‍රියාවලටත් අකීකරුකම්වලටත් සාධාරණ විපාකයක් ලැබුණේ වී නම්, පළමුවෙන් ස්වාමීන්වහන්සේ කරණකොටගෙන කියනලද්දාවූ, ඇසූවන් විසින් අපට ස්ථිරකර දුන්නාවූ මෙපමණ මහත් ගැළවීම අපි නොසලකා සිටියොත් කොහොම ගැළවෙමුද? (හෙබ්‍රෙව් 2:3-4)

2. - හාස්කම්
   - සුවකිරීම්
   - අන්‍යභාෂා
   - අන්‍යභාෂා තේරුම්කර දීම්

3. මේ පොතෙහි ලියා නැති වෙනත් බොහෝ හාස්කම් යේසුස්වහන්සේ ගෝලයන් ඉදිරියෙහි කළ සේක. නුමුත් මේවා ලියනලද්දේ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්වහන්සේ බව නුඹලා විශ්වාසකරන පිණිසත් විශ්වාසකොට උන්වහන්සේගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය. (යොහන් 20:30-31)

4. 2,3,4,1.

5. a. අ: b.ස: c.අ: d.අ: e.ස: f.අ: g.අ: h.අ

## දහවන පරිච්ඡේදය :

1. ඒ කාරණය නිසා මාගේ අත් තැබීම කරණකොටගෙන නුඹ තුළ තිබෙන දෙවියන්වහන්සේගේ දීමනාව පුබුදුකරන හැටියට නුඹට සිහිකරවමි. (2 තිමෝති 1:6)

2. - අභිප්‍රායන් හා අරමුණු ළඟා කර ගනී.
   - ආත්මික සටන් මෙහෙයවයි.
   - අනිසි ලෙස යොදා ගැනීම් මඟහරවයි.
   - නිෂ්ඵලභාවය නැතිකරයි.
   - වගකීම් භාරගනී.

3. පළමු පියවර : නැවත උත්පාදනය ලබා ගන්න.
   දෙවන පියවර : ශුද්ධාත්ම බව්තීස්මය ලබා ගන්න.
   තෙවන පියවර : ආත්මික දීමනා දැන හඳුනගන්න.
   හතරවන පියවර : දීමනා ඇති අයගේ ආදර්ශයන් නිරීක්ෂණය කරන්න.
   පස්වන පියවර : ආත්මික දීමනාවක් සොයන්න.
   හයවන පියවර : අත් තැබීම.
   හත්වන පියවර : ඔබේ ආත්මික ආශාවන් විශ්ලේෂණය කරන්න.
   අටවන පියවර : කිතුනු නායකයෙකු මගින් විශ්ලේෂණය කරන්න.
   නවවන පියවර : ඔබගේ පසුගිය කිතුනු සේවය විශ්ලේෂණය කරන්න.
   දහවන පියවර : ආත්මික දීමනා ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන්න.
   එකොළොස්වන පියවර : ඔබට තිබේ යයි ඔබ සිතන දීමනා හඳුනාගන්න.
   දොළොස්වන පියවර : ආත්මික අවශ්‍යතා හඳුනාගන්න.
   දහතුන්වන පියවර : ආත්මික අවශ්‍යතාවයක් සම්පූර්ණ කරන්න.
   දහහතරවන පියවර : ඔබගේ සේවය ඇගයීමට ලක් කරන්න.

## එකොළොස්වන පරිච්ඡේදය :

1. එවැන්ජලිස්ත සේවයෘ ශුභාරංචි පණිවුඩය පිළිබඳ බලවත් සාක්ෂිකරුවකු බවට පත් වීම.

2. ක්‍රිස්තුස්වහන්සේ වැනි ආත්මික ගුණාංගයන්ගේ අභ්‍යන්තර ඵලය.

3. ගලාති 5:22-23

    - ප්‍රේමය - ප්‍රීතිය
    - සමාදානය - ඉවසිවන්තකම
    - කරුණාවන්තකම - යහපත්කම
    - විශ්වාසකම -මෘදුකම
    - පමණ දැන ක්‍රියා කිරීම.

4. යොහන් 15:16

5. නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්-ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම,විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධ ව්‍යාවස්ථාවක් නැත. (ගලාති 5:22-23)

6. 9,7,8,5,6,2,4,1.

7. ආත්මිකභාවය පිටතින් නිරූපණය කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බැවින් ආත්මික ඵල වැදගත් වේ. අප දෙවියන්වහන්සේගෙන් වන බව දැනගත හැක්කේ මේවා තුළින් වන බැවින් අපට ආත්මික ඵල පැවතිම වැදගත් වේ. දිමනා ආත්මික ලෝකයේ නැවත ඵල දැරීමේ බීජ ගෙනයයි.

8. ධර්මිෂ්ඨ කරනු ලැබීම හා පාපයන්ට සමාව දීම තුළින් දෙවියන්වහන්සේ සමඟ සමාදානය ළඟා කරගත හැකිය. දෙවියන්වහන්සේගේ සමාදානය ලැබෙනුයේ මෙම අත්දැකීමෙන් අනතුරුවය. එය දිනපතා ජීවිතය උදෙසා දෙවියන්වහන්සේ ලබා දෙන සමාදානය වේ.
(රෝම 5:1 හා පිලිප්පි 4:7 බලන්න.)

## දොළොස්වන පරිච්ඡේදය :

1. ඉදින් මාංශයේ ක්‍රියා ප්‍රකාශව තිබේෘ එනම්, වෙශ්‍යාකම, අපවිත්‍රකම, ස්ලාකම,ෘ රූප වැඳිම, මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදිකම්, භේද, ලබ්ධි භේද,ෘ වෛර, මංගල්‍ය ඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. (ගලාති 5:19-21)

2. මාංශයේ ක්‍රියා.

3. ගලාති 5:16

4. 17,14,15,16,4,1,2,3,6,5,7,8,13,9,11,10,12.

## දහතුන් වන පරිච්ඡේදය :

1. මා තුළෙහි තිබී ඵල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරන සේක. ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස උන්වහන්සේ පවිත්‍රකරනසේක. (යොහන් 15:2)

2. ඵල, වඩා ඵල, වඩාත් ඵල, ස්ථිර ඵල.

3. ජීවනය, ජලය, ආලෝකය, වාතය, අවකාශය, මූලපද්ධතිය, ආධාරකය, පස, මරණය, මිදිවැලට සම්බන්ධ වීම, පවිත්‍ර කිරීම, දේශගුණය,